330 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 330 - இல. 12
Volume 330 - No. 12

2026 නොවැම්බර් 06වන සිකුරාදා
2026 நவம்பர் 06, வெள்ளிக்கிழமை
Friday, 06th November, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න මතු කිරීම සඳහා 2026.11.03 දින කරන ලද ඉල්ලීම් [පිටුව 2195]

කථානායකතුමාගේ සහතිකය [පිටුව 2206]

2026 නොවැම්බර් 12වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන [පිටුව 2206]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [පිටුව 2207]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 2211-2250]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

විරැකියාව සහ ඌන සේවා නියුක්තිය විසඳීම සඳහා ගෙන ඇති පියවර [පිටුව 2252]

භාණ්ඩාගාරය මඟින් ඉන්ධන සහ විදුලිය සඳහා ලබා දෙන සහනාධාර [පිටුව 2261]

2026 මහ කන්නයේදී එල් නිනෝ බලපෑම්වලට මුහුණ දීම සඳහා ගනු ලබන පියවර:

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 2267]

ජපානයේ පැවැත්වෙන 20වන ආසියානු ක්‍රීඩා උළෙල සඳහා වන ශ්‍රී ලංකා කණ්ඩායමට ෆාතිමා ශෆියා යාමීක් ඇතුළත් කර නොගැනීම:

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 2274]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:

පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම [පිටු 2278-2294]

මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම [පිටු 2295-2309]

ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම [පිටු 2310-2326]

උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම [පිටු 2326-2342]

ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය සහ මර්දනය කිරීම [පිටු 2342-2353]

කල්තැබීමේ යෝජනාව:

කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් කඩිනම් කිරීම [පිටු 2354-2366]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [පිටු 2366-2376]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சிறப்புரிமை வினாவொன்றை எழுப்புவதற்காக 2026.11.03ஆம் திகதி விடுக்கப்பட்ட கோரிக்கை [ப: 2195]

சபாநாயகரது சான்றுரை [ப: 2206]

2026 நவம்பர் 12ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள் [ப: 2206]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 2207]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2211-2250]

தனி அறிவித்தல் மூல வினா:

வேலையின்மை மற்றும் தகுதிக்கேற்ற வேலையின்மையை நிவர்த்தி செய்வதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் [ப: 2252]

எரிபொருள் மற்றும் மின்சாரத்திற்காக திறைசேரியால் வழங்கப்படும் மானியம் [ப: 2261]

2026 மகா போகத்தில் எல்நினோ தாக்கத்தை எதிர்கொள்வதற்கான நடவடிக்கைகள்:

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 2267]

ஜப்பானில் நடைபெற்ற 20ஆவது ஆசிய விளையாட்டுப் போட்டிக்கான இலங்கை அணியில் பாத்திமா ஷாபியா யாமிக் உள்வாங்கப்படாமை:

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரினது கூற்று [ப: 2274]

தனி நபர் பிரேரணைகள்:

புத்தளம் புகையிரதப் பாதையில் புகையிரத சேவைகளின் எண்ணிக்கையை அதிகரிப்பதற்கான வேலைத்திட்டம் ஒன்றைத் தயாரித்தல் [ப: 2278- 2294]

வீதி ஒதுக்குப் பிரதேசங்களில் மரங்களை நடுதல், அறிவியல் ரீதியாக முகாமை செய்தல் மற்றும் பராமரித்தலுக்கு முறையான வழிமுறையொன்றைத் தயாரித்தல் [ப: 2295-2309]

இலங்கையின் சகல கல்வியியற் கல்லூரிகளையும் பல்கலைக்கழக பீடங்களாக மாற்றுதல் [ப: 2310-2326]

உடவளவை பிரதேசத்தை சுற்றுலா வலயமாகப் பிரகடனப்படுத்தல் [ப:2326-2342]

நீர்த்தாமரை செடியின் பரவலை சாதகமான வகையில் கட்டுப்படுத்துதல் மற்றும் அழித்தல் [ப: 2342-2353]

ஒத்திவைப்புப் பிரேரணை:

கொழும்புத் துறைமுகத்தின் கிழக்கு கொள்கலன் முனையத்தின் நிர்மாணப் பணிகளை துரிதப்படுத்தல் [ப: 2354-2366]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 2366-2376]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Requests Made on 03.11.2026 to Raise Questions of Privilege [Col. 2195]

Speaker's Certificate [Col. 2206]

Special Security Arrangements on 12th November, 2026 [Col. 2206]

AUDITOR-GENERAL'S REPORT [Col. 2207]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2211-2250]

QUESTION BY PRIVATE NOTICE:
Measures Taken to Address Unemployment and Underemployment [Col. 2252]

Subsidies Provided for Fuel and Electricity by Treasury [Col. 2261]

MEASURES TO ADDRESS THE IMPACT OF EL NINO DURING 2026 MAHA SEASON:
Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 2267]

NON – INCLUSION OF FATHIMA SHAFIYA YAMIK IN SRI LANKAN CONTINGENT FOR 20TH ASIAN GAMES HELD IN JAPAN:
Statement by Minister of Youth Affairs and Sports [Col. 2274]

PRIVATE MEMBER'S MOTIONS:
Formulation of a Programme to Increase Train Services on the Puttalam Railway Line [Cols. 2278-2294]

Formulation of a Systematic Methodology for the Planting, Scientific Management, and Maintenance of Trees Within Road Reserves [Cols. 2295-2309]

Converting All Colleges of Education in Sri Lanka into University Faculties [Cols. 2310-2326]

Designation of the Udawalawe Area As a Tourist Zone [Cols. 2326-2342]

Favourable Control and Suppression of the Proliferation of Common Water Hyacinth [Cols. 2342-2353]

ADJOURNMENT MOTION:
Acceleration of Construction of East Container Terminal at Colombo Port [Cols. 2354-2366]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2366-2376]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 නොවැම්බර් 06වන සිකුරාදා
2026 நவம்பர் 06, வெள்ளிக்கிழமை
Friday, 06th November, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න මතු කිරීම සඳහා 2026.11.03 දින කරන ලද ඉල්ලීම්
சிறப்புரிமை வினாவொன்றை எழுப்புவதற்காக 2026.11.03ஆம் திகதி விடுக்கப்பட்ட கோரிக்கை
REQUESTS MADE ON 03.11.2026 TO RAISE QUESTIONS OF PRIVILEGE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to make an Announcement to this House following a study of the requests made on 3rd November, 2026 by five Members of Parliament seeking leave to raise Questions of Privilege. The Hon. Members are,

(i) The Hon. Sajith Premadasa, Leader of the Opposition;

(ii) The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law, Member of Parliament;

(iii) The Hon. Mano Ganesan, Member of Parliament;

(iv) The Hon. Mujibur Rahuman, Member of Parliament; and

(v) The Hon. Chanaka Madugoda, Member of Parliament.

On examining each of these notices, on the basis of the relevant provisions of Standing Orders of Parliament and the Parliament (Powers and Privileges) Act, No. 21 of 1953, it is found that none of the matters raised discloses evidence that *prima facie* establishes a breach of Parliamentary Privilege of a level warranting consideration under Standing Order No. 118 of Parliament.

In arriving at this decision, the following legal and procedural principles were taken into consideration:

Matters such as compliance with procedures, giving notice in the "Order Book" under Standing Order No.10(3) of Parliament and the scheduling of Parliamentary Business by the Committee on Parliamentary Business under Standing Order No. 115 of Parliament are procedural matters. They are not regarded as breaches of Parliamentary Privilege under Standing Order No. 118 of Parliament.

In accordance with the Ruling given by the Hon. Speaker on 06th October, 2026 - recorded in Volume 330 of Hansard - and established parliamentary tradition, administrative decisions relating to the handling of Parliamentary Business and the scheduling of time cannot be challenged by raising Questions of Privilege under Standing Order No. 118 of Parliament.

According to the Minutes of the 57th Meeting of the Committee on Parliamentary Business, an opportunity was granted to submit an amended Motion by removing the *sub judice* matters in the present Motion. As no such amended Motion was submitted within the stipulated time period, no unconditional right to a debate on the original motion arose.

Section 3 of the Parliament (Powers and Privileges) Act, No. 21 of 1953, which concerns the freedom of speech enjoyed by Members within the House of Parliament, and the absence of statutory privilege offences, *i.e.* including acts such as assault, obstruction or the wilful disobedience of Parliamentary Rulings set out in Section 4, which provides protection against external civil or criminal liability, do not disclose any conduct falling under the statutory offences specified in Parts "A" and "B" of the Schedule to the Act.

In light of the above, all the five requests in question do not qualify as matters of Privilege under Standing Order No. 118 of Parliament, nor do they establish a *prima facie* breach of Parliamentary Privilege.

Accordingly, I wish to inform the House that there are no grounds to raise these matters of Privilege in the House.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 118 (2) (අ)හි බොහොම පැහැදිලිව තිබෙනවා, "...වරප්‍රසාද කඩ කිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත් වන්නේ නම්..." කියලා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඊළඟට එය ඉදිරිපත් කරන්න තිබෙන්නේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට. එම කාරක සභාවෙන් තමයි මේක නීන්දු කරන්නේ.

මම පළමුවෙන්ම මේ කාරණය අහන්න කැමැතියි. එතුමා ආපහු කියලා තිබෙනවා, කථානායකතුමාගේ ක්‍රියාකාරකම් ගැන ප්‍රශ්න කරන්න බැහැ කියලා. අපි කිසි වෙලාවක කථානායකතුමාගේ ක්‍රියාකාරකම් ගැන මෙතැන ප්‍රශ්න කරලා නැහැ. මෙතැන ප්‍රශ්න කරලා තිබෙන්නේ මොනවාද බැලුවොත්, - මා ඉදිරිපත් කළ කාරණා සම්බන්ධව කථා කළොත් - *sub judice* කියන කාරණය යටතේ කරුණු 3ක් මම ඉදිරිපත් කළා. මම ඉදිරිපත් කළ පළමුවැනි කරුණ මෙයයි. මහින්ද යාපා අබේවර්ධන මහත්මයාට විරුද්ධව විශ්වාස භංගය ගෙනාපු වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ ගණනාවක ඒ සම්බන්ධව නඩු 7ක් තිබියදීත් අපි ඒක ගැන කථා කළා. දෙවනුව අපි කථා කළා, දේශබන්දු තෙන්කෝන් මහත්මයාගේ කාරණය. තුන්වැනි කාරණයත් මම අද කියන්නම්. අපේ අධිකරණ ඇමතිතුමාට; හර්ෂණ නානායක්කාර මැතිතුමාට විරුද්ධව ගෙනාපු විශ්වාස භංගය ගැන එතුමා කථා කරපු කාරණා සියල්ලම ඒ වෙලාවේ මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් තිබිච්ච නඩුවල කරුණු. ඒ සියල්ල ගැන අපි කථා කළා. මේ කථානායකතුමාම තමයි ඒවාට අවසර දුන්නේ. අපි කියන්නේ මේකෙදි අයින් කරන්න කියලා ආණ්ඩුව කියන කාරණය කිසි විධියකින් *sub judice* යටතට අදාළ වන්නේ නැහැ කියන එකයි.

දෙවැනි කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක හැදුවේ මේ ඉන්න ලේකම් මණ්ඩලයද? මේගොල්ලන් මේකේ වගකීම බාරගන්නවාද? නැත්නම් මේක වෙන කොහෙන් හරි; එළියෙන් ගෙනාවාද? නැත්නම් කවුද මේ නියෝගය හැදුවේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් විශාල අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. මොකද, මේවා ගේන්නේ එළියෙන්. මේ ලේකම් මණ්ඩලයෙන් මම කෙළින්ම අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේකට වගකියනවාද කියලා. මේ නියෝගය - order එක - හැදුවේ කවුද? ලබන 10වැනි දා අපේ ජයලත් මහත්මයා විශ්‍රාම යන්න ඉන්නේ. ඒ මනුස්සයාටත් කරන අසාධාරණයක් මේක. මොකද, ආණ්ඩුවේ සහායක කාර්යාලයේ තිබෙන තනතුරුවලට පත් කරගන්න හදනවා, මේ ආයතනයෙන් විශ්‍රාම ගියාම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I understand your concern.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට මේ නිලධාරීන් විශ්‍රාම ගියාම ඒගොල්ලන්ගේ ස්වාධීනත්වය පිළිබඳව කථා කරන්නේ කොහොමද? ඒ නිසා බොහොම පැහැදිලිව මා අහන්නේ මෙයයි. මේකේ වගකීම මේ ලේකම් මණ්ඩලය භාර ගන්නවාද? *[බාධා කිරීමක්]* ලේකම් මණ්ඩලය මේකේ වගකීම භාර ගන්නවාද කියලා අහන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I listened to you.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will come to you, Hon. Hon. Ajith P. Perera.

This is an Announcement by the Hon. Speaker after studying the matter and in consultation with the Office of the Secretary-General of Parliament. - *[Interruption.]* Yes.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මා අහන්න කැමැතියි, ලේකම් මණ්ඩලය මේකේ වගකීම භාර ගන්නවාද කියලා. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිව්වා නේ දැන්. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ. ඔබතුමා කිව්වාට හරියන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]* ඒ අය වගකීම භාර ගන්නවාද? *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I am telling you, Hon. Jayasekara, - *[Interruption.]* Excuse me, Hon. Dayasiri Jayasekara, - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමාත් එක්ක අපට ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
This had been done in consultation with the Office of the Secretary-General of Parliament.

Hon. Ajith P. Perera, I see that you have been on your feet for some time. Make it brief. I think it is on the same thing.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මේකයි. ගරු කථානායකතුමාට විරුද්ධව චෝදනා 50කින් යුතු විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් මේ නියෝගයේ කිසිම තැනක නැහැ, මේ කියන *sub judice* වෙන්නේ මොන චෝදනාවද කියලා; චෝදනා අංක 01 ද, 02 ද, 03 ද, 49 ද, 50 ද කියලා නැහැ. එහෙම දෙයක් නැහැ. මෙතැනදී ඇත්ත වශයෙන්ම නිකම්ම *"sub judice, sub judice"* කියනවා

මිස, මොකක්ද *sub judice* වෙන්නේ? චෝදනා 50ක් තිබෙනවා. හොරකම් තිබෙනවා; දූෂණ තිබෙනවා; නොගැළපෙන හැසිරීම් තිබෙනවා; අසාධාරණකම් තිබෙනවා; පක්ෂපාතිත්වය තිබෙනවා. මේවායෙන් මොකක්ද *sub judice* වෙන්නේ? මොන නඩුවද? මේ නියෝගයේ එහෙම නැහැ නේ. මේ නියෝගයේ නඩු අංකය නැහැ. මේ නියෝගයේ උසාවිය මොකක්ද කියලා නැහැ. මොකක්ද ප්‍රශ්නය? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණයට ලක් වෙනවා, කථානායකවරයා. ඒක *sub judice* නොවෙයි. එතකොට අභියාචනාධිකරණයේ නඩුවක් තිබෙනවා. ඒකට තවම notice issue කරලාවත් නැහැ. ඒක *sub judice* නොවෙයි. එතකොට, *sub judice* මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට මොකක් හරි සාධාරණත්වයක් තිබෙන්න එපායැ. අපි මොකක්හරි විශ්වාසයක් මත නේ වැඩ කරන්නේ. මොකක්ද *sub judice?*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, would you please listen to me?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොන චෝදනාවද *sub judice*? මොන හේතුව නිසාද *sub judice* වුණේ? මොකක්ද හේතුව? නීතිපතිගේ මතය ඇහුවේ නැහැ නේ. නීතිපතිගේ මතය අහන්න එකඟ වුණා නේ. ඔබතුමා තමයි එදා මුලසුනේ හිටියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා ආණ්ඩුව මේ *sub judice* ප්‍රශ්නය මතු කළාම ඔබතුමා නීතිපතිතුමාගෙන් අහන්න එකඟ වුණා. හරි නේ. නීතිපතිතුමාගෙන් අහන්න එකඟ වෙලා, නීතිපතිතුමාගෙන් ඇහුවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවංක වෙන්නකෝ. ඔබතුමා නීතිපතිතුමාගෙන් ඇහුවාද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක ලේකම් මණ්ඩලයේ වැඩක්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ලේකම් මණ්ඩලය ඒක නීතිපතිතුමාගෙන් ඇහුවේ නැහැ. අපි දන්නවා ඒක ඇහුවේ නැහැ කියලා. නීතිමය ප්‍රශ්නයක් මතු වුණාම එළියේ ඉන්න පෞද්ගලික නීතිඥ මහත්වරුන්ගෙන් නියෝග ලියාගෙන හරියන්නේ නැහැ නේ. නීතිපතිතුමාගෙන් අහන්න ඕනෑ. එහෙම තමයි එකඟ වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා තමයි එදා මුලසුන දැරුවේ. එදා, කථානායකතුමා ලංකාවේ හිටියේ නැහැ. එදා ඔබතුමා මුලසුන දරපු රැස්වීමේදී එකඟ වුණා නේ, නීතිපතිතුමාගෙන් අහන්න. අවංක වෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, I will come to that. I remember this incident. On that day, particularly when - *[Interruption].* Hon. Ajith P. Perera, I listened to you. Now, would you listen to me, Hon. Member? I gave ear to you.

There were actually two conclusions arrived at on that day. One was to get the opinion of the Attorney-General or *නීතිපති*. The other one was to submit an amended Motion for consideration. I think we wanted the Hon. Chief Opposition Whip, the Hon. Gayantha Karunathilleka, to give an amended Motion. At that time, he said, "Okay. We will give one and will it be debated for two days?" The Hon. (Dr.) Nalinda Jayatissa who was there that day, said, "Okay, first, you give the Motion and then, we will consider the number of days." I remember that very well.

The Hon. Chaminda Wijesiri, please. You have been standing for some time.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(2) යටතේ මටත් අවස්ථාවක් දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. මේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කිරීම නීත්‍යානුකූල නොවෙයි කියන කාරණය මුලසුනට ප්‍රකාශ කළ හැකියි. හැබැයි, ඇයි එසේ එය සිදු වුණේ, කියන කාරණය පිළිබඳව අපට පහදන්න, මතු කරන්න අවසර දෙන්න. අපි ගෙනෙනවා, කථානායකවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක්. ඇයි, අපට ඒක ගෙනෙන්න වෙන්නේ? හිටපු කථානායකතුමා විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න කලින් අයින් වුණා. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කථාවක් කරනවා නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ වරප්‍රසාද ප්‍රශ්නය- *[බාධා කිරීමක්]* යම් අපචාරයක්, දූෂණයක් තිබෙනවා නම්,- *[බාධා කිරීමක්]* ජාතික ජන බලවේගයේ ප්‍රතිරූපය රකින්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා විතරයි; වෙන නැහැ. ඒ නිසා ඔබතුමා බලන්න,- *[බාධා කිරීම්]* එසේ නොවන අවස්ථාවකදී ඇමතිවරුන්ට පවා විශ්වාස භංග යෝජනා ගෙනෙන්නේ, යම් අපචාරයක්, වැරැද්දක් සිද්ධ වුණාම අයින් වෙන්න, අයින් කරන්න කියලා. අයින් වුණත් නැතත් විපක්ෂයේ කාර්යභාරය එයයි. හැබැයි, එය නොවුණාම ඒ අයිතිය නැති වෙච්ච නිසා තමයි ගරු මන්ත්‍රීවරු ගෙනාවේ, අපේ වරප්‍රසාද අහිමි වුණා කියලා යෝජනාවක්. අපේ වරප්‍රසාද අහිමි වීම නීත්‍යානුකූලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chaminda Wijesiri, I listened to you. Now, would you listen to me?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතකොට ඔබතුමන්ලා ඒ හොරකම් ටික, වංචා ටික නැති කරන්න- *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි මෙහෙම කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chaminda Wijesiri, I am talking to you. It was an Announcement by the Speaker, having considered a detailed study on what was submitted, requesting for leave to raise a matter of Privilege. That was done in consultation with the SG's office, and that is what I read out in the House.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Mujibur Rahuman?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය, කථානායකතුමා සම්බන්ධ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ විශ්වාස භංග යෝජනාව විවාදයට නොගෙන ඉන්න කියන්න එක කාරණාවක් තමයි අභියාචනාධිකරණයේ තිබෙන නඩුවක් සම්බන්ධ කාරණාව. එතකොට, මේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ සම්ප්‍රදායයන් දෙකක් නේ. එකක් තමයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා වෙලා ඉන්න කාලයේ මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමා හිටියේ. එතුමා ව්‍යවස්ථාදායකයේ සභාපතිවරයා හැටියට දේශබන්දු පොලිස්පතිවරයා පත් කිරීමේදී දුෂිතව වැඩ කළා කියන චෝදනාවට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගණනාවක් අහද්දී, එතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනැල්ලා ඒක විවාදයට ගත්තා. ඊළඟට, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ දේශබන්දු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගණනාවක් යනකොට, ඒ නඩු තිබියදී දේශබන්දු ඉවත් කිරීමට විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා අපිත් සහයෝගය දීලා, ඡන්දය දීලා දේශබන්දුව අයින් කළා. එතකොට මේ පාර්ලිමේන්තුව තුළ සම්ප්‍රදායන් දෙකක් නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ නඩු තිබියදී විශ්වාස භංග යෝජනා විවාදයට අරගෙන තිබෙනවා.

වර්තමාන කථානායකතුමාට තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් චම්න්ද කුලරත්නත් එක්ක තිබෙන නඩුවක්. ඒක අපේ විශ්වාස භංග යෝජනාවත් එක්ක කිසිම සම්බන්ධයක් නැහැ. ඉතින්, ඇයි මේ විශ්වාස භංග යෝජනාව විවාදයට නොගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන අපේ අයිතිවාසිකම් යටපත් කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු පස්දෙනෙක් 03වැනි දා වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කරන්න තිබුණා. ඉන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ සහ මගේ වරප්‍රසාද ප්‍රශ්න මා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Listen to me, Hon. Mujibur Rahuman. Again, I would say the same thing. That is an Announcement by the Speaker. As I told you - I have to repeat myself once again - this was taken into consideration and studied with the Secretary-General's Office, and this is what was found out.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Who were the lawyers? Not the Parliament staff, who were the lawyers?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

This was done in consultation with the Secretary-General's Office.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Chief Opposition Whip?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විශ්වාස භංග යෝජනාව භාර දුන්නාට පස්සේ Order Book එකට ඇතුළත් වුණා. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පක්ෂ නායක රැස්වීමක් පැවැත්වුවා. එතැනදී තීරණය වුණේ, නීතිපතිවරයාගෙන් විමසීමක් කරලා ඒ පිළිබඳ තීරණයක් ගනිමු කියලා. ඒ කරුණු වාර්තාවල තිබෙනවා. අපේ ඉල්ලීම වුණේ විවාදයට එක දවසක් මදි, දින දෙක තුනක් අවශ්‍යයි කියන එක. ඒකත් නීතිපතිගේ උපදෙස් ලැබුණායින් පසු තීරණය කරමු කියලා තමයි එකඟ වුණේ. Minutesවල මේ ඔක්කොම තිබෙනවා. ඊට පසුව, නැවත පක්ෂ නායක රැස්වීමක් තිබුණා. අපි මචිතයට පත් වුණා කථානායකතුමා මූලාසනයේ තබාගෙන මේ ගැන කථා කරන්න වෙච්ච එක ගැන. එහිදී තීරණය වුණා නීතිපතිගේ උපදෙස් අවශ්‍ය නැහැ, විශ්වාස භංග යෝජනාව සංශෝධනය කරලා ඉදිරිපත් කළොත් ලබන සතියේ විවාදයට ගන්න පුළුවන් කියලා. - Minutesවල මේවා තිබෙනවා. - අපි ඉතාම පැහැදිලිව කිව්වා, කිසිලෙසකින්වත් අපි මේක සංශෝධනය කරන්නවත්, අලුත් එකක් භාර දෙන්නවත් සූදානම් නැති බව. ඒ විතරක් නොවෙයි, අපි පැහැදිලිව කිව්වා, - විශේෂයෙන්ම මම එහි සඳහන් කළ බව වාර්තාවේ තිබෙනවා - Parliamentary Business Committee එකට කිසිම අයිතියක් නැති බව, විශ්වාස භංගයක් සංශෝධනය කරන්න කියන්න, යළිත් ගෙනෙන්න කියන්න. එහි අයිතිය තමයි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ තීරණ ගැනීම. අනික් එක, අපි සොයා බැලුවා මෙහි තව මොනවාද අපට වෙනස් කරන්න තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Gayantha Karunathilleka.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට තව තත්පර දෙකක් ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give it to you.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපි බැලුවාම පෙනුණා, අපට නම් වෙනස් කරන්න දෙයක් මෙහි නැති බව, ස්ථාවර නියෝගවලට පටහැනි. ඕනෑ නම්, අපි මෙහි "ගරු කථානායකතුමා" කියලා ලියා තිබෙන එකේ "ගරු" කියන කොටස ඉවත් කරන්න පුළුවන්. එච්චර තමයි අපට වෙනස් කරන්න පුළුවන්.

තව එකම එක කාරණයක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, I recall all what you said and yes, that is correct.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේ කරන වැඩෙන්, අනාගතයේ කවුරු හෝ ඇමතිවරයෙකුට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවොත්, ඒක Order Book එකට ගියාට පසුව ඒ ඇමතිට පුළුවන් කාට හෝ කියන්න, ගිහිල්ලා උසාවියේ මොකක් හෝ එකක් දාලා එන්න කියලා. ඒක විභාග කරනවාද, නැද්ද මොකවත් නැහැ. ඒක පිට දාලා ඒ ඔක්කොම අයින් කරන්න වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Archchuna, why are you on your feet? He caught my eye first, Hon. Leader of the Opposition.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, let me draw your attention to Standing Order No. 118. There is a thing called *nemo judex in causa sua* in law. That means, no one can be the judge for himself. Now, we are raising these issues against the Speaker. Already, I had raised a Privilege issue in Parliament against the Speaker, which was taken up at the Committee on Ethics and Privileges. That was inquired into and it was found that Standing Orders had been violated in my case. So, this matter must also be referred to the Committee on Ethics and Privileges, where they could decide whether the Speaker has allowed the Privilege matter or not. So, let it be taken up by the Committee because this is against the rule of law.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you, Hon. (Dr.) Ramanathan Archchuna. The Hon. Leader of the Opposition.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ කරුණු, අදහස් ඉදිරිපත් කරන්නේ ඔබතුමාට විරුද්ධව නොවෙයි. අපි ඔබතුමාට පැහැදිලිව කරුණු කිහිපයක් කියන්න කැමැතියි. මට ඒකට අවස්ථාව ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මා ඇතුළුව තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් - මනෝ ගනේසන්, දයාසිරි ජයසේකර, මුජීබුර් රහුමාන් හා වානක මාදුගොඩ යන ගරු මන්ත්‍රීතුමන්ලා - වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කළා. ඇයි, ඒ වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කළේ? ඔබතුමා හොඳින් දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට අපි හැමෝම දිවුරුම් දෙනවා හෝ ප්‍රතිඥා දෙනවා කියලා. ඒ තමයි රටේ උත්තරීතර නීතිය. මේ රටේ උත්තරීතර නීතිය තුළ විශේෂයෙන්ම ත්‍රෛපාර්ශ්වීය රාජ්‍ය පාලනයක් ක්‍රියාත්මක වෙනවා. ඒ තමයි, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය. මේ tripartite system එක තුළ සංවරණ සහ තුලන - checks and balances - තිබෙනවා. එතකොට පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - තුළ අපට තිබෙන සංවරණ සහ තුලන බලතලයක් තමයි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීම. ඒක අපේ අයිතිය. ඒක පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවා. ව්‍යවස්ථාදායකය සතු බලයක් තමයි අපි පාවිච්චි කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීමේ අයිතිය අපට තිබෙනවා. ඒ වාගේම මේ විශ්වාස භංග යෝජනාව විපක්ෂය ඉදිරිපත් කරනවා නම්, මෙම යෝජනාවට ඇතුළත් කළ යුතු කාරණා පිළිබඳ අයිතිය සහ අභිමතය තිබෙන්නේත් විපක්ෂයට. විපක්ෂයට බැහැ නේ රජය ලියලා දෙන විශ්වාස භංග යෝජනාවක් අපේ නමින් ඉදිරිපත් කරන්න. අපි එහෙම කරන්නේ නැහැ නේ. විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්නේ විපක්ෂය විශ්වාස කරන ප්‍රතිපත්ති සහ තොරතුරු සහ කරුණු කාරණා මත. අපි එහෙම දෙයක් ඉදිරිපත් කළාම ආණ්ඩු පක්ෂයට කියන්න බැහැ, "අපි ඕකට කැමැති නැහැ, අපි කැමැති නැහැ, ඕකේ අඩංගු වෙලා තිබෙන තොරතුරුවලට, කරුණු කාරණාවලට, මේක සංශෝධනය වෙන්න ඕනෑ, මේක අපට ඕනෑ ආකාරයට කෙරෙන්න ඕනෑ" යනුවෙන් කියන්න. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Leader of the Opposition.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will listen to you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මට අවස්ථාව දෙන්න.

අපට බැහැ නේ, ආණ්ඩුව කියන දේ අපේ විශ්වාස භංග යෝජනාවක් කියලා ඉදිරිපත් කරන්න. සමගි ජන බලවේගයට - සමගි ජන සන්ධානයට - බැහැ, ඒක කරන්න. ඒක මම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා ස්ථාවර නියෝග 29(1) සහ (2) අනුව, අපේ වරප්‍රසාද කඩවෙලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා න්‍යාය පුස්තකයටත් ඇතුළු වුණාට පස්සේ, පක්ෂ නායක රැස්වීමක් පවත්වා ආණ්ඩු පක්ෂය කියනවා, "නැහැ, මේකට අපි කැමැති නැහැ. මේකේ කරුණු කාරණා වෙනස් කරන්න ඕනෑ. වෙනස් කරලා ගෙනාවොත් අපි අවස්ථාව දෙන්නම්" කියලා. එහෙම කොහොමද කරන්නේ? ඒක සම්පූර්ණයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි. ඇත්තවශයෙන්ම ඒකෙන් වෙන්නේ මොකක්ද? විධායකය තමන්ගේ අණසකවලට ව්‍යවස්ථාදායකය යටපත් කරන එකයි ඒකෙන් වෙන්නේ. හිතාගෙන ඉන්නවා ඇති, මේ විපක්ෂය වහල්ලු කණ්ඩායමක් කියලා. රජයේ වහල්ලු වෙන්න අපට බැහැ නේ. එම නිසා මම ඔබතුමාට නැවත වරක් කියන්න කැමැතියි, මේ පිළිබඳව ඔබතුමා reconsider කරන්න කියලා. මම දන්නේ නැහැ, කවුද ඔය decision එක ලිව්වේ කියලා. ඔබතුමා කථානායකතුමා එවපු ලියුමක් ආපහු කියෙව්වාද? එහෙම නැත්නම් වෙනත් කවුරුන් හෝ දුන් උපදෙස් මාලාවක් මෙතැනදී ඉදිරිපත් කළාද? අපි දන්නේ නැහැ, මේ මොකක්ද කියලා. ඒ නිසා මම ඔබතුමාට ගෞරවයෙන් කියන්න කැමැතියි, reconsider your decision කියලා. නැවත කරුණු කාරණා සොයා බලන්න. නැවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවන්න. නැවත සංවරණ හා තුලන - checks and balances, බෙදී ගොස් තිබෙන බලය - separation of powers, ව්‍යවස්ථාදායකය, අධිකරණය, විධායකය සතු බලතල යනාදී දේවල් ගැන සොයා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, I noted your concern.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට දෙන එක එක කොළ කැලි මේ ගරු සභාවේ කියවන්න එපා. ඒක ඔබතුමාටත් ලොකු නිග්‍රහයක්. මම හිතනවා, ඔබතුමා බොහොම ගෞරවාන්විත චරිතයක් කියලා. අපි ඔබතුමාව ඉතිහාසය පුරාවටම දන්නවා. ඔබතුමා අපිත් සමඟ කාලයක් එක මතයක හිටපු කෙනෙක්. *[බාධා කිරීම්]* ඒ වෙනස්වීමේ අයිතිය ඔබතුමාට තිබෙනවා. එහෙම වෙනස් වුණාට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි දන්නවා, ඔබතුමා ගෞරවාන්විත චරිතයක් කියලා. *[බාධා කිරීම්]* ඔබතුමාගේ චරිතයට කැලලක් වන ආකාරයේ නියෝග, එක එක්කෙනා ලියලා දෙන ලියුම් කැලි මේක ඇතුළේ කියවන්න එපා කියලා මම බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]* ඒ වාගේම රජය ඉදිරිපත් කරන ප්‍රතිචාරවලට අපට නැවත වරක් උත්තර බඳින්නට අවස්ථාව ලබා දෙන්න කියලාත් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, now, we will move on to the next Announcement by the Speaker.

II

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I wish to inform that the Hon. Speaker has endorsed the Certificate on the Bill titled “Trusts (Amendment)” on 05th of November, 2026 in terms of Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

III

2026 නොවැම්බර් 12වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන
2026 நவம்பர் 12ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள்
SPECIAL SECURITY ARRANGEMENTS ON 12TH NOVEMBER, 2026

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
On behalf of the Hon. Speaker, I wish to inform all the Hon. Members of Parliament that the following special security arrangements will be implemented in connection with the Budget Speech for the year 2027 to be made by the Hon. Minister of Finance, Planning and Economic Development on Thursday, the 12th of November, 2026:

I wish to inform that the security arrangements for Wednesday, the 11th of November and Thursday, the 12th of November, 2026 will be as follows:

The entire Parliament building including the rest rooms and wardrobes of the Hon. Members of Parliament will be subjected to security inspection on this day.

On behalf of the Hon. Speaker, I also wish to inform that the security arrangements for Thursday, the 12th of November, 2026 will be as follows:

(a) The High Security Areas/significant locations identified in the Parliament building will be subjected to security inspection on this day;

(b) The Public Gallery will be open to the invited guests only. The Ministry of Finance, Planning and Economic Development will issue the invitation cards for the guests;

(c) The Hon. Members are kindly requested to be driven by chauffeurs, as far as possible, and to refrain from bringing guests to Parliament on this day;

(d) Parliament staff drivers will be stationed at the Members' Entrance, the Staff Entrance, and the Public Entrance to park the vehicles driven by Hon. Members of Parliament themselves in the designated parking areas;

(e) Since the Public Gallery is restricted to invited guests, if you have an invited guest coming with you, you can proceed to the Public Entrance by verifying your invitee's identity with the invitation card to the relevant police officers on duty at the Jayanthipura entrance;

(f) The vehicles of the Hon. Members of Parliament will be directed to the designated parking areas since the Parliament vehicle park will be closed on this day; and

(g) The Traffic Police and the nearby police stations will implement a special traffic plan.

Cooperation of all Hon. Members of Parliament is expected towards the aforementioned special security arrangements, and all Hon. Members of Parliament are kindly requested to cooperate with the Serjeant-at-Arms and the security personnel.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

A

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the-

- Ninth Installment - Part XLVI of the Report of the Auditor-General for the Financial Year 2019;
- Ninth Installment - Part L of the Report of the Auditor-General for the Financial Year 2022;
- Second Installment - Part LXIX of the Report of the Auditor-General for the Financial Year 2024; and
- Second Installment - Parts XX and XXI and Ninth Installment - Parts XIV, XV and XVI of the Report of the Auditor-General for the Financial Year 2025,

in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

B

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the ─

- Sixth Installment - Part XXXI of the Report of the Auditor-General for the Financial Year 2023;
- Sixth Installment - Part XXVII of the Report of the Auditor-General for the Financial Year 2024; and
- First Installment - Parts XV, XVI and XVII, Fourth Installment - Parts IX, X and XI, Fifth Installment - Part IX and Sixth Installment - Parts IV, V, VI and VII of the Report of the Auditor-General for the Financial Year 2025,

in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

II

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the Annual Report of the Auditor-General for the year 2025, in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(මාණ්පුමිකු (කලානිති) උපාලි පන්නිලකේ)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය) වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්ගම, දේවිනිගොඩ, 'සැනසුම' යන ලිපිනයෙහි පදිංචි පී.එච්.එස්. සුසාන්ත ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) පහල හෙවෙස්ස, නෙළුව පාර, 03 කණුව යන ලිපිනයෙහි පදිංචි ජී.ජී. අබේදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පානදුර, වැකඩ, හොරණ පාර, අංක 232/4 යන ලිපිනයෙහි පදිංචි ජී.ජී. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පල්ලේබෝවල, දෙල්පත්කඩ, ශ්‍රී දේව බෝධිමලු විහාරයෙහි වැඩවසන පූජ්‍ය කටුපොත ගුණරතන හිමිගෙන් ලැබුණු පෙත්සම.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාගම, නවම්මහර, අංක 92 යන ලිපිනයෙහි පදිංචි එස්.කේ.ඩී. චන්ද්‍රසිරි මහතා සහ වෙනත් තිදෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) අකුරණ, මල්වානහින්න, අංක 738 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී.එම්. වසීම් යූසුෆ් මහතාගෙන් සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතලේ, අල්වත්ත, නොම්මර 18 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. දිලූෂිකා මේබල් මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) නාරම්මල, හෙල්වීශියාවත්ත, අංක 46 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.සී.ටී. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩුමලගල, දොලමුල්ල කන්ද යන ලිපිනයෙහි පදිංචි පී.එම්.ඩබ්ලිව්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda - *[Not in the Chamber.]*

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීරිගම, කළුඅග්ගල පහලගම, අංක 48/බී යන ලිපිනයෙහි පදිංචි එන්.බී. කපුරුගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 1 - 202/2024 - (1), the Hon. Nalin Bandara Jayamaha. - *[Not in the Chamber.]*

Question No. 2 - 373/2025 - (1), the Hon. Ajith P. Perera.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 3 - 477/2025 - (1), the Hon. Ravi Karunanayake.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I ask Question No. 3.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
What about the Answer?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
කල් ඉල්ලනවා. *[බාධා කිරීමක්]*

නැහෙනහිර පළාතේ පෙර පාසල් ගුරුවරුන්: අවම අධ්‍යාපන සුදුසුකම
கிழக்கு மாகாணத்திலுள்ள முன்பள்ளி ஆசிரியர்கள்:ஆகக்குறைந்த கல்வித் தகைமை
PRESCHOOL TEACHERS IN EASTERN PROVINCE: MINIMUM EDUCATIONAL QUALIFICATION

906/2025

4. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නැහෙනහිර පළාතේ, මේ වනවිට ලියාපදිංචි කර ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල සේවයේ නියුතු පාලිකාවන් සපුරාලිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම කවරේද;

(iii) මේ වනවිට සේවයේ නියුතු පෙර පාසල් පාලිකාවන් අතරින් අවම අධ්‍යාපන සුදුසුකම සපුරා ඇති පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) සෑම පෙර පාසලක් සඳහාම එකම විෂය නිර්දේශයක් හෝ ඒ හා සමාන මාර්ගෝපදේශන ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේද;

(v) පෙර පාසල්වල පාලිකාවන්ට රජයෙන් ස්ථිර වැටුපක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தில் தற்பொழுது பதிவு செய்யப்பட்டுள்ள முன்பிள்ளைப் பருவ அபிவிருத்தி நிலையங்களின் (முன்பள்ளிகள்) எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி முன்பள்ளிகளில் சேவையில் ஈடுபடும் ஆசிரியைகள் பூர்த்திசெய்திருக்க வேண்டிய ஆகக்குறைந்த கல்வித் தகைமை யாது என்பதையும்;

(iii) தற்பொழுது சேவையில் ஈடுபடும் முன்பள்ளி ஆசிரியைகளுள் ஆகக்குறைந்த கல்வித் தகைமையைப் பூர்த்தி செய்துள்ள ஆசிரியைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

(iv) අනෙක්තු මුන්පළ්ළිකළුක්කුම් ඔරේ පාඩත්තිට්ටම් අල්ලතු අතර්කු ඉණෙයාන වළිකාට්ටුතල් මුරෙමෙයොන්රු අරිමුකප් පටුත්තප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(v) මුන්පළ්ළි ආසිරියෙකළුක්කු අරසාංකත්තාල් නිරන්තර සම්පළමොන්රෙ වළංකුවතර්කු නටවටික්කෙ එටුක්කප්පටුමා එන්පතෙයුම්;

අවර් ඉච්චෙයික්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House -

(i) the number of Early Childhood Development Centres - preschools - registered in the Eastern Province at present;

(ii) the minimum educational qualification that should be fulfilled by the teachers employed in those preschools;

(iii) the number of preschool teachers who have fulfilled the minimum educational qualification, out of those currently employed;

(iv) whether a uniform syllabus or a similar guideline method has been introduced for every preschool; and

(v) whether steps will be taken to provide a permanent salary to the preschool teachers by the Government?

(b) If not, why?

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i) 2210

(ii) 1. கிழக்கு மாகாணத்தில் முன்பள்ளிகளில் சேவையாற்றும் ஆசிரியர்கள் பூர்த்தி செய்திருக்க வேண்டிய ஆகக்குறைந்த தகைமையாக இருப்பது, க.பொ.த. (சா.த) பரீட்சையில் 5 திறமைச் சித்திகளுடன் சித்தியடைந்து இருப்பதாகும்.

2. க.பொ.த. (உ.த.) பரீட்சையில் 3 பாடங்களில் சித்தியடைந்திருத்தல்.

3. முன்பள்ளிக் கல்வி தொடர்பாக அங்கீகரிக்கப்பட்ட நிறுவனமொன்றிலிருந்து ஒரு வருட கால டிப்ளோமா பாடநெறியைக் கற்றிருத்தல் .

(iii) 2045

(iv) கிழக்கு மாகாண முன்பள்ளிக் கல்விப் பணியகத்தால் தயார் செய்யப்பட்டுள்ள முன்பள்ளிக் கல்விப் பாடவிதானம் பின்பற்றப் படுகின்றது.

(v) தகைமைகளைப் பூர்த்திசெய்துள்ள ஆசிரியர் களுக்கு 6,000 ரூபாய் வீதம் "குரு அபிமானி" கொடுப்பனவை வழங்கத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளன. எதிர்காலத்தில் இதை நிரந்தர சம்பளமாக மாற்றுவதற்கான நடவடிக்கைகளை மேற் கொண்டு இருக்கின்றோம்.

(ஆ) ஏற்புடையதன்று.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා

(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)

(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களுக்கு எனது நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த அமைச்சைப் பொறுப்பேற்ற பின்னர், nursery schoolsக்கான common syllabus ஒன்றை உருவாக்கி இருப்பதும், முன்பள்ளி ஆசிரியர்களுக்கான basic qualificationsஆக O/L, A/L, diploma உடன்கூடிய கல்வித் தகைமையை நிர்ணயித்திருப்பதும் உண்மையிலேயே வரவேற்கத்தக்க விஷயமாகும். நீண்டகாலமாக இவ்வாறானதொரு பணி இடம்பெற வேண்டுமென நாங்கள் பல முயற்சிகளை எடுத்தும் அது கைகூடவில்லை. நீங்கள் அந்தப் பணியைச் செய்திருப்பதையிட்டு நான் மிகவும் சந்தோஷமடைகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கிழக்கு மாகாணத்தில் மிக மோசமான பொருளாதார நிலைமை காணப்படுகிறது. யுத்தம் முடிவடைந்தாலும் இன்னும் அம்மாகாணம் முழுமையாகக் கட்டியெழுப்பப்படவில்லை என்பது உங்களுக்குத் தெரியும். இந்தச் சூழ்நிலையில், அங்கிருக்கின்ற கிராமப் புறங்களிலுள்ள பல nursery schools அடிப்படை வசதிகள் இல்லாமல் இருக்கின்றன. குறிப்பாக, toilets வசதி, நீர் வசதி, மின்சார வசதி, தளபாட வசதி இல்லாமல் இருக்கின்றன. எனவே, இது தொடர்பில் உரிய நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය

(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)

(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

கௌரவ உறுப்பினர் அவர்களுக்கு நன்றியை தெரிவித்துக் கொள்கின்றேன். ஏனென்றால், இது முக்கியமானதொரு கேள்வி. கிழக்கு மாகாணத்தில் மாத்திரமல்ல, பொதுவாகவே கிராமப் புறங்களில் இருக்கின்ற முன்பள்ளிகளில் அடிப்படை வசதிகள் இல்லாத நிலை காணப்படுகின்றது. அவ்வாறான முன்பள்ளிகளுக்கு அரசாங்கத்தால் உதவிகள் வழங்கப்படும். இதில் மாகாண சபையின் பங்களிப்பும் இருக்கின்றது. எனவே, மாகாண சபைகள் ஊடாகவும் மத்திய அரசின் கீழுள்ள எங்களுடைய அமைச்சின் ஊடாகவும் முன்பிள்ளை அபிவிருத்தி தொடர்பான தேசிய செயலகத்தின் ஊடாகவும் இதற்கான அடுத்த வருட நடவடிக்கைகளை நாங்கள் ஆயத்தப்படுத்தி இருக்கின்றோம்.

அதற்கு அப்பால், தனியார் துறையால் நடத்தப்படுகின்ற முறைசாரா கல்வி முறையுடனான முன்பள்ளிகளை அபிவிருத்தி செய்வதற்காக குறிப்பாக, அவற்றை பௌதிக

වසතිකළිලුම් පාඨත්තිට්ඨත්තිලුම් සමමාන නිලෙක්කුක් කොණ්ඩුවරුකින්ර වේලෙත්තිට්ඨත්තුක්කාක, පොදුතික අපිවිරුත්තියෙ ඒර්පඩුත්තික්කොළ්වතර්කු නාංකළ් තිරෙසේරියුඩන් පේච්සුවාර්ත්තෙ නඨත්ති ඉරුක්කිරෝම්. අතාවතු, කුරෙන්ත වට්ටි වීතත්තුඩනාන කඩන් වසතියෙ වළංකි, මුන්පළ්ළිකළුක්කුත් තේවෙයාන තළපාඩංකළෙප් පෙර්රුක්කොළ්වතර්කුම් මලසලකූඩ වසතිකළෙ ඒර්පඩුත්තික් කොළ්වතර්කුම් නාංකළ් නඩවඩික්කෙ එඩුත්තිරුක්කින්රෝම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) M.L.A.M. Hizbullah, if you have a second Supplementary Question, please ask.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

கிழக்கு மாகாணத்தில் இருக்கின்ற எல்லா பாலர் பாடசாலைகளுக்கும் அல்ல, மாகாண சபையின் நிதி நிலைமைக்கேற்ப தெரிவு செய்யப்பட்ட சில பாலர் பாடசாலைகளிலுள்ள ஆசிரியர்களுக்கே இந்த 6,000 ரூபாய் மாதாந்தக் கொடுப்பனவு வழங்கப்படுகின்றது. சில பாலர் பாடசாலைகளில் ஆறு ஆசிரியர்கள் இருந்தால், அவர்களில் ஒருவருக்கு அல்லது இரண்டு பேருக்குத்தான் அந்தக் கொடுப்பனவு வழங்கப்படுகின்றது. இது பொதுவானதொரு பிரச்சினையாகும். இதற்குக் காரணம் மாகாண சபையில் நிலவும் நிதிப் பற்றாக்குறை ஆகும். நான் யாரையும் குறை சொல்லவில்லை. குறிப்பாக, அந்த 6,000 ரூபாய் கொடுப்பனவைப் பெறாத கிராமங்களிலுள்ள முன்பள்ளி ஆசிரியர்களுக்கு, பெற்றோர்களால் வழங்கப்படுகின்ற 2,000 - 3,000 ரூபாய்தான் வழங்கப்படுகின்றது. இந்தத் தொகை மாத்திரமல்ல, 6,000 ரூபாயும் போதாது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் உங்களுடைய பதவிக் காலத்தில் முன்பள்ளி ஆசிரியர்களுக்கென குறிப்பிட்டதொரு தொகையை salaryஆக fix பண்ண வேண்டும். மாகாண சபையால் கொடுக்கக்கூடியதை கொடுத்துவிட்டு, மிகுதியை நீங்கள் சொன்னதுபோல உங்களுடைய அமைச்சின்மூலம் வழங்குவதற்கு ஏற்பாடு செய்ய வேண்டும். தற்பொழுது, இச்சபையில் கௌரவ நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் அவர்கள் இருக்கிறார். நீங்கள் அவருடன் கலந்துரையாடி, நிதி ஒதுக்கீட்டைப் பெற்று, எல்லா பாலர் பாடசாலை ஆசிரியர்களுக்கும் குறிப்பிட்டதொரு தொகையைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු සරෝජා සාවිත්‍රි පෞල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
கௌரவ உறுப்பினர் அவர்களே, நான் அந்த முன்மொழிவை ஏற்றுக்கொள்ளத் தயாராக இருக்கிறேன். நாங்கள் ஏற்கனவே இது பற்றி பேச்சுவார்த்தை நடத்தியிருக்கிறோம். அடிப்படைத் தகைமைகளைப் பூர்த்திசெய்துள்ள அனைத்து முன்பள்ளி ஆசிரியர்களுக்கும் 6,000 ரூபாய் கொடுப்பனவு கொடுக்கப்பட வேண்டும் என்பதை நாங்கள் ஏற்கனவே ஒரு தீர்மானமாக எடுத்திருக்கிறோம். இப்போது, இந்தக் கொடுப்பனவு கிடைக்கப்பெறாத அவ்வாறான முன்பள்ளி ஆசிரியர்கள் இருந்தால், எங்களுக்கு அறியத் தாருங்கள்! அதற்கேற்ப நாங்கள் நடவடிக்கைகளை மேற்கொள்ளலாம் என்பதை இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். அடுத்தது, தற்போது கொடுக்கப்படுகின்ற இந்தக் கொடுப்பனவை சம்பளமாக மாற்றுவதற்கு நாங்கள் முழு முயற்சிகளையும் எடுத்து வருகின்றோம். ஏனென்றால், இது ஒரு நிரந்தரக் கொடுப்பனவு அல்ல; அவர்களுக்கு ஓய்வூதியம் கிடைக்கப் பெறுவதும் கிடையாது. ஆகவே, அவர்களுக்குரிய ஓய்வூதியத் திட்டம், அவர்களுடைய தொழில் பாதுகாப்பு என்பன தொடர்பில் நாங்கள் நடவடிக்கைகளை மேற்கொண்டு வருகிறோம். நன்றி.

BIMSTEC තරුණ සමුළුව නියෝජනය කළ ශ්‍රී ලාංකික කණ්ඩායම: විස්තර
BIMSTEC இளைஞர் மாநாட்டில் இலங்கையைப் பிரதிநிதித்துவப்படுத்திய குழு: விபரம்
SRI LANKAN DELEGATION TO BIMSTEC YOUTH SUMMIT: DETAILS

920/2025

5. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2025 පෙබරවාරි මාසයේ ඉන්දියාවේ පැවැති 'බිම්ස්ටෙක් තරුණ සමුළුව' සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) එම සාමාජිකයන්ගේ නම් සහ තනතුරු කවරේද;

(iii) සමුළුව පැවැති කාල සීමාව කොපමණද;

(iv) එම කණ්ඩායම ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සහ නැවත පැමිණි දිනයන් කවරේද;

(v) මෙම සමුළුව පැවැත්වීමේ අරමුණු කවරේද;

(vi) එම සමුළුව සඳහා සහභාගි වූ ශ්‍රී ලාංකික කණ්ඩායම වෙනුවෙන් රජය විසින් වැය කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(vii) එම මුදල වැය වූ ආකාරය විස්තරාත්මකව සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025 பெப்ருவரி மாதம் இந்தியாவில் நடைபெற்ற "பிம்ஸ்டெக் இளைஞர் மாநாடு" நிமித்தம் இலங்கையைப் பிரதிநிதித்துவப்படுத்தி பங்கேற்ற குழுவில் இடம்பெற்ற அங்கத்தவர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவ்வங்கத்தவர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(iii) மாநாடு நடைபெற்ற கால எல்லை யாது என்பதையும்;

(iv) மேற்படி குழு, இலங்கையிலிருந்து புறப்பட்டுச் சென்ற மற்றும் மீண்டும் நாடு திரும்பிய திகதிகள் யாவை என்பதையும்;

(v) மேற்படி மாநாடு நடத்தப்படுவதன் நோக்கங்கள் யாவை என்பதையும்;

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

(vi) அந்த மாநாட்டில் பங்கேற்ற இலங்கையின் குழுவுக்காக அரசாங்கத்தால் செலவிடப்பட்ட மொத்த நிதித் தொகை யாது என்பதையும்;

(vii) அத்தொகை செலவான விதத்தை விரிவாகக் குறிப்பிட முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House the -

(i) number of members in the delegation that represented Sri Lanka and participated in the BIMSTEC Youth Summit held in India in February, 2025;

(ii) names and designations of the said members;

(iii) duration for which the summit was held;

(iv) dates on which the said delegation departed from Sri Lanka and returned;

(v) objectives of holding this summit;

(vi) total amount of money spent by the Government on behalf of the Sri Lankan delegation that participated in the said summit; and

(vii) breakdown of the said expenditure in detail?

(b) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 10කි.

(ii) 1. ගරු එරංග ගුණසේකර මැතිතුමා - තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය

2. ගරු ලසිත් භාෂණ හත්කොටුව ගමගේ මැතිතුමා - පාර්ලිමේන්තු මන්ත්‍රී

3. ගරු ඩී.එම්. තනුර හර්ෂණ දිසානායක මැතිතුමා - පාර්ලිමේන්තු මන්ත්‍රී

4. එම්.එස්.එච්. සිල්වා මෙනෙවිය - තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්

5. එම්.ඩබ්ලිව්. සසිත ප්‍රියංකර මහතා - ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්

6. ආර්.එම්.එම්.එස්. රත්නායක නිලමේ මහතා, කළමනාකරණ සේවා නිලධාරී, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

7. ජී.කේ.එල්. චතුරංගි මෙනෙවිය - කළමනාකාර සහකාර, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

8. අයි.ජී.ඩී. දසුන් චන්ද්‍රසිරි මහතා - කළමනාකරණ සහකාර, ජනාධිපති කාර්යාලය

9. එස්. රෙකබාකෙර් මහතා - සහකාර තරුණ සේවා නිලධාරී, ජාතික තරුණ සේවා සභාව

10. රන්දිකා සුසුන් කුමාරි මහත්මිය - සංවර්ධන නිලධාරී, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

(iii) 2026.02.07 දින සිට 2026.02.11 දින දක්වා

(iv) සමුළුව සඳහා පිටත්ව ගිය දිනය - 2026.02.07

නැවත පැමිණි දිනය - 2026.02.11

(v)
- Youth as a Bridge for Intra-BIMSTEC Exchange
- Building Digital Public Infrastructure for Shared Prosperity
- Operational Frameworks for Intra-Regional Tourism, Including the BIMSTEC Buddhist and Cruise Circuits

අංක COL/HC/05/2024 හා 2025.01.07 දිනැති ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයෙන් නිකුත් කර ඇති ලිපිය ඇමුණුම ලෙස ඉදිරිපත් කරමි. ඇමුණුම **සභාගත*** කරනවා.

(vi) එම සමුළුව සඳහා සහභාගි වූ ශ්‍රී ලාංකික කණ්ඩායම සඳහා පහත පරිදි තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අනියම් දීමනා ලෙස රු.342,376.80ක මුදලක් ගෙවීම් කර ඇත.

1. ගරු එරංග ගුණසේකර මැතිතුමා - රු. 49,090.40
තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය

2. ගරු ලසිත් භාෂණ හත්කොටුව ගමගේ මැතිතුමා - රු. 49,090.40
පාර්ලිමේන්තු මන්ත්‍රී

3. ගරු ඩී.එම්. තනුර හර්ෂණ දිසානායක මැතිතුමා - රු. 49,090.40
පාර්ලිමේන්තු මන්ත්‍රී

4. එම්.එස්.එච්. සිල්වා මෙනෙවිය - රු. 49, 090.40
තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්

5. ආර්.එම්.එම්.එස්. රත්නායක නිලමේ මහතා - රු. 48,462.40
කළමනාකරණ සේවා නිලධාරී, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

6. ජී.කේ.එල්. චතුරංගි මෙනෙවිය - රු. 48,462.40
කළමනාකරණ සහකාර, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

7. රන්දිකා සුපුන් කුමාරි මහත්මිය
- රු. 49,090.40

සංවර්ධන නිලධාරි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

(vii) (අ) (vi)හි පිළිතුරම අදාළ වේ.

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, you may ask your first Supplementary Question.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නා පරිදි ඒ BIMSTEC සමුළුව තරුණ සමුළුවක්. ඒ තරුණ සමුළුවට යවන්න ඕනෑ, තරුණ සේවා සභාවේ ඉන්න - පහළ ඉන්න - තරුණ සහෝදර සහෝදරියන්. ඇත්ත වශයෙන්ම ඒ සමුළුවට ගිහිල්ලා හිටියේ තරුණ සහෝදර සහෝදරියන්. ලෝකයේ අනෙකුත් රටවලින් ඇවිල්ලා හිටපු අයගේ නම් ටිකත් ඔබතුමාට ඕනෑ නම් මම දෙන්නම්. ඒ රටවල මන්ත්‍රීවරු, ඇමතිවරු ඇවිල්ලා හිටියේ නැහැ. එහෙම ඇවිල්ලා හිටියා නම්, එක්කෙනෙක් එහෙම නැත්නම් දෙන්නෙක්. අපේ රට නියෝජනය කරන්න නියෝජ්‍ය ඇමතිතුමා සහ මන්ත්‍රීතුමන්ලා දෙදෙනා හැරුණාම ගිහින් තිබෙන්නේ, තරුණ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකාර සේවා නිලධාරි ඇතුළු පිරිසක්. මේගොල්ලෝ ඇමතිතුමාගේ personal staff එකේ අය. මම දන්නේ නැහැ, තමුන්නාන්සේලා වෙනසකට නේ ආවේ. පුනරුදයක් හදන්න කියලා නේ ආවේ. ඉතිහාසයේ ඔය දේවල් සිදු වුණු නිසා තමයි ජනතාව ඒවා එපා කියලා කිව්වේ. ලංකාවේ එක තරුණයෙකුවත් මේ තරුණ සමුළුවට අරගෙන ගියේ නැහැ. අරගෙන ගියේ ජනතා විමුක්ති පෙරමුණේ සහ ජාතික ජන බලවේගයේ වැඩ කරපු අය.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වයසක කට්ටිය.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, තරුණ අය තමයි. හැබැයි, ඒ තරුණයෝ පක්ෂයේ අය. ඒ අය වීනයට වාගේ අරගෙන ගිහිල්ලා වෙන මොකක් හරි කර ගන්න පුළුවන් නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කියපු කට්ටිය තමයි ගිහිල්ලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට දොස් කියන්නේ නැහැ. මොකද, ඔබතුමා නොවෙයි ඔය කාරණය භාරව හිටියේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ, උදේ පාන්දර කෑගහන්නේ නැතිව. ඇත්තටම ඒක භාරව සිටියේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමා. මම ඒකට ඔබතුමාට දොස් කියන්නේ නැහැ. හැබැයි, ඇමතිතුමා විධියට ඔබතුමාත් යම් වගකීමක් ගන්න ඕනෑ. අද වනකොට ලංකාවේ තරුණ කටයුතු අමාත්‍යාංශයේ, එහෙම නැත්නම් තරුණ සේවා නිලධාරීන්ගේ තත්ත්වය බලන්න. අද මහරගම තිබෙන තරුණ සේවා මධ්‍යස්ථානයේ පන්ති පහ කරනවා. එහි පන්ති පහ කරනවා. සභා අධ්‍යක්ෂ, මහේෂ් අඹේපිටිය තමයි පන්ති පහ කරන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොඳයි නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි ද? හොඳයි නම් ඒක ඔයගොල්ලන්ගේ පක්ෂයේ කර ගන්න. ඒක පැලවත්තේ කර ගන්න. *[බාධා කිරීමක්]* තරුණ සේවා සභාවේ පන්ති පහ කරන්න බැහැ. *[බාධා කිරීමක්]* JVP එකේ කටයුතු කරගන්න පැලවත්ත පක්ෂ කාර්යාලයට ගිහිල්ලා. *[බාධා කිරීමක්]* ඒවා ගැන ආපහු කථාත් කරනවා, ලජ්ජා නැතිව. අනේ, ඔබතුමා ඉඳගන්න. *[බාධා කිරීමක්]* හරක් හොරකම් කරපු එක්කෙනෙක් ඉන්නවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කවුද කියලා එක්කෙනෙක්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒක හින්දා කරුණාකරලා,- *[බාධා කිරීමක්]* අහගන්න හදන්න එපා, අපෙන්. අප ළඟත් දැන් එක එක බඩු තිබෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මනුස්සයෙක් හිටියා. එයාද කොහේද ඇවිත් ඉඳගෙන ඉන්නවා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමා මේ ගැන හොයලා බලන්න.

ඒත් එක්කම මම තවත් කාරණයක් කියන්න කැමැතියි. කවදාවත් ඒ සභා අධ්‍යක්ෂවරු ඇවිල්ලා ඒ සභාව ඇතුළේ meetingවල ඉඳගත්තේ නැහැ. සභාපතිතුමා ඇතුළු අනෙකුත් පිරිස තමයි ඒක ක්‍රියාත්මක කළේ. නමුත් ඒක දැන් එතැනට තල්ලු වෙලායි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා යම් ගරුත්වයක් තිබෙන කෙනෙකු විධියට කරුණාකරලා මේ ගැන හොයලා බලන්න. තරුණ සේවා සභාව අද සම්පූර්ණයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ශාඛා සමිතියක් වෙලා තිබෙන්නේ. පැලවත්තට එහා ගිහිල්ලා ඒකේ දේශපාලනය කරනවා. තරුණ සේවා සභාව හදපු UNP ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ලාවත්, වෙනත් පක්ෂයක්වත් ඉතිහාසයේ කවදාවත් දේශපාලනය ගෙන ආවේ නැහැ, තරුණ සේවා සභාවට. *[බාධා කිරීම්]* හැබැයි, අද ඒක සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, please pose your first Supplementary Question.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මේ ගිය කණ්ඩායමේ තරුණ සේවා සභාවේ එක තරුණ නිලධාරියෙකුගේ හෝ පහළින් ආපු එක තරුණ සහෝදරයෙකුගේ හෝ සහෝදරියකගේ නමක් තිබෙනවා නම් කරුණාකර මට කියන්න කියලා මා ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(*மாண்புமிகு சுனில் குமார கமகே*)
(The Hon. Sunil Kumara Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, BIMSTEC සමුළුවට ආරාධනාව එවන්නේ ඉන්දියානු රජයෙන් High Commission එක හරහා. ඒ ලියුම මා ළඟ තිබෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරය මේකේ තිබෙනවා. මේකේ දෙවැනි paragraph එක ඔබතුමා හරියට කියවන්න. It states, "You are kindly requested to select ten youth delegates in the age group of 25-35 years (preferably 05 male and 05 female) representing Sri Lanka from various walks of life,…" මේකේ අන්තිමට සඳහන් කර තිබෙනවා, "…It is suggested that the Deputy Minister of Youth Affairs & Sports H.E. Mr. Eranga Gunasekara may be nominated as Head of the Delegation." එතකොට එරංග ගුණසේකර Head of Delegation විධියට යවන්නේ ඉන්දියානු රජයෙන් ඉල්ලා එවපු නිසා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(*மாண்புமிகு சுனில் குமார கமகே*)
(The Hon. Sunil Kumara Gamage)

එහෙම නැතිව අපේ අවශ්‍යතාවකට එරංග ගුණසේකර රට යවන්න ඕනෑ හින්දා යවනවා නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මගේ පැහැදිලි කිරීම අහගන්න. එරංග ගුණසේකර මැතිතුමා යන්නේ ඒ නිසායි.

දෙවෙනි එක තමයි, මේ සියලුදෙනා ඒ age category එකේ ඉන්න තරුණ අය. ඔයගොල්ලන් ඉස්සර තරුණ සමුළුවලට යවපු අවුරුදු 59, 60 වයස්වල අය මේ කණ්ඩායමේ නැහැ. ඕනෑ නම් ඒ නම් කියන්න මට පුළුවන්. ඔබතුමා දන්නවා ඒ කාලයේ තරුණ සමුළුවට යවපු තරුණයා කවුද කියලා. මම ඒ නම කියන්න නැහැ. අරගළය වෙලාවේ අර බිම වැටි වැටී ගියේ. ඒ අයත් තරුණ සමුළුවලට ගියා.

මම කියන්නම් මේ ගිය කණ්ඩායම ගැන. ඔබතුමා දැන් ආණ්ඩුවට චෝදනා කළා නේ. මේ කණ්ඩායමේ ඉන්නේ අපේ officeවල වැඩ කරන තරුණ අය. ඒ අයත් මේ රටේ තරුණයෝ. පක්ෂයේ අය කවුරුවත් මෙතැන නැහැ. ඔබතුමා බලන්න, අමාත්‍යාංශයේ සහ තරුණ සේවා සභාවේ අය තමයි මෙතැන ඉන්නේ.

ඊට අමතරව, රට යන්න අවස්ථාවක් ලැබුණාම රාජ්‍ය සේවයේ ඉන්න අයට අපි අවස්ථාව දෙනවා. ඉස්සර වාගේ දැන් පක්ෂයේ අය සහ ඥාතීන් - නැන්දාගේ පුතාලා - එකතු කරලා අපි යවන්නේ නැහැ. මේ කණ්ඩායමේ ඉන්න ඔක්කොම අපේ රාජ්‍යයේ සේවය කරන සේවකයෝ. ඒ අදාළ වයස් category එකේ අය. ඒ අයත් මේ රටේ තරුණයෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, you may pose your second Supplementary Question.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මම කනගාටු වෙනවා, ඔබතුමාගේ උත්තරය ගැන. මමත් තරුණ සේවා සභාවේ හොඳට වැඩ කරපු කෙනෙක්, අපේ ගම්වල. ඒ කාලයේ තිබුණා, යෞවන සමාජ දිස්ත්‍රික් බලමණ්ඩල, ප්‍රාදේශීය බලමණ්ඩල ආදිය. ඒවායෙන් තෝරා ගත්තු තරුණයන් තමයි අපි ඒවාට යැව්වේ. ඉතිහාසයේත් යැව්වේ එහෙම තමයි. ඊට පිටින් එක්කෙනෙක්, දෙන්නෙක් යවන්න ඇති. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒකට යවන්න තෝරා ගන්නේ මේ අමාත්‍යාංශයේ ඉන්න තරුණයෝ. අර කියපු පෞද්ගලික ලේකම් තරුණයෙක් තමයි. හැබැයි අප අහන්නේ තරුණ සේවා සභාව නියෝජනය කරන ගම්වල ඉන්න -පහළින් ඉන්න - අහිංසක තරුණ තරුණියන් කෝ කියලායි. කෝ, ඒ මනුස්සයන්ට අවස්ථාවක්; කොහේද ඉඩක්? දක්ෂයෝ නොවෙයි නේ, මේ. නමුත් අපි තෝරාගන්න ඕනෑ දක්ෂයන්. ගරු ඇමතිතුමනි, මේ කාරණය වහගන්න ඔබතුමාට ඔය කථාව කියන්න පුළුවන්. නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් තරුණයි. ඒක හින්දා ඔහු ඒ සමුළුවට යවනවා. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් තරුණයි. ඒක හින්දා ඔහුත් යවනවා. කලින් කිව්වා වාගේ තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් තරුණයි. ඒක හින්දා ඔහු යවනවා. අපි කියන්නේ ඒක නොවෙයි. මේ තරුණ සමුළුවට යවන්න ඕනෑ, තරුණ තරුණියෝ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු දෙන්නෙක් තුන්දෙනෙකුත් යැව්වාට කමක් නැහැ. මම ඒකට මොකුත් කිව්වේ නැහැ. නියෝජ්‍ය ඇමති එරංග ගුණසේකර ඒකට යැව්වාට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒකේ එතුමාගේ නම තිබෙනවා මම දැක්කා. එතුමා යැව්වාට ප්‍රශ්නයක් නැහැ. නමුත් තරුණයි කියලා ඔබතුමන්ලාගේ පක්ෂයේ කට්ටියයි, පැලවත්තෙන් නම් කරන කට්ටියයි ඒකට යවලා හරියන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. නව බඳවා ගැනීම් හැටියට සහකාර තරුණ සේවා නිලධාරීන් 76දෙනෙකු බඳවාගත්තා. 50,000ක් ඒ විභාගයට ලිව්වා. ඒ අය අතරින් තමයි මේ කියපු අය තෝරා ගත්තේ. ඒ අයට ලකුණු දුන්නේ කවුද? මහේෂ් අඹේපිටිය මහත්මයා, ජ්‍යෙෂ්ඨ තරුණ සේවා නිලධාරි මහේෂ් සෙනෙවිරත්න මහත්මයා සහ චමින්ද මහත්මයා තමයි ඒ අයට ලකුණු දුන්නේ. ලකුණු දුන්නේ පැන්සලෙන්. ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමා ඒක අරගෙන බලන්න. පැන්සලෙන් ලකුණු කරපු ඒවා අරන් ගිහිල්ලා ලකුණු වෙනස් කරලා තමයි මේ කියන 76දෙනා තෝරාගත්තේ. මේ 76දෙනාගෙන් අතිබහුතරයක් ජනතා විමුක්ති පෙරමුණෙන් නම් යෝජනා කරපු කට්ටිය. මා ළඟ තිබෙනවා, ලැයිස්තු පිටින්. ඕනෑ නම් මට කියන්න පුළුවන්.

තමුන්නාන්සේලා තරුණ සේවා සභාවට අලුතින් නිලධාරීන් බඳවා ගන්න වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ තරුණ සේවා සංවිධානයේ - YSO - කට්ටිය තමයි දැන් ඒකට යොදවා තිබෙන්නේ. ඒ අය හරහා තමයි ගන්න හදන්නේ. ඒ නිසා කරුණාකරලා තරුණ සේවා සභාව දේශපාලනීකරණය කරන්න ලෑස්ති වෙන්න එපා කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ. ඔය විනාශය කළාම ඔබතුමන්ලාටත් අනාගතයේදී එහි විපාකය විඳින්න සිද්ධ වේවි. ඒ නිසා- *[බාධා කිරීමක්]* ඇයි මොකද? මහත්මයා, ඇයි මොකද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, raise your Supplementary Question.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගලප්පත්ති මහත්මයා, මොකක්ද තත්ත්වය? ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද? *[බාධා කිරීම්]* ඔබතුමා ඉන්නකෝ පාඩුවේ. වයසක මනුස්සයෙක් නේ. ඔබතුමාට ඇමතිකමක් දුන්නේත් නැහැ නේ. ඔබතුමා 1994 ඉඳන් ඔය පක්ෂයට දහලලාත් මොකුත් වුණේ නැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Stop the cross-talk, Hon. Members. Hon. Dayasiri Jayasekara, you may pose your Supplementary Question. I think the Hon. Minister is ready to answer that.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කථා කරන්න දෙන්න කියන්නකෝ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පොඩ්ඩක් ඉන්නකෝ. *[බාධා කිරීමක්]* ඉඳගන්නකෝ, ඔබතුමා. මම නේ ප්‍රශ්නය අහන්නේ. *[බාධා කිරීමක්]* ඕකද, ඔබතුමන්ලා හදනවා කියපු සංස්කෘතිය? *[බාධා කිරීමක්]* බාධා කරන්නේ ඇයි, උදේ ප්‍රශ්නයක් අහනකොට? බාධා කරන්නේ ඇයි? මේ පාර්ලිමේන්තුව තිබුණු තත්ත්වයෙන් හොඳ තැනකට ගේන්න නේද, ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ආවේ? *[බාධා කිරීම්]* අහගෙන ඉන්න පොඩ්ඩක්. රිදෙනවා තමයි. වැරැදි කළාම රිදෙනවා. නමුත්, අහගෙන ඉන්න. ගරු ඇමතිතුමනි, මට මීට වඩා අහන්න දෙයක් නැහැ. ගලප්පත්ති මහත්මයා මළ කරදරයක් නේ, කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, raise your Question, please.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම අවසාන වශයෙන් අහන්න කැමැතියි, ජාතික තරුණ සේවා සභාව දේශපාලනීකරණය කරන එක නතර කරන්නේ කවදාද කියලා. තමුන්නාන්සේලා ඉවර වුණාම ද නතර කරන්නේ කියලා මම අහන්න කැමතියි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික තරුණ සේවා සභාව දේශපාලනීකරණය කරලා නැහැ. ඒක නිසා ඒක නවත්වන දිනයකුත් නැහැ. ඒක තමයි පිළිතුර.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය: තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය

கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு: தகவலுக்கான உரிமைச் சட்டத்தின்கீழ் தகவல்களை வழங்கும் வழிமுறை

MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION: METHODOLOGY FOR PROVIDING INFORMATION UNDER RTI ACT

1157/2025

6. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍යාංශය වෙත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාරගත් බව අදාළ ඉල්ලුම්කරුට ලිඛිතව හෝ වෙනත් ක්‍රමයකින් දැනුම්දීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) ඉල්ලා සිටින තොරතුරු එම පනතින් නියම කර ඇති කාල සීමාව තුළ ලබා දීමට පියවර ගෙන තිබේද;

(iii) ඉල්ලා සිටින තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ලබා දෙන තොරතුරු සඳහා ගාස්තුවක් අය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගාස්තු අය කිරීමේ පදනම හා ක්‍රමවේදය කවරේද;

(iii) එම ගාස්තු ගෙවිය යුතු අවස්ථාව කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சுக்கு தகவலுக்கான உரிமைச் சட்டத்தின்கீழ் சமர்ப்பிக்கப்படும் கோரிக்கைகள் கிடைக்கப்பெற்றமை தொடர்பில், சம்பந்தப்பட்ட விண்ணப்பதாரருக்கு எழுத்துமூலமாக அல்லது வேறேதேனும் வழியில் அறிவிக்கும் நடைமுறையொன்று காணப்படுகின்றதா என்பதையும்;

(ii) கோரப்படும் தகவல்களை மேற்படி சட்டத்தால் குறித்துரைக்கப்பட்ட காலப்பகுதிக்குள் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) கோரப்படும் தகவல்கள் வழங்கப்படுவதை நிராகரிக்கக்கூடிய சந்தர்ப்பங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வழங்கப்படும் தகவல்களுக்காக கட்டணமெதுவும் அறவிடப்படுகின்றதா என்பதையும்;

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

(ii) ஆமெனில், மேற்படி கட்டண அறவீட்டின் அடிப்படை மற்றும் நடைமுறை யாது என்பதையும்;

(iii) மேற்படி கட்டணங்கள் செலுத்தப்பட வேண்டிய சந்தர்ப்பம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether there is a methodology to notify the relevant applicant in writing or by any other means to acknowledge receipt of requests submitted to the Ministry under the Right to Information Act;

(ii) whether steps have been taken to provide the requested information within the time frame stipulated by the said Act; and

(iii) the circumstances under which the provision of requested information can be refused?

(b) Will she also inform this House -

(i) whether a fee is charged for the information provided;

(ii) if so, the basis and methodology of levying such fees; and

(iii) the stage at which such fees should be paid?

(c) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) හැකි සෑම අවස්ථාවකදීම අදාළ කාල සීමාව තුළ සිදු කරයි.

(iii) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 වගන්තිය අනුව කටයුතු කිරීම මඟින්.

(ආ) (i) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව ගාස්තු අය කර තොරතුරු මුදා හැරිය යුතු අවස්ථාවලදී පමණක් ගාස්තු අය කිරීමක් සිදු කරයි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අති විශේෂ අංක 2004/66 - 2017.02.03 (1 වැනි කොටස : (1) වැනි ඡේදය-සාමාන්‍ය) - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා රීති 2017හි කරුණු අංක 4 (තොරතුරු සඳහා ගාස්තු) අනුව.

ක්‍රමවේදය - අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණ හෝ ඕනෑම තැපැල් කාර්යාලයක් හරහා රජයේ ගිණුමට මුදල් බැර කිරීමෙන් පසු.

(iii) ශාඛා / අංශ තොරතුරු ලද පසු එම තොරතුරු ඉල්ලුම්කරුවන් වෙත ලබා දීමට සූදානම් කර අදාළ ආකෘති පත්‍රය (RTI 04) හරහා ගෙවිය යුතු මුදල පිළිබඳව දැනුවත් කිරීමෙන් පසු.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Mrs.) Rohini Kumari Wijerathna, raise your first Supplementary Question and make it brief. We are far behind time.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයට උසාවිය පාර, මාවනැල්ල යන ලිපිනයෙහි පදිංචි නීතිඥ විශ්වනාත් වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරපු තොරතුරක් පිළිබඳව මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් අහන්න කැමැතියි. එතුමා 2026.03.27වැනි දා ලිපියකින් නීත්‍යානුකූලව ඉල්ලා සිටිනවා, 2025.01.01වැනි දින වන විට ලංකාවේ සේවය කරන IIIවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරු ගණන සහ IIවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ගණනත්, IIIවැනි ශ්‍රේණියේ සිට IIවැනි ශ්‍රේණියට යාමට රැඳී සිටින, වර්ෂ 8 ඉක්ම වූ අයත් කොපමණ ද කියන එක. ඒ වාගේම IIවන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට යාමට රැඳී සිටින, වර්ෂ 8ක් ඉක්ම වූ අය ගැනත් අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඒකද ඔබතුමිය අහන අතුරු ප්‍රශ්නය?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඔව්. පොඩ්ඩක් ඉන්න, වෙච්ච දේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, make it short, please.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

එතකොට එතුමාට, තොරතුරු නිලධාරි, අතිරේක ලේකම් (පාලන), වසන්ත ගුණරත්න මහතා 2026.04.10වැනි දින උත්තරයක් යවනවා, 2026.03.27වැනි දින තොරතුරු ඉල්ලීම ලැබුණා කියලා. ඊට පස්සේ RTI තොරතුරු මධ්‍යස්ථාන භාර අධ්‍යක්ෂ ප්‍රසාද් වීරසිරි මහතා, එම ඉල්ලීමට අදාළ තොරතුරු ටික

අහලා මහරගම ජාතික අධ්‍යාපන ආයතනයට - NIE එකට - ලිපියක් යවනවා. ඊට පස්සේ නීතිඥතුමාට 2026.06.30වැනි දින උත්තරයක් හම්බ වෙනවා, "ඔබ විසින් 2026.03.16 දිනැතිව එවන ලද හා 2026.03.27 දින අප වෙත එවන ලද RTI 1 පත්‍රිකාව සම්බන්ධයෙනි. එමඟින් ඉල්ලා සිටින තොරතුරු අප භාරයේ සන්තකයේ හෝ පාලනයේ නොමැති බව කාරුණිකව දැනුම් දෙමි" කියලා. ඒක ඇහුවේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් නොවෙයි නේ. ඉන්න විදුහල්පතිවරු ගණන කීයද කියලා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නේ ඇහුවේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ අපේ රටේ ඉන්න ගුරුවරු ගැන, විදුහල්පතිවරු ගැන සංඛ්‍යාලේඛන නැද්ද කියලා. මම මේ ලිපි ටික **සභාගත*** කරනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිතුරක් සපයන්නම්. ගරු මන්ත්‍රීතුමියනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පොදු කාරණාව ගත්තොත්, මුලින්ම දින 14ක් ඇතුළත අදාළ කාරණාව සම්බන්ධයෙන් ප්‍රතිචාර හෝ තොරතුරු දැන්විය යුතුයි. එහෙම නැත්නම් දින 21ක කාලයක් ලබා ගන්න පුළුවන්. ඒක අඛණ්ඩ දින 21ක්. ඒ දින 21ක ඇතුළතදීත් සෑහීමකට පත් වෙන්න බැරි නම්, ප්‍රමාද වෙනවා නම්, ඒ සම්බන්ධයෙන් අභියාචනයක් කරන්න පුළුවන්. ඊට පස්සේ තවත් දින 21ක් ලැබෙනවා, නම් කරන නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට. නම් කරන නිලධාරියා වන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා. එතැනදීත් සෑහීමකට පත්වෙන්න බැරි නම්, මාස 3ක් ඇතුළත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට යන්න පුළුවන්. එතැනදී Commission එකෙන් යම් නිර්දේශයක් හෝ order එකක් ලැබෙනවා නම්, ඒ සියලු orders ක්‍රියාත්මක කර තිබෙන්නේ අමාත්‍යාංශය. මට ඒක වගකීමෙන් කියන්න පුළුවන්. මම මේ කියන්නේ, පොදු ක්‍රමවේදය ඇතුළත සිදුවෙන දේ. තෘප්තිමත් වන්නේ නැති යම්කිසි කාරණයක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පොදු ක්‍රියාවලිය අමාත්‍යාංශය තුළ නිශ්චිතව ක්‍රියාත්මක වන බවට අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්. මම මේ කටයුත්ත ගැන කථා කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Make it brief, Hon. Deputy Minister, or you may table the document.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

දැන් මෙන්න මෙහෙම කාරණාවක් තිබෙනවා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5වන වගන්තිය යටතේ, තොරතුරුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරන අවස්ථා දක්වා තිබෙනවා. පුද්ගලික තොරතුරු, රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධ තොරතුරු, විනිමය අනුප්‍රමාණ හෝ විදේශ භූවමාරු ගනුදෙනු පිළිබඳ තොරතුරු දෙන්න බැහැ. ඒ වාගේම සමහර තොරතුරු හොයා ගන්න, යම් කිසි ස්වාභාවික කාලයක් යනවා නම් ඒ බව දැනුම් දෙනවා. දැන් ඔබතුමිය සඳහන් කළ තොරතුරු හොයා ගන්න ගත කරන කාලය සම්බන්ධයෙන් දැනුවත් කර තිබෙනවා, අදාළ පාර්ශ්ව. ඒ තොරතුරු සම්බන්ධයෙන් වග කියන සහ තොරතුරු සම්බන්ධයෙන් පරිපාලනය තිබෙන තැනින් තමයි උත්තර සපයන්නේ. ඒ නිසා මම කියන්නේ, පොදු ක්‍රියාවලිය ඇතුළත ඔබතුමියගේ මේ නිශ්චිත කාරණාව සම්බන්ධයෙන් අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, අධිකරණ කටයුත්තක් දක්වා යාමට හැකියාව තිබෙනවා; කොමිෂන් සභාව ඒ වැඩේ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may ask the second Supplementary Question, if there is one.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

පළමුවැනි අතුරු ප්‍රශ්නය ගැන මම විනාඩියක් අරගෙන කියන්නම්. මම ඇහුවේ ක්‍රමවේදය ගැන නොවෙයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Move on to your second Supplementary Question, Hon. Member.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මම ඇහුවේ ක්‍රමවේදය ගැන නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතැන ගැටලුවක් තිබෙනවා. "මේ තොරතුරු අප සන්තකයේ නැත" කියලා තමයි පිළිතුර ලෙස එවා තිබෙන්නේ. එතකොට අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න විදුහල්පතිවරු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නැත්නම්, වෙන කොහෙන්වත් ඒක අහලා වැඩක් නැහැ. අන්න එතැන අඩුපාඩුවක් තිබෙනවා කියන එකයි මම කියන්නේ. නඩු යනවාද, ආයෙත් සැරයක් ඉල්ලනවාද කියන එක නොවෙයි කාරණය, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. විදුහල්පතිවරු ගැන තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ නැහැ කියලා තමයි එවා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ගුරුවරුන් බඳවා ගැනීමට මේ රටේ පෙරේදා විභාගයක් තිබුණු බව. මම හිතන විධියට, ඒකට උපාධිධාරීන් 150,000කට වඩා පෙනී සිටියා. ඒ අතර පාසල් සංවර්ධන නිලධාරිනුත් හිටියා. මම හිතන විධියට, ඉන් සමත් වෙලා තිබෙන්නේ 74,000කට ආසන්න සංඛ්‍යාවක්. පාසල් සංවර්ධන නිලධාරීන් අවුරුදු 7ක් ගුරුවරු ලෙස සේවය කළා. ඒ වාගේම කොවිඩ් වසංගතය කාලයේ, ආර්ථික අර්බුදය කාලයේ ඒ අය මේ රටේ දරුවන් වෙනුවෙන් සහ රජය වෙනුවෙන් ගුරු වැටුප නැතුව සේවය කළා. දැන් 17,000ක ලැයිස්තුවක් ඔබතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙනවා. එදා මම Subcommittee

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

on Educational Reformsහිදීත් ඇහුවාම කිව්වා, ඒ 17,000න් ඔබතුමන්ලා 11,000ක්ද කොහේද ගන්නවා, ඉතිරි ටික ආයෙත් සැරයක් ගෙන්වනවා කියලා. මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. දැන් අර ඉස්සර වෙලා කිව්ව ක්‍රමවේදය ඇතුළේ, පාසල් සංවර්ධන නිලධාරීන් ඇවිල්ලා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලුවොත්, අර 13,000න් සමත් වෙච්ච ප්‍රමාණය නම් වශයෙන් දෙන්න කියලා, ඔබතුමන්ලා ළඟ තොරතුරු තිබෙනවාද? මොකද, මම Google form එකක් යැව්වා. ඒකට 1,048දෙනෙක් ප්‍රතිචාර දක්වා තිබුණා.

ඒකෙන් 48යි සමත් වෙලා තිබෙන්නේ. අඩුම තරමින් ඒ අයට තමන් සමත්ද, නැද්ද කියලා හරි දැනගන්න අයිතිවාසිකමක් තිබෙනවා. ඔබතුමාට හැකියාව තිබෙනවාද, ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න? *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ තිබෙන්නේ මෙන්න මෙහෙම කාරණාවක්. විභාගය පවත්වපු ක්‍රමවේදය තුළ අපට සංකීර්ණතා ගොඩකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඔබතුමියත් ඒ පිළිබඳව දන්නවා. මේ වෙද්දි 17,000ක් කැඳවන්නේම ඒ ගණනය කිරීම සහ දෙගුණයක් කැඳවිය යුතු නිසායි. ඔබතුමිය දන්නවාද, විෂයයන් 42ක් තිබෙනවා, එක්කෙනෙක්වත් සමත් නැති. තව විෂයයන් 124ක පුරප්පාඩු සංඛ්‍යාව පුරවන්න අවශ්‍ය තරම් පිරිස නැහැ. ඒ නිසා තමයි 17,000ක් කැඳවන්නේ. මෙහි සංකීර්ණතාවක් තිබෙනවා. එක්කෙනෙකුට විෂයයන් 8ක් ඉල්ලන්න පුළුවන්. ඊළඟට, පළාත් විධියට වෙන් වනවා, සීමිත සහ විවෘත විධියට වෙන් වනවා. 2023දී අපි සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් තිබෙන ප්‍රතිපාදන මත ගත් තීන්දුවක් තිබෙනවා. ඒකත්, නඩු තීන්දුවත් මත තමයි මේ කටයුතු කරගෙන යන්නේ.

මෙතැන සංකීර්ණතාවක් තිබෙනවා. මේක මේ වෙලාවේදී කොච්චර සංකීර්ණයිද කිව්වොත්, මේ 17,000 නැවත වට කිහිපයක් කැඳවිය යුතුද කියලා තීරණය වෙන්නේම ඉල්ලුම්කරුවන්ගේ සම්මුඛ පරීක්ෂණ මත.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, make it brief.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඒ නිසා අපට ඒ සම්බන්ධයෙන් කියන්න බැහැ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Do not get into a debate. You may finish it off, Hon. Deputy Minister.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ලබා දෙන්නේ ප්‍රස්තුත කාරණයට අදාළව සහ මේ මොහොතට අදාළවයි. උදාහරණයක් විධියට ගත්තොත්, විභාග තත්ත්වයක් තිබෙනවා නම් මේ මොහොතට අදාළව තමයි උත්තර දෙන්නේ, පෙර දාතම ඇතිව උත්තර දෙන්න බැහැ. පවතින තත්ත්වය බලා තමයි ඒක කරන්නේ. ඔබතුමිය දන්නවා, පසුගිය කාලවල දේශපාලන බලපෑම් මත, නොයෙක් සම්බන්ධකම් මත ගුරු සේවාවට බඳවා ගැනීම් කළ බව. අපි එහෙම කරන්නේ නැහැ, අපි බොහොම පාරදෘශ්‍යයි. පුළුවන් නම් අපි සියලු තොරතුරු දෙනවා, මේ මොහොතට අදාළව.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 7 - 1670/2025 - (1), the Hon. Chamara Sampath Dasanayake. - *[Not in the Chamber.]*

Question No. 8 - 1983/2026 - (1), the Hon. Lal Premanath.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන: සංරක්ෂණය
அநுராதபுர மாவட்டத்திலுள்ள தொல்லியல் இடங்கள்: பாதுகாத்தல்
SITES OF ARCHAEOLOGICAL VALUE IN ANURADHAPURA DISTRICT: CONSERVATION

2400/2026

9. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ වන විට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) මෙම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා මෙම වර්ෂයේ වෙන් කර ඇති ප්‍රතිපාදන, එක් එක් ස්ථානය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில் இதுவரை அடையாளம் காணப்பட்டுள்ள தொல்லியல் முக்கியத்துவம் வாய்ந்த இடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி இடங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) இந்த தொல்லியல் முக்கியத்துவம் வாய்ந்த இடங்களைப் பாதுகாப்பதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி இடங்களைப் பாதுகாப்பதற்காக இவ்வாண்டில் ஒதுக்கப்பட்டுள்ள நிதி, ஒவ்வோர் இடத்துக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House the -

(i) number of sites of archaeological value currently identified in the Anuradhapura District;

(ii) names of the said sites;

(iii) measures taken to conserve those archaeological sites; and

(iv) provisions allocated for the conservation of the said sites for this year, separately for each site?

(b) If not, why?

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 846යි.

(ii) ඇමුණුම මඟින් දක්වා ඇත. ස්ථාන 846ක් පිළිබඳව සඳහන් වන නිසා එය දීර්ඝ ලේඛනයක්. එම නිසා ඇමුණුම **සභාගත*** කරනවා.

(iii) මෙම පුරාවිද්‍යා ස්ථානවල ආරක්ෂාව, සංරක්ෂණය සඳහා එක් එක් පුරාවිද්‍යා ස්ථානවල අගයන්, බලපෑම්වල ස්වභාවය, පිහිටි ස්ථානය, නෛතික පසුබිම ආදිය සලකා බලා පහත කටයුතු සිදුකර ඇත.

- ස්ථාන අධීක්ෂණ කටයුතු කිරීම
- මුර කටයුතු
- ආරක්ෂිත වැට, මායිම් කණු යෙදීම
- නීතිමය කටයුතු සිදු කිරීම
- ගවේෂණ කටයුතු කිරීම
- නඩත්තු කිරීම
- තහවුරු කිරීම
- කැණීම් කිරීම
- සංරක්ෂණය කිරීම

මේවා තමයි පුරාවිද්‍යා විධි නියම අනුව ස්ථානීය පරීක්ෂණයකින් පුරාවිද්‍යාත්මක ස්ථානයක් දැන හඳුනාගත්තාට පස්සේ අනුගමනය කරන ක්‍රියාමාර්ග. මෙම ස්ථාන 846 සම්බන්ධවම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා.

(iv) මෙම ස්ථාන සංරක්ෂණයට, ආරක්ෂාවට 2026 වර්ෂය තුළ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන මෙසේයි.

01	ස්ථානීය පරීක්ෂා කිරීම්	රු. 750,000.00
02	පුරාවිද්‍යා රක්ෂිත ගැසට් කිරීම	රු. 436,010.00
03	ගල්ළිඳ යාය පොකුණ සංරක්ෂණය	රු. 1,599,300.00
04	වෙස්සගිරිය දාගැබ සංරක්ෂණය	රු. 5,293,545.00
05	අලුත් දිවුල්වැව සිතුවම් සංරක්ෂණය	රු. 85,000.00
06	පුරාවස්තු සංරක්ෂණය	රු. 125,000.00
07	ගල්නෑව විහාරයේ සිතුවම් සංරක්ෂණය	රු. 70,000.00
08	කැකිරාව අම්බලම භාණි මර්දනය	රු. 22,000.00
09	රන්මසු උයන ශිලා නිර්මාණ සංරක්ෂණය	රු. 7,000.00
10	පදවිය නඩත්තු කටයුතු	රු. 100,000.00
11	මිහින්තලය ගිරිහණ්ඩ දාගැබ ප්‍රතිසංස්කරණය	රු. 88,898.00
12	කාලි කෝවිල තහවුරු කිරීම	රු. 67,641.00
13	ඇලගමුව පැරණි අම්බලම ආරක්ෂිත වැට	රු. 160,000.00
14	මයුර පිරිවෙන තහවුරුව	රු. 74,694.00
15	විජයබාහු මාළිගය නඩත්තු කටයුතු	රු. 177,000.00
16	ඇතුල්නුවර දළදා මාළිගාව තහවුරු කිරීම	රු. 30,444.00
17	රන්මසු උයන තහවුරු කිරීම	රු. 739,789.00
18	කිරලාගල ආරක්ෂිත වැට සැකසීම	රු. 467,218.00
19	තන්තිරිමලය විත්‍ර ලෙන ආරක්ෂිත වැට	රු. 81,537.00
20	මානාකන්ද, රිටිගල මායිම් කණු යෙදීම	රු. 1,071,964.00
21	උපුල්වෙහෙර නඩත්තු කටයුතු	රු. 1,161,894.00

2026 වර්ෂය තුළ බාහිර ප්‍රතිපාදන යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන මෙසේය.

01	අනුරාධපුර, මිහින්තලය නඩත්තු කිරීම (CCF ප්‍රතිපාදන)	රු. 4,995,000.00
02	දෙමටගල දාගැබ කැණීම	රු. 454,850.00

(ආ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, පසුගිය දවස්වල අනුරාධපුරයේ පෞරාණික වටිනාකමකින් යුත් මේ ස්ථාන සම්බන්ධයෙන් විශාල සාකච්ඡාවක්, සංවාදයක් ඇති වුණු බව. විශේෂයෙන්ම අවුරුද්දකට විතර කලින් ගහපු වැටවල් සම්බන්ධයෙන් සමහරු කථා කරන්න ගත්තා. ඒ වාගේම රුවන්වැලි සෑය ගිල්ලනවා වාගේ කථාත් සමහරු කියන්න පටන්ගත්තා. හැබැයි, මම හිතන විධියට ඒක නොවෙයි ඇත්ත කථාව. ගරු ඇමතිතුමනි, මේ පිළිතුර දෙස බලනකොටත් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් මෙම ස්ථාන, පෞරාණික වටිනාකමකින් යුත් මෙම ස්ථාන ආරක්ෂා කිරීම වෙනුවෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය විශාල ක්‍රියාමාර්ග ප්‍රමාණයක් ගෙන තිබෙනවා කියා අපට දැනගන්නට ලැබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන්, විශේෂයෙන්ම අනුරාධපුර ඇතුළුනුවර මේ පූජා භූමි සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය මේ වනකොට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද කියා දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය විමසීම ගැන එක අතකට මම සතුටු වනවා. මොකද, පසුගිය දිනවල මේ සම්බන්ධව ඇති කර තිබුණු කලබලයට, සැකයට පිළිතුරු දීමට අවස්ථාව ලැබෙන එකත් වැදගත් දෙයක්. සාවද්‍ය කරුණු, නොමඟ යවන කරුණු තමයි ඔබතුමා මතක් කරපු සම්මුඛ සාකච්ඡා, ප්‍රවෘත්ති අර්ථ කථනවල දකින්නට ලැබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප සියලුදෙනා දන්නවා, අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල, සීගිරිය වැනි අපේ ඓතිහාසික ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල වාගේ ආයතන විසින් දශක ගණනාවක් තිස්සේ විධිමත්ව සංරක්ෂණය කරගෙන එන බව. ඒවා කාලයක් තිස්සේ විධිමත්ව කරගෙන ආපු රාජකාරි, වගකීම්. මේ විරෝධතාවලදී භාවිත වන වචන මොනවාද කියා බැලුවා නම් එය ප්‍රමාණවත් වනවා, මෙහි අරමුණ හොයාගන්න. වැටවල් ගහන එක, මල් ආසන ගලවා ඉවත් කරනවා කියන එක, රුවන්වැලි මහා සෑය ගිල්වනවා කියන ඒවා ඉතාම සාවද්‍ය, සාහසික ප්‍රකාශ. පසුගිය දවස්වල ගරු ජනාධිපතිතුමා අනුරාධපුරයට ගිහිල්ලා කරපු නිරීක්ෂණත් එක්ක අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ඉතාම සංවිධිත වැඩ පිළිවෙළක් මේ සම්බන්ධව ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් විමසන්නේත් මේ වැඩ පිළිවෙළ කොයි වාගේද කියලායි. මම කැමැතියි, දැනට ඒ සම්බන්ධව කෙටි පිළිතුරක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ප්‍රධාන ප්‍රවේශ 5කින් තමයි මේ වැඩ පිළිවෙළ ඉෂ්ට කරන්න බලාපොරොත්තු වන්නේ. මම ඒක විස්තර කරන්න යන්නේ නැහැ. පුරාවිද්‍යා උරුමය, ලෝක උරුම වගකීම්, පුරාණ වාරි සංස්කෘතිය, ජීවමාන බෞද්ධ සම්ප්‍රදායයන්, උරුමය පදනම් කරගත් සංවර්ධනය කියන ප්‍රවේශ පහ ඇතුළේ තමයි මේ ශුද්ධ භූමිය, පූජා නගරය, ඉතාම අමිල සම්පත් සම්භාරය ආරක්ෂා කරන්න බලාපොරොත්තු වන්නේ. මේ වන විට මේ කටයුත්ත සඳහා ජනාධිපති උපදේශක සභාවක් පවා පත් කරලා තිබෙනවා. පසුගිය දිනවල අප අමාත්‍යාංශයට සියලු පාර්ශ්ව කැඳවා, "අනුරාධපුර පූජා නගර ඒකාබද්ධ සංරක්ෂණ" වැඩසටහන සකස් කර ගන්න අපට පුළුවන් වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඉතාම විස්තෘත වැඩසටහනක්. ඒ අනුව තමයි අපි මේ කටයුතු කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම පුරවිද්‍යා වටිනාකමකින් යුත් ස්ථාන ආරක්ෂා කර ගනිමින් අපේ රටේ සංවර්ධන කටයුතු කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. අපි ඒ සංවර්ධන කටයුතු කරගෙන යනකොට ඒ අනුමැතීන් ලබා ගැනීම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාගේම මේ අමාත්‍යාංශයේ දායකත්වය අවශ්‍ය වනවා. මොකද, අපට ඒ සම්බන්ධයෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වනවා. අමාත්‍යාංශය විධියට වාගේම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විධියට ඒ සඳහා අනුමැතීන් ලබා දීම වෙනුවෙන් හදලා තිබෙන ක්‍රමවේදය මොකක්ද කියන එක මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍යාංශය මේ සම්බන්ධව පැහැදිලි රාශියකින් මැදිහත් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඉන් එකක් තමයි මා කලින් සඳහන් කරපු, අනුරාධපුර පූජා නගර ඒකාබද්ධ සංරක්ෂණ වැඩසටහන. ඒකට අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන කිහිපයක් වාගේම අපේ අමාත්‍යාංශයෙන් පිට වෙනත් රේඛීය අමාත්‍යාංශ ගණනාවකට අයත් වන ආයතන මැදිහත් වෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල ඍජුවම අපේ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ තිබෙන්නේ. අනෙක් ආයතන වන්නේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, අනුරාධපුර මහ නගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ විශේෂයෙන්ම යුනෙස්කෝ ආයතනයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුරය කියන්නේ අපේ රටේ තිබෙන, ජගත් උරුම භූමි අටෙන් එකක්. අනුරාධපුරය තමයි ඒ අතුරින් ප්‍රථම ස්ථානයේ තිබෙන්නේ. ඒ වාගේම අනුරාධපුරය තමයි අපේ ප්‍රථම අගනගරය. ඒ වාගේම එය මිල නියම කළ නොහැකි අතිවිශාල උරුමයක් රැස් වෙලා තිබෙන, අපේ බෞද්ධ සම්ප්‍රදායයන්වල සංස්කෘතික මූලයන් තිබෙන තැන. ගරු මන්ත්‍රීතුමනි, අප සූදානම් කරගෙන තිබෙනවා, මේ ඒකාබද්ධ සංරක්ෂණ වැඩසටහන ශීර්ෂ 74ක් යටතේ අනුරාධපුර පූජා නගර ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම හැටියට කරන්න. තව නුදුරු දිනකදී අපි අපේක්ෂා කරනවා, ජනාධිපති උපදේශක සභාව රැස් කරගෙන මේ ඒකාබද්ධ උරුම සංරක්ෂණ වැඩසටහන ඔවුන්ට ඉදිරිපත් කරන්න. ඒ අනුව තමයි ඔබ විමසන පුරාවිද්‍යා නිෂ්කාසන, අවසර ගැනීම්, ගැසට් ප්‍රකාශන ආදී සියල්ල තිබෙන්නේ. ජනාධිපති උපදේශක සභාව රුවන්වැලිසෑ චෛත්‍යාරාමාධිකාරී අතිපූජ්‍ය ඊතලවැටුනුවැවේ ඤාණතිලක ස්වාමීන් වහන්සේගේ වාගේම ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහත්මයාගේ සමසභාපතිත්වයෙන් තිබෙන්නේ. ඒ වාගේම ථූපාරාමය,

අභයගිරිය ආදී සිද්ධස්ථානවල විහාරාධිකාරී ස්වාමීන් වහන්සේලා මුල්තැන තියාගෙන තිස්දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මේ තිබෙන්නේ. ඒ කමිටුවේ අධීක්ෂණයෙන් ඉදිරියේදී ඉතාම වේගවත්ව සහ සංවිධිත විධියට අනුරාධපුර උරුම සංරක්ෂණය සිදු වන බව ඔබතුමාට මම දැනුම් දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 10 - 2516/2026 - (1), the Hon. S.M. Marikkar. - *[Not in the Chamber.]*

Second Round.

2020 වර්ෂයේ සිට දුම්රියේ ගැටී මිය ගිය අලි ඇතුන්: විස්තර
2020 முதல் புகையிரதங்களில் மோதி உயிரிழந்த யானைகளும் கொம்பன் யானைகளும்: விபரம்
ELEPHANTS AND TUSKERS KILLED AFTER COLLISION WITH TRAINS SINCE 2020: DETAILS

202/2024

1. ගරු ජේ.සී. අලවතුවල මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. J.C. Alawathuwala on behalf of the Hon. Nalin Bandara Jayamaha)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා දුම්රියේ ගැටී මිය ගිය අලි ඇතුන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු සිදු වූ ස්ථාන කවරේද;

(iii) දුම්රියේ ගැටී අලි ඇතුන් මිය යෑම වැළැක්වීම සඳහා නිරසර විසඳුමක් ලබා දීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இதுவரை புகையிரதங்களில் மோதி உயிரிழந்த யானைகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வெறாக யாது என்பதையும்;

(ii) மேற்படி விபத்துகள் இடம்பெற்ற இடங்கள் யாவை என்பதையும்;

(iii) புகையிரதங்களில் மோதி யானைகளும் கொம்பன் யானைகளும் உயிரிழப்பதைத் தடுப்பதற்கான நிரந்தரத் தீர்வொன்றை வழங்குவதற்காக மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of elephants and tuskers which had been killed after collision with trains from 2020 to date, for each year separately;

(ii) the locations where such accidents had occurred; and

(iii) the measures that have been taken to provide a sustainable solution to prevent elephants and tuskers from being killed in collision with trains?

(b) If not, why?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

වර්ෂය	මිය ගිය අලි ඇතුන් සංඛ්‍යාව
2020	03
2021	06
2022	14
2023	24
2024	11
2025	21
2026.10.12 දක්වා	02

(ii) ඇමුණුම** මඟින් දක්වා ඇත.

(iii) ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ නැඟෙනහිර දුම්රිය මාර්ගයේ දෙපස හොඳින් දර්ශනය වන හා වඩා හොඳින් වේගය පාලනය කළ හැකි දියුණු දුම්රිය කවටල හඳුන්වා දීම.
- ගල්ඔය හන්දියේ සිට හිඟුරක්ගොඩ හා ගල්ඔය හන්දියේ සිට කන්තලේ දෙසට සම්පූර්ණයෙන් අලි මාරු වන දුම්රිය මාර්ගය කිලෝමීටර් 27ක් හඳුනා ගෙන ඇති අතර, එම ස්ථානවල ගල් අතුරා වනඅලින්ට පහසුවෙන් ගමන් කිරීමට හැකි වන පරිදි දුම්රිය මාර්ගයේ සිල්පර අතර හිස්තැන් පිරියන පරිදි කොන්ක්‍රීට් ගල් කියුබ් 800ක් අතුරා අවසන් කිරීම.
- දුම්රිය මාර්ගයේ සමහර ස්ථානවල හා වංගු සහිත ස්ථානවල වනඅලින් දුම්රිය රියදුරන්ට නොපෙනෙන බැවින් එම ස්ථානවල මීටර් 10 සිට 20 දක්වා යටි පඳුරු ඉවත් කිරීම. මේ යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කිලෝමීටර 20ක් සුද්ද පවිත්‍ර කර ඇත.
- අඩි 2x2 නාම පුවරු 100ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී හඳුනා ගත් ස්ථානවල සවි කිරීම.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

- ගල්ඔය සිට හිඟුරක්ගොඩ දෙසට ඇති 143,144 3/4 සැතපුම් කණුව කළු ගල් කැපුමේ ඇති සියලු ශාක ඉවත් කිරීම හා එම කළු ගල් මතුපිට රාත්‍රී කාලයේ අලි ඇතුන් දර්ශනය වන ලෙස ජල ප්‍රතිරෝධක - water resistant - සුදු තීන්ත ආලේප කිරීම.
- දුම්රිය දෙපාර්තමේන්තුවේ රියදුරන්, දුම්රිය ස්ථානාධිපති, දුම්රිය මාර්ග හාරව කටයුතු කරන ඉංජිනේරුවරුන් හා දුම්රියේ රියදුරු සහායක නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2025.05.16 හා 17 යන දිනයන්හි සිදු කරන ලදී.
- හබරණ දුම්රිය ස්ථානය පසුකර කන්තලේ දෙසට ගමන් කිරීමේදී හමු වන වනසංරක්ෂණ රක්ෂිතය තුළ දුම්රිය මාර්ගයෙන් සැලකිය යුතු දුරින් ඔබ්බට ජලය සපයා ගැනීමට හැකියාවක් ඇති වැව් දෙකක් ඉදිකිරීම හා සුපෝෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 25.4ක ප්‍රතිපාදන චාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. මේ සඳහා යොදවා ඇති කණ්ඩායම් 3ක් විසින් අදාළ මිනුම් කටයුතු සිදු කරන බව පොළොන්නරුව චාරිමාර්ග කලාප අධ්‍යක්ෂ විසින් දැනුම් දී ඇත. වැව් 7ක මූලික මිනුම් කටයුතු සඳහා රුපියල් 4,009,500.00ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා චාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත මෙම ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මෙම වර්ෂයේදී ලබා දී ඇත.
- දුම්රිය මාර්ග හරහා වනඇලින් ගමන් කිරීමේදී දුම්රියේ ගැටී මිය ගිය ස්ථාන හා දුම්රිය හරහා ගමන් කරන ස්ථාන පිළිබඳව දුම්රිය රියදුරන් දැනුවත් කිරීම සඳහා දුම්රිය මාර්ගයේ එම ස්ථානවල සිල්පර කඳන් ලුමිනස් වර්ණයෙන් යුත් තීන්ත ආලේප කිරීම.
- මනම්පිටිය දුම්රිය මාර්ගය හරහා යටි මාර්ගවල ඇති ගස් ඉවත් කිරීම යටතේ හඳුනා ගත් ස්ථාන 9ක වර්ග මීටර් 8,500ක යටිරෝපණ ඉවත් කිරීම.
- වනඇලි නිරීක්ෂණය සඳහා කැමරා සවි කිරීම

  ගල්ඔය හා මින්නේරිය අතර 141 ස්ථානයේ හා කාසිකොටේ දුම්රිය මාර්ගය හරහා අලි ගමන් කරන ස්ථානය නිරීක්ෂණය සඳහා CCTV cameras සවි කර ඇත. අනුරාධපුර මෙහෙයුම් මැදිරිය මඟින් නිරීක්ෂණ කටයුතු සිදු කරයි.
- මීට අමතරව, 2025.02.20වන දින ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහ ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවෙහි පැවති රැස්වීම මූලාරම්භ කර ගනිමින් මාසිකව පාර්ලිමේන්තුවෙහිදී අදාළ අමාත්‍යාංශ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදු කරන ලද අතර, මෙහිදී වනඇලි දුම්රියේ ගැටීම් හේතුවෙන් වනඇලින්ට සිදු වන හානි අවම කිරීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුමෙහි ප්‍රගතියද තාක්ෂණික විසඳුම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන පරීක්ෂණ හා ඒවාහි ඵලදායීතාව පිළිබඳවද සාකච්ඡා කිරීම් සිදු කරනු ලැබිණි.
- ඒ අනුව, වනඇලි හඳුනා ගැනීම සඳහා thermal detector cameras දුම්රිය මත සවි කිරීමේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරමින් අඛණ්ඩව පරීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ආතර් සී ක්ලාක් පරීක්ෂණ ආයතනය මඟින් සිදු කරනු ලබයි.
- ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, as the Hon. Minister of Ports and Civil Aviation has come, could we take up Question No. 3 - 477/2025? I am sure he is equipped to answer that.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Earlier the Hon. Upali Pannilage asked for time to answer that Question. *[Interruption.]*

Question No. 7 - 1670/2025 - (1), the Hon. Chamara Sampath Dasanayake.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ අනවසර සහ ඔප්පු නොමැති නිවාස: වන්දි

'திட்வா' அனர்த்தத்தால் பாதிக்கப்பட்ட சட்டவிரோத மற்றும் உறுதிகள் இல்லாத வீடுகள்: இழப்பீடு

UNAUTHORIZED HOUSES AND HOUSES WITHOUT DEEDS DAMAGED BY CYCLONE "DITWAH": COMPENSATION

2516/2026

10. ගරු ජේ.සී. අලවතුවල මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. J.C. Alawathuwala on behalf of the Hon. S.M. Marikkar)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂයේ 'දිට්වා' ආපදා තත්ත්වයේදී ඔප්පු නොමැතිකම නිසා හෝ අනවසර පදිංචිය හේතුවෙන් නිවාස හානි වන්දි නොලැබුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එහිදී අනවසර නිවාස සහ ඔප්පු නොමැති නිවාස ලෙස සලකා බැලූ නිර්ණායක කවරේද;

(iii) ආපදාවෙන් පසු නිවාස පිරිසිදු කර ගැනීමේ කටයුතු සඳහා රුපියල් 25,000ක් සහ පදිංචියට යාමට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා රුපියල් 50,000ක් ලබා දී ඇතත්, අනවසර නිවාස පදනම හා ඔප්පු නැති පදනම මත හානි වූ නිවාස සඳහා මෙම වන්දි ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 504A බැලගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හංසගම ජන උදාන ගම්මානයේ නිවාස 52 අනවසර නිවාස ලෙස හඳුනාගෙන තිබේද;

(ii) එම නිවාස 52 අතරින් නිවාස හානි වන්දි ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ලබා නොදුන් නිවාස සඳහා වන්දි ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පාදුකාප්පු අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) 2025ආම් ආණ්ඩිල් 'තිත්වා' අනර්ත්ත නිලෙමෙයින්පෝදු කාණි උරුතිකළ් ඉල්ලාත කාරණත්තාල් අල්ලදු චට්ටවිරෝතමාකක් කුඩියිරුන්තමෙයාල් සේතමඩෙන්ත වීටුකළුක්කාන ඉළප්පීටුකළ් කිඩෙක්කප්පෙරාතවර්කළින් එණ්ණික්කෙ යාදු එන්පතෙයුම්;

(ii) ඉතිල් චට්ටවිරෝත වීටුකළ් මර්රුම් උරුතිකළ් ඉල්ලාත වීටුකළ් එන්පතෙක් කණ්ටරිවතර්කාක පයන්පටුත්තප්පට්ට අළවුකෝල්කළ් යාවෙ එන්පතෙයුම්;

(iii) අනර්ත්තත්තින් පින්නර් වීටුකළෙච් චුත්තම් සෙය්යුම් පණිකළුක්කාක 25,000 රූපාය් මර්රුම් කුඩියේරුවතර්කුත් තේවෙයාන අත්තියාවසියප් පොරුට්කළෙක් කොළ්වනවු සෙය්වතර්කාක 50,000 රූපාය් වළංකප්පට්ටපෝතිලුම්, චට්ටවිරෝත වීටුකළ් මර්රුම් උරුතිකළ් ඉල්ලාත වීටුකළ් එනුම් අටිප්පටෙයිල් සේතමඩෙන්ත වීටුකළුක්කු ඉන්ත ඉළප්පීටු වළංකප්පටාමෙක්කු කාරණංකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) කොළන්නාවෙ පිරදේච සෙයලකප් පිරිවින්, 504A ඉලක්කමුටෙය පෙලකම කිරාම සේවෙයාළර් පිරිවිල් අමෙන්තුළ්ළ හුංචකම ජන උදාන කිරාමත්තිලුළ්ළ 52 වීටුකළ් චට්ටවිරෝත වීටුකළාක අටෙයාළම් කාණප්පට්ටුළ්ළනවා එන්පතෙයුම්;

(ii) අන්ත 52 වීටුකළිල් සේතමඩෙන්ත වීටුකළුක්කාන ඉළප්පීටුකළ් වළංකප්පට්ටුළ්ළ වීටුකළින් එණ්ණික්කෙ යාදු එන්පතෙයුම්;

(iii) ඉළප්පීටුකළ් වළංකප්පටාත වීටුකළුක්කු ඉළප්පීටුකළ් වළංකප්පටුවතර්කු නටවටික්කෙ එටුක්කප්පටුමා එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Defence:

(a) Will he inform this House-

(i) the number of persons who did not receive compensation for damages to their houses during the "Ditwah" disaster in 2025 due to the absence of deeds or because they were unauthorized occupants;

(ii) the criteria considered in classifying houses as unauthorized houses or houses without deeds in this regard; and

(iii) although Rs. 25,000 was provided for cleaning houses after the disaster and Rs. 50,000 for purchasing essential items required for resettlement, the reasons for not providing compensation for damaged houses on the basis that they were unauthorized houses or houses without deeds?

(b) Will he also inform this House -

(i) whether the 52 houses in the Hansagama Jana Udana Gammanaya in Grama Niladhari Division No. 504A, Belagama within the Kolonnawa Divisional Secretary's Division have been identified as unauthorized houses;

(ii) the number houses, out of the said 52 houses, which have received the compensation for damaged houses; and

(iii) whether action will be taken to provide compensation to the houses which have not yet received such compensation?

(c) If not, why?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) 'දිට්වා' ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වූ හානි සඳහා වන්දි ලබා දීමේදී, අදාළ දේපළ සම්බන්ධ ඔප්පු නොමැති වීම හෝ අනවසර පදිංචිය වැනි හේතූන් මත ඇතැම් පුද්ගලයන්ගේ වන්දි ඉල්ලීම් ප්‍රතික්ෂේප විය හැකිය.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් යොමු කරනුයේ වන්දි ලබන ප්‍රතිලාභීන්ගේ තොරතුරු පමණක් වන බැවින් ප්‍රතික්ෂේපිත ප්‍රතිලාභීන්ගේ තොරතුරු/ දත්ත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතුව නොමැත.

(ii)
- රජයේ ඉඩමක් නම්, වලංගු නීතිය යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක්, අවසර පත්‍රයක්, දීමනා පත්‍රයක් හෝ බදුකරයක් පවතින ඉඩම්
- රජයේ ඉඩමක් නම්, වලංගු ඔප්පුවක් නොපවතින නමුත් අදාළ රජයේ ඉඩම පරිපාලනය කරනු ලබන ආයතනය විසින් එකඟතාව ලබා දී ඇති ඉඩම්
- පෞද්ගලික ඉඩමක් නම්, සින්නක්කර ඔප්පු සහිත ඉඩම්

යන නිර්ණායක මත මෙම වර්ගීකරණයට අයත් නොවන ඉඩම් ඉදිරියේදී නියමානුකූල කිරීමේ හැකියාවක් නොමැති විට ප්‍රාදේශීය ආපදා සහන සේවා කමිටුව විසින් එම ඉඩම් අනවසර සහ ඔප්පු නොමැති නිවාස ලෙස හඳුනා ගන්නා ලදි.

(iii) ආපදා සහන සේවා මාර්ගෝපදේශ 09/2026හි 05 හා 06 අනුව,

05. හදිසි ආපදා තත්ත්වය පහව යාමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට තම නිවස හෝ නව තාවකාලික නවාතැන නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව,-

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

06. ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු, අත්‍යවශ්‍ය ගෘහ උපකරණ ආදිය මිලට ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා සංයුක්ත නිවාස ඒකකයකට රුපියල් 50,000 බැගින් දීමනාවක් ලබා දිය යුතුය.

ඉහත එක් වරක් පමණක් ගෙවන රුපියල් 25,000 හා රුපියල් 50,000ක් වන දීමනා විපතට පත් පුද්ගලයින් කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා පිරිසිදු කිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ලබා දුන් අතර එහිදී නිවසේ අයිතිය නොසලකා මෙම දීමනා ලබා දීම සිදු කරයි.

නමුත්, නිවාස හානි වන්දි ලබා දීමේදී හානියට පත් නිවාස හා දේපළ යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් ලබා දෙන අතර, අනවසර හෝ රක්ෂිත භූමි සඳහා රජයේ වන්දි ලබා දීම මඟින් එම පුද්ගලයින්ගේ නීත්‍යානුකූල නොවන ඉදිකිරීම්වලට නෛතික වලංගුතාවක් හිමි වේ. එබැවින්, නියමානුකූල කළ නොහැකි අනවසර හෝ රක්ෂිත පදිංචිකරුවන් සඳහා වන්දි ලබා දීමට හැකියාවක් නොමැත.

(ආ) (i) 504ඒ බැලගම ග්‍රාම නිලධාරි වාර්තාව අනුව වන්දි ලබා ගැනීමට අයදුම්පත ඉදිරිපත් කර ඇති නිවාස 51ක තොරතුරු පමණක් යොමු කර ඇත.

එම ග්‍රාම නිලධාරි වාර්තාවට අනුව නිවාස 29ක් සඳහා පහත හේතූන් මත ගෙවීම් සිදු කර නොමැත. සවිස්තර වාර්තාව ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

- කුලියට දී ඇති නිවාස සංඛ්‍යාව - 03
- අනවසර නියමානුකූල කිරීමට අදාළ තක්සේරු මුදල ගෙවීම පැහැර හැරීම නිසා ප්‍රතික්ෂේප වූ නිවාස - 09
- අනවසර නියමානුකූල කිරීමට අදාළ තොරතුරු මාස 06ට වඩා ප්‍රමාද වී ලබා දීම නිසා ප්‍රතික්ෂේප වූ නිවාස - 14
- ප්‍රාදේශීය කමිටුව වෙත යොමු කර ඇති ඉල්ලීම් - 01
- අදාළ ලිපිනයේ වෙනත් අයෙකුගේ නමින් වන්දි ගෙවා ඇති නිවාස - 02

(ii) නිවාස 22ක් සඳහා මේ වනවිට වන්දි මුදල් ගෙවා ඇත. සවිස්තර වාර්තාව ඇමුණුම 02 මඟින් පහත දක්වා ඇත.

(iii) චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ප්‍රකාරව හා ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ආපදා සහන සේවා කමිටු තීරණවලට යටත්ව ගෙවීම් කළ "දිට්වා" ආපදාව හේතුවෙන් නිවාස හානි වූ 504ඒ බැලගම ග්‍රාම නිලධාරි වසමේ හංසගම ගම්මානයේ පවුල් 29කට නිවාස හානි වන්දි ලබා දීම ප්‍රතික්ෂේප වී ඇත. ඔවුන් අනවසර පදිංචිකරුවන් ලෙස සැලකීමට හේතු පහත පරිදි වේ.

දිට්වා ආපදා නිවාස හානි වන්දි ලබා දීම - හංසගම ගම්මානය,බැලගම ග්‍රාම නිලධාරී වසම
මේ වන විට නිවාස හානි වන්දි ගෙවීම් සිදු කර තිබෙන සහ ගෙවීමට නියමිත ප්‍රතිලාභී නාම ලේඛනය හා ගෙවීමට හේතු

01	504 ඒ බැලගම	කේ.එල්.ආර්.ඩී.සෙනෙවි රත්න	238/ඒ/48,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
02	504 ඒ බැලගම	ආර්.එම්.නොයෙල් ලලිත්	238/ඒ/34,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත(එම්.ඩී.ඩී.ප්‍රියන්තිකා කුමාරි)
03	504 ඒ බැලගම	කේ.එල්.සමන්තිකා	238/ඒ/12,හංසගම,කැළණිමුල්ල	ගොණුවේ අඩුපාඩු සකසා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
04	504 ඒ බැලගම	ඩී.පී.ලින්ටන් ඩයස්	238/ඒ/44,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
05	504 ඒ බැලගම	එම්.මාලනී	238/ඒ/17,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදලින් කොටසක් ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
06	504 ඒ බැලගම	රේණුකා මානගේ	238/ඒ/21,හංසගම,කැළණිමුල්ල	ගොණුවේ අඩුපාඩු සකසා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
07	504 ඒ බැලගම	රංජනී මුහන්දිරම්	238/ඒ/43,හංසගම,කැළණිමුල්ල	ඉඩම් කොමසාරිස් වෙත යොමු කිරීම සඳහා ගොණුවේ අඩුපාඩු සකස් කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
08	504 ඒ බැලගම	එම්.ඩී.තිලකලතා	238/ඒ/40,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
09	504 ඒ බැලගම	ඕ.ඩ.සුමිත් ජානක	238/ඒ/38,හංසගම,කැළණිමුල්ල	තක්සේරු මුදල කොටස් වශයෙන් ගෙවමින් පවතින බැවින් වන්දි මුදල ගෙවා ඇත
10	504 ඒ බැලගම	ඩ.එල්.රූපවතී	238/ඒ/32,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
11	504 ඒ බැලගම	සින්නයියා පෙරුමාල්	238/ඒ/18,හංසගම,කැළණිමුල්ල	ගොණුවේ අඩුපාඩු සකසා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
12	504 ඒ බැලගම	වේලු මගන්දේවන්	238/ඒ/19,හංසගම,කැළණිමුල්ල	තක්සේරු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
13	504 ඒ බැලගම	පී.ඒ.සුනිල්	238/ඒ/50,හංසගම,කැළණිමුල්ල	රණවිරු පදනමින් නිදහස් දීමනා පත්‍රයක් ලබා දම සඳහා මේ වන විට ජනාධිපති කාර්යාලයේ ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
14	504 ඒ බැලගම	එස්.එන්.අබේසිංහ	2838/ඒ/42,හංසගම,කැළණිමුල්ල	තක්සේරු මුදල කොටස් වශයෙන් ගෙවමින් පවතින බැවින් වන්දි මුදල ගෙවා ඇත
15	504 ඒ බැලගම	ආර්.බී.සුනීතා	238/ඒ/36,හංසගම,කැළණිමුල්ල	තක්සේරු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
16	504 ඒ බැලගම	ජේ.කුසුමාවතී	238/ඒ/31,හංසගම,කැළණිමුල්ල	තක්සේරු මුදල කොටස් වශයෙන් ගෙවමින් පවතින බැවින් වන්දි මුදල ගෙවා ඇත
17	504 ඒ බැලගම	ආරියදාස	238/ඒ/41,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
18	504 ඒ බැලගම	එච්.ඥානවතී පෙරේරා	238/ඒ/39,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
19	504 ඒ බැලගම	විමලසේන ඒකනායක	238/ඒ/28,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදලින් කොටසක් ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
20	504 ඒ බැලගම	එච්.එම්.එෆ්.අයිෂා	238/ඒ/26,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදලින් කොටසක් ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
21	504 ඒ බැලගම	තෙඹුවන ආරච්චිගේ ලක්ෂ්මන්	238/ඒ/13,හංසගම,කැළණිමුල්ල	තක්සේරු මුදලින් කොටසක් ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවා ඇත
22	504 ඒ බැලගම	ඒ.කේ.එස්.රංජනී පෙරේරා	238 ඒ /37,හංසගම,කැළණිමුල්ල	සම්පූර්ණ තක්සේරු මුදල ගෙවා ඇති බැවින් වන්දි මුදල ගෙවීමට නියමිතය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- තක්සේරු මුදල් ගෙවීම පැහැර හැරීම

  ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද LB / උපදෙස් පත්‍රිකා/2024 අංක හා 2024.04.25 දිනැති ලිපිය මඟින් ඉඩම් කච්චේරිය පවත්වා අවසන් ගෙවීම් ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමෙන් පසු මාස 06ක් ඇතුළත තක්සේරු මුදල් ගෙවිය යුතු බවට උපදෙස් දී ඇත. නමුත්, කිහිප වරක් දැනුවත් කළද මුදල් නොගෙවීම නිසා ඔවුන් ප්‍රතික්ෂේප වී ඇත.
- ලේඛන ලබා දීම මාස 06කට වඩා ප්‍රමාද වීම

  ඉඩම් කච්චේරිය පැවැත්වූ පසු නියමිත ලේඛන ලබා දීම මාස 06කට වඩා ප්‍රමාද වීම.
- නිවාස 02ක් තිබීම

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Question under Standing Order No. 27(2), the Hon. Sajith Premadasa.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Ravi Karunanayake? I see you on your feet.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, we get the opportunity to ask a Question under Questions for Oral Answers once in two months. My Question was submitted one year ago. The Question 477/2025 has come in the Order Paper, but I am unable to get an Answer. The Hon. Minister is here and he is well-equipped to answer. So, why is it not possible to take up that Question? Today is not a day with urgent Business.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We have passed that stage, Hon. Member.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But then, you have a right to give that opportunity.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. Hon. Minister Anura Karunathilaka, what have you got to say on this?

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම උත්තර දෙන්නම්. හැබැයි, මේක පූර්වාදර්ශයක් නොවේවි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I hope you would not take too long, Hon. Minister. We have to take up both Ministerial Statements and Questions under Standing Order No. 27(2). So, Hon. Minister, you may make it brief, please.

ශ්‍රීලන්කන් ගුවන් සේවය: ගුවන් යානා, කාර්ය මණ්ඩලය සහ අනුබද්ධ සමාගම්
ஸ்ரீலங்கன் விமான சேவை: விமானங்கள், பணியாட்டொகுதி மற்றும் இணை நிறுவனங்கள்
SRILANKAN AIRLINES: AIRCRAFT, STAFF AND SUBSIDIARIES

477/2025

3. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රීලන්කන් ගුවන් සේවය විසින් මෙහෙයවනු ලබන සමස්ත ගුවන් යානා සංචිතයේ ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානා බදු පදනම මත ලබා ගෙන ඇති කොන්දේසි සහ නියමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට එහි සිටින ස්ථිර සහ අනියම් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂ 05 තුළ කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද මුළු වැටුප් සහ දීමනා එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්තමානයේ එක් ගුවන් යානයක් සඳහා සේවයේ යොදවා ඇති කාර්ය මණ්ඩල සංඛ්‍යාව සහ එම අනුපාතය කලාපයේ අනෙකුත් ප්‍රමුඛ පෙළේ ගුවන් සේවා සමාගම් සමඟ සැසඳූ විට කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ශ්‍රීලන්කන් ගුවන් සේවයේ අනුබද්ධ සමාගම් කවරේද;

(ii) එම එක් එක් අනුබද්ධ සමාගම සංස්ථාපනය කරන ලද දින කවරේද;

(iii) එම ආයතන විසින් ඉදිරියට ගෙන එනු ලබන සමුච්චිත ලාභය හෝ අලාභය, එක් එක් අස්ථිත්වය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අනුබද්ධ සමාගම්වල මුළු පිරිවැටුම, දළ ලාභය, ශුද්ධ ලාභය, ආයෝජන ප්‍රතිලාභය, ඍජු බදු සහ ශුද්ධ ශේෂපත්‍ර අගය පසුගිය වර්ෂ 05 සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றுவரை சிறிலங்கன் விமான சேவையால் இயக்கப்படும் மொத்த விமானத் தொகுதியிலுள்ள விமானங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

[ගරු රවී කරුණායක මහතා]

(ii) அத்தகைய விமானங்கள் குத்தகைக்கு எடுக்கப் பட்டுள்ள விதிகள் மற்றும் நிபந்தனைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றுவரை உள்ள நிரந்தர மற்றும் அமைய ஊழியர்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(ii) கடந்த 5 ஆண்டுகளில் ஒவ்வோர் ஆண்டும் ஊழியர்களுக்கு வழங்கப்பட்ட மொத்தச் சம்பளம் மற்றும் ஊதியக் கொடுப்பனவுகளை வெவ்வேறாகவும்;

(iii) தற்போது ஒரு விமானத்துக்கு நியமிக்கப் பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கையையும் மேலும் இப்பிராந்தியத்திலுள்ள ஏனைய முன்னணி விமானச் சேவைகளுடன் இந்த விகிதாசாரத்தின் ஒப்பீட்டையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சிறிலங்கன் விமான சேவையின் துணை நிறுவனங்களையும்;

(ii) அந்தத் துணை நிறுவனங்கள் ஒவ்வொன்றும் கூட்டிணைக்கப்பட்ட திகதிகளையும்;

(iii) ஒவ்வொரு துணை நிறுவனத்தினாலும் முன்கொண்டுவரப்பட்ட மொத்தத் திரட்டிய இலாபம் அல்லது நட்டத்தை வெவ்வேறாகவும்;

(iv) குறித்த துணை நிறுவனங்களின் கடந்த 5 ஆண்டுகளுக்கான மொத்தப் புரள்வு, மொத்த இலாபம், தேறிய இலாபம், முதலீட்டின் மீதான இலாபம், நேரடி வரிகள் மற்றும் தேறிய ஐந்தொகைப் பெறுமதி ஆகியவற்றை வெவ்வேறாகவும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the number of aircraft in the full fleet operated by SriLankan Airlines to date; and

(ii) the terms and conditions under which such aircraft have been leased?

(b) Will he also inform this House -

(i) the number of permanent and casual staff members to date, separately;

(ii) the total salaries and emoluments paid to staff during each of the last five years, separately; and

(iii) the number of staff employed per aircraft at present, and a comparison of this ratio with other leading airlines in the region?

(c) Will he further inform this House -

(i) the subsidiaries of SriLankan Airlines;

(ii) the dates of incorporation of each subsidiary;

(iii) the total accumulated profit or loss carried forward, by each entity, separately; and

(iv) the total turnover, gross profit, net profit, return on investment, direct taxes, and net balance sheet value of the said subsidiaries for the last five years, separately?

(d) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
Sir, the Answer is as follows:

(a) (i)

Narrow Bodied Aircraft (NB)	13
Wide Bodied Aircraft (WB)	10
Total Aircraft	**23**

(ii)

#	Fleet	Type	Registration	Lease Start	Lease Expiry	Rent (USD)
1	NB	A320	4R-ABL	Apr-11	Apr-27	85,000 Note 1
2	NB	A320	4R-MRE	Jan-17	Feb-28	155,000
3	NB	A320	4R-ABM	Jun-11	May-31	235,000
4	NB	A320	4R-ABN	Oct-11	Oct-26	240,000
5	NB	A320	4R-ABO	Nov-11	Nov-26	240,000
6	NB	A320	4R-ANA	Feb-17	Feb-29	367,000
7	NB	A320	4R-ANB	Mar-17	Mar-29	368,000
8	NB	A320	4R-ABS	Nov-23	Nov-29	210,000
9	NB	A320	4R-ABT	Jun-24	Jun-30	210,000
10	NB	A321	4R-ANC	Jun-17	Jun-31	405,000
11	NB	A321	4R-AND	Oct-17	Oct-31	405,000
12	NB	A321	4R-ANE	Dec-17	Nov-29	413,000
13	NB	A321	4R-ANF	Jul-18	Jul-30	435,000
14	WB	A330	4R-ALH	Dec-11	Dec-28	260,000
15	WB	A330	4R-ALS	Jun-17	Jun-27	445,000
16	WB	A330	4R-ALL	Oct-14	Oct-29	893,000 Note 2
17	WB	A330	4R-ALM	Dec-14	Dec-34	800,000 Note 3
18	WB	A330	4R-ALN	Mar-15	Mar-35	800,000 Note 3
19	WB	A330	4R-ALO	Aug-15	Aug-35	800,000 Note 3
20	WB	A330	4R-ALP	Nov-15	Nov-35	800,000 Note 3
21	WB	A330	4R-ALQ	Dec-15	Dec-35	800,000 Note 3
22	WB	A330	4R-ALR	Dec-15	Dec-35	800,000 Note 3
23	WB	A330	4R-ALT	Jun-25	Jun-33	275,000

Note 1: 4R-ABL is on Airframe only rent basis and the airframe is under ownership transfer process.

Note 2: Rent of this aircraft with an original lease period of 12 years was extended by three years at a reduced rental of US Dollars 350,000.

Note 3: 4R-ALM to ALR - Rent of these six aircraft with an original lease period of 12 years were extended until 2034/2035 at a reduced rental of US Dollars 430,000.

(b) (i)

Permanent Staff	5,345
Fixed Term Contract	1,294
Service Provider	783
Total Staff	**7,422**

(ii)

	2025/26	**2024/25**	**2023/24**	**2022/23**	**2021/22**
Total salaries and emoluments (LKR Mn)	30,531	26,979	26,166	21,987	14,735

Company's Financial Year is from April to March.

(iii)

At present	
Staff employed in core airline operations (permanent and fixed term contract)	2,908
Number of aircraft	23
Staff employed per aircraft	**126**

Comparison with other airlines

Airline	**Staff employed per aircraft**	**Source Year**
Emirates	213	FY Apr 25-Mar 26
Qatar Airways	185	FY Apr 25-Mar 26
Singapore Airlines	118	FY Apr 25-Mar 26
Thai Airways	161	FY Jan 25-Dec 25
Cathay Pacific	142	FY Jan 25-Dec 25
SriLankan Airlines	127	FY Apr 25-Mar 26

(c) (i) SriLankan Catering Limited.

(ii) SriLankan Catering Limited - 05th December, 1979.

(iii) LKR Mn 26,543 as per unaudited accounts 31.3.2026.

(iv)

Year	**2025/26 (Unaudited) (LKR Mn)**	**2024/25 (Audited) (LKR Mn)**	**2023/2024 (Audited) (LKR Mn)**	**2022/2023 (Audited) (LKR Mn)**	**2021/2022 (Audited) (LKR Mn)**
Turnover	16,668	14,105	13,971	12,543	3,902
Gross Profit	10,462	8,580	10,600	9,398	2,888
Net Profit	7,696	4,860	4,054	4,697	2,803
Return on Investment	24.56%	20.51%	21.50%	31.77%	26.30%
Direct Taxes - IT	1,169	902	877	683	88
Net Balance Sheet Value (Total Equity)	31,336	23,696	18,853	14,787	10,655

(d) Does not arise.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, I would like to remind you that we deviated from procedure, particularly due to your plea that your Questions come up once a year or whatever, as you said. If you have a Supplementary Question, hit the bull's-eye and that is it; I would not give you much time. So, please, no going around.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I will try to hit the bull's-eye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, please.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, it is not my fault. So, you must be accommodative when we are trying to-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I know, and I deviated from the procedure.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද "Daily Mirror" පත්තරයේ සිරස්තලයේ තිබෙනවා, 2025-2026 වර්ෂයේ පළමු මාස තුන, එනම් අප්‍රේල්, මැයි, ජූනි මාසවල අලාභය රුපියල් කෝටි 3,550යි කියලා. ඊට පසු දෙවන කාර්තුව වන July, August, September මාසවල අලාභය රුපියල් කෝටි 3,900යි කියලා එහි සඳහන් වනවා. මෙවැනි අලාභයක් ඇති වෙලා තිබෙන, තමාගේ ඍණ ප්‍රාග්ධනය බිලියන 351ක් තිබෙන මේ අවස්ථාවේදී කොයි ආකාරයෙන්ද මෙහි ඉදිරි ගමන තිබෙන්නේ කියලා ඔබතුමාට කාරුණිකව කියන්න පුළුවන්ද? මොකද, auditorsලා confirm කර තිබෙනවා, going concern concept එකක් අනුව problem එකක් තිබෙනවා කියලා. 7,000ක් වැඩ කරන තැනක, මේ රටට සංචාරකයන් ගෙනෙන්න තිබෙන අවස්ථාවක ඇමතිතුමාට පුළුවන් වෙයිද අපව දැනුවත් කරන්න,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We will wait for the Hon. Minister's Answer, Hon. Karunanayake. කෙටියෙන්, please.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මම ඉතා කෙටියෙන් ඒ ගැන පැහැදිලි කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇත්තටම SriLankan Airlines එකේ මෑත කාලය ගත්තොත්, අපි පසුගිය මාර්තු වෙනකම් operational profit එකක් අරගෙන ආවා. නමුත් අපි දන්නවා, මාර්තු මාසයේදී මැදපෙරදිග යුද්ධයත් එක්ක විශේෂයෙන් ගුවන්

[ගරු අනුර කරුණාතිලක මහතා]

යානා ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ ගිය බව. ඒකත් එක්ක තමයි operational loss එක අපට ඇවිල්ලා තිබෙන්නේ. ඒ වාගේම overall loss එක එන්නෙත් legacy debt එකත් එක්ක. ඒ නිසා මේ මාර්තුවලින් පසුව තමයි ඔබතුමා ඔය සඳහන් කරන loss එක අපට ඇවිල්ලා තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Operational loss එක ඒ මාස තුනට,-

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
නැහැ, නැහැ, ඒක තමයි මම පැහැදිලි කළේ. පසුගිය පෙබරවාරි, මාර්තු මාස වෙනකල් operational profit එකක් අපි අරගෙන ආවා. නමුත්, ගුවන් යානා ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ යෑමත් එක්ක තමයි මේ loss එක වැඩි වුණේ. ඒ වාගේම legacy debt එකත් එක්ක. ඔබතුමා දැනටමත් දන්නවා, මේ සම්බන්ධයෙන් අපි expert committee එකක් පත් කරලා තිබෙනවා කියලා. ඒ expert committee එකේ අදහසත් එක්ක ශ්‍රීලන්කන් ගුවන් සේවය සඳහා මොන වාගේ ප්‍රතිව්‍යුහගත කිරීමක්ද කරන්න ඕනෑ, ආයෝජන අවස්ථාවලට කැඳවන්නේ කොහොමද කියන එක ගැන අපි තීරණය කරනවා. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Okay, make it very brief, Hon. Member. Again, hit the bull's-eye. I do not want any scrambled eggs here, okay?

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Sir, I do not know what type of a chef you have become today being in that Chair. But, certainly, let us see how the cookery turns out.

ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව මම අහන්නේ ඉතාම වැදගත් කාරණයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා කිව්වා, State-owned enterprisesවල වාණිජකරණයක් කරන්න ඕනෑ කියලා. ඒක නොකිරීම තුළ, මේ කථා කරන හත්වෙනි tranche එක තුළ, මේක reflect කරලා තිබෙනවා, ඇයි මේ සම්බන්ධයෙන් උත්තරයක් දීලාත් නැත්තේ කියලා. ඉතින්, ඔබතුමාගේ ආණ්ඩුව දැන් පිළිගන්නවාද ඒවා වාණිජකරණයට සුදුසුයි කියලා? මොකද, එදා ආවේ ඒවාට රැකවරණයක් දෙන්න ඕනෑ කියලා නේ. අපි එදා කිව්වා වාගේ, වමට සිග්නල් දාලා දකුණට හැරෙන්න එපා. ඒක ඉදිරියට ගෙනියන්න. එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළක්. රනිල් වික්‍රමසිංහ මහතා විසින් එය ගෙනැල්ලා බංකොලොත්භාවයෙන් නිවැරදි තත්ත්වයකට ගෙනැල්ලායි තිබෙන්නේ. ඉතින්, ඔබතුමන්ලා ඒක අනුමත කරලා ඉදිරියට යන ගමනක් තමයි තිබෙන්නේ. එදා බැන්නා. හැබැයි අපි කියනවා, හොඳයි කියලා. ඉතින්, ඒ හොඳ ගමන යන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. එහෙම නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කිරීමට සහභාගි වූ හාන්ස් විජේසූරියගේ කමිටුව තුළින් ලැබුණු උත්තරය මොකක්ද?

ගරු අනුර කරුණාතිලක මහතා
(මාණ්පුමිකු අනුර කරුණාතිලක්ක)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමාත් වරෙක සඳහන් කළා වාගේ, පියාඹන දියබරියා තත්ත්වයට පත් වුණු එකක් ගැන තමයි ඔය කථා කරන්නේ. ඔබතුමා අහන මූලික ප්‍රශ්නයට මම දැනටමත් උත්තර දීලා තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය නිර්දේශ කරන්න අපි දැනටමත් expert committee එකක් පත් කර තිබෙනවා. ඒ expert committee එකේ නිර්දේශය මත ඉදිරියේදී කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(මාණ්පුමිකු කේ. කාදර් මස්තාන්)
(The Hon. K. Kader Masthan)
Sir, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, the Hon. K. Kader Masthan.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(මාණ්පුමිකු කේ. කාදර් මස්තාන්)
(The Hon. K. Kader Masthan)
Standing Order100 and 101

கொவிட் காலத்தில் ஜனாஸாக்கள் எரிக்கப்பட்டமை சம்பந்தமாக விசாரணை செய்வதற்கென Select Committee ஒன்றை நியமிக்குமாறு நாங்கள் சொல்லியிருந்தோம். இதுவரைக்கும் அது நியமிக்கப்படவில்லை. அதற்குப் பிறகு, ஆளுந்தரப்பால் விடுக்கப்பட்ட கோரிக்கைக்கு இணங்க, கறுப்பு யூலை சம்பந்தமாக ஆய்வொன்றை மேற்கொள்வதற்கென Select Committee ஒன்றை நியமித்து இருக்கிறீர்கள். கொவிட் காலத்தில் ஜனாஸாக்கள் எரிக்கப்பட்டமையானது, அந்தக் காலகட்டத்தில் முஸ்லிம்களுக்கு இழைக்கப்பட்ட பாரியதோர் அநீதி; அநியாயம்! எனவே, விரைவாக இது சம்பந்தமான Select Committeeஐ நியமிக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, we will make a note of that. Next, Question under Standing Order No. 27(2), the Hon. Sajith Premadasa, Leader of the Opposition.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමතී) හේමාලි වීරසේකර] තලෙමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ Point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I refer to Standing Order Nos. 100 and 101, which relate to Select Committees. Earlier, Muslim Members of Parliament have asked for a Select Committee to be appointed to look into the Muslim cremations in 2019. That has not been allowed for more than two months now. The Hon. Masthan also asked about the same matter, but there was no reply given by the Hon. Deputy Speaker. The question was properly addressed to the Chair. The Hon. Masthan was asking when that Select Committee will be appointed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවධානය යොමු කරවන්නම්, ගරු මන්ත්‍රීතුමා.

ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට පෙර මා ඉතාම වැදගත් ඉල්ලීමක් කරන්න කැමැතියි. විජිත හේරත් මැතිතුමාත්, ලාල් කාන්ත මැතිතුමාත් සභාවේ සිටින මේ මොහොතේ මම මේ කාරණය කියනවා. මේක ජාතික වැදගත්කමකින් යුත් ගැටලුවක්. මේ මොහොත වන විට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බරපතළ ඖෂධ හිඟයක් මතුවෙලා තිබෙනවා. මේ නිසා ඇත්තවශයෙන්ම රෝගීභාවයට පත්වුණු, ගිලන්වෙච්ච ජනතාව බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

රාජ්‍ය අංශයේ පමණක් නොවෙයි මේ ඖෂධ පිළිබඳ ගැටලුව තිබෙන්නේ. IV Adrenaline, IM Atropine, Piriton, Ondansetron, Maxolon, Phenergan, Hydrocortisone යනාදී වශයෙන් වන පිළිකා සම්බන්ධ බෙහෙත් private sector එකෙත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය යොමු කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා කරුණාකරලා මේ ප්‍රශ්නයට රජයේ අවධානය යොමු කරලා ගිලන් වෙච්ච ජනතාව වෙනුවෙන් ඒ ඖෂධ හිඟයට විසඳුමක් සපයන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විරැකියාව සහ ඌන සේවා නියුක්තිය විසඳීම සඳහා ගෙන ඇති පියවර
வேலையின்மை மற்றும் தகுதிக்கேற்ற வேலையின்மையை நிவர்த்தி செய்வதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்
MEASURES TAKEN TO ADDRESS UNEMPLOYMENT AND UNDEREMPLOYMENT

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ශ්‍රී ලංකාව මේ වනවිට මුහුණ දී සිටින බරපතළ සාර්ව ආර්ථික අභියෝග අතර, විරැකියාව ප්‍රමුඛ ස්ථානයක් ගනු ලබනවා. විශේෂයෙන් තරුණ පරපුර ඇතුළු වැඩ කළ හැකි වයසේ ජනතාවට ප්‍රමාණවත් සහ තිරසර රැකියා අවස්ථා නිර්මාණය නොවීම රටේ ආර්ථික වර්ධනයට මෙන්ම සමාජ ස්ථාවරයට ද බලපාන බරපතළ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා රටේ වත්මන් විරැකියා තත්ත්වය, එහි ව්‍යාප්තිය සහ එය විසඳීම සඳහා රජය සතු ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික වැඩ පිළිවෙළ පිළිබඳව රජයෙන් නිශ්චිත පිළිතුරු සහ පැහැදිලි කිරීම් බලාපොරොත්තු වෙනවා.

1. ශ්‍රී ලංකාවේ වර්තමාන විරැකියා තත්ත්වය පිළිබඳව රජය සතු නවතම නිල සංඛ්‍යාලේඛන අනුව, විරැකියාවෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාව සහ විරැකියා අනුපාතය කොපමණද? එය වසස් කාණ්ඩ, අධ්‍යාපන මට්ටම් සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙන් වෙන්ව කොපමණද? එම දත්ත පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගෙන තිබේද?

   ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒකේ පිටපතක් පිළිතුරු දෙන්න ඉස්සෙල්ලා මට ලබාදෙන්න කියලා. එතකොට මට වඩාත් විධිමත්ව අතුරු ප්‍රශ්න අහන්නට අවස්ථාව ලැබෙනවා.

2. විරැකියාව මේ වනවිට රට තුළ උද්ගත වී ඇති බරපතළ සාර්ව ආර්ථික ගැටලුවක් - macroeconomic problem එකක් - බව රජය පිළිගන්නේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එයට හේතුව රට තුළ සුදුසු රැකියා අවස්ථා නොමැතිවීමයි. ඒ තුළින් තරුණ ශ්‍රම බලකාය ඉතාම ශීඝ්‍රයෙන් රට හැර යනවා. හොඳට ඉගෙන ගත්ත වෘත්තීයවේදීන් - professionalsලා, හොඳ qualified පුද්ගලයන් රට අතහැර යනවා. ඉන් බුද්ධි ගලන ප්‍රශ්නයක් නිර්මාණය වෙනවා.

3. රටේ විරැකියා ගැටලුව විසඳීම සඳහා රජය විසින් මේ වනවිට හඳුනාගෙන ඇති සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විසඳුම් හා වැඩ පිළිවෙළවල් කවරේද?

ඉදිරි වසර 03 තුළ වාර්ෂිකව නිර්මාණය කිරීමට අපේක්ෂා කරන නව රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද?

ඒ නව රැකියා සංඛ්‍යාව කිව්වාම, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේත් - public sector -, පෞද්ගලික අංශයේත් - private sector - ඔබතුමන්ලාගේ ඉලක්ක සහ බලාපොරොත්තු මොනවාද?

4. රට තුළ විරැකියාව අවම කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජන ඉහළ නැංවීමේදී රජය අනුගමනය කරන ආයෝජන උපායමාර්ගය කුමක්ද? එම ආයෝජන හරහා ඍජු හා වක්‍ර රැකියා අවස්ථා කොපමණ සංඛ්‍යාවක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරන්නේද?

විශේෂයෙන්ම රජය විසින් අධ්‍යාපනයට ආයෝජනය කරලා, එයින් බිහි වෙන උපාධිධාරීන්ට සහ වෘත්තීය සුදුසුකම් සහිත තරුණයන්ට අවශ්‍ය රැකියා රට තුළ නිර්මාණය කර ගන්නට බැරිවීම හේතුවෙන්, ඇත්ත වශයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තියේ අසාර්ථකභාවය මේ වන විට පෙනී යනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද?

5. රටේ පවතින විරැකියා ගැටලුව ප්‍රායෝගිකව හා තිරසරව විසඳීම සඳහා අවශ්‍ය දේශීය හා විදේශීය රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන ප්‍රමාණය පිළිබඳව රජය ඇස්තමේන්තුවක් සිදු කර තිබේද? එසේ නම්, එම ආයෝජන අවශ්‍යතාව සහ ඒවා සපුරා ගැනීමට යෝජිත මූල්‍ය උපාය මාර්ගය කුමක්ද?

අපි ඔබතුමන්ලාගෙන් දැන ගන්න කැමැතියි, විශේෂයෙන්ම දේශීය ආයෝජන ප්‍රතිශතය පිළිබඳව ඉලක්ක මොනවාද, ඔබතුමන්ලාගේ රාජ්‍ය ක්‍රමෝපායික ආර්ථික සැලැස්ම තුළ ඍජු විදේශ ආයෝජන - foreign direct investments - කොපමණ බලාපොරොත්තු වෙනවාද කියන එක.

6. විරැකියා ගැටලුව විසඳීමේදී ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින රැකියා වෙළෙඳ පොලේ ස්වභාවය, රැකියා ව්‍යුහය සහ අනාගත රැකියා අවශ්‍යතා පිළිබඳව රජය සිදු කර ඇති අධ්‍යයනය කුමක්ද?

ඔබතුමන්ලා හොඳින් දන්නවා, විශේෂයෙන්ම AI ඇතුළු අලුත් තාක්ෂණික දියුණුව ඉතාම ශීඝ්‍රයෙන් වෙනස් වී ගෙන යන රැකියා පද්ධතියක් නිර්මාණය කෙරෙනවා කියන එක. අද තිබෙන රැකියා ඇබෑර්තුව හෙට නැති වෙන්නට පුළුවන්. ඒ තරමටම වේගයෙන් විශාල වශයෙන් එක්තරා අංශයක රැකියා බිහි වෙනකොට, තවත් අංශවල රැකියා අහිමිවීමක් සිද්ධ වෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා ගන්නා පියවර කුමක්ද කියන එක අපි දැන ගන්නට කැමැතියි.

7. ඌන සේවා නියුක්තිය - underemployment - පිළිබඳව රජය සිදු කර ඇති අධ්‍යයන මොනවාද?

විශේෂයෙන්ම ඔබතුමා දන්නවා, රාජ්‍ය අංශයේ මේ ඌන සේවා නියුක්තිය පිළිබඳව. විශේෂයෙන්ම graduatesලා, ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබන අය විවිධ පහළ තලයන්වල රැකී රක්ෂාවල යෙදිලා සිටිනවා.

ඒ නිසා මේ ඌන රැකියා - underemployment - ප්‍රශ්නයට ඔබතුමන්ලා ලබා දෙන විසඳුම මොකක්ද?

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට නොගැළපෙන රැකියා සහ ශ්‍රම ධාරිතාව නිසි ලෙස භාවිත නොවීම අවම කරමින් රැකියාවල ගුණාත්මකභාවය, ඵලදායීතාව සහ වැටුප් මට්ටම් ඉහළ නැංවීමට රජය සතු නිශ්චිත වැඩ පිළිවෙළ කුමක්ද කියන එකත් මම අහන්න කැමැතියි.

8. නව ව්‍යවසායයන් බිහි කිරීම සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම විරැකියා ගැටලුවට තිරසර විසඳුමක් ලෙස රජය පිළිගන්නේද? එසේ නම්, නව ව්‍යවසායයන් ආරම්භ කිරීම, ඒවා පවත්වා ගෙන යෑම සහ පුළුල් කිරීම සඳහා රජය හඳුන්වා දී ඇති මූල්‍ය, තාක්ෂණික සහ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ කුමක්ද?

නව ව්‍යාපාර ආරම්භ කිරීම - new business start-ups - පිළිබඳව රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද? මොකද, new business start-ups හරහා, ව්‍යවසායකත්වය හරහා මේ විරැකියා ප්‍රශ්නයට යම් තාක් දුරකට හෝ විසඳුම් ලබා දීමේ හැකියාව තිබෙනවා.

අපේ ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මා කලිනුත් කිව්වා වාගේ අර සංඛ්‍යාලේඛනවල පිටපතක් මට මේ මොහොතේම ලැබෙන්න සලස්වන්න කියලා. එතකොට අපට පුළුවන් පැහැදිලි කිරීම වඩාත් විධිමත්ව, කාර්යක්ෂමව, කාර්යශූරව කරන්න. ස්තුතියි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු විපක්ෂ නායකතුමනි, මේ පිළිතුර මට දැන් කියවන්න අවශ්‍ය වෙනවා. ඊට පසුව මම මෙහි පිටපතක් ලබා දෙන්නම්. ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. විරැකියාවෙන් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාව - 340,240යි.
ජුනි මාසය වන විට, විරැකියා අනුපාතය - සියයට 4.0යි.
විරැකියා අනුපාතය වයස් කාණ්ඩය අනුව - 2026 දෙවන කාර්තුව

වයස් කාණ්ඩය (අවුරුදු)	විරැකියා අනුපාතය (සියයට)
ශ්‍රී ලංකාව	4.0
15-24	17.8
25-29	12.1
30 සහ ඉහළ	1.4

විරැකියා අනුපාතය ස්ත්‍රී/පුරුෂභාවය අනුව - 2026 දෙවන කාර්තුව

ස්ත්‍රී/පුරුෂභාවය	විරැකියා අනුපාතය (සියයට)
ශ්‍රී ලංකාව	4.0
පුරුෂ	2.8
ස්ත්‍රී	6.1

විරැකියා අනුපාතය අධ්‍යාපන මට්ටම අනුව - 2026 දෙවන කාර්තුව

අධ්‍යාපන මට්ටම	විරැකියා අනුපාතය (සියයට)	විරැකියාවෙන් පෙළෙන පුද්ගලයන් සංඛ්‍යාව
ශ්‍රී ලංකාව	4.0	340,240
අ.පො.ස. (සාමාන්‍ය පෙළ)ට පහළ	2.0	90,182
අ.පො.ස. (සාමාන්‍ය පෙළ)	5.0	84,696
අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට ඉහළ	6.7	165,361

මෙම දත්ත පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගෙන තිබෙනවාද කියා ඔබතුමා අසා තිබෙනවා. ඇත්තටම දත්ත රැස් කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මඟින් කර තිබෙනවා. ඒත් ඒවා වාර්තා විධියට ඉදිරිපත් කර තිබෙන්නේ දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමින්. මම මේ වාර්තාව ඔබතුමාට ලබා දෙන්නම්. දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමින් තමයි ඒවා තිබෙන්නේ. ඒ අනුව, අවසානයේදී දිවයිනම ආවරණය වන පරිදි නිවාස ඒකක 25,000ක නියැදියක් මත දත්ත ලබාගෙන තිබෙනවා. එහි මූලාශ්‍රය විධියට තිබෙන්නේ, "ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය, සංක්ෂිප්ත වාර්තාව - 2026 දෙවන කාර්තුව". එය ඇමුණුමක් විධියට ඉදිරිපත් කරනවා. එකී ඇමුණුම **සභාගත*** කරනවා.

2වන ප්‍රශ්නය සහ 3වන ප්‍රශ්නය එකිනෙකට සම්බන්ධවයි තිබෙන්නේ. මම ඒ දෙකටම අදාළ පිළිතුරු එකට සම්බන්ධ කරන්නම්.

2. නැත.

විරැකියාව රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයට බලපාන වැදගත් සාර්ව ආර්ථික අභියෝගයක් ලෙස රජය පිළිගන්නා අතර, එම අභියෝගය සාර්ථකව ජය ගැනීමට කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන් තරුණ විරැකියාව, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය අඩු වීම, ඌන සේවා නියුක්තිය සහ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වලට ගැළපෙන රැකියා අවස්ථා නිහ වීම පිළිබඳව අධ්‍යයනය කරමින් රැකියා ජනනය කිරීම සඳහා අවශ්‍ය කරන ආයෝජන පුළුල් කිරීමට කටයුතු සිදු කරමින් තිබෙනවා.

ආර්ථික වර්ධනය වේගවත් කිරීම, දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීම, වෘත්තීය හා තාක්ෂණික කුසලතා සංවර්ධනය කිරීම, ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් විරැකියාව අවම කිරීමට ඉදිරියේදී අපි ප්‍රමුඛතාව ලබා දෙනවා. ඒ වාගේම, ඉදිරි අය වැය මඟිනුත් මෙයට අදාළ වැඩසටහන් සහ යෝජනා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

3. තරුණ හා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීම, වෙළෙඳ පොළ අවශ්‍යතා අනුව කුසලතා සංවර්ධනය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම රජයේ ප්‍රමුඛ අරමුණක් විධියට අපි සලකනවා; ඒ අනුව වැඩ කටයුතු කරනවා.

ඒ අනුව, තරුණ විරැකියාව අඩු කිරීම සඳහා 2030 වනවිට ඩිජිටල් ශ්‍රම බලකාය ලක්ෂ 2 දක්වා සහ සංචාරක ක්ෂේත්‍රයේ සෘජු රැකියා ලක්ෂ 6 දක්වා ඉහළ නැංවීමත්, දැනට සියයට 32ක්ව පවතින කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය සියයට 40 දක්වා වැඩි කිරීමත් ඉලක්ක කරමින් වැඩසටහන් යෝජනා කරනවා.

ඊට අමතරව, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සහ අනෙකුත් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් Empowering Unemployed Youth in Sri Lanka, Digital Public Employment Services and Platform in Sri Lanka, Labour Community Platform වැනි වැඩසටහන් සහ දැනටමත් වෘත්තීය මාර්ගෝපදේශන සේවා තුළින් රැකියා අපේක්ෂකයන්ට රැකියා අවස්ථා ලබා දීමත්, ශ්‍රම වෙළෙඳ පොළේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් අපේක්ෂා කරමින් වැඩ කටයුතු කරනවා.

4. ආයෝජකයන්ට හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සහ ආයෝජනය අනුමත කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම හා වේගවත් කිරීම තුළින් ආයෝජන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, කාර්මික හා ආයෝජන ප්‍රවර්ධන කලාප පුළුල් කිරීම සහ අපනයන ඉලක්ක කරගත් ආයෝජන ආකර්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනවා. ඒ අනුව, මේ වන විටත් එම ආයෝජන හිතකාමී පරිසරය නිර්මාණය කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කරලා තිබෙනවා. අදාළ නිර්ණායක ඉදිරිපත් කරමින් වරාය නගරය සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කර තිබෙනවා. එමෙන්ම, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ අලුතින් කර්මාන්තපුර ස්ථාපිත කරනවා. පවතින කර්මාන්තපුර නවීකරණය කරමින් ඒ සඳහා වේගයෙන් ආයෝජකයන් කැඳවන්න කටයුතු කරමින් තිබෙනවා.

ඒ වාගේම, ජාතික තනි වෙළෙඳ කවුළු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය පටන් අරගෙන තිබෙනවා. එහි නියමු වැඩසටහන - pilot වැඩසටහන - online platform එකක් හරහා ඊයේ ඉතාම සාර්ථකව දියත් කළා. එහි ප්‍රතිඵල මත අනෙකුත් කණ්ඩායම් එතැනට සම්බන්ධ කර ගන්න කටයුතු කරනවා.

ඊට අමතරව, ජාතික අපනයන සංවර්ධන සැලැස්ම හරහා ක්‍රියාත්මක වෙමින් අපනයන වෙළෙඳ පොළ ඉලක්ක කර ගන්නවා. ඒ සඳහා වූ ශ්‍රම බලකාය සහ ආයෝජන නිර්මාණය කරන්නත් බලාපොරොත්තු වෙනවා.

5. විරැකියාව අවම කිරීම සහ නව රැකියා නිර්මාණය කිරීමේ අමුණින්, මධ්‍යකාලීනව මෙරට ආර්ථික වර්ධන වේගය සියයට 7ක මට්ටමට ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. ඒ සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමස්ත ආයෝජනය සියයට 30 දක්වා පුළුල් කිරීමට සැලසුම් කර තිබෙනවා. රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීමට අමතරව දේශීය පෞද්ගලික අංශයේ ආයෝජන සහ සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. සමස්ත ආයෝජනයෙන් සියයට 25ත්, 30ත් අතර ප්‍රමාණයක් පෞද්ගලික සහ විදේශීය ආයෝජන මඟින් සපුරා ගැනීමට අපේක්ෂා කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමස්ත ආයෝජනවල ප්‍රතිශතය කොපමණද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
සියයට 30කට ආසන්නව තිබෙනවා. ඉතිරි කිරීම් සහ ආයෝජන අතර ජාතික ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම ඒ ප්‍රමාණයේ තමයි තිබෙන්නේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

6. දැනට පවතින සමීක්ෂණවලට අනුව ප්‍රධාන වශයෙන් තිබෙන්නේ, Labour Market Survey එක. ඒ පිළිබඳ දත්ත තමයි කලින් කලට ඉදිරිපත් කරන්නේ. මෑතකදීත් දත්තයක් ඉදිරිපත් කළා. ඊට අමතරව විරැකියාව ප්‍රශ්නය ව්‍යුහාත්මක ප්‍රශ්නයක් නිසාත්, ලංකාවේ තත්ත්වයත්, ලෝකයේ තත්ත්වයත් වෙනස් වෙලා තිබෙන නිසාත් අපි මේ පිළිබඳ නැවතත් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා අපි කම්කරු අමාත්‍යාංශය, කොළඹ විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන් සම්බන්ධ කරගෙන, යාපනය, කිලිනොච්චිය, නුවරඑළිය, කොළඹ, ගම්පහ කියන දිස්ත්‍රික්ක පදනම් කරගෙන, ඒ එක් දිස්ත්‍රික්කයකින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බැගින් සම්බන්ධ කරගෙන සමීක්ෂණයක් සිදු කරනවා. ඒකේ ප්‍රතිඵල දෙසැම්බර් මාසයේදී ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් සිදු කරන ලද සමීක්ෂණවලින් වර්තමානයේ පවතින කෙටි කාලීන රැකියා අවස්ථා පිළිබඳව සහ ආයෝජන අවස්ථා පිළිබඳව හඳුනාගෙන තිබෙනවා. එහිදී සංචාරක කර්මාන්තය මඟින් සහ සත්කාරක ආර්ථිකය - care economy - මඟින් නව රැකියා අවස්ථා නිර්මාණය වීමට ඉඩකඩ තිබෙනවා කියලා තොරතුරු ලැබී තිබෙනවා. ඒ අනුව, රැකියා සුරැකුම් ආර්ථිකයක් මඟින් සංචාරක කර්මාන්තයේත් නව රැකියා බිහි කිරීම සහ ආයෝජන වැඩි කිරීමටත් කටයුතු කරමින් තිබෙනවා.

7. Underemployment, ඇත්තටම දීර්ඝ කාලීනව පැවතෙන ප්‍රශ්නයක්. ඒ වාගේම ව්‍යුහාත්මක ගැටලුවක්. පළමුවැනි දේ තමයි, දැනට තිබෙන අධ්‍යාපන ක්‍රමවේදය අනුව ලබා ගත් සුදුසුකම්, දක්ෂතා සහ කුසලතා මත එක පැත්තකින් ගමන් කරන ගමන්ම අනෙක් පැත්තෙන් ආර්ථිකයට අවශ්‍ය රැකිරක්ෂා ජනනය වෙනවා. මේ දෙක අතර නොගැළපීමක් තිබෙනවා. ඒවා ගැළපීමටත් අපි කටයුතු කරනවා. ඒ වාගේම දිගු කාලීන වශයෙන් අපි සිදු කරන්න බලාපොරොත්තු වෙන පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් මේ සඳහා පාදක කර ගන්න බලාපොරොත්තු වෙනවා. කලින් තිබුණු අධ්‍යාපන ක්‍රමය වෙනුවට දැන් ව්‍යාත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයත්, ශාස්ත්‍රීය අධ්‍යාපන ක්ෂේත්‍රය වාගේම ඉලක්ක කරමින් ඉදිරියට ගමන් කරමින් තිබෙනවා. ඒ වාගේම ව්‍යාත්තීය අධ්‍යාපනය දියුණු කිරීම සඳහාත් - විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමේ මට්ටම දක්වා - ප්‍රතිසංස්කරණ ගණනාවක් ගේනවා. ඉදිරි අය වැයේදී ඒ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

මේ underemployment ප්‍රශ්නයේදී, දැනට තිබෙන තත්ත්වය ගැළපීම සඳහා අපි ව්‍යාත්තීය මාර්ගෝපදේශනය ලබා දෙනවා. විශේෂයෙන්ම රැකියා අපේක්ෂිතයන්ගේ දක්ෂතා සහ ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතා අනුව ව්‍යාත්තීය මඟ පෙන්වීම් ලබා දෙනවා. ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කරමින් රැකියා අවස්ථා සහ අනාගත ශ්‍රම වෙළෙඳ පොළ ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබා දෙනවා. ඒ වාගේම රැකියා ප්‍රදර්ශන වාගේ වැඩසටහන් මඟින් සේවායෝජකයන් සහ රැකියා අපේක්ෂිතයන් සම්බන්ධ කර සුදුසු රැකියා අවස්ථා ලබා දෙනවා.

දැනට සිදු කරනු ලබන පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල ලැබෙන්න තව වසර ගණනාවක් ගත වෙනවා. ඒ වෙනතුරු නිපුණතා සංවර්ධනය යටතේ, කර්මාන්ත අවශ්‍යතා අනුව තාක්ෂණික හා ව්‍යාත්තීය කුසලතා වැඩිදියුණු කිරීම සිදු කරනවා. මොකද, 21වන ශත වර්ෂය වෙනකොට අවශ්‍ය වෙන කුසලතා වෙනස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම problem-solving, analytical skills, negotiation skills ඒ වාගේම IT සහ AI කුසලතා සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඒ නිසා අපි කෙටි කාලීනව එම කුසලතා ලබා දෙන ගමන්, පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ මේ කුසලතාවලට වැඩි අවධානයක් යොමු කරනවා. ඒ වාගේම ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුව, උපදේශනය සහ මූල්‍ය පහසුකම් ලබා දීම සිදු කරනවා.

8. නව ව්‍යවසායකයන් බිහි කිරීම සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, විරැකියාව අවම කිරීම, විශේෂයෙන් තරුණ හා කාන්තා රැකියා අවස්ථා පුළුල් කිරීම සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය රජයේ ප්‍රමුඛ ක්‍රියාමාර්ගයක් විධියට සලකනවා. ඒ අනුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහනදායී ණය පහසුකම් ලබා දීම, ව්‍යාපාරික උපදේශනය හා පුහුණු සේවා, නවීන තාක්ෂණය සහ වෙළෙඳ පොළ ප්‍රවේශය ලබා දීමට කටයුතු කරනවා. මේ යටතේදී විශේෂයෙන් පැවත ගෙන ආපු SME Credit Line II, ඒ වාගේම SME Sector Development Programme, Establishment of Business Incubators in Nine Provinces, National Programme to Develop 1,000 Young Entrepreneurs සහ Producer Cooperative Society for Youth Entrepreneurs වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. මේ පිළිබඳව වැඩිදුර විස්තර ඇතුළත් ලේඛනයක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරනවා. එම ඇමුණුම මම **සභාගත*** කරනවා.

එහි ප්‍රධාන ක්ෂේත්‍ර ගත්තොත්, අපි ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දෙනවා. ඒ යටතේ Re-energizing the MSME Sector නමැති වැඩසටහන තිබෙනවා. ඊට අමතරව, Farming System Sustainability Programme කියලා එකක් තිබෙනවා. එම වැඩසටහන් කිහිපයටම ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනවා. ඊට සම්බන්ධ කරලා තිබෙනවා, ආසියානු සංවර්ධන බැංකුවේ ණය යෝජනා ක්‍රම කිහිපයකුත්. එහිදී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයේ වටිනාකම් දාමය - value chain එක - සංවර්ධනය සඳහාත්, කෘෂි කාර්මික අගය දාමය සංවර්ධනය කිරීම සඳහාත් වැඩසටහන් දෙකක් - ණය යෝජනා ක්‍රම දෙකක් - තිබෙනවා.

ඊට අමතරව, පොලී සහනාධාර ක්ෂේත්‍ර කිහිපයකදී ලබා දෙනවා. එකක්, pledge loan එක යටතේ ලබා දෙනවා. ඒ වාගේම New Comprehensive Rural Credit Scheme එක යටතේ ලබා දෙනවා. මේවා තමයි දැනට ලබා දෙන්නේ. ඉදිරියේදී අපි මේ ණය අවස්ථා තවත් පුළුල් කරන්න බලාපොරොත්තු වනවා. ඊට අමතරව, ඇප රහිත ණය ලබා දීමේ වැඩසටහන 2025දී සාර්ථකව ක්‍රියාත්මක කළා. 2026දීත් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒ සඳහා වෙන් කළ සියලු මුදල් මේ වර්ෂය අවසාන වනකොට ලබා දීමේ හැකියාවක් තිබෙනවා. මේ කරුණු ටික තමයි සඳහන් කරන්න තිබෙන්නේ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමාට කෙටි පැහැදිලි කර ගැනීමක් කරන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මේ කාරණා මම ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්න කැමැතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම අහපු ප්‍රශ්නයේ, ඔබතුමා "විරැකියාව" කියන ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් හැටියට සලකනවාද කියන එක ගැන කිව්වේ, "නැහැ" කියලා. නමුත්, මම ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්න කැමැතියි, IMF එක finance and development සම්බන්ධයෙන් සිදු කර තිබෙන "Asia's New Opportunity" කියන වාර්තාවේ International Monetary Fund එක කියනවා, විශේෂයෙන්ම 2024 දක්වා graduate unemployment level එක, ඒ කියන්නේ, උපාධිධාරීන් අතර රැකියා විරහිතභාවය ආසියාවේම බරපතළම තැන තිබෙන්නේ ශ්‍රී ලංකාවේ, සියයට 43කට රැකියා නැහැ කියලා. ඔබතුමා, විරැකියා ප්‍රශ්නය ගැටලුවක් නොවෙයි කියලා උත්තර දුන්නා. නමුත්, ඒක ගැන නැවත වරක් හිතලා බලන්න. මොකද, විරැකියා ප්‍රශ්නයට විසඳුම් ලබා දීම රජයේ ප්‍රමුඛතාවක් බවට පත් කිරීම වැදගත්.

ඔබතුමා ඉදිරිපත් කළා, යෝජනා ගණනාවක්. ඩිජිටල් ක්ෂේත්‍රයේ රැකියා ලක්ෂ 2ක් බිහි කරනවා. සංචාරක ක්ෂේත්‍රයේ රැකියා ලක්ෂ 6ක් බිහි කරනවා. ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගිත්වය සියයට 30 ගණන්වල ඉඳලා සියයට 40 දක්වා වැඩි කරනවා කියලා. හැබැයි, ප්‍රායෝගික වැඩ පිළිවෙළක් - ඒ කියන්නේ, උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඇඟලුම් කම්හල් 200 වාගේ ජාතික වැඩසටහනක් - පිළිබඳව ඔබතුමා කිසිම යෝජනාවක් ඉදිරිපත් කළේ නැහැ. ඒ නිසා ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්නකෝ, ඔබතුමන්ලාගේ සංඛ්‍යාත්මක දත්ත සහිත හරයක් තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද මේ රැකීරක්ෂා බිහි කරන්න තිබෙන, කියලා. ඒ වාගේම වාර්ෂිකව උත්පාදනය කරන්න බලාපොරොත්තු වන රැකියා ප්‍රමාණය ගැන මම ඇසූ ප්‍රශ්නයට ඔබතුමා උත්තර දුන්නේ නැහැ.

මම අවසාන වශයෙන් මේ කාරණය ගැන පැහැදිලි කර ගන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, චීන ආයෝජනයක් අද අපේ රටෙන් ගිලිහිලා තිබෙන බව. ඒ කියන්නේ, China Merchants Port Holdings Company Limited, ඒ වාගේම Sinopec investment එක ගිහිල්ලා තිබෙනවා. MAS Holdings එක ඉවත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේක වැදගත් ප්‍රශ්නයක්.

MAS Holdings එක ඉවත් වෙලා ගිහිල්ලා තිබෙනවා. MAS Holdings එක ඉවත් වෙලා ගිහිල්ලා පිට රට කර්මාන්තශාලා පමණක් නොවෙයි, කර්මාන්තපුරවල් නිර්මාණය කරනවා. Brandix එක ඉවත් වෙලා ගිහිල්ලා තිබෙනවා, Esquel එක ඉවත් වෙලා ගිහිල්ලා තිබෙනවා, HSBC එක ඉන්දියාවට යනවා. R.R. Donnelley එක යනවා, පිලිපීනයට. ඔබතුමන්ලාට ඇත්තවශයෙන්ම මේ තිබෙන ආයෝජන රැක ගන්නටත්, අලුත් ආයෝජන අපේ රටට ආකර්ෂණය කර ගන්නටත් පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ. ඒක තමයි මහ පොළොවේ සත්‍යය සහ යථාර්ථය.

ඊළඟට මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. විරැකියා ප්‍රශ්නය විසඳන්නට ඇත්තවශයෙන්ම හොඳ ක්‍රමවේදයක් තමයි, අලුත් - new - business startup වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. අපේ සැලැස්මේ තිබුණා, one million new business startups ව්‍යාපෘතිය.

අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ කාරණයත්. ඔබතුමා වට්ටෝරුවක් කියාගෙන ගියා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ලබා දෙන සහන පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, කාලය පිළිබඳ සැලකිලිමත් වෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හැබැයි, ඒ සහන ටික මේ බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක වනකොට ඒ මුදල් යන්නේ අමාරුවේ වැටිලා තිබෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට නොවෙයි, බැංකුව තීන්දු කරන safe customersලාට. ඒ කියන්නේ, බැංකුවට සියයට සියයක් හැමදාම ණය වාරික ගෙවපු safe customersලාටයි ඒ අරමුදල් යන්නේ. අර අමාරුවේ වැටුණු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මේ අරමුදල් යන්නේ නැහැ. මේ ගැටලුවලට ඔබතුමන්ලා ලබා දෙන පිළිතුර මොකක්ද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්න රාශියක් ඇසුවා. මම කෙටියෙන් පැහැදිලි කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඉතාම කෙටියෙන් පැහැදිලි කරන්න. අපට කාලය කළමනාකරණය කර ගැනීමට අවශ්‍යයි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු විපක්ෂ නායකතුමාගේ දෙවන ප්‍රශ්නයට පිළිතුර විධියට මම "නැත" යන්නෙන් අදහස් කළේ මෙන්න මේ නිසායි. ගරු විපක්ෂ නායකතුමාගේ දෙවන ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "විරැකියාව මේ වන විට රට තුළ උද්ගත වී ඇති බරපතළ සාර්ව ආර්ථික ගැටලුවක් බව රජය පිළිගන්නේද?" යන්න පිළිබඳවයි. විරැකියාව කියන එක ලෝකයේ හැම තැනකම තිබෙන ප්‍රශ්නයක්. ඒක අපේ රටේ බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා නැහැ විතරක් නොවෙයි, අතීතයට සාපේක්ෂව අපි විරැකියාව ක්‍රමිකව අඩු කරලාත් තිබෙනවා. ඒ වාගේම මේ ඇමුණුම්වලින් ඉදිරිපත් කරන දත්ත දිහා බැලුවාම, පළාත් සහ දිස්ත්‍රික්ක අතර විරැකියාවේ වෙනස ගත්තාම විෂමතා, ව්‍යුහාත්මක ගැටලු තිබෙනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ තමයි දැනට වැඩිම විරැකියා අනුපාතය තිබෙන්නේ කියන එක. මේ අවසාන වාර්තාවලට අනුව එය සියයට 6.6ක්. එම නිසා මම කියන්නේ මේ ව්‍යුහාත්මක ගැටලුවේ සමස්තයේ average එක ගත්තාම, මේ ආණ්ඩුව යටතේ අපි එය පහළට ගෙනැල්ලා තිබෙන කියන එකයි. ඒ අදහසයි මා මතු කළේ. නමුත්, අපි විරැකියාව අවම කර ගනිමින් කටයුතු කරනවා. මොකද, ලෝකයේ කිසිම රටක් සමස්ත පූර්ණ ශ්‍රම නියුක්තියට එන්නේ නැහැ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ වාගේම උපාධිධාරීන් පිළිබඳ ප්‍රශ්නයේදී ඇත්තටම ඔබතුමා මතු කරපු කාරණය නිවැරදියි. අපේ රටේ දැන් තිබෙන අධ්‍යාපන ක්‍රමය තුළ තමයි මේ කුසලතා ගොඩ නැහෙන්නේ. එතකොට ඒ කුසලතා නව ලෝකය වෙනස් වන හැටියට, ආයෝජන වෙනස් වන හැටියට, රැකී රක්ෂා ජනනය වන හැටියට ගැළපෙන්න ඕනෑ. දැන් මේ අතර පුංචි නොගැළපීමක් තිබෙන නිසා තමයි අපි ප්‍රශස්ත පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් යෝජනා කරලා තිබෙන්නේ. එහිදී මේ කුසලතා ප්‍රශ්නය අපි දිගු කාලීනව ආමන්ත්‍රණය කරනවා. ඒ වාගේම කෙටි කාලීන වැඩ පිළිවෙළකුත් මෙහි සඳහන් කරනවා.

ගරු විපක්ෂ නායකතුමා ඇඟලුම් ක්ෂේත්‍රය වැනි ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධවත් සඳහන් කළා. මෙතැන තිබෙන ප්‍රශ්නය මෙකයි. හුදෙක් අතීතයේ තිබුණු එක් කර්මාන්තයක් හොයාගෙන, භූගෝලීයව එක තැනක තියලා රැකියා නිෂ්පාදනය කිරීමට වඩා, දැන් පවතින තත්ත්වය වෙනස්. ඒක දශක තුනකට, හතරකට, පහකට කලින් යථාර්ථයක් වුණාට, දැන් තිබෙන්නේ ගෝලීය සැපයුම් දාමයත් එක්ක ගැටගැසුණු රැකියා. ඒ නිසා අපි මේ global supply chain එකත් එක්ක ගැටගැහිලා, විශේෂයෙන්ම මෙම logistics සම්බන්ධයෙන් අපේ පිහිටීම අනුව ආයෝජන ගණනාවක් යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, බලශක්ති ක්ෂේත්‍රය සහ සංචාරක ක්ෂේත්‍රය. ඒ වාගේම බනිජ සම්පත් ආශ්‍රිතව වටිනාකම් එකතු කරන කර්මාන්තවලටත් අපි රැකී රක්ෂා යෝජනා කරනවා. ඒ වාගේම නව වෙළඳ ගිවිසුම්වලටත් අපි ඉදිරියේදී සම්බන්ධ වනවා. මේ ක්ෂේත්‍ර ගණනාව ඇතුළේ රැකී රක්ෂා විශාල ප්‍රමාණයක් ජනනය කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ කරුණු එක්ක ගත්තාම ඇත්තටම අපට කරන්න තිබෙන්නේ පවතින තත්ත්වයන් මත වඩාත් නිවැරදි තීන්දු තීරණ ගැනීම සහ ලෝකය සමඟ ගැටගැසුණු ක්‍රමවේදයකට අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් සමඟ ඉදිරියට යන එකයි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

II

භාණ්ඩාගාරය මඟින් ඉන්ධන සහ විදුලිය සඳහා ලබා දෙන සහනාධාර

எரிபொருள் மற்றும் மின்சாரத்திற்காக திறைசேரியால் வழங்கப்படும் மானியம்

SUBSIDIES PROVIDED FOR FUEL AND ELECTRICITY BY TREASURY

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ජීවන වියදම අඛණ්ඩව ඉහළ යමින් පවතී. 2026 ඔක්තෝබර් මාසයේ සමස්ත උද්ධමනය සියයට 8.3ක් සහ ආහාර උද්ධමනය සියයට 8.8ක් විය. නොවැම්බර් 02වන දින ඉන්ධන මිල නැවත ඉහළ ගිය අතර, ඔක්තෝබර් 30 සිට පාන් ඇතුළු බේකරි නිෂ්පාදනවල මිල ද රුපියල් 5කින් වැඩි විය.

ගරු අමාත්‍යතුමනි, ඉන්ධන මිල පිළිබඳව ගරු කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය අමාත්‍යතුමිය සභාවේ කියපු ප්‍රකාශය වැරදියි. අපි ගෙන්වන මිලට වඩා අඩුවෙන් ලංකාවේ තෙල් දෙනවා කියලා කිව්වා. ඇත්තටම ඩීසල් ලීටරයක් රුපියල් 307ටත්, පෙට්‍රල් ලීටරයක් රුපියල් 322කටත් තමයි අපි ගේන්නේ. මම දන්නේ නැහැ, එතුමිය කොහෙන් තොරතුරු අරගෙන ද ඒ මිල ගණන් කිව්වේ කියලා.

අප්‍රේල් මාසයේ විදුලි ගාස්තු සාමාන්‍යයෙන් සියයට 10.3කින්ද, මැයි මාසයේ ඒකක 180 ඉක්මවන ගෘහස්ථ පාරිභෝගිකයින්ට තවත් සියයට 18කින් ද ඉහළ දැමුණි. ඒ වාගේම තවත් ගාස්තු සංශෝධනයක් සලකා බලමින් ද පවතී.

මම දැක්කා, දැන් ඒක නැහැ කියලා NSO එකෙන් දාලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒකේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා.

ඩීසල් ලීටරයකට ලබා දෙන රුපියල් 70ක සහනාධාරය දෙසැම්බර් 31 දින අවසන් වන බවද ප්‍රකාශකොට තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ වර්ෂය මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2026 අනුව ජූනි මස අවසානයේ භාණ්ඩාගාර මුදල් ශේෂය රුපියල් බිලියන 690.3කි. මෙච්චර මුදල් තිබෙනවා නම් තෙල්වලට වැඩිපුර බදු ගහන්නේ ඇයි කියන එකත් අහන්න ඕනෑ. මුදල් තිබෙනවා නම් ඒ මුදල්වල සහනය කෙළින්ම ජනතාවට ලබා දෙන්න පුළුවන්, තෙල්වලට බදු ගහන්නේ නැතිව. මම මීට පෙරත් සඳහන් කළා, තෙල් ගෙන්වන මිල. පළමු මාස හය තුළ ඉන්ධන සහනාධාරය සඳහා රුපියල් බිලියන 57ක් පමණද, ඉන් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන 41ක්ද, විදුලි සහනාධාරයක් සඳහා රුපියල් බිලියන 15ක්ද ලබා දී ඇත. එම කාලයේ සංස්ථාව රුපියල් බිලියන 29.2ක ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, ඊට ප්‍රධාන හේතුව සහනාධාර බව වාර්තාව සඳහන් කරයි.

ගරු අමාත්‍යතුමනි, මම මේ කියන අවස්ථාවට පෙර රුපියල් බිලියන 750ක් - Treasury එකේ මුදල්, රටේ ජනතාවගේ බදු මුදල් - පසුගිය අවුරුද්ද ඇතුළත, Ceylon Petroleum Corporation ආයතනය bail out කරන්න, People's Bank එකේ සහ ලංකා බැංකුවේ තිබුණු ණය පියවන්න ගෙව්වා. එක අතකින් ලංකාවේ ජනතාවගේ බදු සල්ලි අපි එහාට ගෙවනවා. ඊට පස්සේ ලාභයක් වාර්තා කරනවා කියලා කියනවා. ඇත්ත පරමාර්ථය ලාභ වාර්තා කිරීමද, නැත්නම් ජනතාවට සහන ලබා දෙන එකද කියලාත් අහන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ මේ කාරණය නිසායි. විශේෂයෙන්ම තෙල්වල තිබෙන price formula එකත් එක්ක සමහර වෙලාවට මාසය අන්තිම වනකොට තෙල් හිඟයක් ඇතිවන්න පුළුවන්. මොකද, බෙදුම්කරුවන් තමන් ළඟ තිබෙන තෙල් විකුණන්නේ නැතිව හිරකරගෙන ඉන්න පුළුවන්, මිල වැඩිවෙයි කියලා. එහෙම නැත්නම් මිල අඩුවෙයි කියලා මුල් කාලයේදීම තෙල් විකුණලා ඉවර කරන්නත් පුළුවන්. එතකොට මාසයේ අන්තිමට තෙල් පෝලිම් වැඩිවෙන්න පුළුවන් අවස්ථාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වනවා.

1. 2026 ජනවාරි සිට මේ දක්වා ලබා දුන් මුළු ඉන්ධන සහනාධාරය කොපමණද? ඉන් බනිජ තෙල් සංස්ථාවට සහ අනෙකුත් ඉන්ධන බෙදා හරින්නන්ට ලබා දුන් මුදල් වෙන් වෙන්ව කොපමණද?

මම මේ ප්‍රශ්නය බලශක්ති ඇමතිතුමාට යොමු කරන්නේ නැතිව මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කරන්නේ මේකට සෘජු ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුත්තේ මුදල් අමාත්‍යාංශය නිසායි.

2. ඉන්ධන සහ විදුලි සහනාධාර සඳහා භාණ්ඩාගාරයේ වර්තමාන මාසික වියදම කොපමණද?

3. අප්‍රේල් සිට ජූනි දක්වා සංස්ථාවට ලබා දුන් රුපියල් බිලියන 41ක සම්පූර්ණ සහනාධාරය ඉන්ධන මිල අඩු කිරීම හරහා පාරිභෝගිකයින්ට ලබා දී තිබේද?

ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම මීට පෙරත් මේ සභාවේදී - මීට පෙර සහනාධාරය දුන් අවස්ථාවේදී - මේ කාරණයම මතු කළා. සියලුදෙනාටම සහනාධාරයක් ලබා දෙනවා. නමුත් අපි යෝජනා කරන්නේ මෙයයි. ගරු අමාත්‍යතුමනි, දැන් මෙට්‍රෝ බස් සේවාව තිබෙනවා. මෙට්‍රෝ බස් එකට සහනාධාර වැඩිපුර දෙන්න. එතකොට ජනතාවට එය pass කරන්න පුළුවන්. ඒක semi-government ආයතනයක්. ලංගමට වැඩිපුර සහනාධාරයක් දෙන්න. Private බස් හිමියන්ටත් වැඩිපුර සහනාධාරයක් දෙන්න. එතකොට රටේ ජනතාවට ගමන් වියදම අඩු කරගන්න පුළුවන්. ගරු අමාත්‍යතුමනි, දැන් මේ සහනාධාරය පොදුවේ සියලුදෙනාටම ලැබෙනවා. වාහනයට දවසකට තෙල් ලීටර් 100ක් පාවිච්චි කරන මනුස්සයාටයි, ඩීමෝ බට්ටා වැනි වාහනයකට තෙල් ලීටර් 5ක්, 10ක් පාවිච්චි කරන මනුස්සයාටයි එකම සහනාධාරය ලැබෙන්නේ. එම නිසා රටේ ඉන්න සියයට 70ක පමණ ජනතාවක් තමයි මේ ක්‍රමවේදය හරහා මේ සහනාධාරයෙන් වැඩිපුර වාසි ලබා ගන්නේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් දන්නවා, මේ වනකොට පවතින crack price එකත් එක්ක තෙල් මිල බලනකොට, crude oil ගෙනැල්ලා refine කරලා විකුණන නිසා ලෝකයේ තිබෙන ඩීසල් මිලට වඩා අඩු මිලකට අපට ඩීසල් නිපදවන්න පුළුවන් කියලා. ඒකෙන් ලැබෙන ලාභය අපි හරියට කළමනාකරණය කරගන්න ඕනෑ. ඒ වාගේම CPC එකට ඕනෑ විධියට විතරක් වැඩ කරන්න බැහැ. මුදල් අමාත්‍යාංශය ඒකට මැදිහත් වෙන්න ඕනෑ.

4. වර්තමාන මාසික වියදම අනුව භාණ්ඩාගාර මුදල් ශේෂයෙන් මෙම සහනාධාර තවත් මාස කීයක් පවත්වාගෙන යා හැකිද?

5. ලෝක ඉන්ධන මිල තවදුරටත් ඉහළ ගියද, 2026 දෙසැම්බර් 31න් පසුව ඉන්ධන සහ විදුලි සහන අඛණ්ඩව ලබා දෙන්නේද?

ගරු අමාත්‍යතුමනි, ලංකාවේ මුළු market share එකෙන් CPC ළඟ තිබෙන්නේ සියයට 60ක් පමණ ප්‍රමාණයක්. IOC හරි වෙනත් ආයතනවල හරි ඉතිරි සියයට 40 තිබෙනවා නම්, ඒගොල්ලන්ට refinery එකක් නැහැ, ලංකාවේ ඇතුළේ refine කරලා ඩීසල්වලින් ලාභ ලබන්න. එහෙම නම් එක්කෝ ඒගොල්ලන්ට කැමැති මිලකට ගෙනැල්ලා, කැමැති මිලකට දෙන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ. මොකද, CEYPETCO එකට අයිතිව තිබුණු පෙට්‍රල් ෂෙඩ් ටිකෙන් කොටසක් Sinopec, LIOC වාගේ වෙනත් ආයතනවලට දීපු නිසා අද ගම්වල තිබෙන Sinopec පෙට්‍රල් ෂෙඩ්වල තෙල් නැහැ. මොකද, ඒ මිනිස්සු තෙල් විකුණන්නේ නැහැ. මේ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රාසමාණික්කම් මහතා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මේ වර්ෂයටම ඉන්ධන සඳහා සමස්ත සහනාධාරය ලෙස රුපියල් බිලියන 98ක් ලබා දීලා තිබෙනවා. පළමුවැනි කාණ්ඩය හැටියට අප්‍රේල් සිට ජූනි දක්වා ලබා දුන් ඉන්ධන සහනාධාරය පහත වගුවේ දක්වා ඇත.

රුපියල් මිලියන						
ආයතනය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	-	-	-	15,032	14,130	11,811
ලංකා ඉන්දියන් තෙල් සමාගම	-	-	-	2,340	2,138	2,392
ආර්එම් පාර්ක් සමාගම	-	-	-	1,666	1,577	1,536
සිනොපෙක් සමාගම	-	-	-	1,501	1,112	1,345
මුළු එකතුව	-	-	-	20,539	18,957	17,084

ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසවල එහෙම ඉන්ධන සහනාධාර ලබා දීලා නැහැ.

2. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ, මේ ඉන්ධන සහනාධාරය මාසිකව හෝ පුද්ගලයන්ට ලබා දෙන එකක් නොවෙයි, ක්‍රමවේදයක් අනුව ආයතනයට ලබා දෙන එකක්. ඒ නිසා මාසික වියදමක් දරන්න සිදු වන්නේ නැහැ. නමුත් අපි පළමුවැනි අදියරෙන් පස්සේ දෙවැනි අදියරේදී ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා තව රුපියල් බිලියන 41ක් ලබා දෙනවා. ඒ අනුව තමයි රුපියල් බිලියන 41කුත්, රුපියල් බිලියන 57කුත් වශයෙන් රුපියල් බිලියන 98ක් බවට පත් වන්නේ.

විදුලිය සම්බන්ධයෙන් ගත්තාම, අවසාන වශයෙන් විදුලි බිල වැඩි කිරීමේදී විදුලි ඒකක 180ට වඩා අඩුවෙන් පාවිච්චි කරන අයගේ විදුලි බිල වැඩි වුණේ නැහැ. ඒ අනුව අනිවාර්යයෙන් ඔවුන්ට ඒ සහනාධාරය ලැබෙනවා. ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය අදාළ ආයතනයට ලබා දුන්නු සහනාධාරය දැනටමත් එලෙස ලබා දී තිබෙනවා. ඒකේ පළමුවැනි අදියරේදී රුපියල් බිලියන 15කුත්, දෙවැනි අදියරේදී රුපියල් බිලියන 17කුත් වශයෙන් රුපියල් බිලියන 32ක් ලබා දී තිබෙනවා.

3. ඇත්තටම අප්‍රේල් සිට ජූලි දක්වා ලබා දුන් රුපියල් බිලියන 57ක සහනාධාරය පාරිභෝගිකයන්ට ලැබෙනවා. එහි ක්‍රමවේදය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන්නේ. අපේ ක්‍රමවේදය මෙයයි. තෙල් බෙදා හරින ඒ, ඒ ආයතන තමන් විකුණන ලද තෙල් ප්‍රමාණය පරීක්ෂා කරලා, විගණනය කරලා ඒ අනුව නිසි පරිදි ඒවා ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ, අපිත් කැමැතියි, මේ සහනාධාරය ඉලක්කගත තැනකට දෙන්න. නමුත් මෙතැනදී සිද්ධ වන්නේ මෙයයි. විශේෂයෙන්ම මැද පෙරදිග යුද්මය තත්ත්වය හමුවේ ඇති වන හදිසි තත්ත්වයකදී එවැනි ක්‍රමවේදයක් හදලා, මාස ගණනාවක් ගත වෙලා ඒ සහනාධාර ලබා දෙනවාට වඩා තිබුණු ක්‍රමය අනුගමනය කරන එක තමයි අපි මේ කරන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමා සඳහන් කළා, මෙට්‍රෝ බස් සේවාව ක්‍රියාත්මක කරන ආයතනය semi-government කියලා. ඒක එහෙම එකක් නොවෙයි. ඒක සම්පූර්ණයෙන්ම රාජ්‍ය ආයතනයක්. මොකද, සමාගමක් කිව්වාම, ඒක රාජ්‍යයද, පෞද්ගලිකද, පොදුද කියන එක වෙනම කාරණයක්. සමාගම් සැදීමේදී ඒකට නම ලබා දෙනකොට එහි නම "පෞද්ගලික" හෝ "පොදු" කියලා තිබෙන්න පුළුවන්. මේක පෞද්ගලික සමාගමක් කියලා නාමිකව තිබෙනවා. *[බාධා කිරීමක්]* කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාරණය මතු කරපු එකත් හොඳයි. මොකද, නැත්නම් වැරදි අදහසක් සමාජයට යනවා. මේක

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

private company එකක් කියලා තිබෙනවා. මේක semi-government හෝ පෞද්ගලික ආයතනයක් නොවෙයි, රාජ්‍ය මැදිහත්වීමක් තිබෙන ආයතනයක්.

4. ඇත්තටම මේ සහනාධාරය ලබා දෙන්නේ විශේෂයෙන්ම මැද පෙරදිග යුද්ධය නිසා. එය අපි කලින් කලට පවතින තත්ත්වය අධ්‍යයනය කරමිනුයි ලබා දෙන්නේ. එහෙම නැතුව මේ සහනාධාරය දීර්ඝව ලබා දෙන කාලයක් ප්‍රකාශ කරන්න බැහැ. මොකද, සමහර විට අද ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වෙන්න පුළුවන්. ඇත්තටම පවතින භූ දේශපාලන තත්ත්වය යටතේ නැවතත් ඉන්ධන මිල පොඩ්ඩක් පහළට ඇවිල්ලා තිබෙනවා. හෙට නැවත එය වැඩි වේවිද කියලා අපිට කියන්න බැහැ. අපේ තිබෙන මූල්‍ය ස්ථාවරත්වයත්, අත්පත් කරගත්ත ආදායමත් මත අපි අනිවාර්යයෙන්ම මහජනතාවට අනවශ්‍ය පීඩනයක් එනවා නම් ඒ පීඩනය සම්පූර්ණයෙන්ම ඔවුන් වෙත පටවන්නේ නැතුව ඒ සහනය ලබා දෙනවා. ඒ වෙනුවෙන් අපිට තිබෙන මුදල් අතිරික්ත ප්‍රමාණවත් නොවෙනවා නම් වෙනත් ආකාරයක් භාවිත කරලා, ණය ගැනීමකින් හෝ ඒ සහන ලබා දෙන්න අනිවාර්යයෙන් අපි මැදිහත් වෙනවා.

පස්වැනි ප්‍රශ්නයට පිළිතුර විධියට කියන්න වෙන්නේත් මේකයි.

5. 2026 දෙසැම්බර් 31වැනි දායින් පසුව ඒ වෙනකොට තිබෙන තත්ත්වය අධ්‍යයනය කරලා අනිවාර්යයෙන්ම ලබා දිය යුතු සහනයක් තිබෙනවා නම් එය ලබා දෙන්න වැඩ කටයුතු කරනවා කියන එක මම සඳහන් කරන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු අමාත්‍යතුමනි,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, හැකි තරම් කෙටියෙන් පැහැදිලි කර ගැනීම කරගන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ ප්‍රශ්නය අහන්න පටන් ගත්ත වෙලාවයි, මම ඒ සඳහා අරගෙන තිබෙන වෙලාවයි ගැන. එම නිසා මට සාධාරණ විධියට කාලය ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය පිරිමහ ගන්න අවශ්‍යයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු අමාත්‍යතුමනි, මේ කාරණාව පිළිබඳව ගත්තොත්, මේක සහනාධාරයකට මුදල් වෙන් කළ දෙවැනි අවස්ථාව. මම මීට පෙර අවස්ථාවේ මේ ගැන කියනකොටත් ඔබතුමා කිව්වා, "මේක හදිසි තත්ත්වයක් මත අපි ගන්න තීන්දුවක්, මැද පෙරදිග තත්ත්වයත් එක්ක" කියලා. දෙවැනි අවස්ථාවේදීත් අපි මේ සහනාධාරය ලබා දෙනවා. අනිවාර්යයෙන් මේ සහනාධාරය තුන්වැනි අවස්ථාවේදීත් දෙන්න පුළුවන් ප්‍රතිශතය වැඩියි. මේ සහනාධාරය තුන්වැනි වරටත් දෙන්න වෙනවා, ලබන දෙසැම්බර් 31වැනි දායින් පසුව. ගරු අමාත්‍යතුමනි, අපි එක පැත්තකින් ඉන්ධන landing cost එකට වඩා, බද්දක් පනවලා මුදල් එකතු කරගෙන ආපහු සහනාධාරයක් හැටියට ඉන්ධන ලබා දෙනවා.

ගරු අමාත්‍යතුමනි, මම යෝජනා කරන්නේ මෙයයි. අපිට ඉන්ධන බෙදා හැරීමේදී QR code ක්‍රමයක් තිබෙනවා. මම හිතන විධියට, QR code ක්‍රමය නම් බොහෝ වෙලාවට දැන් භාවිත වන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, මේකේ තිබෙන වැදගත්කම මෙයයි. ඉදිරියේදී මහ කන්නයේ ගොවිතැන් පටන් ගන්නවා. ගොවීන්ට ගොවිතැන් කරන්න අක්කරයකට වැය වන වියදම ඩීසල් මිලත් එක්ක විශාල ප්‍රමාණයකින් ඉහළ යනවා. ඔබතුමන්ලා ලබා දෙන මේ සහනාධාරය ගොවි මහත්වරුන්ට එහෙම නැත්නම් ධීවරයන්ට එහෙම ඉලක්ක - target - කරලා දුන්නොත් production cost එකත් අඩු කරන්න පුළුවන්.

අද වනකොට මොකක්ද වෙන්නේ, ගරු අමාත්‍යතුමනි? විශාල කර්මාන්තශාලාවක් පවත්වාගෙන යන්න දවසකට ඩීසල් ලීටර් 2,000ක් ඕනෑ නම් ඒ සඳහාත් මේ සහනාධාරය ලබා දෙනවා. අද රේන්ජ් රෝවර් එකක් හරි, ලීටරයට කිලෝමීටර 3ක් යන්න පුළුවන් වාහනයක් හරි පදින මනුස්සයාටත් මේ සහනාධාරය ලබා දෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ සහනාධාරය ලබා දෙනකොට මීට වඩා target කරලා, ඒ සහනාධාරය ලැබෙන්න ඕනෑ අයට එය ලැබෙන්න සලස්වන්න කියායි මම කියන්නේ.

මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි මේ සහනාධාරය අනෙකුත් ආයතනවලට දෙන්න ඕනෑද? මොකද, market share එකෙන් සියයට 40ක් තිබෙන්නේ ඒගොල්ලන්ට නම්,- මම හිතන විධියට අපේ refinery එකෙන් අපට නිපදවන්න පුළුවන් බැරල් 35,000යි, අවශ්‍ය ප්‍රමාණයෙන්. එතකොට සියයට 50ක් වාගේ ප්‍රමාණයක් තමයි crude oil හැටියට ගෙනෙන්න පුළුවන්. ඉතිරි සියයට 50ට අනෙක් ආයතන අවශ්‍යයි. ඉතින්, මේක ප්‍රායෝගික - practical - system එකක් නොවෙයි කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

ගරු ලාල් කාන්ත ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මයිලත්තමඩු ප්‍රදේශයේ අපේ කිරි ගොවීන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් රැස්වීමක් පැවැත්වීම සඳහා ඔබතුමා තවම අපට වෙලාවක් දුන්නේ නැහැ. ඔබතුමා මැදිහත් වෙලා ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරන්න වෙලාවක් ලබා දෙනවාය කිව්වා. ඒ කටයුත්තත් කරලා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන කාරණය පිළිබඳව මම පිළිතුරේදීත් සඳහන් කළා. ඇත්තටම අපි සහනාධාර දීමේදී ඉලක්කගත සහනාධාර සඳහාම යොමු වෙනවා. ඒ වැඩ පිළිවෙළ හදා ගන්න බැරි වීම ගැන මම පැහැදිලි කළා. ඇත්තටම බාහිර සාධකයක් නිසා තමයි ඒ ගැටලුව පැන නැඟුණේ. නමුත් ඉදිරියේදීත් ඒක වෙන්න පුළුවන්. අපි ඒ සඳහා සාකච්ඡා කරමින් ඉන්නවා. ඔබතුමන්ලාගේත් අදහස් ඉදිරිපත් කරන්න. හොඳ ක්‍රමවේදයක් හදලා අපි එතැනට එමු.

ඒ වාගේම මේ පිරිවැය ආවරණය කර ගැනීමේදී අපි අනවශ්‍ය බදු පැනවීමක් කරලා තිබුණේ නැහැ. කලින් සිද්ධ වෙලා තිබුණේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අනවශ්‍ය පීඩනයක් එන විධියට ලබා ගත්ත ණය නිසා ඉදිරියට යන්න බැරි වෙලා තිබීමයි. අන්න ඒ ණය භාණ්ඩාගාරයට පවරා ගත්ත නිසා ඇති වෙච්ච රුපියල් බිලියන 980ක ප්‍රමාණය ආවරණය කර ගැනීම සඳහා කොටසක් එකතු කරලා මීසක් පවතින බදු ව්‍යුහයට අමතරව - අතිරේකව - බද්දක් එකතු කරලා නැහැ. මොකද, දැන් අපි

පවත්වාගෙන යන්නේ ආයතනය බිඳ නොවැටෙමින් පිරිවැය ආවරණය කර ගනිමින්. ඒකෙන් යම් ප්‍රමාණයක් මේ සුවිශේෂී අවස්ථාවේදී පාරිභෝගිකයා දරනවා; පොදුවේ අපි දරනවා. එතකොට මේ පිරිවැය ආවරණය කර ගන්නවා. ආයතනය ආරක්ෂා කර ගන්නවා. මොකද, අපට ඉන්ධන හිඟයක් පළමුකොටම ඇති නොවෙන්න ඕනෑ, එහි මිලට වඩා. ඒ නිසා අපි කිසිදු ආකාරයකින් හිඟයක් ඇති වෙන්න දෙන්නේ නැහැ.

ඒ වාගේම අනෙකුත් බෙදා හැරීමේ ආයතන පිළිබඳ කාරණය සම්බන්ධව ගත්තොත්, ඇත්තටම ඒ විවෘතකාරී වෙළෙඳ පොළ තුළ ඒවා බෙදා හැරීමට ඉඩකඩ තිබෙනවා. නමුත් මේ මොහොතේදී ඉතාම පැහැදිලිව පෙනුණු දේ තමයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රාජ්‍ය ආයතනය විධියට ඒ වගකීම කරට අරගෙන ඒ බෙදා හැරීම සිද්ධ කිරීම. ඒ නිසා තමයි අපේ market share එක පවා වැඩි වුණේ. එතැනදී අනෙක් පැත්තෙන් පෞද්ගලික ලාභය ගැන පමණක්ම හිතන අවස්ථාවකදී, පොදු අර්බුදයකදී මැදිහත් නොවීමත් පෙන්නුම් කරනවා. අපි රටක් වශයෙන් පොදු අර්බුදයක ඉන්නවා නම්, ඒ මැදිහත් වීම සිද්ධ වුණා නම්, තවත් පහසුවක් ඇති කරන්න ඉඩ තිබෙනවා. ඒ නිසා දැන් ඔවුන්ට නිදහස තිබෙනවා. පාඩු ලැබෙනවා කියලා හිතෙනවා නම් ඒ මිල වැඩි කර ගැනීමේ අවකාශය දීලා තිබෙනවා. ඒ අනුව ඔවුන් යම් මිල වැඩි කිරීමක් දැනටමත් සිද්ධ කරලා තිබෙනවා. කෙසේ වෙතත්, අපි ඉදිරියේදී සැලසුම් කරන්නේ, විශේෂයෙන්ම බලශක්ති උපයෝගිතාවලදී ඒ උපයෝගිතා අඛණ්ඩව ලබා දෙමින්, මිනිසුන්ට දරන්න පුළුවන් මිලකට එය ලබා දෙමින්, වැඩිපුර පීඩනයක් එනවා නම් මූල්‍ය උපාය මාර්ග භාවිත කරමින් ඒ පීඩනයට යම් ආකාරයක සහනයක් ලබා දෙන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

අමාත්‍යාංශ නිවේදන. 2026.11.03වන දින ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම, ගරු කේ.ඩී. ලාල් කාන්ත ඇමතිතුමා.

2026 මහ කන්නයේදී එල් නිනෝ බලපෑම්වලට මුහුණ දීම සඳහා ගනු ලබන පියවර: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2026 மகா போகத்தில் எல்நினோ தாக்கத்தை எதிர்கொள்வதற்கான நடவடிக்கைகள்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று

MEASURES TO ADDRESS THE IMPACT OF EL NINO DURING 2026 MAHA SEASON: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026.11.03වන දින ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුර ලබා දෙනවා. එල් නිනෝ තත්ත්වය කෘෂි කර්මාන්තය කෙරෙහි බලපෑම තමයි මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ. ඔක්කෝම ඒ සම්බන්ධ ප්‍රශ්න තිබෙන්නේ. පසුගිය පාර්ලිමේන්තු සභා වාරයේදී මම මේ සම්බන්ධව සම්පූර්ණ විස්තරයක් සහිතව විශේෂ ප්‍රකාශයක් ඉදිරිපත් කළා. නමුත් මම මේ ප්‍රශ්නයටත් උත්තර දෙන්නම්. ඔබතුමාගේ ප්‍රශ්නයේ සඳහන් වන "2026 මහ කන්නයේ වගාව" යන්න "2026-2027 මහ කන්නයේ වගාව" ලෙස නිවැරදි වෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

(1) අ. ඔව්.

ආ.
- රාජ්‍ය අංශයේ හා පෞද්ගලික ආනයනකරුවන් සමඟ සාකච්ඡාකොට 2026/27 මහ කන්නය සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය නිසි කලට ආනයනය කිරීමට සැලසුම් කිරීම.
- ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ රජයේ අවශ්‍යතාව ගණනයකොට ඒ අනුව අදාළ පොහොර වර්ග ආනයනය කිරීමට කටයුතු කිරීම.

  මේ වෙනකොටත් අවශ්‍ය තරම් පොහොර රටට ඇවිල්ලා තිබෙනවා.
- මෙහිදී ආනයනකරුවන් වැඩි ප්‍රමාණයක් සිටීම නිසා තරගකාරීත්වයක් නිර්මාණය වීම තුළින් සාධාරණ මිලක් යටතේ පොහොර ලබාදීමට හැකි වී තිබේ.

  ඒ සම්බන්ධ විස්තර පහත වගුවෙහි දැක්වේ.

2026.11.04 දිනට වෙළෙඳ පොළ තුළ පොහොර මිල ගණන්

පොහොර වර්ගය	ප්‍රධාන කාර්යාලයේ මිල (රුපියල්) (කිලෝග්‍රෑම් 50 ඇසුරුමක් සඳහා)		ගොවීන් වෙත අලෙවි කරනු ලබන මිල (රුපියල්) (කිලෝග්‍රෑම් 50 ඇසුරුමක් සඳහා)		රාජ්‍ය පොහොර සමාගම මඟින් ගොවි සංවිධාන වෙත ප්‍රවාහනය කර පොහොර ලබා දිය හැකි මිල (රුපියල්) (කිලෝග්‍රෑම් 50 ඇසුරුමක් සඳහා)
	රාජ්‍ය පොහොර සමාගම	අනෙකුත් සමාගම්	රාජ්‍ය පොහොර සමාගම	අනෙකුත් සමාගම්	
UREA	10,350.00	10,500.00	10,800.00	11,000.00	10,650.00
TSP	12,300.00	12,000.00	12,700.00	12,700.00	12,600.00
MOP	11,200.00	11,200.00	11,600.00	11,800.00	11,500.00

- තවද, 2026/27 මහ කන්නය සඳහා පොහොර සහනාධාරය වී සඳහා මෙන්ම කන්න රැස්වීම්වලදී තීරණය කරනු ලබන හා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශ කරනු ලබන කුඹුරු ඉඩම්වල වගා කරන වෙනත් ක්ෂේත්‍ර භෝග සඳහා ද හෙක්ටෙයාරයකට රුපියල් 30,000 වන සේ හෙක්ටෙයාර දෙකක උපරිමයකට පොහොර මූල්‍ය සහනාධාරය ලබාදීමට තීරණය කර, ගොවීන්ගේ වගා ක්ෂේත්‍ර පරීක්ෂා කර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ගොවීන් වෙත පොහොර සහනාධාරය ලබාදීම ආරම්භ කර ඇත.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(2) අ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අනුව ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සාමාන්‍යයට වඩා වැඩි වර්ෂාපතනයක් අපේක්ෂා කෙරේ. අපේක්ෂිත වර්ෂාපතනය සැලකිල්ලට ගනිමින් සැලසුම් කර ඇති මහ කන්නයේ වගා වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, වැඩිදියුණු කළ ජල කළමනාකරණ ක්‍රමවේදයන් හරහා පවතින ජල සම්පත් කාර්යක්ෂමව භාවිත කරනු ඇත. ජලාශවල ජල මට්ටම් නිරන්තරයෙන් නිරීක්ෂණය කෙරෙන අතර, පවතින සහ පුරෝකථනය කර ඇති වර්ෂාපතන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කන්නානුරූපීව ජලාශ මෙහෙයුම් සැලසුම්වලට අනුකූලව ජලාශ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.

මෙම පියවර මඟින් ජලාශවල ජල ගබඩාව ඵලදායී ලෙස කළමනාකරණය කිරීමටත්, පහළ ප්‍රදේශවල අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ජල නිකුතුවක් සහතික කිරීමටත් ජලාශවල සහ ඒ ආශ්‍රිත ව්‍යුහයන්ගේ ආරක්ෂාව සහ ස්ථායීතාව පවත්වා ගැනීමටත් සහාය වනු ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය සහ ගොවි සංවිධාන වැනි අදාළ සියලුම පාර්ශ්ව දැනුවත් කර 2026/27 මහ කන්නය ඔක්තෝබර් මාසය තුළදී ආරම්භ කිරීමට සැලසුම් සකස් කරන ලද අතර, මේ වන විට බොහෝ වාරි ව්‍යාපාරවල ජලය නිකුත් කිරීම් ආරම්භ කර ඇත. මහවැලි පද්ධතියේ බිම් සැකසීම් සියයට 80ක් පමණ ආරම්භ කර ඇත. තවද, එල් නිනෝ තත්ත්වයට පූර්ව සූදානම්වීම සහ සුළු වාරි මාර්ගවලට සිදු විය හැකි ගංවතුර හානි අවම කිරීමට සහ ඒ යටතේ ඇති වගාවන් ආරක්ෂා කිරීමට අදාළ වන උපදෙස් ඇතුළත් කර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස 08/2026 චක්‍රලේඛ අංක දරන 2026/27 එල් නිනෝ තත්ත්වය හමුවේ රටේ ආහාර සුරක්ෂිතතාව, සුළු වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම, ජල කළමනාකරණය, මෙහෙයුම් සහ නඩත්තු කිරීම, අධීක්ෂණ හා වාර්තාකරණය සඳහා වන උපදෙස් සහිත චක්‍රලේඛය නිකුත් කර ඇත. ඊට අමතරව,

i. ජලාශවල පවතින ජල ප්‍රමාණය මත වාරි ව්‍යාපාරවල මහ කන්නයේ වගා කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කිරීම සහ කන්න රැස්වීම්වල තීරණවලට අනුගතව කටයුතු කිරීම.

ii. ඉදිරි මහ කන්නයේ වගා කටයුතුවල කාලසටහන් සකස් කිරීමේදී පවතින ජල ප්‍රමාණය කාර්යක්ෂමව භාවිත කිරීම මෙන්ම ලැබෙන වර්ෂාපතනය උපරිමයෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි අදාළ කාලසටහන් සැකසීම.

iii. සියලුම වාරි ව්‍යාපාරවල තෙත් සහ වියළි, නැතහොත් මුර ජල ක්‍රමය භාවිත කිරීම.

iv. කෙටිකාලීන වී වර්ග මහ කන්නය තුළ වගා කිරීමෙන් ඉදිරි යල කන්නයට යම් ජල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට කටයුතු කිරීම.

v. ජලාශවල වාන් දොරටු නිසි පරිදි නඩත්තුකොට ඉදිරි මෝසම් වර්ෂාපතනයට සූදානම් කර තැබීම.

vi. ජලාශවල අත්‍යවශ්‍යම නඩත්තු කටයුතු නිම කර තබා ගැනීම.

vii. වාන් ඇළවල් ජල අපවහන පද්ධති පිරිසිදුකොට ජලය පහසුවෙන් බැස යන පරිදි සකසා තබා ගැනීම.

ආ. මහවැලි කලාපවලට අදාළව ජලය ප්‍රධාන වශයෙන් මහා වාරි හා කලාප තුළ පවතින කුඩා පරිමාණ වැව් මඟින් සපයා ගැනේ. ඊට අමතරව, කැණීම් කර ඇති හා බඳින ලද වගා ළිං 9,000කට ආසන්න ප්‍රමාණයක් කලාප තුළ විසිරී පවතින බැවින් එමඟින් භූගත ජලය සපයා ගැනීම සිදු කෙරේ.

අපේක්ෂිත ජල නිහ තත්ත්වයන් යටතේ ජල භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම, වගා වසුන් යොදා ගැනීමෙන් වාෂ්පීකරණය අවම කිරීම, ජල අවශ්‍යතාව අඩු බෝග හා කෙටි කාලීන බෝග හඳුන්වාදීම තුළින් ආහාර සුරක්ෂිතතාව ඇති කරලීම. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ක්ෂුද්‍ර ජල සම්පාදනය සඳහා සහනාධාර ලබා දීමේ ක්‍රමවේද යටතේ ගොවීන් මේ සඳහා දිරිමත් කිරීම සිදු කෙරේ.

නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී ඇතිවිය හැකි අධික වර්ෂාව හේතුවෙන් ඇති වන ගංවතුර තත්ත්වයට මුහුණ දීම සඳහා කන්නය ඔක්තෝබර් මස තුළදී ආරම්භ කිරීමට 2026 සැප්තැම්බර් 18වන දින ගන්නෝරුව ජාතික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ 2026/27 මහ කන්නය සඳහා විෂයභාර අමාත්‍යවරුන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යන ආයතනවල රාජ්‍ය නිලධාරීන්ගේ සහ ගොවි සංවිධාන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබූ ජල කළමනාකරණ රැස්වීමේදී තීරණය කරන ලදී.

මීට සමගාමීව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවදානම් සහගත දිස්ත්‍රික්ක 16ක තෝරාගත් නිලධාරීන් 150ක් පමණ පුහුණුකරුවන් ලෙස පුහුණු කර ඇති අතර, එම නිලධාරීන් මඟින් ක්ෂේත්‍ර නිලධාරීන් සහ ගොවි සංවිධාන මට්ටම දක්වා එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය දැනුම සහ උපදෙස් ලබා දීම මේ වන විටත් සිදු කරමින් පවතින අතර, එමඟින් පහත ක්ෂේත්‍ර ආවරණය කර ඇත.

අනු අංකය	පුහුණු වැඩසටහනේ අන්තර්ගත කරුණු
01	ඉදිරියේදී ඇති වන එල් නිනෝ තත්ත්වය පිළිබඳ හඳුන්වා දීම හා එමඟින් ශ්‍රී ලංකාවට ඇතිවිය හැකි බලපෑම.
02	සුළු වාරිමාර්ග නඩත්තු කටයුතු සහ ගංවතුර ආපදාවකදී සුළු වාරිමාර්ග ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය.
03	ජලය වැඩි/අඩු කාලයන්වලදී වී/අනෙකුත් වගාවන් ආරක්ෂාවට ගතයුතු ක්‍රියාමාර්ග.
04	තෙත් හා වියළි ආන්තරික ජල කළමනාකරණ ක්‍රමය හඳුන්වා දීම හා එය ක්ෂේත්‍රයේ සිදු කරන ආකාරය පිළිබඳ පුහුණුව.
05	වී වගාවේ ඵලදායී බව ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා තාක්ෂණික ක්‍රමවේද.

(3) එල්නිනෝ කාලගුණික විපර්යාස පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කොට්ඨාස කළමනාකරණ කාර්යාල 48ක් හා ඒකක කළමනාකරණ කාර්යාල 268ක් යටතේ පවතින ගොවි සංවිධාන 1,121ක ප්‍රමාණ ඒකකයේ සභය කමිටු කොට්ඨාස අනුකමිටු හා ව්‍යාපාර කමිටු මට්ටමින් අවස්ථා ගණනාවකදී දැනුවත් කිරීම් සිදු කර ඇත. එමෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ වැඩසටහනක් ලෙස එම නිලධාරීන් සම්බන්ධ වෙමින් ගොවීන් කණ්ඩායම් ලෙස මෙම කාලගුණික වෙනස්වීම් පිළිබඳ දැනුවත් කර ඇති අතර, එහිදී තම වගාවන් ආරක්ෂා කර ගනිමින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී. එමෙන්ම, පවුලේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමේ අරමුණින් ගෙවතු සංවර්ධන වැඩසටහන පිළිබඳව ඒකක මට්ටමින් සියලු ගොවීන් දැනුවත් කර එම වැඩසටහන ආරම්භ කර ඇත.

2026 සැප්තැම්බර් 18වන දින ගන්නෝරුව ජාතික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ 2026/27 මහ කන්නය සඳහා ජල කළමනාකරණ රැස්වීම් විෂය භාර අමාත්‍යවරුන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික පොහොර ලේකම් කාර්යාලය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යන ආයතනවල රාජ්‍ය නිලධාරීන්ගේ සහ ගොවි සංවිධාන නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. එහිදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් එල්නිනෝ තත්ත්වය පිළිබඳව දැනුවත් කළ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් අවශ්‍ය කෘෂි තාක්ෂණික උපදෙස් පිළිබඳව සියලුම ගොවි සංවිධාන නියෝජිතයන් දැනුවත් කරන ලදී. අනතුරුව, රාජ්‍ය නිලධාරීන් සහ ගොවි සංවිධාන නියෝජිතයින් ඒ ඒ වාරි ව්‍යාපාරවල කන්න රැස්වීම්වලදී මෙම තොරතුරු සියලුම ගොවි මහතුන් වෙත ලබා දෙනු ඇත. එල්නිනෝ කාලගුණික විපර්යාස පිළිබඳව සහ ඊට අදාළව දෙපාර්තමේන්තු මට්ටමින් ලබා දිය හැකි තාක්ෂණික උපදෙස් සම්බන්ධයෙන් සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන නිලධාරීන් ඇතුළු අදාළ සියලු පාර්ශ්වයන් දැනුවත් කර ඇත. ඊට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් විසින්ද මේ සම්බන්ධයෙන් ඔවුන් විසින් ලබා දිය යුතු තාක්ෂණික උපදෙස් අදාළ පාර්ශ්ව වෙත ලබා දීම සිදු කර ඇත.

(4) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වී, බඩ ඉරිඟු, ලොකු ලූනු, අර්තාපල්, සෝයා, මිරිස් යන භෝග සඳහා පෙර වර්ෂවලදී මෙන්ම එල්නිනෝ තත්ත්වයන් යටතේ හානි වුවහොත් කඩිනමින් තක්සේරු කර වන්දි මුදල් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)

පැහැදිලි කර ගැනීම ඉතාම කෙටියෙන් කරන්න, ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் முக்கியமான விடயம் தொடர்பில் நடவடிக்கை எடுத்தமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு எனது நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக, விவசாயிகளையும் விவசாய நிலங்களையும் பாதுகாப்பதற்கு முன்னோடியான நடவடிக்கைகளை எடுத்தமைக்கு நன்றிகள்!

அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற அக்கரைப்பற்று, பொத்துவில், நிந்தவூர், இறக்காமம், அட்டாளைச்சேனை, சம்மாந்துறை போன்ற பிரதேசங்களில் ஏற்கனவே மகாபோக வேளாண்மைச் செய்கையை ஆரம்பித்துவிட்டார்கள். மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்களில் பயிர்ச்செய்கை ஆரம்பிக்கப்பட்ட பின்னர்தான் பொலன்னறுவை மாவட்டத்தில் பயிர்ச்செய்கையை ஆரம்பிப்பார்கள். பொலன்னறுவை மாவட்டத்தின் காலநிலைக்கு ஏற்ப அரசாங்கத்தின் மானிய விலையிலான உரம் - fertilizer - விநியோகிக்கப்படுவதால், சில நேரங்களில் எங்களுடைய மாவட்ட விவசாயிகளால் உரிய நேரத்துக்கு அந்த உரத்தைப் பெற்றுக்கொள்ள முடியாத நிலை ஏற்படுகின்றது. மேலும், 'தித்வா' அனர்த்தம் காரணமாக வாகனேரி - பொத்தானை அணைக்கட்டு, வாகனேரி - அக்குரான அணைக்கட்டு, திரவியடுமடு குளக்கட்டு என்பன பாதிக்கப்பட்டு இருக்கின்றன. அவற்றைச் சீர்செய்வதனூடாக பல்லாயிரக்கணக்கான ஏக்கர் நிலத்தில் வேளாண்மை செய்ய முடியும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இவை தொடர்பில் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා යොමු කරපු ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ඔබතුමාගේ ප්‍රශ්නය ආශ්‍රිතව පොදු පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

පොහොර හිඟයක් තිබෙනවා, පොහොර ලබා ගැනීමට අපහසු වෙනවා කියලා ගොවි නායකයන් යැයි කියා ගන්නා ඇතැම් අය මාධ්‍ය සාකච්ඡා කියලා විවිධ මත ඉදිරිපත් කරනවා. ඒ නිසා පළමුවෙන්ම කියන්න ඕනෑ, පොහොර හිඟයක් නැති බව සහ අවශ්‍ය ප්‍රමාණයට හා අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා පොහොර තිබෙන බව. යූරියා ගත්තොත්, අපට සාමාන්‍යයෙන් මහ කන්නයට අවශ්‍ය වන්නේ මෙට්‍රික් ටොන් 180,000ක්; වී වගාවට මෙට්‍රික් ටොන් 120,000ක්, අනෙකුත් භෝගවලට මෙට්‍රික් ටොන් 60,000ක්. එතකොට අපි මේ වනකොට පොහොර මෙට්‍රික් ටොන් 33,000කට වැඩි ප්‍රමාණයක් නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම ගබඩාවල තිබෙනවා, මෙට්‍රික් ටොන් 42,000කට වැඩි ප්‍රමාණයක් හෙවත් 42,486ක්. මේ වනකොට නැව් තුනක පොහොර ගොඩබාමින් තිබෙනවා. ඒවා මේ වනකොට රටට ඇවිල්ලායි තිබෙන්නේ. ඒ නැව් තුනේම පොහොරවල එකතුව මෙට්‍රික් ටොන් 98,700ක් වනවා. ඊළඟට, මේ මාසයේ අග සහ දෙසැම්බර් මාසයේ මුල තවත්

[ගරු නාමල් කරුණාරත්න මහතා]

පොහොර මෙට්‍රික් ටොන් 44,000ක් එන්න නියමිතයි. ඒ අනුව රට තුළ පොහොර මෙට්‍රික් ටොන් 218,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. එහෙම නම්, යූරියා පොහොරවල හිහයක් නැහැ.

අපට මඩ පොහොර - TSP පොහොර - අවශ්‍ය වන්නේ මෙට්‍රික් ටොන් 25,000යි. ඒ අනුව දැනට රට තුළ නිදහස් කරලා තිබෙනවා, නිකුත් කරලා තිබෙනවා, TSP පොහොර මෙට්‍රික් ටොන් 4,396ක්. මඩ පොහොරවලට විකල්පයක් විධියට ගන්නා SSP පොහොර මෙට්‍රික් ටොන් 511ක් නිදහස් කරලා තිබෙනවා. ඒ අනුව අපට TSP පොහොර මෙට්‍රික් ටොන් 21,168කුත්, SSP පොහොර මෙට්‍රික් ටොන් 10,311කුත් වශයෙන් මෙට්‍රික් ටොන් 31,479ක පොහොර තොගයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපට අවශ්‍ය වන්නේ, පොහොර මෙට්‍රික් ටොන් 25,000ක ප්‍රමාණයක්. ඒ අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා තිබෙනවා.

ඊළඟ එක, බණ්ඩි පොහොර. ඒවා අවසානයට තමයි අවශ්‍ය වෙන්නේ. මේ වනකොට මෙට්‍රික් ටොන් 5,000කට වැඩි ප්‍රමාණයක් නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේම මෙට්‍රික් ටොන් 50,500ක ප්‍රමාණයක් මේ වනකොට ගබඩාවල තිබෙනවා. මේ මාසයේ අග වනකොට, දෙසැම්බර් මුල වනකොට මෙට්‍රික් ටොන් 2,000ක් ඒමට නියමිතයි. ඒ අනුව මෙට්‍රික් ටොන් 57,500ක පොහොර ප්‍රමාණයක් රට තුළ තිබෙනවා. අපට අවශ්‍ය වන්නේ ඒ ප්‍රමාණයයි. ඒ අනුව ප්‍රමාණවත් පොහොර තොග රට තුළ තිබෙන බව අපි මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම ඔබතුමා මතු කරපු කාරණයට අදාළව ගත්තොත්, ඇත්තටම පොහොර මුදල් නිදහස් කිරීමේ කටයුතු මේ වනකොට වේගයෙන් කරගෙන යනවා. එම මුදල් දැන් එකවර නිදහස් කරනවා. පසුගිය කන්නයේ වට දෙකකින් තමයි නිදහස් කළේ. මෙවර හෙක්ටෙයාර දෙකක් සඳහා - අක්කර පහක් සඳහා - එක ගොවියකුට රුපියල් 60,000ක් වෙන් කරනවා. කන්න රැස්වීමේ තීන්දුවක් අනුව, වී වගාව හැරුණු කොට තවත් අමතර බෝග 12ක් සඳහා වී වගාවට දෙන සහනාධාරයම ඒ ප්‍රමාණයෙන්ම ලබා දෙනවා. ඒ, වී වගා කරන ඉඩම්වලම එම භෝග වගා කරන ගොවීන්ටයි. ඒ අනුව පොහොර සහනාධාර මුදල් ටික මේ වන කොට ඉතාම වේගයෙන් ගිණුම්ගත කරන්න පටන්ගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණාවත් අපි විශේෂ අවධානයට යොමු කරන්නම්. මොකද, එහි පමාවක් සිදු වෙනවා කියන කාරණය මතු කළා.

වාරිමාර්ග සම්බන්ධයෙනුත් ඔබතුමා මෙතැනදී කාරණයක් මතු කළා. අපි අමාත්‍යාංශය විධියට ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය. 2026.10.23 දින ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම, ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා.

ජපානයේ පැවැත්වෙන 20වන ආසියානු ක්‍රීඩා උළෙල සඳහා වන ශ්‍රී ලංකා කණ්ඩායමට ෆාතිමා ශෆියා යාමීක් ඇතුළත් කර නොගැනීම: තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஜப்பானில் நடைபெற்ற 20ஆவது ஆசிய விளையாட்டுப் போட்டிக்கான இலங்கை அணியில் பாத்திமா ஷாபியா யாமிக் உள்வாங்கப்படாமை: இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரினது கூற்று

NON-INCLUSION OF FATHIMA SHAFIYA YAMIK IN SRI LANKAN CONTINGENT FOR 20TH ASIAN GAMES HELD IN JAPAN: STATEMENT BY MINISTER OF YOUTH AFFAIRS AND SPORTS

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026.10.23 දින ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ශ්‍රී ලංකා මලල ක්‍රීඩා - Sri Lanka Athletics - විසින් ආසියානු ක්‍රීඩා සඳහා තෝරා ගැනීමට යොදාගත් නිර්ණායක ඇමුණුම 01* ලෙස ඉදිරිපත් කරලා තිබෙනවා.

(ආ) 2025 වසරේදී ශෆියා යාමීක් ක්‍රීඩිකාව විසින් දක්වා තිබූ දක්ෂතා අනුව ඇය දිගු ලේඛනයට ඇතුළත් වූ නමුත්, ඉන් අනතුරුව 2026 වසරේ දැක්වූ දක්ෂතා ආසියානු ක්‍රීඩා සඳහා වූ අවසන් ලැයිස්තුවට - final list එකට - ඇතුළත් කිරීමට ප්‍රමාණවත් නොවූ බව දක්ෂතා ලේඛනය අනුව පැහැදිලිව පෙනේ. ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය විසින් තීරණය කර ඇති පරිදි 2026 ආසියානු කාන්තා මීටර් 100 තරගය සඳහා අවම පරිසාධන මට්ටම තත්පර 11.40ක් වන අතර, මෙම ක්‍රීඩිකාවගේ 2026 වර්ෂයේ මීටර් 100 තරගය සඳහා දක්වා ඇති උපරිම දක්ෂතාව තත්පර 11.71කි.

(ඇ) 2026 වසරේදී ආසියානු ක්‍රීඩා සඳහා සහභාගි කරවීමට 2026 වසරේ ඇයගේ දක්ෂතා ප්‍රමාණවත් නොවූ බව පෙන්වා දිය හැකිය.

(ඈ) ඕනෑම ක්‍රීඩකයකු හෝ ක්‍රීඩිකාවක විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීම් අප විසින් මලල ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලබාදෙන අතර, සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් අදාළ ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව ඇතුළත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

(ඉ) සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා මලල ක්‍රීඩා වෙබ් පිටුව හා Facebook පිටුව මඟින් දැනුවත් කිරීම් සිදු කරන අතර, ඉදිරියේදී විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. ලංකාවේ තේරීම් කටයුතුවලදී හැම දාම විශාල ගැටලු මතු වෙනවා, විශේෂයෙන්ම ක්‍රීඩා සංගම්වලින් කරන favouritism කියන කාරණයත් එක්ක. ඉදිරියේදී මේ සඳහා නීතිමය වශයෙන් ක්‍රියා කිරීමේ සහ නීතිමය ප්‍රතිපාදන සැලැස්වීමේ වගකීම අමාත්‍යවරයා විධියට මම භාර ගන්නවා.

(ඊ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීම කෙටියෙන් කරන්න.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(මාණ්පුමිකු කේ. කාදර් මස්තාන්)
(The Hon. K. Kader Masthan)
කෞරව කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, පතිලළිත්තමෛක්කු කෞරව අමෛච්සර් අවර්කළුක්කු නන්රි කූරුකින්රේන්.

සිරන්තතොරු වීරාංගනෛ එන්ර අටිප්පටෛයිල්, පාත්තිමා ෂාපියා යාමික් අවර්කළුක්කු ඉතු තොටර්පිල් නේරකාලත්තෝටු අරිවිත්තිරුක්කලාම්. තිරමෛයානවර් ඉන්ත මුරෛ පුරක්කණික්කප්පට්ටු ඉරුක්කිරාර් එන්ර සෙය්දි social media ඌටාක පරප්පප්පට්ට පිරකුතාන් අවර් ඉතු පර්රි අරින්දිරුක්කිරාර්. අතර්කුප් පිරකුතාන්, අවර් නේරටියාකත් තොටර්පුකොණ්ටු ඉතු පර්රි අරින්තුකොණ්ටතාකත් තෙරියවරුකිරතු.

කෞරව අමෛච්සර් අවර්කළේ, අවරුටෛය තිරමෛ පින්නර් කුරෛන්තුවිට්ටතාක නීංකළ් සෙන්නීර්කළ්. මේලුම්, අතු තොටර්පාන අළවීටුකළෛයුම් ඉණෛත්තිරුප්පතාකච් සොන්නීර්කළ්. මුන්නෛය වරුටම් සිරන්ත මුරෛයිල් තනතු තිරමෛයෛ අවර් වෙළිප්පටුත්තිනාර්. තිටීරෙන weakආකාමල් තොටර්ච්සියාකප් පයිර්සිකළෛක් කොටුත්තු අවරෛ මුන්නෝක්කික් කොණ්ටුසෙන්රිරුන්තාල් නන්රාක ඉරුන්තිරුක්කුමෙන නාන් නිනෛක්කින්රේන්. ඒනෙනිල්, කටන්ත කාලංකළිල් අව්වාරු නටක්කවිල්ලෛ. ඉව්වාරු පුකළ්පෙට්ට වීර, වීරාංගනෛකළ් තිටීරෙන පින්නටෛයුම්පෝතු - ඔරු වරුටත්තිල් සෝපිත්තුවිට්ටාර්කළ් එන්රු සොල්ලුම්පෝතු - විළෛයාට්ටිල් ඊටුපට ආර්වමාකවුළ්ළ ඒනෛය වීර, වීරාංගනෛකළ් මුන්වරුවතු කුරෛවටෛයුම්. එනවේ, ඉතනෛ නිවර්ත්ති සෙය්යුම් විතත්තිල් උරිය නටවටික්කෛකළෛ එටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්.

පොතුවාක ඉව්වාරාන විළෛයාට්ටුප් පෝට්ටිකළුක්කු කොළුම්පු, කම්පහා, කණ්ඩි, කළුත්තුරෛ පෝන්ර මාවට්ටංකළිල් ඉරුන්තුතාන් කූටුතලානවර්කළ් තෙරිවු සෙය්යප්පටුකින්රාර්කළ්. වටක්කු, කිළක්කු මාකාණංකළිල් එංකළුටෛය වන්නිප් පකුතියිලුළ්ළ වවුනියා, මන්නාර්, මුල්ලෛත්තීවු පෝන්ර මාවට්ටංකළිලිරුන්තු ඉවර්කළ් තෙරිවු සෙය්යප්පටුවතු කුරෛවු. නාන් එන්න සොල්ල වරුකිරේන් එන්රාල්, තිරමෛක්කුත්තාන් මුක්කියත්තුවම් කොටුක්ක වේණ්ටුම්. තිරමෛයානවර්කළ් එංකළුටෛය පකුතිකළිලුම් ඉරුක්කිරාර්කළ්. අවර්කළුක්කුප් පෝතියළවු පයිර්සිකළුම් පයිර්රුවිප්පාළර්කළුම් ඉල්ලාතතාල්තාන් අවර්කළ් තංකළතු තිරමෛකළෛ වෙළිප්පටුත්ත මුටියාමල් ඉරුක්කිරාර්කළ්. ඉන්ත නිලෛයෛ මාර්රුවතර්කු නීංකළ් එන්න පොරිමුරෛයෛ ඒර්පටුත්ති ඉරුක්කිරීර්කළ් එන්පතෛත් තෙළිවුපටුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්.

ඉන්ත විනාවුටන් නේරටියාකච් සම්පන්තම් ඉල්ලාත ඔරු විටයම් තොටර්පිලුම් කේට්ක විරුම්පුකින්රේන්. Line Ministryආල් ඔරු playgroundක්කු Rs. 5 million - 50 ඉලට්සම් රූපාය් - නිති ඔතුක්කීටු සෙය්යප්පට්ටු, මන්නාර් මාවට්ටත්තිල් 7 පාටසාලෛ මෛතානංකළුම්, වවුනියා මාවට්ටත්තිල් 5 පාටසාලෛ මෛතානංකළුම්, මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් 5 පාටසාලෛ මෛතානංකළුම් අපිවිරුත්ති සෙය්වතර්කාකත් තෙරිවු සෙය්යප්පට්ටු ඉරුක්කින්රන. නිති ඔතුක්කීටු සෙය්තු, එල්ලා පාටසාලෛ මෛතානංකළෛයුම් අපිවිරුත්ති සෙය්ය වේණ්ටිය තේවෛ ඉරුක්කිරතු. ඉතර්කෙන තෙරිවුසෙය්යප්පට්ට පාටසාලෛකළ් තොටර්පිල් නාංකළ් කුරෛ සොල්ලවිල්ලෛ. ආනාල්, මේර්කුරිත්ත මූන්රු මාවට්ටංකළිලුම් ඉතේ තේවෛ ඉරුක්කින්ර ඔරු සමූකම් සාර්න්ත පාටසාලෛකළ් තෙරිවු සෙය්යප්පටවිල්ලෛ එන්පතු කවලෛක්කුරිය විටයමාකුම්.

ඔරු සමූකම් තොටර්න්තු පුරක්කණික්කප්පටුකින්රතා? එන්ත අටිප්පටෛයිල් පාටසාලෛකළෛත් තෙරිවු සෙය්තාලුම්, ඒන් ඉව්වාරාන පිළෛකළ් ඒර්පටුකින්රන? ඉතු පර්රි කේට්ටාල්, මාකාණ අමෛච්සුතාන් තෙරිවුසෙය්තතු එන්රු සොල්කිරාර්කළ්. අතිකාරිකළිටම් කේට්ටාල්, ඉතු පර්රි තංකළුක්කුත් තෙරියාතු එන්රු සොල්කිරාර්කළ්. අරසියල්වාතිකළිටම් කේට්ටාල්, අතිකාරිකළින් තෙරිවු එන්රු සොල්කිරාර්කළ්. ඉතර්කාන නටෛමුරෛයෛ ඔළුංකාකක් කෛයාණ්ටිරුන්තාල් ඉව්වාරාන පුරක්කණිප්පු ඒර්පට්ටිරුක්කාතු. එනවේ, එතිර්කාලත්තිල් ඉව්වාරාන පුරක්කණිප්පුකළ් නටෛපෙරාමල්, අනෛත්තු සමූකත්තෛච් සාර්න්ත පාටසාලෛකළුම් ඉව්වාරාන සෙයර්රිට්ටංකළිල් උළ්වාංකප්පට වේණ්ටුමෙන කෞරව අමෛච්සර් අවර්කළෛක් කේට්ටුක්කොළ්කින්රේන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් පිළිතුර ලබා දෙන්න.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(මාණ්පුමිකු සුනිල් කුමාර කමකේ)
(The Hon. Sunil Kumara Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා මේ යොමු කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇත්තටම අපි දිගටම සාකච්ඡා කළා. රටක ජාතික කණ්ඩායම්වලට ක්‍රීඩකයෝ තෝරනකොට දිස්ත්‍රික්කය පදනම් කරගෙන හරි ජාතිය පදනම් කරගෙන හරි ආගම පදනම් කරගෙන හරි තෝරන්න බැහැ. ජාතික කණ්ඩායම්වලට ක්‍රීඩකයෝ තෝරන්නේ ඒ ක්‍රීඩකයන්ගේ දක්ෂතාව මත පමණයි. ඒකට ඉගෙනුම ලැබූ පාසල, දිස්ත්‍රික්කය යනාදි වෙන මොනවත් අදාළ වෙන්නේ නැහැ. එම නිසා විශේෂයෙන් වවුනියාව දිස්ත්‍රික්කයෙන් තෝරා ගන්නේ, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් තෝරා ගන්නේ කියලා ජාත්‍යන්තර තරගවලට ක්‍රීඩකයෝ තෝරා ගන්න බැහැ. ඒක තමයි ක්‍රීඩාවේ පොදු නීතිය.

ඒ වාගේම ජාතික කණ්ඩායම්වලට ක්‍රීඩකයෝ අමාත්‍යාංශයෙන් තෝරන්නේත් නැහැ. එම ක්‍රීඩකයෝ තෝරන්නේ ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා සංගමයේ තේරීම් කමිටුවෙන්.

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

උදාහරණයක් ගත්තොත්, මලල ක්‍රීඩාවලට අදාළ තරගකරුවන් තෝරන්නේ ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ තේරීම් කමිටුවෙන්. ඊට පසුව එම ලැයිස්තුව ජාතික තේරීම් කමිටුවට ඉදිරිපත් කරනවා. ජාතික තේරීම් කමිටුවෙන් නිර්දේශ කළාට පසුව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කරනවා. එතුමාගේ නිර්දේශයත් ලැබුණාට පසුව තමයි අමාත්‍යතුමාගේ නිර්දේශයට එන්නේ. විශේෂයෙන්ම රටින් එළියට යන එකට අදාළව නිර්දේශයක් තමයි මම දෙන්නේ. මම ක්‍රීඩකයෝ තෝරන්න යන්නේ නැහැ. එම නිසා ක්‍රීඩකයෝ අමාත්‍යාංශයෙන් තෝරනවාය කියන එක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක නොමඟ යැවීමක්. කවදාවත් අමාත්‍යාංශයෙන් ක්‍රීඩකයෝ තෝරන්නෙත් නහැ. එහෙම තෝරන්න වගකීමක් සහ බලයක් ඇත්තෙත් නැහැ. ඒක තමයි භූමියේ තිබෙන යථාර්ථය.

හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට ක්‍රීඩකයන් තෝරා ගැනීමේදී ක්‍රීඩා සංගම්වල තේරීම් කමිටුවල ඉන්න නිලධාරීන් යම් යම් අසාධාරණකම්, favouring නොකරනවා නොවෙයි. ඒවා ගැන අපි ප්‍රශ්න කරනවා. මොකද, දේශපාලන අධිකාරිය විධියට ඒ සඳහා අපට අයිතියක් තිබෙනවා. අපි මහජනතාවගේ බදු මුදල් වියදම් කරන්නේ. එම නිසා කවුරුන් හෝ ක්‍රීඩකයෙකුට අසාධාරණයක් වුණාම ඒ පිළිබඳව සොයා බලන්න සහ ප්‍රශ්න කරන්න අපට අයිතියක් තිබෙනවා. ඒක political influence එකක් නොවෙයි. ඒ වගකීම අපි ඉෂ්ට කරනවා. මම ෆාතිමා *ශඝියා* යාමීක් ක්‍රීඩිකාව එක්ක පෞද්ගලිකවත් කථා කරලා තිබෙනවා. ශඝියාගේ training ගැන මම ශඝියා එක්ක වෙනමම කථා කරලා තිබෙනවා. ඒක ශඝියා දන්නවා. මෙම තරගාවලියට තේරීමේදීත් ඒ තෝරා ගත් ආකාරය තමයි ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය සහ NOC එක දිගින් දිගටම පැහැදිලි කළේ. ඉතින්, මෙය තමයි ගරු මන්ත්‍රීතුමාට දෙන්න තිබෙන පිළිතුර.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී යෝජනා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5, 6 සහ 7 පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 24(2)හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2026 නොවැම්බර් 12 බ්‍රහස්පතින්දා අ. භා. 1.30 වනතෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 7 දක්වා වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනා - පා. 130/2026, පා. 133/2026, පා. 4/2024, පා. 103/2025, පා. 56/2025 සහ පා. 79/2025 - ඉදිරිපත් කිරීම.

පළමුවන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව, පා. 130/2026 ඉදිරිපත් කිරීමට, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
தனி நபர் பிரேரணைகள்
PRIVATE MEMBERS' MOTIONS

පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම
புத்தளம் புகையிரதப் பாதையில் புகையிரத சேவைகளின் எண்ணிக்கையை அதிகரிப்பதற்கான வேலைத்திட்டம் ஒன்றைத் தயாரித்தல்
FORMULATION OF A PROGRAMME TO INCREASE TRAIN SERVICES ON THE PUTTALAM RAILWAY LINE

[අ.භා. 12.10]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මැද පෙරදිග කලාපයේ මේ වන විට උද්ගත වී ඇති වාතාවරණය මත ඉන්ධන මිල ඉහළ යෑමේ තත්ත්වය හමුවේ මහජනයා විශාල වශයෙන් පොදු ප්‍රවාහන සේවා වෙත නැඹුරු වීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන හෙයින් ද, දිනපතා විශාල පිරිසක් රාජකාරී හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා පුත්තලම මාර්ගයේ ගමන් ගන්නා හෙයින් ද, එම මගී ජනතාවට ප්‍රමාණවත් සේවාවක් ලබා දීම සඳහා පුත්තලම-කොළඹ අතර දුම්රිය ධාවනය ඉහළ දැමීමට වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොළඹ සිට දිවෙන පුත්තලම දුම්රිය මාර්ගය සම්බන්ධයෙන් අද දවසේ අදහසක් ඉදිරිපත් කිරීමට මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම අපි දන්නවා, මේ වනකොට මැද පෙරදිග තිබෙන තත්ත්වයත්, ඒ වාගේම රටේ ආර්ථික තත්ත්වයත් සමඟ ඉන්ධන භාවිතය අඩුවීම නිසා පෞද්ගලික වාහන භාවිතය එන්න එන්න අවම වී ගෙන යන බව. ඒ වාගේම පොදු ප්‍රවාහන සේවයට තිබෙන ඉල්ලුම වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ ප්‍රදේශයේ රැකියාව කරන පුත්තලම, හලාවත, වෙන්නප්පුව, නාත්තණ්ඩිය කියන මේ සියලු ප්‍රදේශවල ජනතාවගේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය විධියට අවුරුදු ගණනාවක සිට දුම්රිය යොදා ගන්නවා.

මේ වෙලාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ දුම්රිය මාර්ගයට මේ වසරේදී අවුරුදු 100ක් පිරෙනවා කියන කාරණය. 1926දී තමයි පුත්තලම දුම්රිය මාර්ගය පුත්තලම දක්වා හදලා ඉවර කළේ. එතකොට මේ මාර්ගය අවුරුදු 100ක් පැරණියි. ඒ වාගේම මතක් කරන්න ඕනෑ, මේ තිබෙන දුම්රිය ස්ථානත්, ඒවායේ පහසුකම් පවා අවුරුදු 100ක්ම පැරණි බව. එම නිසා ඒවා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව අවුරුදු 100කට පසුව දැන් පැන නැඟිලා තිබෙනවා. මේ අවුරුද්දට මේ දුම්රිය මාර්ගයට ශත වර්ෂයක් පිරෙන බව නැවතත් මම මතක් කරනවා.

මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ, දුම්රිය සේවාව ආශ්‍රිත පහසුකම් දියුණු කිරීම සම්බන්ධයෙන් කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. දුම්රිය ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීම, railway stationවල, දුම්රිය මාර්ගවල, අනෙකුත් සේවා ඇතුළු සියලු දේවල්වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා තමයි මේ පාර්ලිමේන්තුවට මා යෝජනා කරන්නේ. ඇත්තෙන්ම අපි බැලුවොත්, පසුගිය ටිකේ පත්තරවලත් මේ තොරතුරු පළ වුණා.

වයික්කාල, කාක්කපල්ලිය වාගේ දුම්රිය ස්ථාන බැලුවොත්, ඒවා විශාල වශයෙන් ගරා වැටිච්ච දුම්රිය ස්ථාන. වයික්කාල දුම්රිය ස්ථානය මම දැක්කා, ඇත්තටම මම එතැනට ගිහිල්ලාත් බැලුවා. ඒකේ platform එකත් යම් යම් තැන්වල ගිලා බැහැලා තිබෙනවා. ඒ වාගේ අඩුපාඩු එතැන තිබෙනවා. ඒවා සොයා බලා හදන්නට අවශ්‍යයි. කාක්කපල්ලිය දුම්රිය ස්ථානය නම් ආරංචි විධියට බොහෝ සේ ගරා වැටිලා තිබෙනවා. ඒකත් හදන්න අවශ්‍යයි. මම හිතන විධියට නෙළුම් පොකුණ ප්‍රදේශය අපේ හිරුනි මන්ත්‍රීතුමියගේ ගම් ප්‍රදේශය වෙන්න ඕනෑ. එතුමිය ඒ දුම්රිය ස්ථානය අලුත්වැඩියා කරලා යම් වැඩසටහනක් කළා. ඒකට එතුමියට ස්තුතිවන්ත වනවා. ඉතාම සන්තෝෂයි, ඒ ගැන. ඒ දුම්රිය ස්ථානය දවසක ආදායම රුපියල් 3,000ක්, 4,000ක් විතර තිබෙන ස්ථානයක්. ඇත්තටම ඊට වඩා ගොඩක් කාර්ය බහුල දුම්රිය ස්ථාන තිබෙනවා. ඒවා කෙරෙහිත් අවධානය යොමු කරන්න කියා මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම උදේ 8-10 අතර කාලයේදී කොළඹට එන්න සිද්ධ වුණොත්, ඒ සඳහා දුම්රියක් මේ දුම්රිය මාර්ගයේ මේ වනකොට ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් කිහිපදෙනෙක් කරුණු යොමු කළා. ඒකත් මම මතක් කරන්නට කැමැතියි. ඒ වාගේම ශීඝ්‍රගාමී - express - දුම්රිය දෙකක් මේ මාර්ගයේ ධාවනය වනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ මාර්ගයේ ශීඝ්‍රගාමී දුම්රිය දෙකක් ධාවනය වුණත් උප දුම්රිය ස්ථානවල ඒවා නවත්වන්නේ නැහැ. ඒක පැහැදිලියි. ඒක අපි දන්නවා. හැබැයි, වයික්කාල දුම්රිය ස්ථානය පිහිටා තිබෙන්නේ ප්‍රධාන පාර ආසන්නයේ. හරියටම ගත්තොත් පාරයි, දුම්රිය ස්ථානයයි එකට තිබෙන්නේ. එය උප දුම්රිය ස්ථානයක් වුණත්, ශීඝ්‍රගාමී දුම්රිය වයික්කාල දුම්රිය ස්ථානයේ නවත්වන්න කියලා විශාල වශයෙන් ඉල්ලීම් තිබෙනවා. මොකද, එතැනින් මිනිස්සුන්ට දුම්රියට ගොඩ වෙන්න ඉතාම පහසුයි. අනික් දුම්රිය ස්ථානවලට ටිකක් ඇතුළට යන්න සිද්ධ වනවා. ඉතින් ඒකත් මේ වෙලාවේ මම මතක් කරන්නට ඕනෑ.

අවසාන වශයෙන් මම මතක් කරනවා, මීගමුව දක්වා තිබෙන ද්විත්ව දුම්රිය මාර්ගයත් හලාවත දක්වා වැඩිදියුණු කරන්න පුළුවන් නම් හොඳයි කියන එක. මොකද අපි දන්නවා, දුම්රියේ සියයට 40ක් විතර මගීන් සිටිය යුතු අවස්ථාවලත් සියයට සියයක ප්‍රමාණයට දුම්රිය මගීන්ගෙන් පිරී යනවා කියන කාරණය. හැබැයි, මෙම දුම්රිය ජා-ඇළ, රාගම ප්‍රදේශ පසු කරන්න ගත්තාම මගීන් සියයට 300ක්, 400ක් බවට පත් වනවා. ඒ නිසා බොහොම ලොකු ප්‍රශ්නයක් මේ සම්බන්ධවත් තිබෙනවා. එම නිසා ඒ මාර්ගයත් ද්විත්ව මාර්ගයක් කරන්න පුළුවන් නම් හොඳයි. ඒ වාගේම මෙම මාර්ගයේ ධාවනය වන දුම්රිය සඳහා නව එන්ජින් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. 1954දී කොළඹ ක්‍රමය යටතේ ලබා දුන් කැනේඩියානු එන්ජින් දෙකක් තමයි තවමත් බංගදෙණිය සහ මුතුකුමාරි දුම්රිය දෙකට යොදා ගන්නේ. මේවා අබලන් වෙනවා, කැඩෙනවා. එම නිසා ඒවාටත් යම්කිසි ක්‍රමවේදයක් යෙදිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මම තව පොඩි වෙලාවයි ගන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසාන වශයෙන් මම මතක් කරන්න ඕනෑ, විශේෂයෙන්ම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ආරක්ෂාවට යොදවා ඉන්න පිරිස ගැන; ගේට්ටු මුරකරුවන් ගැන. අද වන විට එය විශාල ප්‍රශ්නයක්. ඇත්තටම ඒ කටයුතු නිසි පරිදි සිද්ධ වන්නේ නැහැ. කිසිම වැඩක් පලක් කර ගන්න බැරි අවුරුදු 80, 90 වයස්වල ඉන්න සීයලා තමයි මේ කටයුත්තේ යොදවා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ඔවුන්ට කීයක් ගෙවනවාද කියලා. බොහෝ විට ඔවුන් බීමතින් - මත්පැන් පානය කරලා - ඉන්නේ. මෙම ස්ථානවල සිදුවන අනතුරු නිසා තරුණ ළමයින් ඇතුළු ජන ජීවිත විශාල වශයෙන් නැති වනවා. රටේ පෙරේදාත් එහෙම සිද්ධි කිහිපයක් වුණා. පෞද්ගලිකව මටත් එක දවසක් එවැනි අනතුරක් සිද්ධ වෙන්න ගියා. එම නිසා මෙවැනි ස්ථානවල සිදුවන අනතුරුවලින් ජීවිත බේරා ගැනීම පිළිබඳවත් විශේෂයෙන් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි. ඉතින් මම හිතනවා, මේ යෝජනාවට අපේ මන්ත්‍රීවරුන් සහයෝගය දක්වයි කියලා. අවසානයේ මම නැවත අදහස් දක්වන්නම්.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.15]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

විශේෂයෙන්ම ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම සම්බන්ධ යෝජනාව මම ස්ථිර කරනවා. මේක ඉතාම කාලෝචිත යෝජනාවක්. ලෝකයේ අනික් රටවල් දිහා බැලුවාම අපේ රටෙත් දුම්රිය සේවාව සම්බන්ධයෙන් ගන්න ඕනෑ පියවර රාශියක් ගැන මතක් කිරීම අපේ යුතුකමක් කියලා මම හිතනවා. ඔබතුමන්ලා දුම්රිය සේවකයින් සඳහා ස්ථිර කණ්ඩායමක් බඳවා ගෙන තිබෙනවා. සමහර දුම්රිය ස්ථාන විශේෂ ස්ථාන හැටියට සලකා ඒවාට ස්ථිර සේවකයින් පත් කර තිබෙනවා. හැබැයි, අනෙක් තැන්වල සිටින සේවකයින්ට ඔබතුමන්ලා ලබා දෙන්නේ දීමනාවක්. ඒ දුම්රිය ස්ථානය පිරිසිදු කරන්න, දුම්රිය ස්ථානයේ අඩුපාඩු සකස් කරන්න, ටිකට් පත් ලබා දෙන්න සහ අනෙකුත් රාජකාරි කටයුතු කරන්නත් ඕනෑ ඒ කණ්ඩායමේ දීමනාවෙන්. ඒකෙන් ඒ සියලු දේ කරන්න බැහැ. ඒ නිසා එවැනි ස්ථානවල බරපතළ ප්‍රශ්නයක් තිබුණා. අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කර ඒ ප්‍රශ්නය විසඳා ගත්තාද, නැද්ද කියන එක මම දන්නේ නැහැ. හැබැයි, මේ ආකාරයෙන් දුම්රිය සේවාව දියුණු කරන්න බැහැ. දුම්රිය සේවාව දියුණු කරන්න නම් විධිමත් වැඩ පිළිවෙළක් හදන්න වෙනවා. දුම්රිය ස්ථාන වාගේම එහි සේවකයින්, නිලධාරීන් සම්බන්ධයෙනුත් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

ලෝකයේ බොහෝ රටවල් ඉතාම වැදගත් ප්‍රවාහන සේවාව හැටියට සලකන්නේ දුම්රිය සේවාවයි. නවීන පන්නයේ දුම්රිය සේවා ඒ රටවල තිබෙනවා. හැබැයි, ඒවා ලාභ ලබනවා. ඒ මිනිස්සු ඒවායෙන් ප්‍රයෝජනත් ගන්නවා. ඒ වාගේම ඒ රටවල් වේගයෙන් දියුණු වනවා. ඒ රටවල මිනිස්සුන්ගේ අවශ්‍යතා ඉතා ඉක්මනින් ඉෂ්ට කරගන්න හැකියාව ලැබෙනවා. මොකද, දුම්රිය සේවාව කියන්නේ ඕනෑම තැනකට බාධාවකින් තොරව ඉක්මනින් යන්න පුළුවන් ප්‍රවාහන මාධ්‍යයක්. ඔබතුමන්ලාගෙන් අපි ඉල්ලන්නේ මේකයි.

පුත්තලම කියන්නේ, මේ රටේ ඉතාම වැදගත්, ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන්න පුළුවන් දිස්ත්‍රික්කයක්. ඒ දිස්ත්‍රික්කය තුළ රජයේ රැකියා කරන විශාල පිරිසක් ඉන්නවා. ඒ අය ප්‍රවාහනය සඳහා වැඩියෙන් භාවිත කරන්නේ දුම්රිය සේවය. මොකද, දුම්රියෙන් ආවාම ඒගොල්ලන්ට පහසුයි, තමන්ගේ සේවා ස්ථානයට යන්න. හැබැයි, අපේ රටේ දුම්රිය සේවයේ ප්‍රමාදවීම් ගොඩක් තිබෙනවා. ඒ නිසා දුම්රිය සේවය විධිමත් කරන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ සඳහා මීගමුවෙන් පස්සේ රේල් පාරවල් දෙකක් -මාවත් දෙකක් විධියට- අරගෙන ගිහිල්ලා විතරක් මදි. ඒ දුම්රිය සේවාවත් නවීකරණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. ඒ වාගේම දුම්රිය සේවාවට ජනතාව ආකර්ෂණය කරගත යුතුයි. එතකොට මේ වැඩ පිළිවෙළ හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් අපට විශේෂයෙන් මතක් කරන්න තිබෙන කාරණා තිබෙනවා.

රාජ්‍ය සේවයේ නිරත අයට ගෞරවය දක්වන, ආදරය කරන දුම්රිය රියදුරන් ද මේ ප්‍රදේශයේ හිටියා. ඒ මිනිසුන්ව දාලා යන්නේ නැති, සමහර තැන්වලදී දුම්රිය ප්‍රමාද වුණත් ඒ ප්‍රමාදය නොසලකා මගදී වේගයෙන් හෝ දුම්රිය ධාවනය කරලා අදාළ සේවා ස්ථානයට යන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ඔවුන් හදලා තිබෙනවා. එතැනදී සේනක බණ්ඩාර රියදුරු මහත්මයාවත්, සම්පත් බණ්ඩාර රියදුරු මහත්මයාවත් ඉතාම ගෞරවයෙන් මේ වෙලාවේ සිහිපත් කරනවා. ඒ දෙදෙනාට ජනතාව ගොඩක් ආදරෙයි. ඒ රියදුරන් දෙදෙනා ඉතාම වැදගත් සේවාවක් කර තිබෙනවා. මේ මාර්ගයේ දුම්රිය බොහෝ වෙලාවට ප්‍රමාද වනවා. එලෙස දුම්රිය ප්‍රමාද වුණාට මගදී වේගයෙන් දුම්රිය ධාවනය කරලා හරි - සමහර වෙලාවට නීතිවලින් පිටස්තර වෙන්න පුළුවන් - දුම්රියේ යන මගීන්ට නියමිත වෙලාවට සේවා ස්ථානයට යන්න අවශ්‍ය පහසුකම ඒ රියදුරන් සලසනවා. ඒ නිසා ඒ අයවත් මතක් කරන ගමන් අපි ඉල්ලනවා, දුම්රිය සේවාව විධිමත් කරන වැඩ පිළිවෙළක් සැලසුම් සහගතව හදන්න කියලා.

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මැතිතුමා අද දින ගෙනා මේ යෝජනාව ඉතාම ප්‍රශංසනීය බව සිහිපත් කරමින්, අවස්ථාව ලබා දුන්නාට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.19]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ නව රජයේ අපේ ප්‍රවාහන ප්‍රතිපත්තිය වන්නේ, පරිසර හිතකාමී, කාර්යක්ෂම, විශ්වසනීය, ආරක්ෂාකාරී සහ ගෞරවාන්විත, ජනතාවාදී ප්‍රවාහන සේවයක් ජනතාවට ලබා දීමයි කියලා. අපේ රටේ ජනතාවගේ කාලයෙන් සැලකිය යුතු කාලයක් මහ මහට නාස්ති වන බව තමයි අපට තිබෙන ඉතිහාසමය අත්දැකීම. ඒ නිසා තමයි නව රජය නව දැක්මක් එක්ක මේ ප්‍රතිපත්තිය තුළ ඉඳගෙන කටයුතු කරමින් ඉන්නේ.

එහිදී පුත්තලම දිස්ත්‍රික්කයට අදාළව ගත්තොත්, දුම්රිය ධාවනය ඉහළ නැංවීම සඳහා අපි මේ වෙනකොටත් අමාත්‍යාංශ මට්ටමින් ඉතා විශාල වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මේ ගරු සභාවේ ඉන්න හැමෝම දන්නවා, අපේ රටේ මෑත ඉතිහාසය තුළ අපි මුහුණ දුන්නු දැවැන්තම ව්‍යසනය "දිට්වා" ආපදාව බව. "දිට්වා" ආපදාවෙන් දුම්රිය මාර්ග පද්ධතියට තමයි වැඩිපුර හානි සිද්ධ වුණේ. මේ යථාර්ථය තුළ බලයට ආපු අපිට ඉතාම කෙටි කාලයක් තුළ දුම්රිය මාර්ග සංවර්ධනය සහ පොදු ජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙලා තිබෙනවා. එහිදී අපේ දිස්ත්‍රික්කයට දුම්රිය සේවාවේ ඇති අවශ්‍යතාව කොතරම්ද කියන එක අපි හඳුනාගෙන තිබෙනවා. රාජකාරිමය අවශ්‍යතා සඳහා ඉතා විශාල පිරිසක් පුත්තලම ප්‍රදේශයේ ඉඳන් කොළඹට එනවා. ඒ වාගේම පාසල් සිසුනුත් එනවා. ඒ විතරක් නොවෙයි, ඉදිරි සංවර්ධන වැඩ කටයුතුවලදී පුත්තලම දිස්ත්‍රික්කයේ කර්මාන්තපුර ආරම්භ කරන්න සහ සංචාරක කර්මාන්තය දියුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ ආදී වශයෙන් සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී දුම්රිය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සහ දුම්රිය සේවාව කාර්යක්ෂම කිරීම අතිශය වැදගත් වනවා. ඒ යටතේ හඳුනාගෙන තිබෙන

ගැටලු පිළිබඳව මීට කලින් කථා කරපු අපේ මන්ත්‍රීතුමන්ලාත් කරුණු ඉදිරිපත් කළා. ඉදිරි කාලය තුළදී අපි මේ ගැටලුවලට නිසි අවධානය යොමු කරමින් ඒවා විසඳන්න අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

අපි දන්නවා, සුළු වර්ෂාවකදීත් ඒ ප්‍රදේශ ජලයෙන් යට වෙන බව. ගොඩබිම පැත්තෙන් එන වතුර මුහුදට බහින්න විශාල බාධාවක් විධියට තිබෙනවා, රේල් පාර හරහා කුඩා බෝක්කු ඉදිකර තිබීම. ඒවා ප්‍රමාණාත්මක මදි වාගේම ඒ බෝක්කුවල විශාලත්වයත් මදි. ඒ නිසා ඒවා ක්‍රමවත් කරන්න වැඩ පිළිවෙළක් අපි මේ වනවිට ආරම්භ කරලා තිබෙනවා. දුම්රිය ස්ථාන විතරක් නොවෙයි, උප දුම්රිය ස්ථාන නවීකරණය කරන වැඩසටහන යටතේ අපි මේ අවුරුද්ද ඇතුළත උප දුම්රිය ස්ථාන හයකට වැඩි ප්‍රමාණයක් නවීකරණය කරන්නත් කටයුතු කරලා තිබෙනවා. දැන් ඒ කටයුතු සිද්ධ වෙමින් තිබෙනවා.

අපේ චිත්‍රාල් මන්ත්‍රීතුමා වාගේම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් කිව්වා, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පිළිබඳ ප්‍රශ්නය ගැන. අපි ඒ වාගේ ස්ථාන 26ක් හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී bell and light signal ක්‍රමවේදය හරහා මගීන්ට ඉතාම ආරක්ෂිත ප්‍රවාහන පද්ධතියක් ලබා දීමට අපි කටයුතු කරමින් ඉන්නවා. මේ හැම දෙයක්ම ඉතාම කෙටි කාලයක් තුළ සැලසුම් කරලා ක්‍රියාත්මක කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලාපොරොත්තු වෙනවා, කටුනායක සිට හලාවත දක්වා expressway එකක් ආරම්භ කරන්නට. නව රජය ඊට සමාන්තරව විදුයුත් දුම්රිය සේවාව වැඩිදියුණු කිරීම සඳහාත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි ඉදිරියේදී හලාවත දක්වා විදුයුත් දුම්රිය සේවයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙනුත් ප්‍රවාහන අමාත්‍යාංශයත් එක්ක යම් සාකච්ඡාවක් සිදු කරමින් ඉන්නවා. අපි මේ හැම දෙයක් තුළින්ම බලාපොරොත්තු වෙන්නේ මේ දේවල්වලට කඩිනම් විසඳුම් ලබා දෙන්නයි. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 12.24]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනාවක් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. පුත්තලම දුම්රිය මාර්ගය සම්බන්ධයෙන් ඒ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන වයඹ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම ඉතාම සතුටු වෙනවා. මේ දුම්රිය මාර්ගය කොළඹ සිට මීගමුව දක්වා lanes දෙකක තිබෙනවා. එතැනින් එහාට තනි lane එකක් හැටියට තමයි එය ක්‍රියාත්මක වෙන්නේ. ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ ඉඳලාම තිබුණු දුම්රිය මාර්ගයක් හැටියට මෙය හඳුන්වනවා. මේ දුම්රිය මාර්ගය දියුණු කිරීම ඉතාම වැදගත් වෙනවා. අපේ සංචාරක ව්‍යාපාරයටත් මේ මුහුදුබඩ දුම්රිය මාර්ගය ඉතා වැදගත් වෙනවා. ඒ නිසා මේ යෝජනාව අනුව අපට ඉදිරියට කටයුතු කරන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත් වෙනවා. මේ වෙනකොට පුත්තලම දක්වා අධිවේගී මාර්ගයකුත් නැහැ. එතකොට සාමාන්‍ය මාර්ගයේම තමයි ගමනාගමන කටයුතු කරන්න තිබෙන්නේ. ඒ නිසා දුම්රිය මාර්ගය වැඩිදියුණු කරලා, විශේෂයෙන්ම මීගමුවේ ඉඳලා පුත්තලම දක්වා lanes දෙකක් හදන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත් මාර්ගයක් බවට පත් වෙනවා. මොකද, අපි දන්නවා, lane එකක් තිබියදී දුම්රියක් මාරු වෙන්න නම් එක දුම්රියක් station එකක නවත්වා ගෙන ඉන්න වෙන බව.

විශේෂයෙන්ම කුරුණෑගල දුම්රිය මාර්ගය දිහා බැලුවත් අපිට ඒ තත්ත්වය දකින්න පුළුවන්. කුරුණෑගල දුම්රිය මාර්ගය ගත්තත් පොල්ගහවෙල දක්වා double lanes තිබෙනවා. නමුත්, පොල්ගහවෙල ඉඳලා අඩු ගණනේ කුරුණෑගල දක්වාවත් lanes දෙකක් හැදුවොත් ප්‍රමාදයක් නැතුව දුම්රියේ යන්න අවස්ථාව උදා වෙනවා. නමුත්, අපි විශ්වාස කරනවා, ඊටත් එහා, අනුරාධපුරය දක්වාවත්, මහව දක්වාවත් අඩු ගණනේ double lanes තිබිය යුතුයි කියලා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අපේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් තමයි ගෙනැල්ලා තිබෙන්නේ. අද වනකොට ලෝකයේ හැම රටකම දුම්රිය ඉතා දියුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නමුත්, අපේ රටේ ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ ගෙනාපු දුම්රිය ටිකක් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා මිසක් එතැනින් එහාට ගිහිල්ලා නැහැ. ඒ නිසා චිත්‍රාල් මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන යෝජනාව අනුව පුත්තලම දුම්රිය මාර්ගය වැඩිදියුණු කරලා, double lanes, එහෙම නැත්නම් දෙපැත්තටම ගමන් කිරීමේ හැකියාව ලබා දෙනවා නම් එය ඉතාම වැදගත් බව මම කියා සිටිනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.27]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව යටතේ පුත්තලම-කොළඹ දුම්රිය මාර්ගයේ ධාවනය ඉහළ නැංවීමට වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා පැහැදිලි කළා. ඒ වාගේම තමයි, පොදු ප්‍රවාහන සේවයට අපේ මහජනතාව නැඹුරු වෙලා තිබෙනවා කියන කාරණාවත්, මේ වෙනකොට මැද පෙරදිග කලාපයේ පවතින තත්ත්වය මත ජනතාවට පෞද්ගලික ප්‍රවාහන සේවාවක් සලස්වා ගන්න අපහසුකමක් තිබෙනවා කියන කාරණාවත් එතුමා සඳහන් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමාගේ යෝජනාව අනුව වර්තමානයේ අවශ්‍යතාවක් තිබෙනවා. හැබැයි, අපි දන්නවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට වර්තමාන ආණ්ඩුව, ප්‍රවාහන අමාත්‍යාංශය විධියට ප්‍රවාහන ක්ෂේත්‍රයේ යම් පරිවර්තනයකට නැඹුරු වෙලා ඒ කටයුතු කරමින් තිබෙන බව. අපි දන්නවා, පසුගිය කාලය පුරාවටම ප්‍රශ්න රාශියක් නිර්මාණය වුණු බව. අපේ ගයාන් ජනක මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා වාගේ "දිට්වා" සුළි කුණාටුවෙන් පුත්තලම-කොළඹ දුම්රිය මාර්ගයට විශාල වශයෙන් හානි වුණා. එලෙස හානියට පත් වූ දුම්රිය මාර්ගය කඩිනමින් හදලා ජනතාවට ඒ පොදු ප්‍රවාහන සේවය භාවිත කරන්න අවශ්‍ය කටයුතු අපි සකස් කරලා දුන්නා.

ඒ වාගේම, පුත්තලම දිස්ත්‍රික්කයේ විශේෂ තදබදයක් තිබෙන්නේ උදේ සහ සවස තිබෙන කාර්යාල දුම්රියවලයි. විශේෂයෙන්ම මීගමුවේ සිට විශාල තදබදයක් තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඉතාම අඩු ප්‍රමාණයක් තමයි දුම්රිය භාවිත කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හලාවතින් එහාට ඩිමෝ බස් එකක් කලින් දාලා තිබුණා. නමුත්, ඒ බස් එකත් දැන් නවත්වා තිබෙනවා. අවශ්‍ය නම් හලාවත සිට පුත්තලමට තව දුම්රිය ගමන් වාරයක් එකතු කරන්න අපට පුළුවන්.

ඊළඟට, විශේෂ අවස්ථා තිබෙනවා. තලවිල වාර්ෂික මංගල්‍යය අවුරුද්දකට දෙවතාවක් තිබෙනවා. ඒ වාර්ෂික මංගල්‍යයට විශේෂ දුම්රිය ධාවන සේවාවක් සපයනවා. ඒ අවශ්‍යතා අපි ඉටු කරනවා. ඇත්තටම අපි දන්නවා, ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කරන්න ඕනෑ කියලා තිබෙන බව. මේ වෙද්දී ඒකට අවශ්‍ය කටයුතු සූදානම් කරලා, ඒ සඳහා අවතීර්ණ වෙලා තිබෙනවා. අපි මෙට්‍රෝ බස් සේවය අලුතින් ආරම්භ කළා. ඒ වාගේම විදුලි දුම්රිය සේවය සඳහාත් අපි වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. ඒ වාගේම තමයි, පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කරන්න expressways හදලා තිබෙනවා. පුත්තලම සිට හලාවත දක්වා expressway එකක් හදන්න දැනට සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම තවත් මාර්ග වාගේම ඕලන්ද ඇළ, හැමිල්ටන් ඇළ ඉදිරියේදී තවත් ප්‍රවාහන අවස්ථා සඳහා යොදා ගන්න අපි සැලසුම් කරනවා.

ඒ නිසා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ අරමුණත් ඒකයි. පොදු ප්‍රවාහන සේවය සමඟ ජනතාව සම්බන්ධ වෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා. වර්තමාන ආණ්ඩුවේ වැඩ පිළිවෙළ යටතේ ජනතාවට එම පහසුකම සලසා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම වෙනත් රටවලට ගියාම අපි දැක තිබෙනවා, ඒ රටවල රාජ්‍ය සේවකයන් දුම්රිය භාවිත කරන ආකාරය. ඒ රටවල දුම්රිය සේවාව ශක්තිමත් වෙලා තිබෙනවා. අපිත් අන්න ඒ තත්ත්වයට යන්න සැලසුම් කර තිබෙනවා. මොකද, ඒකෙන් කාලය ඉතුරු වෙනවා. ඒ වාගේම ජනතාවගේ මුදල් ඉතුරු වෙනවා. ඒ වාගේම තමයි ජනතාව ඔවුන්ගේ වාහන park කළාම එතැනටත් ගෙවන්න ඕනෑ. ජනතාවට ඒක අමාරු කටයුත්තක්.

වර්තමාන ආණ්ඩුව විධියට අපේ වගකීම තමයි පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කර ජනතාවට එම පහසුකම් ලබා දීම. ඒ සඳහා අපේ ගරු බිමල් රත්නායක අමාත්‍යතුමාත්, අපේ ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමාත් ශක්තිමත්ව වැඩ කරනවා. අපිට ඒ ඉලක්කයට යන්න පුළුවන්. පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කරලා ජනතාවට ඒ පහසුකම් ලබා දීමේ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. අපි ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව තුළ සඳහන් කාරණා සම්බන්ධව සාකච්ඡා කර ඉතා ඉක්මනින් ඊට අවශ්‍ය පහසුකම් හදන්නත් සැලසුම් කරනවා.

පසුගිය කාලයේ මාර්ග සංඥා පුවරු 25ක් අක්‍රිය වෙලා තිබුණා. එයින් 10ක් නැවත හදා දීලා තිබුණා. ඉතුරු 15 ලබන පෙබරවාරි මාසය වනවිට හදා අවසන් කරන්න කටයුතු සූදානම් කර තිබෙනවා. මට මේ වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று. மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, THE HON. DEPUTY SPEAKER in the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Ramanathan Archchuna. You have three minutes to speak on the Private Members' Motion moved by the Hon. Chithral Fernando.

[பி.ப. 1.00]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் கௌரவ சித்ரால் பர்னாந்து அவர்களால் கொண்டு வரப்பட்டுள்ள புத்தளம் புகையிரப் பாதையில் புகையிரத சேவைகளின் எண்ணிக்கையை அதிகரித்தல் தொடர்பான தனிநபர் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு எனக்கு மிகவும் சந்தோசம்!

ஐயா! நான் ஒரு தமிழனாக வெட்கப்படுகிறேன். யாழ்ப்பாணத்தில் நாங்கள் ஒரு லீற்றர் பெற்றோலுக்கு 150 ரூபாய் tax செலுத்துகிறோம்; ஓர் இறாத்தல் பாணுக்கு 20 - 30 ரூபாய் tax செலுத்துகிறோம். யாழ்ப்பாணம் உட்பட வடக்கில் இருக்கின்ற 12 இலட்சம் மக்கள், பெற்றோல் உட்பட ஏனைய பொருட்களுக்காக எத்தனை ஆயிரம் கோடி ரூபாயை taxஆக செலுத்துகிறார்கள் என்பதை சற்று யோசித்துப் பாருங்கள்!

ஐயா, இரண்டு கைகளையும் ஏந்தித்தான் உங்களிடம் கேட்கவேண்டி இருக்கின்றது. எங்களுடைய வடக்கு மாகாணத்தில் இருக்கின்ற Brown Road, முதலாம் குறுக்குத் தெருவிலுள்ள railway trackக்கு அருகில் 2 மில்லியன் ரூபாய் பெறுமதியான signal lightஐ அமைக்கச் சொல்லி கௌரவ ராமலிங்கம் சந்திரசேகரிடம் கேட்டு இரண்டு வருடங்களாகி விட்டது. யாழ்ப்பாணம் இந்துக் கல்லூரியில் கல்வி கற்கும் 3 சின்னஞ்சிறு மாணவர்கள், அந்த இடத்தில் train மோதி செத்திருக்கிறார்கள்.

நாங்கள் இப்படி இரண்டு கைகளையும் ஏந்திப் பிச்சை எடுத்தும் இனி வழி இல்லை என்றால் என்ன செய்வது? நாங்கள் எத்தனையோ ஆயிரம் கோடி ரூபாயை taxஆகச் செலுத்துகின்றோம். இந்த அரசாங்கத்திடமும் கௌரவ பிமல் ரத்னாயக்காவிடமும் கேட்டது ஒரேயொரு signal lightஐத்தான். யாழ்ப்பாணம், இந்துக் கல்லூரிக்கு, நீராவியடிப் பிள்ளையார் கோவிலுக்கு முன்னால் இருக்கின்ற laneஐ முழுமையாக மறித்து railway trackஐ அமைத்திருக்கிறார்கள். காலங்காலமாக மாநகர சபைக்குரிய பாதையாக அது இருந்தது. ஒரேயொரு signal lightஐ நாங்கள் 2 வருடங்களாகக் கேட்டுக்கொண்டு இருக்கிறோம். கிளிநொச்சியில் அண்மையில்கூட car ஒன்று புகையிரதத்துடன் மோதியதால் ஓர் உயிரிழப்பு ஏற்பட்டது. ஓய்வுபெற்ற அரசாங்க உத்தியோகத்தர் ஒருவர் உயிரிழந்தார். ஐயா! நாங்கள் இந்த அரசியலை எப்படிப் பயன்படுத்த வேண்டும் என்றால், ஒன்றில் நாங்கள் இங்கே சண்டைபிடிக்க வேண்டும் அல்லது இவர்களைத் தூஷண வார்த்தைகளால் பேச வேண்டும். நாங்கள் செய்யக்கூடியது இரண்டாவதைத்தான்.

வடக்கு மாகாணத்திலிருந்து தெரிவுசெய்யப்பட்ட கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி உட்பட நான்கு பேர் அரசாங்கத் தரப்பில் இருக்கிறார்கள். நான்கு பேர் இருந்தும், ஒரேயொரு signal lightஐப் போட்டுத்தர முடியாத இந்த அரசாங்கத்திடம் கௌரவ சித்ரால் பர்னாந்து அவர்கள் கொழும்பிலிருந்து புத்தளத்துக்கான புகையிரத சேவைகளை develop பண்ணித் தருமாறு கேட்பது, எந்தவகையில் நியாயமாக இருக்கு மென யோசித்துப் பாருங்கள்! எங்களுடைய றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள் வந்து இருந்ததும் கிளிநொச்சியில்தான். அந்தக் கிளிநொச்சியில் இளம் பிள்ளைகள் roadஐ cross பண்ணும்போது, புகையிரத்தில் மோதுண்டு சாகிறார்கள். அங்கு ஓரிடத்தில்கூட signal light இல்லை. நாங்கள் DCC meetingஇல் 8-10 இடங்களில் signal lightsஐ அமைக்குமாறு கேட்டு, அவற்றை அமைப்போம் என்று சொல்லியும், இன்று வரைக்கும் ஒரு signal light அமைக்கப்படவில்லை. யாழ்ப்பாணத்தில் roadஇல் இருக்கின்ற signal lightsஐ எண்ணிப் பார்க்கலாம். கொழும்பில் வசிக்கின்ற உங்களுக்குத் தெரியும், தெற்குப் பகுதிகளில் என்ன மாதிரியான அபிவிருத்திகள் இருக்கின்றன என்று.

வடக்கைப் பொறுத்தவரைக்கும், நாங்கள் இரண்டு கைகளையும் ஏந்திப் பிச்சை எடுக்கிறோம். ஏனென்றால், வேறு வழி இல்லை! தமிழர்களுடைய நிலைமை அந்தளவுக்கு வந்திருக்கிறது. வடக்கில் ஒரு signal lightஐக் கேட்கின்ற அளவுக்கு நிலைமையை இந்த நான்கு பாராளுமன்ற உறுப்பினர்களும் எங்களுக்கு ஏற்படுத்தி இருக்கிறார்கள். ஒரு தேசியப்பட்டியல் ஆசனத்தைக் கொடுத்திருக்கிறார்கள். மூன்று பாராளுமன்ற உறுப்பினர்கள் தெரிவுசெய்யப்பட்டு இருக்கிறார்கள். பாவம் ஐயா! கதைப்பதற்கு வாய்கூட இல்லை. றஜீவன் அண்ணா! நான் உங்களுடைய பெயரைச் சொல்கிறேன். தயவுசெய்து, எழுந்து இதற்குப் பதில் சொல்லுமாறு அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kaveenthiran Kodeeswaran.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே -

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Rajeevan Jeyachandramoorthy? The Hon. (Dr.) Archchuna mentioned your name. Hon. (Dr.) Archchuna, why do you have to mention names? - *[Interruption.]* Okay, Hon. Rajeevan Jeyachandramoorthy, I will give you a minute to answer him. Do not make it a habit please.

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள் என்னுடைய பெயரை இங்கு குறிப்பிட்டார். தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினராகிய நாங்கள், வீதி சமிக்ஞைகள் அமைப்பது சம்பந்தமாக DCC meetingஇல் தீர்மானங்களை எடுத்திருக்கிறோம். தற்பொழுது, அதற்கான வேலைத் திட்டங்கள் நடைபெற்று வருகின்றன. உண்மையிலே நாங்கள் மக்கள் பணிக்காகத்தான் ஒவ்வோர் இடத்திலும் வேலை செய்துகொண்டு இருக்கின்றோம். நாங்கள் இங்கு மட்டும் கதைத்துவிட்டு வெறுமனே செல்வதில்லை. அதற்கப்பால், நாங்கள் எல்லா இடங்களிலும் வேலை செய்துகொண்டு இருக்கின்றோம். வெகுவிரைவில் வடக்கில் நிறைய மாற்றங்கள் ஏற்படும் என்பதை இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Sorry, Hon. Kaveenthiran Kodeeswaran. Now, you get your time of three minutes to speak on this Motion before the House.

[பி.ப. 1.04]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கௌரவ சித்ரால் பர்னாந்து அவர்களால் கொண்டுவரப் பட்டுள்ள புகையிரத சேவைகளின் எண்ணிக்கையை அதிகரிப்பது சம்பந்தமான தனிநபர் பிரேரணையை நாங்கள் வரவேற்கின்றோம். புகையிரத சேவைகளின் எண்ணிக்கையை

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

අතිකැරිප්පු මට්ටුමල්ලාමල්, පුකෙයිරතඞ්කළිල් වසති කළෙයුම් අතිකැරික්ක වේණ්ටුම්. සර්වතේස තර නියමඞ්කළුක්කු ඒර්රවාරු අතන් පාතුකාප්පෙයුම් සේවෙයෙයුම් උරුතිප් පටුත්ත වේණ්ටිය පොරුප්පු ඉරුක්කිරතු. මට්ටක්කළප්පිලිරුන්තු කොළුම්පුක්කුච් චෙල්කින්ර පුකෙයිරතත්තෙ එටුත්තුක් කොණ්ටාල්, අතිල් චිර්රුණ්ටිච්චාලෙ වසතියෝ, මුතලාම්, ඉරණ්ටාම් වකුප්පුකළුක්කාන උරඞ්කල් ඉරුක්කෙ වසතිකළෝ, ඒනෙය වසතිකළෝ ඉල්ලාත ඔරු නිලෙ කාණප්පටුකින්රතු. අතුමාත්තිරමල්ල, මූන්රාවතු වකුප්පු ආසනඞ්කළෙ මුන්පතිවු චෙය්යක්කූටිය වසතියර්ර නිලෙයුම් කාණප් පටුකින්රතු.

නාන් ඉඞ්කු විසේටමාක ඔරු විටයත්තෙක් කූර විරුම්පුකින්රේන්. 1972ආම් ආණ්ටුම් අතර්කුප් පින්නරුම් ඉරණ්ටු තටවෙ මට්ටක්කළප්පිලිරුන්තු පොත්තුවිල් වරෙ පුකෙයිරතප් පාතෙයෙ විස්තරිප්පතර්කුප් පල තිට්ටඞ්කළ් මේර්කොළ්ළප්පට්ටන. අප්පෝතු, ඉන්තත් තිට්ටත්තෙ මේර්කොළ්වතර්කාක වෙළිනාටුකළිල් ඉරුන්තුකූට නිති උතවිකළ් කිටෙක්කප්පෙර්රන. ඉන්ත නාට්ටිල් නිලවිය අසාතාරණ සූළ්නිලෙ කාරණමාක, අන්තප් පුකෙයිරතප් පාතෙයින් නිර්මාණප් පණිකළ් නිරුත්තප්පට්ටන. තර්පොළුතු සාතකමාන සූළ්නිලෙ කාණප්පටුවතන් කාරණමාක, අන්තප් පුකෙයිරතප් පාතෙයෙ විස්තරිප්පතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්টුම්. කූටුතලාන පොරුට්කළෙ ඒර්රි ඉරක්කුකින්ර චෙයර්පාටුකළෙ මේර්කොළ්වතර්කුම්, අරුකම්පෙ පෝන්ර කරෙයෝරප් පිරතේසඞ්කළිල් සුර්රුලාත්තුරෙයෙ මේම්පටුත්තුවතර්කුම් ඉන්ත railway පාතෙයෙ විස්තරික්ක වේණ්ටියතු මිකවුම් කට්ටායමාන ඔන්රාක ඉරුක්කින්රතු. ඉන්රු එරිපොරුළුක්කාන චෙලවු මිකවුම් අතිකරිත්තුච් චෙල්කින්රතු. මක්කළ් පොරුට්කළෙ ඒර්රි ඉරක්කුකින්රපොළුතු අල්ලතු විවසාය උළ්ළීටුකළෙ ඒර්රි ඉරක්කුකින්රපොළුතු අල්ලතු ඒනෙය උර්පත්තිප් පොරුට්කළෙ ඒර්රි ඉරක්කුකින්ර පොළුතු, එරිපොරුළ් චෙලවු මික අතිකමාක ඉරුප්පතන් කාරණමාක, උර්පත්තිච් චෙලවු මික අතිකමාකක් කාණප්පටුකින්රතු. ඉන්තච් චෙලවුකළෙක් කුරෙක්ක වේණ්টුම් එන්රාල්, නාඞ්කළ් මට්ටක්කළප්පිලිරුන්තු පොත්තුවිල් වරෙ පුකෙයිරතප් පාතෙයෙ විස්තරික්ක වේණ්ටුම්.

එනවේ, කටන්ත කාලත්තිල් නිරුත්තප්පට්ට ඉන්ත වේලෙත්තිට්ටත්තෙ ඉන්ත අරසාඞ්කම් මුන්නෙටුක්ක වේණ්ටුම්. ඉන්ත අරසාඞ්කම් ඉතර්කාන විටයඞ්කළෙ මුන්නෙටුත්තු, ඉන්තප් පුකෙයිරතප් පතෙයෙ අමෙක්කින්ර පොළුතු, මක්කළ් තඞ්කළතු පිරයාණඞ්කළෙ මික ඉලකුවාකච් චෙය්ය මුටිවතුටන්, තඞ්කළතු විවසාය උර්පත්තිප් පොරුට්කළෙක් කොණ්ටුචෙන්රු උරිය විලෙක්කු විර්රු, ඉලාපත්තෙප් පෙර්රුක්කොළ්ළක්කූටිය වාය්ප්පුම් ඒර්පටුම්. එනවේ, නීঙ්කළ් මක්කළ් මීතාන චුමෙයෙ ඉන්නුම් ඉන්නුම් ඒර්රාමල්, එරිපොරුළ් චෙලවෙක් කුරෙප්පතර්කු ඉව්වාරාන වේලෙත්තිට්ටඞ්කළෙ මේර්කොණ්ටාල්, අවර්රින්මූලම් මක්කළ් නන්මෙ අටෙයක්කූටිය වාය්ප්පු ඉරුක්කුමෙන නාන් ඉන්තච් චපෙයිල් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Prasanna Gunasena. You have seven minutes to provide the Minister's reply to this Private Members' Motion.

[අ.භා. 1.08]

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛත්තියර්) පිරසන්න කුණසේන - පෝක්කුවරත්තු මර්රුම් නෙටුඤ්චාලෙකළ් පිරති අමෙච්චර්)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සාධනීයව භාර ගන්නා ගමන්, මට කලින් අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනාත් සාධනීයව භාර ගන්නවා. ඒ වාගේම මමත් මේ සම්බන්ධව යම් අදහසක් දැක්වීමට කැමැතියි.

පුත්තලම දුම්රිය මාර්ගයේ peak hoursවල, ඒ කියන්නේ දෛනික රාජකාරි සඳහා කොළඹ නගරය වෙත ඇදී එන මගීන් ඒ යන එන වේලාවන්වලදී දුම්රිය සඳහා අධික ඉල්ලුමක් තිබෙනවා. දෛනිකව ධාවනය වන දුම්රිය වාර ප්‍රමාණය ගත්තොත්, පුත්තලම දුම්රිය මාර්ගයේ සාමාන්‍යයෙන් සතියේ දවස්වල ගමන් වාර 32ක වාගේ ප්‍රමාණයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගමන් වාර 32 තුළ කාර්යාල දුම්රිය හතක් ධාවනය වෙනවා. ඒ අනුව එම දුම්රිය හත උදේ පුත්තලමේ ඉඳලා කොළඹ කොටුව දක්වාත්, රාජකාරි වෙලාවෙන් පසුව කොළඹ කොටුවේ සිට පුත්තලම දක්වාත් මගීන් ගෙන යනු ලබනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළ පරිදි දවල් කාලයේදී, ඒ කියන්නේ කාර්යාල වේලාව නොවන කාලය තුළ ආසන්න වශයෙන් පැය එකහමාරක් දෙකක් වාගේ කාලයක් තුළ තමයි දුම්රිය ගමන් වාරයක් යෙදී තිබෙන්නේ. නමුත් මගීන්ගේ ඉල්ලුම - passenger demand එක - ගැන බැලුවොත්, කාර්යාල පටන් ගන්නා සහ අවසන් වන වේලාවන් හැර අනෙක් වේලාවන්වලදී අර වේලාවට සාපේක්ෂව අඩු මගී ඉල්ලුමක් තමයි තිබෙන්නේ. නමුත් අපි දුම්රිය කිහිපයක් ධාවනය කරනවා. හැබැයි, ඒ දුම්රිය දෙකක් අතර ධාවනය කරන කාල පරාසය වැඩියි. අපි ඒක පිළිගන්නවා. ඒ කියන්නේ පැය එකහමාරක්-දෙකක් අතර තමයි දුම්රියක් ධාවනය වෙන්නේ. ඕක තමයි සාමාන්‍යයෙන් පුත්තලම දුම්රිය මාර්ගයේ දෛනිකව ධාවනය වන දුම්රිය පිළිබඳ කාල සටහන.

අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවෙන් දුම්රිය මාර්ග පද්ධතිමය දැඩි ලෙස හානියට පත් වුණු බව. ඒකෙන් පුත්තලම දුම්රිය මාර්ගයත් සෑහෙන විනාශයට පත් වුණා. ප්‍රධාන වශයෙන් ස්ථාන හයක් තිබුණා, සම්පූර්ණයෙන්ම සේදී ගිය. සුළු වශයෙන් සේදී ගිය ස්ථාන 27ක් තිබුණා. ඊළඟට, ගස් කඩා වැටීම නිසා විනාශයට පත් වුණු ස්ථාන 51ක් තිබුණා. මේ සියල්ල ප්‍රතිසංස්කරණය කර දුම්රිය ධාවනය සඳහා පුත්තලම දුම්රිය track එක දෙන්න අපට හැකියාව ලැබුණා, මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ. අපි දන්නවා, තනි track එකේ දුම්රිය ධාවනය වෙනකොට, තවත් කෝච්චියක් එද්දී ඒ කෝච්චිය station එකක නවත්වා යෑමේදී යම් කාලයක් ගත වෙන බව. ඒ නිසා මීගමුවේ ඉඳලා කොච්චිකඩේ දක්වා වන කොටස ද්විත්ව මාර්ගයක් කරන්න අපි කටයුතු ආරම්භ කළා. ඒ සඳහා අවශ්‍ය පාලම් සහ බෝක්කු මේ වනවිට ඉදි කරන්න පටන් ගෙන තිබෙනවා. එම කටයුතු කරගෙන යනවා. අපි හිතනවා, ඉදිරි අවුරුදු දෙකහමාර ඇතුළත ඒවායෙන් සෑහෙන ප්‍රමාණයක් ඉදිකර අවසන් කරන්න හැකියාව ලැබෙයි කියලා. ඒ වාගේම කට්ටුව පාලමේ ඉදිකිරීම් කටයුතුත් මේ වෙනකොට අපි අවසන් කර තිබෙනවා, එම දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් කිරීම සඳහා.

ඒ වාගේම දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනවලින් - Sri Lanka Railways' fundsවලින් - අපි මගී අවශ්‍යතා, මගී පහසුකම් වැඩි කිරීම සඳහාත් කටයුතු කරනවා. ඒ අනුව දුම්රිය ස්ථානවල

යම් ඉදිකිරීම් ප්‍රමාණයක් සිදුකර මගී ජනතාවට පහසුකම් සැපයීම සඳහා කටයුතු පටන් ගත්තා. ඒවායෙන් සමහර ඒවා අවසන් කර තිබෙනවා. සමහර ඒවා තවමත් කරමින් පවතිනවා. පොඩි පොඩි වැඩ තමයි. නමුත් ඒවා කාලයක් තිස්සේ අවධානය යොමු වෙලා තිබුණේ නැති කාරණයි. නෙළුම්පොකුණ, පුලිච්චිකුලම් වාගේ දුම්රිය ස්ථානවල වේදිකා - platforms - උස් කිරීම, දිගු කිරීම වාගේ වැඩ අපි අවසන් කර තිබෙනවා. ඒවා ලොකු මුදලක් යන ඒවා නොවන නමුත් මගීන්ගේ පැත්තෙන් බැලුවාම වැදගත් වන, මෙතෙක් අවධානය යොමු නොවුණු කාරණයි. ඒවා කෙරෙහි අවධානය යොමු කරලා ඒවා යථාවත් කිරීමේ කටයුතු අපි අවසන් කර තිබෙනවා. ඒ වාගේම නාත්තන්ඩිය සහ එරුක්කලම්පිඩ්ඩි දුම්රිය ස්ථානවලත් දැනට ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතිනවා. මා කලින් සඳහන් කළේ ඉදි කිරීම් කටයුතු අවසන් කර තිබෙන ඒවා ගැනයි. අපි ඉදිරි වසරේදී බලාපොරොත්තු වෙනවා මාදම්පේ, කාක්කපල්ලිය සහ තිල්ලඩිය කියන දුම්රිය ස්ථානවලත් මගී පහසුකම් මීට වඩා හොඳින් ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කරන්න. ඒ වාගේම ජා ඇල දුම්රිය ස්ථානයේත් යම්කිසි පහසුකම් ප්‍රමාණයක් වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර තිබෙනවා.

දුම්රිය සේවය ගැන කථා කරද්දී අපි සාමාන්‍යයෙන් කියනවා track එකට caution boards දානවා කියලා. ඒ කියන්නේ, රේල් පීලිවල තත්ත්වය එච්චරම quality නැති වුණාම වේග සීමා පනවන එකයි. වේග සීමා පැනෙව්වාම දුම්රිය ධාවනය කරන රියැදුරු මහත්මයාට හැම වෙලාවේම ඒ වේග සීමාවට අනුගත වෙලා තමයි දුම්රිය ධාවනය කරන්න සිදු වන්නේ. ඒ නිසා පුත්තලම දුම්රිය මාර්ගයේ ගමනාන්ත දෙක සඳහා ළඟා වීමේදී අනවශ්‍ය පමාවීම් සිදු වෙනවා. ඒ නිසා අපි වේග සීමා ඉවත් කරන්න, track එක අලුත් කරන වැඩක් පටන් ගත්තා. අපි එහි සෑහෙන වැඩ ප්‍රමාණයක් අවසන් කර තිබෙනවා. ඒ වාගේම තවත් ස්ථාන 4ක caution boards ඉවත් කරන්න තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ස්ථාන හතරේත් කටයුතු ඉදිරි කාලයේදී අවසන් කිරීමට හැකියාව ලැබෙයි කියලා.

ඒ වාගේම, දුම්රිය මගීන්ගෙන් ලැබෙන පැමිණිලිවලින් කියැවෙන ගැටලු ප්‍රමාණයක් ද තිබෙනවා. දුම්රිය මැදිරිවල තත්ත්වය සුබදායක නැහැ, fan වැඩ කරන්නේ නැහැ, ඒවා මලකඩ කාලා, දිරලා යනාදි complaints ගොඩක් ලැබෙනවා. ඒ ප්‍රශ්න විසඳීම සඳහා අපි අලුතින් වැඩක් පටන්ගෙන තිබෙනවා. ලංකාවේ බොහෝ දුරට තිබෙන්නේ, රුමේනියානු දුම්රිය මැදිරි. බංගදෙනියේ ඉඳලා එන "මුතු කුමාරි" දුම්රියේත් ඒවා තමයි තිබෙන්නේ. අපි ඒ මැදිරි සඳහා අලුත් condition එකට washrooms හදලා, fans සවි කරලා, ලයිට් සවි කරලා මැදිරි set එකක් සම්පූර්ණයෙන් හදලා අවසන් කර තිබෙනවා. තව පොඩි වැඩ වගයක් තමයි තිබෙන්නේ. මම විශ්වාස කරනවා, බොහෝ විට ලබන සතිය ඇතුළත ඒ බංගදෙණිය දුම්රියේ එන්ජින් එකට - චිත්‍රාල් මන්ත්‍රීතුමාත් ඒ නම මතක් කළා - ඒ මැදිරි set එක සවි කරන්න පුළුවන් වෙයි කියලා. එතකොට බොහෝ විට ලබන සතියේ ඉඳලා ඒ දුම්රියේ ගමන් කරන මගීන්ට, දැන් ගමන් කරනවාට වඩා සුව පහසු විධියට ගමන් කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පුත්තලමේ සිට ඉදිරියට තිබෙන දුම්රිය මාර්ගය ගැනත් අපි අවධානය යොමු කරනවා. මේක ඇත්තටම වැදගත් වන දුම්රිය මාර්ගයක්. මගී ප්‍රවාහනය සඳහා විතරක් නොවෙයි, මේ දුම්රිය මාර්ග භාවිත කරමින් ලංකාවේ ජාතික ආර්ථිකයට වැදගත් වන කාර්යභාරයකුත් සිදු කරනවා. ඒ තමයි සිමෙන්ති නිෂ්පාදනයට භාවිත කරන හුනුගල් අරුවක්කාලු ප්‍රදේශයේ ඉඳලා පුත්තලම දක්වා transport කරනවා. ඒ කියන්නේ, අරුවක්කාලුවලදී ඒවා කඩලා පුත්තලමට අරගෙන එනවා. ඒ නිසා ඒ track එක පිළිබඳවත් අවධානය යොමු වෙලා තිබෙනවා.

ඒ වාගේම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම - solid waste management - ගැනත් අවධානය යොමු කර තිබෙනවා. Private sector එක තමයි ඒවා කරන්නේ. නමුත්, ඒක manage කිරීම සඳහා නාගරික සංවර්ධනය අධිකාරිය හරහා වැඩක් පටන් ගන්න තිබෙනවා. ඒ සඳහාත් දුම්රිය භාවිත කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ වෙනුවෙන් අපි එතැන loop lines ඉදි කිරීමක් කරනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඒ track එක වැඩිදියුණු කරන්නත්. ඒ සඳහා කරඩිපුවර් සහ පෙරියනාගවිල්ලු දුම්රිය ස්ථාන වැඩිදියුණු කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම වෙලාව අඩුවෙන් ධාවනය කිරීම සඳහා අවශ්‍ය loop lines, ඒ කියන්නේ කෙටි මාර්ගයක් ඉදි කිරීමේ කටයුතුත් අපි මේ දුම්රිය මාර්ගයේ පටන් ගන්නවා. ඒ කියන්නේ, පුත්තලමෙන් ඉදිරියට තිබෙන කොටස. එයත් ඉදි කරන්න පටන් ගන්නවා. ඒ වාගේම අරුවක්කාලු ප්‍රදේශයේ නව දුම්රිය ස්ථානයක් ඉදි කිරීමටත් කටයුතු කරනවා. මේ වැඩ පිළිවෙළ හරහා අපි බලාපොරොත්තු වෙනවා, මගී ප්‍රවාහනයට අමතරව, commercial value එකක් තිබෙන, ජාතික ආර්ථිකයට බද්ධ වන යම් ව්‍යාපෘති කිහිපයක් සඳහාත් පුත්තලම corridor එකේ ධාවනය වන දුම්රියේ දායකත්වය ලබා ගන්න.

ඒත් එක්කම අපි දන්නවා, දුම්රිය විදුලිකරණය කිරීමේ ව්‍යාපෘතිය ලබන අවුරුද්දේ පටන් ගන්නවා කියලා. සාමාන්‍යයෙන් ලංකා ඉතිහාසය තුළ මේ තාක් වියදම් කරපු වැඩිම මුදල-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, your time is up.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

ඉතිහාසයේ වැඩිම මුදල වෙන් කරමින් සිදු කරනු ලබන මෙම සම්පූර්ණ ව්‍යාපෘතියට දළ වශයෙන් රුපියල් බිලියන 600ක් විතර යනවා. Corridors 3ක් තිබෙන ප්‍රධාන මාර්ග 3ක් තමයි අපි තෝරාගෙන තිබෙන්නේ. ඒ අනුව මූලික අදියර විධියට කොළඹ සිට ගම්පහ දක්වා වන ප්‍රධාන දුම්රිය මාර්ගයේ වැඩ පටන් ගන්නවා. ඒ වාගේම coastal line එකේ කොළඹ සිට පුත්තලම දක්වාත්, රුවන්පුර දුම්රිය මාර්ගයේ හෝමාගම දක්වාත් ඉදි කිරීම් කටයුතු අපි ලබන අවුරුද්දේ පටන් ගන්නවා. ඒක 2029 අවුරුද්ද වන විට අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉන් පසු, දෙවැනි අදියර විධියට එහි දිගුව ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊට පසුව, අනෙක් corridorsවලට අදාළවත් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අපි උපරිම උත්සාහ දරනවා. පුත්තලම මාර්ගය ඇතුළු තවත් මාර්ග කිහිපයක්ම තිබෙනවා. ඉහත කී දුම්රිය ව්‍යාපෘතිය සාර්ථක වුණොත්, Colombo Suburban Railway Project - CSRP - එක හරහා අනෙකුත් මාර්ගවලට අදාළවත් එය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි, ඒක අවුරුදු තුනකින්, හතරකින් වෙන දෙයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා යම්කිසි කාලයක් ගත වෙනවා. මොකද, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමටත් අවුරුදු,-

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
CSRP කියන්නේ මොකක්ද?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
Colombo Suburban Railway Project කියන එක තමයි CSRP කියන්නේ. එම ව්‍යාපෘතිය හරහා තමයි දුම්රිය විදුලිකරණය සිදු කරනු ලබන්නේ. එම ව්‍යාපෘතිය දළ වශයෙන් අවුරුදු 3කින් අවසන් වුණත් එහි දිගුව අවසන් කරන්න තව අවුරුදු 2ක් විතර යයි. ඊට පසුව තමයි අප අනෙක් ඒවා කරන්න යන්නේ. නමුත් අපි විශ්වාස කරනවා, යම්කිසි කාලයක් තුළ අපට එය අවසන් කිරීමේ හැකියාව ලැබෙයි කියලා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chithral Fernando, you have three minutes to make the Mover's winding up remarks.

[අ.භා. 1.17]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ යෝජනාව සම්බන්ධයෙන් කථා කළ සියලුදෙනා ධනාත්මක අදහස් - positive remarks - ඉදිරිපත් කළා. මම බෙහෙවින්ම සන්තෝෂ වෙනවා, ඒ සම්බන්ධයෙන්. විශේෂයෙන්ම, මේ යෝජනාව ස්ථිර කළ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාටත්, ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමාටත්, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාටත්, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමාටත්, ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාටත්, ගරු කෝඩීස්වරන් මන්ත්‍රීතුමාටත්, අවසාන වශයෙන් අදහස් දැක්වූ නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න ගුණසේන මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම, අප මුලින් මතක් කරපු විධියට stations ටික සංවර්ධනය කරන්න අවශ්‍යයි කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් පිළිගත්තා. මේ වනකොට එම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් යනවා කියලාත් ආරංචියක් ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමියගේ ගම වන මාදම්පේ, නෙළුම්පොකුණ දුම්රිය ස්ථානය පිළිබඳව සඳහන් කළේ, ඇත්තටම එතුමියගේ ගම සංවර්ධනය කර තිබෙන එක ගැන කියන්නයි. මම ඒක කිව්වේ හොඳ අදහසකින් මිස නරක අදහසකින් නොවෙයි. මා කියපු දේට හිරුනි මන්ත්‍රීතුමියට තරහා ගිහිල්ලා එතුමිය දැන් මට දුන්නා, දුම්රිය ස්ථාන කිහිපයකම list එකක්. ඒකට අනුව, ආරච්චිකට්ටුව, කාක්කපල්ලිය, මාදම්පේ සහ නාත්තණ්ඩිය යන දුම්රිය ස්ථානත්, ඊළඟ වසරේදී කුඩාවැව, වයික්කාල සහ තුම්මෝදර යන දුම්රිය ස්ථානත් අලුත්වැඩියා කටයුතු සිදු කරනවා කියලා එතුමිය සඳහන් කළා. ඉතින්, අපට බෙහෙවින්ම සන්තෝෂයි. ඒක තමයි සිද්ධ වෙන්න අවශ්‍ය. ඒ සියලු දේවල් සිද්ධ වෙනවා කියලා එතුමිය ඒ සම්බන්ධයෙන් වගකීම භාර ගත්තා. ඒ පිළිබඳව එතුමියට ස්තුතිවන්ත වෙන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, මීගමුව කොච්චිකඩේ ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමට කටයුතු කරන බවත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. එයත් ඉතාම හොඳ කටයුත්තක්. හැකි නම් එය පුත්තලම දක්වාම දීර්ඝ කරනවා නම් වඩාත් හොඳයි. ඒ සඳහා කාලයක් ගතවන බවත්, ඉඩම් පවරා ගැනීම ඇතුළු තවත් කටයුතු කිහිපයක් සිදු කිරීමට තිබෙන බවත් අපි දන්නවා. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් මගේ ස්තුතිය පිරිනමනවා.

විශේෂයෙන්ම, දුම්රිය මැදිරිවල තත්ත්වය ගැනත් ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපට මතකයි, එක කාලයක් Clean Sri Lanka වැඩසටහන යටතේ දුම්රිය මැදිරිවල තිබෙන fan එකේ ඉඳලා ඔක්කොම සුද්ද කළා. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් එය සිදු වන්නේ නැහැ. ඔබතුමන්ලාගේ cadre එක යොදවා නිතරම ඒ කටයුත්ත සිදු කරනවා නම්, ඉතාම හොඳයි. ඒ දවස්වල අපි දැක්කා, ඒ ඔක්කොම ගිහින් හැම තැනම clean කළා. එක දවසයි දෙකයි ඒක කළේ. ඊට පස්සේ ඒක කෙරුණේ නැහැ. එය දිගටම ඒ විධියටම සිද්ධ වෙනවා නම් ඉතාම හොඳයි කියන එක මතක් කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම මම මේ පිළිබඳව කරුණු සොයාගෙන යද්දි 2025 වසරේදී ප්‍රකාශයට පත් කළ ඉතා හොඳ පර්යේෂණ පත්‍රිකාවක් මට හමු වුණා. මම එය **සභාගත*** කරනවා.

"Passenger Demand and Service Supply Imbalances in the Colombo Suburban Railway System: Findings of a Gap Analysis on Main and Puttalam Lines" තමයි එහි මාතෘකාව. කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ටී. ලලිතසිරි ගුණරුවන් මහත්මයා සහ වී.ඒ.බී. ගමගේ මහත්මයා විසින් මෙම පර්යේෂණ පත්‍රිකාව බොහෝ කරුණු කාරණා සහිතව ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අවශ්‍ය නම් ඔබතුමාටත් මෙම පර්යේෂණ වාර්තාව පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන්. හැබැයි, මෙහි සඳහන් වෙන්නේ 2019 වසරේ දත්තයි. 2019 වසරේ අළෙවි වූ දුම්රිය ටිකට් පත් සම්බන්ධයෙන් ලබා ගත් කරුණු තමයි මේකේ තිබෙන්නේ. නමුත්, 2026 වසර වන විට පවතින තත්ත්වය මොකක්ද කියන එක පිළිබඳ තොරතුරුත් ඔබතුමන්ලා මේ වනකොට ලබාගෙන ඇති කියා මා හිතනවා. මෙම වාර්තාවට අනුව මහී කිලෝමීටර් පදනම් කරගෙන තමයි මෙම විශ්ලේෂණය සිදු කර තිබෙන්නේ. ඒ අනුව, 2019 වසරේ මහී කිලෝමීටර් 190,000කට ආසන්න ප්‍රමාණයක් පිළිබඳව මෙහි සඳහන් වෙනවා. එම නිසා, අලුත් වාර්තා අරගෙන කටයුතු කරන්න කියලාත් මම සඳහන් කරනවා.

අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. පුත්තලම දුම්රිය මාර්ගයේ දුම්රිය මගී සංගමය පිළිබඳවත් අපි කථා කළා. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් ඒ කාරණය මතක් කළා. විවිධ බාධක මධ්‍යයේ වුවත් තම රාජකාරිය නිසි පරිදි ඉටු කරන සම්පත් බණ්ඩාර සහ සේනක බණ්ඩාර යන දුම්රිය රියැදුරන් දෙදෙනාට ස්තුතිය පිරිනමන්න කියලාත් එම මගී සංගමය මට දැනුම් දුන්නා. ඒ අනුව, එම රියැදුරන් දෙදෙනාටත් මගේ ස්තුතිය පිරිනමනවා.

අවසාන වශයෙන්, මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ සියලු දෙනාට නැවත වරක් මගේ ස්තුතිය පිරිනමමින්, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Private Members' Motion No. 3 in today's Order Paper - P. 133/2026 - to be moved by the Hon. Lasith Bhashana Gamage. Hon. Member, you have five minutes to move the Motion.

මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම

வீதி ஒதுக்குப் பிரதேசங்களில் மரங்களை நடுதல், அறிவியல் ரீதியாக முகாமை செய்தல் மற்றும் பராமரித்தலுக்கு முறையான வழிமுறையொன்றைத் தயாரித்தல்

FORMULATION OF A SYSTEMATIC METHODOLOGY FOR THE PLANTING, SCIENTIFIC MANAGEMENT, AND MAINTENANCE OF TREES WITHIN ROAD RESERVES

[අ.භා. 1.20]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

> "පදිකයන්ට සෙවණ සැපයීම, පරිසරයේ සුන්දරත්වය සහ හරිත ආවරණය වැඩිදියුණු කිරීම, වාහනවලින් නිකුත් වන දූෂක වායු අවශෝෂණය කිරීම මෙන්ම නාගරික ප්‍රදේශවල ජෛව කොරිඩෝ - bio corridors - ලෙස ක්‍රියා කිරීම උදෙසා මාර්ග රක්ෂිතයන්හි ඇති ගස් මඟින් සුවිශාල මෙහෙවරක් ඉටු කෙරෙන හෙයින් ද, ශ්‍රී ලංකාවේ මාර්ග රක්ෂිතයන්හි ගස් වෘත්තීයමය ආකාරයෙන් -arborists මඟින්- කළමනාකරණය නොකෙරෙන හෙයින් ද, විදුලිබලය සපයන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය - RDA, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - PRDA, පළාත් පාලන ආයතන සහ ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතනවල සේවකයන් මඟින් විදුලි රැහැන් හා මාර්ග සංඥා ආවරණය වන අතු පමණක් කපා ඉවත් කිරීමේ අක්‍රමවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන හෙයින් ද, පරිසර සුන්දරත්වය රැකෙන පරිදි මාර්ග රක්ෂිත ප්‍රමාණයන් නිසි ලෙස නිර්මාණය කිරීම, අදාළ ආයතනවල සේවකයන් පුහුණු කරමින් ශාක වියන් නඩත්තු කිරීම සහ මාර්ග රක්ෂිතවල ගස් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් සිදුවන අනතුරු හා ව්‍යසන වළක්වා ගත හැකි විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

අපි දන්නවා, ශ්‍රී ලංකාවේ වන වැස්ම සම්බන්ධයෙන් මේ වන විට පරිසර අමාත්‍යාංශයේ විවිධ සාකච්ඡා පැවැත්වෙන බව. ඒ, විශේෂයෙන්ම 2030 වසර වන විට මෙරට වන වැස්ම සියයට 32ක පමණ මට්ටමකට අරගෙන ඒම සඳහායි. මේ මොහොතේ තිබෙන ප්‍රමාණයත් එක්ක බලන කොට එය සියයට 3ක පමණ වර්ධනයක්.

නාගරික සංවර්ධන අධිකාරිය සහ අදාළ අමාත්‍යාංශය යටතේද මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම, නාගරික ප්‍රදේශවල වන වැස්ම ඇති කරන්නේ කොහොමද, වන ඝනත්වය වැඩි කරන්නේ කොහොමද යන්න පිළිබඳවත් මේ වන විට සාකච්ඡාවක් පැවැත්වෙමින් තිබෙනවා. නමුත් අපි දන්නවා, එම සාකච්ඡාව ඒ විධියට ආවාට එය ප්‍රායෝගිකව බිමේ ක්‍රියාත්මක වෙන්න අදාළ ආයතනික පද්ධතිය ඒ ව්‍යුහයේ ක්‍රියාත්මක නොවන බව. මම එහෙම කියන්නේ මේ නිසායි. අපි දන්නවා, නාගරික කලාපයෙන්, ඊට පරිබාහිර දුර කලාපවලත් රක්ෂිත තිබෙන බව. මාර්ගවල තිබෙන ඒ රක්ෂිත භාවිත කරලා වන ඝනත්වය වැඩි කර ගන්න, වන ගහනය වැඩි කර ගන්න පුළුවන්. සාමාන්‍යයෙන් විවිධ සංගම් සහ විවිධ සමිතිවලින් මාර්ගවල පැළ සිටුවීම සිදු කරනවා. නමුත්, තිබෙන ගැටලුව මෙයයි. ටික දවසකින් RDA එකෙන්, එහෙම නැත්නම්, මාර්ගය අයත් කුමක් හෝ ආයතනයකින්, එහෙම නැත්නම්, Sri Lanka Telecom එකෙන්, ලංකා විදුලිබල මණ්ඩලයෙන්, - මේ මොහොතේ ගත්තොත්, EDL එක - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ඒ සිටුවන පැළය සම්බන්ධයෙන් තිබෙන්නේ ඍණාත්මක ආකල්පයක්. මම එහෙම කියන්නේ මේ නිසායි.

මේ ගැන මම එක අවස්ථාවක ඇහුවා, අපේ RDA එකේ ඉංජිනේරු මහත්මයෙකුගෙන්. මම ගම්පහ දිස්ත්‍රික්කයේ පරිසර අනුකමිටුව නියෝජනය කරනවා. ඒ මෙහෙයවීම කරනවා. මොකද, අපි ඒ සාකච්ඡාවකදී තීන්දුවක් ගත්තා, පාරවල්වල, රක්ෂිතවල පැළ සිටුවලා ඒක ආදර්ශවත් පාරක් බවට පත් කරන්න ඕනෑය කියලා. එතකොට RDA එකේ ඉංජිනේරු මහත්මයාගෙන් අපි ඇහුවාම, කොහොමද ශාක සිටුවන්නේ, කොහොමද ඒවා නඩත්තු කරන්නේ, කොයි විධියටද අපි ඒ කටයුතු කරගෙන යන්න ඕනෑ කියලා, මට දුන් උත්තරය තමයි, "අනේ, මන්ත්‍රීතුමා, ඔක නම් කරදර වැඩ" කියන එක. මම කියන්නේ, ඒක එයාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ඒක ආයතනයේ තිබෙන ගැටලුවක්. ආයතන ව්‍යුහයේ එහෙම ක්‍රමවේදයක් නැහැ. මොන ශාක ද අපි වගා කළ යුත්තේ, මොන ශාකය මොන ප්‍රදේශයේ වගා කළ යුතුද, ඒක රැක බලා ගන්නේ කොහොමද, ඒක නඩත්තු කරන්නේ කොහොමද, ඒක සිටුවන්න ඕනෑ කොපමණ පරතරයකින්ද යන්න පිළිබඳ කිසිදු ක්‍රමවේදයක් නැහැ. ඒක මේ සියලු ආයතනවලට පොදුවේ තිබෙන ප්‍රශ්නයක්. මේ ගැටලුව විසඳන්න ලෝකයේ තිබෙනවා ක්‍රමවේදයක්. ඒ, biotechnology engineering කියන ක්‍රමවේදය. ඒක විවිධ රටවල මාර්ග සංවර්ධන අධිකාරිය සහ ඒ අදාළ ආයතන හරහා ක්‍රියාත්මක වනවා. අපි කොහොමද ඒ ක්‍රමවේදය ලංකාවට ගෙන්වා ගන්නේ? විද්‍යාත්මකව ඒ ශාක ප්‍රවර්ධනය කරගන්නේ කොහොමද? පරිසර අමාත්‍යාංශය ගෙනයන වැඩසටහනටත්, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය හරහා සිද්ධ වන ඒ ක්‍රමවේදයටත් භයියක් වෙන්න මේ ක්‍රමවේදය අපි කොහොමද මේ ව්‍යුහ තුළට බද්ධ කර ගන්නේ කියන සාකච්ඡාව කර ගන්න ඕනෑ.

මම හිතන විධියට, ශාක සිටුවීමේ වැදගත්කම, ඒකේ පාරිසරික වැදගත්කම, එහෙම නැත්නම්, ආර්ථික වැදගත්කම, සමාජයීය වැදගත්කම අපි මෙතැන සාකච්ඡා කළ යුතු නැහැ. ඒක අපි ඕනෑවටත් වඩා දන්නවා. ඒ නිසා මම හිතන විධියට, අපි සාකච්ඡා කළ යුත්තේ කොහොමද මේ ව්‍යුහය, මේ තාක්ෂණය, මේ විද්‍යාත්මක ක්‍රමවේදය අපේ රුධිරයට, ජානවලට බද්ධ කර ගන්නේ කියන එකයි. "අනේ, ඔක කරදරයක්" කියන ආකල්පයේ සිට "ඔව්, මේක තමයි ක්‍රමවේදය" කියලා වැලඳ ගන්න ක්‍රමවේදයක් බවට මේක පත් කරන්න ඕනෑ. මේ මොහොතේ අපේ Chairman විධියට ඉන්න බණ්ඩාරනායක මහත්මයා ශාකවලට බොහොම ඇලුම් කරන පුද්ගලයෙක් කියන එක මම කියන්න ඕනෑ. ඔහුත් එක්ක කථා කළාම, මේක කොහොම හරි කරමු කියන තැනක ඉන්නේ. නමුත්, ඒකට නිශ්චිත ක්‍රමවේදයක් නැහැ. එම නිසා මම හිතනවා, අපි ඒ ක්‍රමවේදය - biotechnology engineering කියන ක්‍රමවේදය - මේ ආයතන පද්ධතිය තුළට ගෙනෙන්න ඕනෑ කියලා. ඒ ක්‍රමවේදය තුළම තිබෙනවා, ඒ ශාක නඩත්තු කිරීමේ කාර්යයත්. එහි arborist කියන ගස් නඩත්තු කරන්නන් ඉන්නවා. විශේෂයෙන්ම උද්භිද උද්‍යානවල ගස් කප්පාදු කරන්නේ කොහොමද කියන එක සම්බන්ධව තාක්ෂණයක් තිබෙනවා.

දැන් අපි හිතමු, මේ මොහොතේ පාරවල්වල ගස් ටික කප්පාදු කරන්නේ කොහොමද කියලා. මොකක් හෝ ආයතනයකින් එනවා, ඒකට කිසිම ක්‍රමවේදයක් නැහැ, වයර් එකට පහත් වෙලා

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

තිබෙනවා නම් ඒ අතු ටික කපලා එතැනම දාලා යනවා. එහෙම ක්‍රමවේදයක් නොවෙයි, නිශ්චිත ක්‍රමවේදයක් අපි මේ සඳහා සකස් කර ගන්න ඕනෑ. ගස් සිටුවීමට එහා ගිහිල්ලා ivy කියන ශාකය තාප්පවල වැලක් විධියට යවන රටවල් ලෝකයේ තිබෙනවා. ඒක ලංකාවට ගැළපෙනවාද නැද්ද, ඒක කොයි විධියට ද ක්‍රියාත්මක කරන්නේ කියන එක වෙනම සාකච්ඡාවක්. ඒක අපි සාකච්ඡාවට ගන්න ඕනෑ. ඒ ශාකය වගා කරනවාට වර්ග අඩියට ගෙවනවා, සමහර රටවල.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Lasith Bhashana, your time is up.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මේ කාරණය කියලා මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි කොහොමද එහෙම තැනකට යන්න එවැනි promotion එකක් කරගන්නේ? අපි ඒ සාකච්ඡාව කර ගන්න ඕනෑ. අද දවසේ ඉදිරිපත් කළ මේ යෝජනාව සුදුසු ආකාරයකට ආයතන තුළින් ක්‍රියාවට නංවා ගත යුත්තේ කොහොමද කියන එක ගැන අපි සාකච්ඡා කළ යුතු වනවා. ඒ වාගේම අනෙකුත් අදාළ මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙනවා, මේ සම්බන්ධයෙන් කරුණු දක්වන්න.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga to second the Motion moved by the Hon. Lasith Bhashana Gamage.

[අ.භා. 1.26]

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා ගෙනාපු "මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම" කියන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව මා ස්ථිර කරනවා.

ඇත්තටම එතුමා ඉතාම වැදගත් යෝජනාවක් තමයි ගරු සභාවට ගෙනැල්ලා තිබෙන්නේ. ලංකාවේ බොහෝ මාර්ග රක්ෂිතවල විවිධ අවස්ථාවල විවිධ සංගම්වලින් සහ විවිධ ආයතනවලින් ගස් සිටුවා තිබෙනවා. ඒවා යම් වෙලාවකට ධනාත්මකවත් බලපානවා. ඒවා ඍණාත්මකවත් බලපාන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට fibre-optic linesවලට, වතුර ලයින්වලට සහ මාර්ගය පුළුල් කරද්දී ගැටලු ඇති වෙන අවස්ථාත් තිබෙනවා. කන්ද උඩරට ප්‍රදේශය ගත්තාම, මාර්ගයේ තිබෙන රක්ෂිතයන්හි ගස් සිටුවීම නිසාම යම් අනතුරුවලින් බේරීමේ හැකියාවක් තිබෙනවා. එහි තිබෙන වැදගත්කම සලකා රක්ෂිතයන්හි ගස් සිටුවීම සහ නඩත්තු කිරීම සඳහා යම් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමටයි ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ.

ඇත්තටම අපට මාර්ගය දෙපස ඇති පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමටත්, වාහනවලින් පිටවන දූමාරය සහ දූවිලි පාලනය කර ගැනීමටත්, පාංශු බාදනය අවම කර ගැනීම සඳහාත් ශාක යොදා ගන්න පුළුවන්. ඒ වාගේම, ශාක සිටුවද්දි එම ශාක පරිසර පද්ධතියට ගැළපෙනවාද කියන එක බලන්නට ඕනෑ. හැම තැනම හැම ශාකයක්ම සිටෙව්වාම ඒක පරිසර පද්ධතියට ගැළපෙන්නේ නැති වනවා. අනෙක් එක, පවතින වටිනා ගස් සංරක්ෂණය කරන්නටත් ක්‍රමවේදයක් අවශ්‍ය වනවා. ඒත් එක්කම මාර්ගයේ භූමිය තුළ සහ රක්ෂිත තුළ යම් සැලසුමකට අනුව රෝපණ කටයුතු කරන්නටත් වෙනවා. ඒ සඳහා ලංකාවේ මාර්ග පද්ධතියේ තිබෙන රක්ෂිතයන් සලකුණු කර ගැනීමත්, තිබෙන ගස් යම් ක්‍රමයකට GPS කර ගැනීමත් වැදගත් වනවා. ඒත් එක්කම ගස් සිටුවීමේදී රියැදුරන්ගේ දෘශ්‍ය පරාසරයට අවහිරයක් නොවන පරිදි සිටුවීමටත්, ගස් නිසි පරිදි කප්පාදු කරලා පවත්වාගෙන යාමත් අවශ්‍ය වනවා.

මේ වැඩකටයුතු කරගෙන යද්දි මේ සඳහා යම් නියාමනයක් අපට අවශ්‍ය වෙනවා. දැනටත් අපි දකිනවා, මාර්ග රක්ෂිතයන්හි විවිධ ශාක සිටුවා තිබෙන ආකාරය. යම් සංවර්ධන කටයුතුවලදී ඒවා ඉවත් කර ගැනීමට අවශ්‍ය වුණාමත් යම් ගැටලුසහගත තත්ත්වයන්ට මුහුණ දෙන්නට වනවා. ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා වාගේ මමත් හිතනවා, අපිට ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වාගේ ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවන්න අවශ්‍යයි කියලා. මොකද, ගස් සිටුවීම සඳහා අවසර දෙන්නේ මොන ප්‍රදේශයේද, මොන ගස්ද අවශ්‍ය වන්නේ කියා දැනගන්න. සමහර ප්‍රදේශ තිබෙනවා, තෘණ වර්ග විතරක් අවශ්‍ය වන. සමහර ප්‍රදේශ තිබෙනවා, වැඩිය උස නොයන ගස් අවශ්‍ය වන. සමහර වෙලාවට මාර්ග රක්ෂිතයන්හි ඉඩ තිබෙන තැන් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, කඩවත, කෙරවලපිටිය වාගේ areasවල expressways යට, viaducts යට විශාල ඉඩක් ඉතුරු වෙලා තිබෙනවා. අපිට පුළුවන්, ඒවා ලස්සන පරිසර පද්ධතියක් විධියට හදන්න. හැබැයි මේ ගස් සිටුවීම යම්කිසි නියාමනයකට යටත් වෙලා තමයි කරන්න ඕනෑ. එම ගස් පරිසරයට ගැළපෙනවාද, ඒ ප්‍රදේශයට ගැළපෙනවාද, ඒ තුළින් මාර්ග අනතුරු ඇති වෙන්න පුළුවන්ද සහ මාර්ග අනතුරු වළක්වන්නට ඒක යොදාගන්න පුළුවන්ද කියන නිසි නියාමනයකින් යුතුව මේක කරන්නට ඕනෑ.

ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා ඉතාම හොඳ යෝජනාවක් තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය කරන යම් නියාමන අධිකාරියක් පිහිටුවීම අත්‍යවශ්‍ය වනවා, පරිසර පද්ධතිය තුළ සහ මාර්ග රක්ෂිතයන් තුළ සිටුවන ගස් ධනාත්මකව යොදා ගැනීම සඳහාත්, රියැදුරන්ටත් ආරක්ෂාව සැලසෙන විධියට, මේ තුළින් මාර්ග පද්ධතියටත්, පරිසර පද්ධතියටත් යම් ආදර්ශයක් සහ ලස්සනක් ලැබෙන විධියට මේ වැඩ කටයුතු ටික කරගෙන යන්නත්. මම යෝජනා කළා වාගේ ඒ සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වාගේ ආයතන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ CEB එක වාගේ ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත යම් උපදේශක මණ්ඩලයක් හෝ යම් ආයතනයක් පිහිටුවනවා නම් වඩා කළමනාකරණයකින් යුතුව මේ වැඩකටයුතු ටික කරගෙන යාමේ හැකියාව ලැබෙනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Jagath Gunawardana. You have four minutes to speak on the Private Member's Motion before the House.

[අ.භා. 1.31]

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාර්ග රක්ෂිතයන්හි ගස් සිටුවීම, විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ගෙනා පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉතාම වැදගත්, කාලීන යෝජනාවක් ලෙස මා සලකනවා. මෙය නිසි අවධානයක් යොමු නොවුණු, ඒ වුණාට නිසි අවධානයක් යොමු විය යුතු යෝජනාවක් ලෙසත් මා දකිනවා. ඇත්තෙන්ම රුක් රෝපණ වැඩසටහන් විශාල වශයෙන් මේ රටේ ක්‍රියාත්මක වනවා. මාර්ග රක්ෂිතවල ක්‍රියාත්මක වනවා; වෙනත් ආකාරවලිනුත් ක්‍රියාත්මක වනවා. නමුත්, ඒවායේ නිසි කළමනාකරණයක් අපි දකින්නේ නැහැ. ඒවායේ නිසි කළමනාකරණයක් දකින්නේ නැති හින්දා, ඒවා සමහර වෙලාවට ඉබාගාතේ ගිය තත්ත්වයක් තිබෙනවා. සමහර වෙලාවට පැළ සිටුවන එක විතරයි කරන්නේ. ලොකුවට උත්සවයක් පවත්වා පැළ සිටුවනවා. ඊට පස්සේ ඒ ගස් රැක බලා ගන්නේ නැහැ; ඒ ගස්වල වර්ධනය ගැන බලන්නේ නැහැ; ඒවා කප්පාදු කිරීම ගැන බලන්නේ නැහැ. ඒ සිටුවන ලද ගස්වලින් කොටසක් මැරිලා යනවා. ඒ අනුව ඒවා ගැන සෙවීමක් නොකරන තත්ත්වයක් අපට දක්නට තිබෙනවා. එම නිසා මේ සඳහා ඉතාම හොඳ ක්‍රමවේදයක් හදන්න ඕනෑ. නිසි ආකාරයෙන් මේ තත්ත්වය අපි කළමනාකරණය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් වායුව සපයන ප්‍රධාන මූලාශ්‍රය ගස් කියලා අපි දන්නවා. අපට අවශ්‍ය ඔක්සිජන් සපයන මූලාශ්‍රය වාගේම, පරිසරයේ සුන්දරත්වය වැඩි කිරීම, සිසිලස සහ සෙවන සැලසීම, නාගරික ප්‍රදේශවල තිබෙන අධික උෂ්ණත්වය අඩු කිරීම, පාංශු බාදනය අවම කිරීම, වායුගෝලයේ ගුණාත්මකභාවය තවත් වැඩි කිරීම, වනජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා සහ වනජීවීන් සඳහා වාසස්ථාන ඇති කිරීම, ජල දූෂණය වැළැක්වීම, තද සුළංවලින් සිදු විය හැකි බලපෑම අඩු කිරීම වැනි විශාල කර්තව්‍යයක් මාර්ග ආශ්‍රිතව සිටුවන ගස්වලින් සිද්ධ වනවා. එම නිසා අපි මේ කටයුතු සඳහා සියලුම ආයතන ඒකරාශී කරගෙන යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එසේ කළොත් තමයි මේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වන්නේ. මේ තත්ත්වය ගෝලීය වශයෙනුත් මනා කළමනාකරණයකින් යුතුව, නියමිත සැලසුමකින් යුතුව සිදු කළොත් අපට පුළුවන් වනවා, දේශීය වශයෙන් රටේ වන ආවරණය වැඩි කර ගන්න. ඒ වාගේම ගෝලීය වශයෙනුත් ඒක යම්කිසි පිටිවහලක් බවට පත් වනවා.

ඒ වාගේම තවත් ඉතාම වැදගත් කාරණයක් තමයි, අපි මාර්ග ආශ්‍රිතව සිටුවන ගස්වලින් ජෛව කොරිඩෝ - bio-corridors - නිර්මාණය කරන්න අපට පුළුවන් වීම. එක වන කොටසක ඉඳන් තවත් වන කොටසකට ජෛව කොරිඩෝවක් විධියට සම්බන්ධ කරලා, මාර්ග දෙපස ඉදිකරන ගස්වලින් අපට විශාල වශයෙන් ප්‍රයෝජන සලසා ගන්න හැකියාව ලැබෙනවා. ඒ විධියට ගත්තාම මේක ඉතාම වැදගත් කටයුත්තක්. මේ සඳහා රජය වාගේම, පෞද්ගලික අංශය, විශ්වවිද්‍යාල, පාසල්, පරිසර සංවිධාන, නොයෙකුත් ප්‍රජා සංවිධාන ඇතුළු සියලුම ආයතන සම්පූර්ණයෙන්ම එකතු කරගෙන මේ කටයුතු ඉදිරියට ගෙන යා යුතුයි. ඒ සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගත යුතුයි. මේ සම්බන්ධයෙන් රජය විශේෂ අවධානයක් යොමු කරලා, මේ සඳහා අවශ්‍ය අය වැය ප්‍රතිපාදන ද ලබා දිය යුතුයි. මේ කටයුත්ත අපි සිද්ධ කළොත් අපේ රටේ වන ආවරණය වැඩි කිරීමට වාගේම මාර්ග දෙපස ඉතාම සුන්දරව පවත්වා ගැනීමටත් අපට පුළුවන් වනවා. ඒ වාගේම මෙහි තවත් නොයෙකුත් ප්‍රතිඵල අපට හොඳින් ලබා ගන්නත් පුළුවන් වනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have four minutes to speak on this Private Members' Motion.

[பி.ப. 1.35]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ லசித் பாஷண கமகே அவர்களால் கொண்டுவரப்பட்ட வீதி ஒதுக்குப் பிரதேசங்களில் மரங்களை நடுதல், அறிவியல் ரீதியாக முகாமை செய்தல் மற்றும் பராமரித்தலுக்கு முறையான வழிமுறையொன்றைத் தயாரித்தல் தொடர்பான தனிநபர் பிரேரணையை மிகவும் வரவேற்கத்தக்க ஒரு பிரேரணையாகவே நான் பார்க்கிறேன். ஏனெனில், அவர் இந்தப் பிரேரணையில் விசேடமாகச் சொல்லியிருக்கிறார், மரங்களை நடுவது மாத்திரமல்ல, அவற்றைப் பராமரிப்பது சம்பந்தமாகவும் ஒரு திட்டத்தைக் கொண்டுவர வேண்டும் என்று.

இப்போது எங்களுடைய பிரதேசங்களில் என்ன நடக்கின்றது என்று சொன்னால், பல நூற்றாண்டுகளுக்கு முதல் இந்த நாட்டை ஆட்சி செய்த அந்நியர்கள் நட்டிய நூறு வயதுக்கும் மேற்பட்ட தொல்பொருள் சின்னங்களாக இருக்கின்ற பாரிய மரங்கள்கூட road வேலைகள் செய்யப்படுகின்றபோது RDAஇனால் வெட்டி அகற்றப்படுகின்றன. மிகவும் பசுமையாக இருந்த எங்களுடைய வவுனியா நகரை ஊடறுத்துச் செல்கின்ற A9 வீதியின் அருகில் இருந்த மரங்கள் எல்லாம் வெட்டப்பட்டு, இன்று வரண்ட பிரதேசமாகக் காணப்படுகின்றது. ஆகவே, இந்த யோசனை மிகவும் முக்கியமானது. இந்த யோசனையை நடைமுறைப்படுத்தும்போது, வீதி அபிவிருத்தி அதிகாரசபை, மாகாண வீதி அபிவிருத்தித் திணைக்களம், Sri Lanka Telecom, CEB எல்லாவற்றையும் சேர்த்து ஒரு குழுவாகச் செயற்பட்டு இதனை மேற்கொள்ள வேண்டும். இதனை கௌரவ உறுப்பினரும் குறிப்பிட்டிருந்தார். ஏனென்று சொன்னால், மரங்களை நட்டி, வெயில் காலத்தில் தண்ணீர் ஊற்றி வளர்த்த மரங்களை பின்னர் இலங்கை மின்சாரசபை - CEB, ஸ்ரீ லங்கா ரெலிகொம் வெட்டிவிட்டுச் செல்கின்றன. இது மிகவும் மோசமான செயற்பாடு! ஆகவே, மேற்கூறிய அரச நிறுவனங்களையும் உள்வாங்கி திட்டமிட்ட வகையில் இந்த விடயத்தைச் செய்ய வேண்டும். பிரதான வீதிகளில் மாத்திரமல்லாமல், சகல வீதிகளிலும் மரங்களை நட வேண்டும். விசர்நாய்க்கடி நோயைக் கட்டுப்படுத்தும் நடவடிக்கைக்கு உள்ளூராட்சி மன்றங்களை உள்வாங்கியது

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

පෝල, මර නටුකෙ සම්පන්දමාන ඉන්ද විටයත්තිලුම් පේතියළවු නිතියෙ ඔදුක්කි අම්මන්රංකළෙ ඊටුපටුත්ත වේණ්ටුමෙන නාන් ඉන්දච් සන්දර්ප්පත්තිල් කේට්ටුක් කොළ්කින්රේන්.

යුත්තම් මුටින්ද පිර්පාටු, 2009ආම් ආණ්ටුක්කුම් 2015ආම් ආණ්ටුක්කුම් ඉටෙප්පට්ට කාලප්පකුතියිල්, එංකළුටෙය පිරදේසත්තිල් 10,000 ඒක්කරුක්කුම් මේල් ඉරුන්ත මිකවුම් මුක්කියමාන පෙරිය කාටුකළෙ අළිත්තු, වෙළි මාවට්ටංකළිල් ඉරුන්තු ආට්කළෙක් කොණ්ටුවන්තු කුටියේර්රංකළෙච් සෙය්තාර්කළ්. ඉප්පෝතු එන්න නටක්කින්රතු එන්රු සොන්නාල්, ආවණම් උළ්ළ, අරසාංකත්තාල් වළුංකප්පට්ට කාණිකළුක්කු ඉටම්පෙයර්න්ත මක්කළ් මීළ් කුටියේරුවතර්කු වරුම්පෝතු අන්ත ඉටංකළිල් වන වළත් තිණෙක්කළම් මර නටුකෙ සෙය්කින්රතු. කුරිප්පාක, විවසාය නිලංකළිල් මර නටුකෙ සෙය්කින්රතු.

එංකළුටෙය වවුනියා මාවට්ටත්තිලුළ්ළ කළ්ළික්කුළම් සිතම්පරම් එන්රු සොල්ලප්පටුකින්ර පාරම්පරිය කිරාමත්තිලුළ්ළ මක්කළ් 100 සතවීතම් ඉටම්පෙයර්න්තු සෙල්ලුම්පෝතු, නෙල් විතෙක්කප්පට්ටු ඔරු මාතප් පයිරාක ඉරුන්ත වයල් නිලංකළුක්කුළ් පෝය්, එන්තවොරු සින්තනෙයුමිල්ලාමල් වනවළත් තිණෙක්කළත්තිනර් වාකනංකළිල් සෙන්රු මරම් නටුකිරාර්කළ්. එමතු නාට්ටින් මොත්ත නිලප්පරප්පිල් 28 - 29 සතවීතම් වනමාක ඉරුක්ක වේණ්ටුම් එන්පතු නල්ලතොරු සින්තනෙ! කෞරව ලසිත් පාෂ්ණ කමකේ අවර්කළ් කොණ්ටුවන්තුළ්ළ ඉන්දප් පිරේරණෙයෙප් පයන්පටුත්ති එමතු නාට්ටින් වනවළත්තෙප් පාතුකාක්කලාම්. කුරුනාකලිල් ඉරුන්තු තම්පුළ්ළෙක්කුච් සෙල්ලුම් වළියිල්, වීතියෝරත්තිල් ඉරුක්කුම් වනප් පකුතියෙප් පාර්ක්කුම්පෝතු එව්වළවු අළකාක ඉරුක්කින්රතු. මක්කළ් අංකු වන්තු ඉළෙප්පාරිච් සෙල්කින්රාර්කළ්.

කෞරව පිරතිච් සපානායකර් අවර්කළේ, නාන් ඉන්ද ඉටත්තිල් ඉන්නුමොරු මුක්කියමාන විටයත්තෙක් කුරිප්පිට වේණ්ටුම්. එංකළුටෙය වවුනියා මාවට්ටත්තිල් වේලුප්පිළ්ළෙ තනපාලසිංකම් එන්ර නපර් "මරුතම් පසුමෙ ඉයක්කම්" එන්ර පෙයරිල් මර නටුකෙ ඉයක්කම් ඔන්රෙ ඉප්පොළුතු නටත්තික්කොණ්ටු ඉරුක්කිරාර්. කටන්ත 10 ආණ්ටුකළිල් ඔරු තනිනපරින් මුයර්චියාල් 11,000 මරංකළ් නටප්පට්ටු, ඉප්පොළුතු අතු ඕර් අමෙප්පාක උරුවෙටුත් තුළ්ළතු. අංකු නටප්පට්ට 11,000 මරංකළිල් 9,000 මරංකළ් උයිරෝටු ඉරුක්කින්රන. අවර්රුක්කු වෙයිල් කාලංකළිල් තණ්ණීර් පාය්ච්සුකිරාර්කළ්. අන්ත වකෙයිල්, කෞරව ලසිත් පාෂ්ණ කමකේ අවර්කළාල් කොණ්ටුවරප්පට්ට ඉන්දප් පිරේරණෙයෙ නාන් වරවේර්ක්කින්රේන්. උළ්ළූරාට්චි මන්රංකළෙයුම් උළ්වාංකි, එමතු වීතිකළෙප් පසුමෙයාන වීතිකළාකවුම්, නාට්ටුක්කුත් තේවෙයාන වනත්තෙ වීතියෝරංකළිල් අමෙප්පතර්කුමාන නටවටික්කෙකළුක්කු එංකළතු පූරණ ඔත්තුළෙප්පෙ වළංකුවෝමෙනක් කූරි, සන්දර්ප්පත්තුක්කු නන්රි කූරි විටෙ පෙරුකින්රේන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Thilina Samarakoon. You get four minutes to speak on this Motion.

[අ.භා. 1.40]

ගරු තිළිණ සමරකෝන් මහතා
(මාණ්පුමිකු තිලිණ සමරක්කෝන්)
(The Hon. Thilina Samarakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ සහෝදර ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා විසින් අද දින මේ සභාවට ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව, ඉතාම වටිනා යෝජනාවක්. මේ යෝජනාවට අදාළව කථා කළොත්, මාර්ගය දෙපස ගස් සිටුවා අලංකරණය කිරීම, පවතින ගස් ඉවත් කිරීම වැනි කාරණා පිළිබඳව අපි සැලකිල්ලක් දක්වන්න ඕනෑ. විශේෂයෙන්ම මේ සභාවේ ඉන්න මැති ඇමතිවරු බොහෝ දෙනෙකු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු විධියට වාගේම සාමාජිකයින් විධියට කටයුතු කරනවා. ඔවුන්ට ඕනෑ තරම් අත්දැකීම් තිබෙනවා, මහ දෙපස සිටුවා ඇති ගස් සම්බන්ධව. විශේෂයෙන්ම ඒවා මාතෘකා බවටත් පත් වෙලා තිබෙනවා. අපේ ලසිත් භාෂණ මන්ත්‍රීතුමා මේ යෝජනාව හරහා ඉදිරිපත් කළේ ගස් සිටුවීමේ වැදගත්කම, අවශ්‍යතාව සහ ඒවා නඩත්තු කිරීම වැනි කාරණා ගැනයි.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට මම කියන්න කැමතියි, ගස් සිටුවීම සම්බන්ධයෙන් එම දිස්ත්‍රික්කය තුළ විශේෂතාවක් දක්නට ලැබෙන බව. විශේෂයෙන්ම මහවැලි අධිකාරිය අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ස්ථාපනය වීමත් එක්ක අලුතින් ඉදි කරපු මාර්ගවල - 1980 කාලයේදීත් මාර්ග දෙපස ගස් සිටුවා තිබෙනවා - විධිමත් ආකාරයට ගස් සිටුවා තිබීම නිසා මාර්ගවලට අලංකාර ස්වභාවයක්ද එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ හරහා අපේ මනසට යහපත් අත්දැකීම් ටිකක් එකතු කර තිබෙනවා. ගස් සිටුවීම තුළින් අපේ භෞතික පරිසරයට වටිනාකමක් එකතු වන බවත් අපි සියලු දෙනාම දන්නා කාරණයක්.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, තඹුත්තේගම රෑජිණ හන්දියේ සිට ගල්නෑව හරහා බලලුවැව මංසන්ධිය දක්වා දිවෙන ජයමාවත කියන මාර්ගය ගැනත්. ඒ මාර්ගය ඉතාම අලංකාරයි. මාර්ග දෙපස ගස් සිටුවා තිබුණත් කාලය ගත වීමත් එක්ක මේ වනකොට ඒ ගස් විශාල ගස් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, ඒ ගස් නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා සමහර තැන්වල කරදරකාරී තත්ත්වයක්ද මතු වෙලා තිබෙනවා. ගස් සිටුවීමේ අවශ්‍යතාවක් තිබෙනවා වාගේම ගස් අනිවාර්යයෙන්ම සිටුවිය යුතුයි. හැබැයි, ඒ ගස් නඩත්තු කිරීමටත් විධිමත් වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම හදන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් අපට පසුගිය කාලයේදී කොළඹ දිස්ත්‍රික්කය තුළත් අත්දැකීමක් තිබෙනවා. මීට අවුරුදු කිහිපයකට කලින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාර්ගයකට ගසක් කඩා වැටීම නිසා ජීවිත කිහිපයක් අහිමි වුණා. හැබැයි, ඒවා නිසි ලෙස නඩත්තුකරණයකට ලක් කළා නම් අපට ජීවිත හානි සිදු වන එක නතර කරගන්නත්, අපේ ජීවිතවලට නැවුම් වාතාශ්‍රයක් ලබා ගන්නත් පුළුවන්කම ලැබෙනවා. මේ සියලු කාරණා අපට හරියට ඉෂ්ට කරගන්න පුළුවන්.

අපි මාර්ග පුළුල් කරනවා, බෝක්කු ඉදි කරනවා, මාර්ග කාපට් කරනවා. මේ කාරණා ගැන සැලකිල්ලට ලක් කරන ගමන් ගස් සිටුවීම සම්බන්ධයෙනුත් විධිමත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා වාගේ ඒ සඳහා පළාත් පාලන ආයතන, PRDA, RDA වාගේ ආයතනත්, ස්වේච්ඡා සංවිධානත් සම්බන්ධ කරගන්න පුළුවන්. එම ආයතන සම්බන්ධ කර ගනිමින් අනාගත පරපුර වෙනුවෙන් මාර්ග දෙපස ගස් සිටුවීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියා මමත් යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Ramanathan Archchuna. You get four minutes.

[பி.ப. 1.43]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! உங்களை பிரதிச் சபாநாயகர் என்று சொல்ல எனக்கு விருப்பமில்லை.

இன்றைய தினம் கௌரவ லசித் பாஷண கமகே அவர்களால் கொண்டுவரப்பட்டுள்ள தனிநபர் பிரேரணையை நான் முழுமனதுடன் ஏற்றுக்கொள்கின்றேன். பாதையோரங்களில் மரங்கள் நடப்பட வேண்டும் என்பதையும், இருக்கின்ற மரங்களை scientific approachமூலம் பாதுகாக்க வேண்டும் என்ற விடயத்தையும் நான் நூறு சதவீதம் ஏற்றுக்கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீங்கள் கொழும்பிலிருந்து யாழ்ப்பாணம் வரை ஒரு தடவை காரில் பயணம் செய்தீர்கள் என்றால், உங்களுக்கு குருநாகலில் இருக்கின்ற அழகு தெரியும், தம்புள்ளை எப்படி இருக்கிறது என்று தெரியும், அநுராதபுரம் எப்படி இருக்கிறது என்று தெரியும், வவுனியாவை தாண்டிப் போகும்போது, தமிழர் பிரதேசங்களில் இருக்கின்ற பாதைகள் ஒழுங்கமைக்கப்பட்டு இருக்கின்ற விதம் தெரியும்! ஒரு double-track இல்லாத பிரதேசமாகத்தான் எங்களுடைய பிரதேசம் இன்று வரை இருக்கிறது. இன்றைக்கு நாங்கள் கொழும்பிலிருந்து கண்டிக்குப் போகும்போது, double-track இருக்கிறது. காலிக்குப் போவதாக இருந்தால், expressway இருக்கிறது. வடக்கு மாகாணத்தில் வவுனியாவைத் தாண்டி ஒரு தடவை பயணம் செய்து பாருங்கள்! பாதை ஓரங்கள் முழுக்க முழுக்க குப்பைகளாக இருக்கின்ற அதேநேரம், சகல மரங்களும் வெட்டிச் சாய்க்கப்பட்டிருப்பதைக் காண முடியும்.

நான் இதற்கு நல்லதோர் உதாரணத்தைச் சொல்கின்றேன். நான் இதற்கு முன்னர் ஆற்றிய உரையிலும் சொன்னேன், எங்களுடைய பிரதேசத்தில் ஒரு signal lightகூட இல்லை என்று. எங்களுடைய பிரதேசத்தில் எந்தவோர் இடத்திலும் பாதையில் signal lights இல்லை என்று சொல்லி, 2025ஆம் ஆண்டு நாங்கள் கிளிநொச்சி டிப்போ சந்தியில் signal lightஐப் பொருத்துமாறு பகீரதப் பிரயத்தனம் எடுத்து, அதனைக் கொண்டுவந்தபோது, முதலில் பாதையோரங்களில் இருந்த மரங்கள் முழுவதையும் வெட்டித் தள்ளினார்கள். ஆனால், இன்றுவரை பாதைகள் அபிவிருத்தி செய்யப்படவில்லை. கிளிநொச்சியில் இருந்து ஆனையிறவு - கரடிப்போக்கு சந்தி வரைக்கும் எந்தப் பாதையும் புனரமைக்கப்படவில்லை. தற்பொழுதுதான் கொஞ்சம் கொஞ்சமாக, அடி அடியாக பாதை போடுகிறார்கள். ஐயா! நான் இங்கு பாராளுமன்ற உறுப்பினர்களுடைய பெயரைச் சொல்ல விரும்பவில்லை. பிறகு வேண்டுமென்றால், அவர்கள் எழும்பி பதில் சொல்லட்டும். எதிர்க்கட்சியின் வேலை விமர்சனம் செய்வது மட்டும்தான்! என்னுடைய கையில் அதிகாரம் இல்லை! அடுத்த 10 வருடங்களுக்கு தமிழர் வாழ்கின்ற எங்களுடைய பகுதிகளைச் சுத்தமாக வைத்திருக்க வேண்டும், அங்குள்ள பாதைகளை அபிவிருத்தி செய்ய வேண்டும் என்பன தொடர்பில் master plan ஒன்றைப் போட்டு, Urban Development plan ஒன்றைச் செய்கின்ற எந்தவோர் எண்ணமும் அரசாங்கத் தரப்பில் இருக்கும் இவர்களிடம் இல்லை.

76 வருட சாபம் என்று சொல்லிக்கொண்டுதான் நானும் பாராளுமன்றத்துக்கு வந்தேன். ஆனால், 77ஆவது வருடமும் அதே சாபம் வடக்கு, கிழக்கில் இருக்கக்கூடாதென நான் நினைக்கின்றேன். உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் யாருடைய பெயரையும் நான் சொல்லவில்லை. நாங்கள் DCC meetingஇல் சண்டை பிடித்து ஒரு signal lightஐ கேட்கும்பொழுது, முதலில் செய்வது மரங்களை வெட்டுவதுதான்.

இலங்கையில் காணப்படுகின்ற மிகவும் அழகான இடங்களில் ஒன்று யாழ்ப்பாணக் கோட்டைப் பகுதி! இன்று அங்குபோய் பார்த்தீர்கள் என்றால், சகல இடங்களிலும் பொலித்தீன் பரவி இருப்பதைக் காண முடியும். யாருமே அதனைத் துப்புரவு செய்வதில்லை. காலி கோட்டைப் பகுதியையும் கண்டி - தும்பர கோட்டைப் பகுதியையும் யாழ்ப்பாணக் கோட்டைப் பகுதியுடன் ஒப்பிட்டுப் பாருங்கள்! நாங்கள் இந்த அரசாங்கத்தை விமர்சிப்பதற்குத் தயாராக இல்லை. ஐயா! இந்த அரசாங்கத்தில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் shopping bagஇல் சாப்பாடு கொடுப்பதையும் 'ரயர்' கொடுப்பதையும் மாட்டுக் கன்றுகள் கொடுப்பதையும் தண்ணீர் tapஐச் சுற்றிக் கட்டிப் போட்டு ribbon வெட்டுவதையும்தான் நாங்கள் எதிர்க்கிறோம். மற்றப்படி இந்த அரசாங்கத்தை விமர்சிப்பதற்கு நாங்கள் தயாராக இல்லை.

கடந்த தடவை யாழ்ப்பாணத்தின் மானிப்பாய் பிரதேசத்தில் இருக்கின்ற Urban Development Authority - UDA- சொன்னது, பாதையோரங்களில் நடைபாதைக் கற்களை நடப்போகிறோம் என்று. இந்த நடைபாதைக் கற்களை நடும் விடயத்தை அழகாகச் செய்வதாக இருந்தால், மரங்களை வெட்டாமல் master plan ஒன்றைச் செய்யும்படி அப்போது நாங்கள் சொன்னோம். 100 வருடங்களுக்குப் பிறகு யாழ்ப்பாணம் எப்படி இருக்கும் என்பதைச் சிந்தித்து இதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு சொன்னால், எந்தப் பாராளுமன்ற உறுப்பினரும் தூரநோக்கோடு செயல்படுவதாகத் தெரியவில்லை. மரங்களை வெட்டுவது தான் முதலாவது வேலை! கிளிநொச்சி இருக்கும் அழகைப் பாருங்கள்! அதேநேரம், யாழ்ப்பாணம் இருக்கும் நிலையைப் பாருங்கள்! யாழ்ப்பாண Townஐச் சுற்றிப் பாருங்கள்! யாழ். மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் NPPஇன் பாராளுமன்ற உறுப்பினர்களிடம் நாங்கள் கேட்டுக்கொள்ள விரும்புவது, தயவுசெய்து இந்தப் பிரேரணைகளைக் கேளுங்கள் என்றுதான். At least, வீட்டில் இருந்தாவது கேளுங்கள்! உங்களுடைய கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்தான் இந்தப் பிரேரணையைக் கொண்டுவந்தார்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, your time is up.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවසන් කරනවා.

அடுத்தடுத்த DCC meetingஇலாவது சற்று சிந்தித்து, யாழ்ப்பாணத்தை அழகாக வைத்திருப்பதற்கு நடவடிக்கை எடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Prasanna Gunasena. You have eight minutes to provide the Reply.

[අ.භා. 1.48]

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මම සාධනීයව භාර ගන්නවා. සරලව කිව්වොත්, අපේ මාර්ග දෙපස - මාර්ග රක්ෂිතවල - ශාක සිටුවලා යම්කිසි ආකර්ෂණයක්, ස්වාභාවික සුන්දරත්වයක් මිනිසුන්ට ලබා දීමට තමයි යෝජනා කරලා තිබෙන්නේ. මේක සාධනීය යෝජනාවක්. මට කලින් අදහස් දක්වපු සියලු මන්ත්‍රීවරුන්ගේ යෝජනාත් ඒ විධියට සාධනීයව භාර ගන්නවා.

හැබැයි, මේ මාතෘකාව ගැන කථා කරනකොට මට එක දෙයක් මතක් වෙනවා. ඔය පාර දෙපැත්තේ තිබුණු ගස් අවභාවිත කරපු යුගයකුත් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට මතකයි, ඉස්සර පාර්ලිමේන්තුවේදී රාජපක්ෂවරුන්ට විරුද්ධව කථා කරලා ආපහු යනකොට ඔය ගස් අවභාවිත වෙලා, හැප්පිලා මැරිච්ච ඉතිහාසයකුත් තිබුණු බව. ශ්‍රීපති සූරියආරච්චි ගැන එහෙම මතක ඇති. *[බාධා කිරීම්]* නමුත්, දැන් එහෙම වෙන්නේ නැහැ. මොකද, ඒ අවභාවිත වෙන්න තිබුණු කරුණු කාරණා, බාධක දැන් ඉවත් කරලා තිබෙනවා. ඒ නිසා මේ යෝජනාව අපි සාධනීයව භාර ගන්නවා. එහෙම නැතිව මේ යෝජනාව කලින් ආවා නම් පොඩ්ඩක් අපට ඒ ගැන දෙවතාවක් හිතන්න වෙනවා. මොකද, ඒ ගස් අවභාවිත කළ ඉතිහාසයක් තිබුණු නිසා. ඒ නිසා මේ යෝජනාව අපි සාධනීයව භාර ගන්නවා.

ගරු මන්ත්‍රීතුමා යෝජනාව ගෙනෙනකොටත් මාර්ග සංවර්ධන අධිකාරියේ අදාළ නිලධාරින් එක්ක කථා කරලා තිබුණා. ඒ නිලධාරින්ගේ පිළිතුර වුණේ, මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික අපහසුතා තිබෙනවා, තව වැඩ තිබෙනවා වාගේ කාරණා. හැබැයි, ඒගොල්ලන්ගේ පැත්තෙන් බැලුවාම වාගේම දැන් තිබෙන ව්‍යුහයත් එක්ක බැලුවාම ඒක සාධනීයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේකට ව්‍යුහයක් අවශ්‍යයි. ඒ එක්කම අපේ පක්ෂයේ නිර්මාතෘවරයා වන ආදරණීය රෝහණ සහෝදරයා දශක ගණනාවකට කලින් තමයි මධ්‍යම කඳුකරය අපි කොයි විධියටද තියා ගන්න ඕනෑ කියන යෝජනාව ගෙනෙන්නේ. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව අපි ඒ බරින්ම, ඒ සාධනීයත්වයෙන්ම භාර ගන්නවා.

මේ සඳහා අපි දැනට ව්‍යාපෘතියක් හදලා තිබෙනවා. ඒක හඳුන්නේ පැහැදිලිවම, "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ. "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ඒ ව්‍යාපෘතියේ නම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "හරිත මාවත" කියන එක. ඒක තමයි ව්‍යාපෘතියේ නම. ඒ ව්‍යාපෘතිය යටතේ තමයි අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපට බිම් මට්ටමට අරගෙන යන්න තිබෙන්නේ. මේ සඳහා ව්‍යුහයක් හදා තිබෙනවා, පසු විපරමක් තිබෙනවා, නඩත්තුවක් තිබෙනවා. ඒ මොනවත් නැතුව අපට මේ යෝජනා බිමේ පැළ කරන්න බැහැ. මොකද, මීට කලිනුත් මේ වාගේ යෝජනා ඉදිරිපත් වෙන්න ඇති. හැබැයි, ඒවා සාධනීය විධියට බිමේ පැළ කිරීමේ හැකියාවක් තිබුණේ නැහැ. නමුත් "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන මේ "හරිත මාවත" කියන ව්‍යාපෘතිය යටතේ අපි බලාපොරොත්තු වෙනවා, පළමු අදියර යටතේ A හා B මාර්ගවල ගස් ලක්ෂයක් සිටුවා, ඊට පස්සේ අපේ සම්පූර්ණ target එක විධියට ගස් මිලියනයක් සිටුවා, ඒවා රැක බලාගෙන, අනාගත පරපුරට දායාද කර දෙන්න. එවැනි ව්‍යාපෘතියක් තමයි මේ "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන ඔස්සේ අපි අරගෙන එන්නේ.

මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අපි රැස්වීම් ගණනාවක් පැවැත්වුවා. එහිදී තීන්දු තීරණ කිහිපයක් ගත්තා. ව්‍යුහය සකස් කරලා තිබෙනවා. මේ වැඩසටහන යටතේ අපේ මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ග - RDA එක යටතේ වැඩි හරියක් නඩත්තු වෙන්නේ අධිවේගී මාර්ග හා A හා B මාර්ග - දෙපස හරිත ආවරණය වැඩිදියුණු කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙනවා. ඒ අනුව මූලික සැලසුම්කරණයේදී පළමු අදියර විධියට අපි ලංකාවේ තිබෙන පළාත් නවයම ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර 374ක දුරක් හඳුනාගෙන තිබෙනවා. පළමු අදියර - first stage එක - විධියට ගත්තාම ඒක ලොකු ප්‍රමාණයක්. ඉදිරියේදී ඒ සඳහා තවත් මාර්ග කොටස් හඳුනා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි හිතනවා, ඒකත් ලබන අවුරුද්ද ඇතුළත පටන් ගන්න පුළුවන් වෙයි කියලා. දිස්ත්‍රික් මට්ටමින් තාක්ෂණික ඇගැයීම් කරලා කුමන ගස් සිටුවන්න ඕනෑද, කුමන ප්‍රදේශවලද සිටුවිය යුත්තේ, කුමන දේශගුණයට අනුකූල වන ගස් සිටුවන්න ඕනෑද, ඒවායින් ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා හඳුනා ගැනීමක් කරනවා. එහෙම තමයි සිටුවන තැන සහ සිටුවන ගස් පිළිබඳව අවබෝධයක් ගන්නේ. දළ වශයෙන් ගත්තාම කොහොඹ, කුඹුක්, ඇහැළ, මී, මයිල, කරඳ, බුළු, රොබරෝසියා ඇතුළු ශාක විශේෂ ගණනාවක් මේ වෙනකොට අපි මූලික අදියරේදී සිටුවන්න හඳුනාගෙන තිබෙනවා.

මෙහි විශේෂත්වය වෙන්නේ සෑම ප්‍රදේශයකම එකම වර්ගයේ පැළ සිටුවන්නේ නැහැ. මොකද, ඒක සෙට් වෙන්නේ නැහැ. කොහෙන් හරි පැළ ටිකක් ගෙනැල්ලා ලංකාව පුරා අපට හිතුණු හිතුණු තැන්වල හිටවලා හරියන්නේ නැහැ. ඒවා යම්කිසි විද්‍යානුකූල සැලසුමකට අනුව සිටුවිය යුතුයි. අපි ඒ ඒ ප්‍රදේශවල දේශගුණික තත්ත්වයන් සලකා බලනවා, ඒ වාගේම භූගෝලීය සහ පාරිසරික තත්ත්වයන්ට ගැළපෙනවාද කියලා බලනවා. එහෙම තමයි අපි ඒ ශාක විශේෂ ප්‍රදේශය අනුව තෝරා ගන්නේ. ශාකවල මූල පද්ධතිය, වර්ධනය වෙන ස්වභාවය, පවතින ඉඩකඩ සහ දිගු කාලීන නඩත්තු අවශ්‍යතාවත් සැලකිල්ලට අරගෙන තමයි මේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ, "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේයි.

මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මාර්ග ආරක්ෂාව පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මොකද, වංගු තිබෙන තැන්වල රියදුරෙකුට පැහැදිලිව මාර්ගය නිරීක්ෂණය නොවන ආකාරයෙන් වර්ධනය වෙන ශාක සිටුවන්න බැහැ. මොන ශාකද සිටුවන්නේ, මොන ස්ථානවලද සිටුවන්නේ කියන එක පිළිබඳවත් පූර්ණ අවබෝධයක්, විද්‍යාත්මක අවබෝධයක් ඇතිව තමයි අපි මේ කටයුත්ත කරගෙන යන්නේ.

විශේෂයෙන් මාර්ග සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් ගසක් ඉවත් කරන්න සිද්ධ වෙනවා නම්, අපි ගසක් සිටුවලා ඉදිරි මාර්ග සංවර්ධන කටයුත්තකදී ඒ ගස කපලා අයින් කරන්න සිදු වෙනවා නම් අපේ ව්‍යාපෘතිය සාර්ථක නැහැ. ඒ නිසා advance programme එකක් බලලා තමයි තැන් තෝරා ගැනීම සිදු කරන්නේ. ඒ වාගේම මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - PRDA, පළාත් පාලන ආයතන සහ අදාළ තාක්ෂණික ආයතනවල සම්බන්ධීකරණයෙන් තමයි මේ කටයුතු සිද්ධ වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ විශේෂඥ සහාය ලබා ගැනීමට අපට හැකියාවක් තිබෙනවා. අපි ඒ කටටිය හඳුනාගෙන තිබෙනවා,

කාගෙන්ද තාක්ෂණික සහාය සහ විශේෂඥ ඥානය ලබා ගන්නේ කියලා. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරිය - UDA එක - යටතේ තිබෙනවා Environment and Landscape Division කියලා අංශයක්; ඒක ක්‍රියාත්මක වෙනවා. ඒකෙනුත් අපට විශේෂඥ දැනුම ලබා ගැනීමේ හැකියාවක් ලැබෙනවා.

මෙම ව්‍යාපෘතියේ තවත් වැදගත් අරමුණක් තමයි මාර්ග දෙපස ස්වභාවික සුන්දරත්වය වැඩි දියුණු කිරීම. ඔබතුමන්ලා දන්නවා අපේ රටේ දැනටමත් ඒ වාගේ හරිත ආවරණයක් තිබෙන ප්‍රදේශයක් තිබෙනවා. තඹුත්තේගම සිට ගල්නෑව දක්වා දිවෙන මාර්ගයේ දෙපැත්තේ ගස් හැදිලා හරිත ආවරණයක් නිර්මාණය වෙලා තිබෙනවා. අපට වාහනයක යනකොට ඒ ප්‍රදේශයේ නවත්වලා බෙලි මල් කෝප්පයක් බීලා, පොඩි විවේකයක් - rest එකක්, break එකක් - අරගෙන යාමේ හැකියාව තිබෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාල භූමිය මැදින් යන පාරත් ඒ වාගේම හරිත ආවරණයක් තිබුණු තැනක්. හැබැයි දැන් වුට්ටක් අඩු වෙලා තිබෙනවා. නමුත් ඒ කාලයේ ඒ පාරෙත් සෑහෙන හරිත ආවරණයක් තිබුණා. ඒ කාලයේ, අපි පාසල් යන කාලයේ මහනුවර වැව රවුමත් ඒකටම blend වෙලා ගිය එකක්. ඒවා ගැනත් පූර්ව අවබෝධයක්, විපරමක් ඇතිව තමයි අපි මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්නේ.

මේ කාරණා තුළින් පදිකයින්ට සෙවණ ලැබෙනවා, මාර්ග ආශ්‍රිත උෂ්ණත්වය අඩු කිරීමට හැකියාවක් ලැබෙනවා, වාතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ හැකියාවක් ලැබෙනවා, මාර්ග දෙපස හරිත ආවරණය ක්‍රමවත් ලෙස වර්ධනය කිරීමෙන් ජෛව විවිධත්වයට සහභෝගයක් ලැබෙනවා සහ පරිසර පද්ධතිය එකින් එක සම්බන්ධ කෙරෙන හරිත තීරු නිර්මාණය කිරීමට හැකියාව ලැබෙනවා. මේ විධියට තමයි වැඩි වශයෙන් මේ වැඩසටහන කෙරෙහි අවධානය යොමු වෙලා තිබෙන්නේ.

මම කලින් කිව්වා වාගේම මූලික අදියරේදී අපි පැළ ලක්ෂයක් සිටුවන්න බලාපොරොත්තු වුණත් අපේ අන්තිම target එක වෙන්නේ පැළ මිලියනයක් මාර්ග දෙපස රෝපණය කිරීමයි. මෙහිදී මාර්ග සංවර්ධන අධිකාරියට යම්කිසි වගකීමක් පැවරෙනවා, ඒ වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියටත් යම්කිසි වගකීමක් පැවරෙනවා. ලංකාවේ මාර්ග පද්ධතියෙන් වැඩිම ප්‍රමාණයක්, කිලෝමීටර 88,000ක් වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට, ඒ කියන්නේ ප්‍රාදේශීය සභා සහ නගර සභාවලට. ඒ ආයතනවලටත් මේ වගකීම පැවරෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, your time is up now.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
හොඳයි.

මේ සිටුවන පැළ නඩත්තු කරන්නත් අපි වැඩ පිළිවෙළක් හදාගෙන තිබෙනවා. ඒකට පොලීසිය ඇතුළු ආරක්ෂක අංශයේ නිලධාරීන් සහ පාසල් වාගේ ආයතන එකතු කරලා සම්පූර්ණ සැලැස්මක් හදලා තිබෙනවා. "ක්ලීන් ශ්‍රී ලංකා" යටතේ වන "හරිත මාවත" වැඩසටහන සම්බන්ධයෙන් අපි සංකල්ප පත්‍රිකාවක් නිර්මාණය කරලා තිබෙනවා. මේක ක්‍රියාත්මක කරන ක්‍රමවේදය මොකක්ද, කළමනාකරණ ව්‍යුහය කුමක්ද, ජාතික මට්ටමින් කොහොමද කරන්නේ, පළාත් කමිටුව කොහොමද තිබෙන්නේ, එහි ව්‍යුහය මොකක්ද, දිස්ත්‍රික් කමිටුව සහ එහි ව්‍යුහය මොකක්ද, තාක්ෂණික උපදෙස් සහ ශාක සැපයීමේ දායකත්වය දෙන්නේ කවුද කියන විස්තර වාගේම මෙහෙයුම් සහ නඩත්තු කමිටුව පිළිබඳවත් අවසාන වශයෙන් සම්පත් කළමනාකරණය සහ තිරසරභාවය පිළිබඳවත් එහි ඇතුළත් කර තිබෙනවා. මේ විධියට සම්පූර්ණ සංකල්ප පත්‍රිකාවක් එක්ක තමයි "ක්ලීන් ශ්‍රී ලංකා" යටතේ "හරිත මාවත" ව්‍යාපෘතිය පටන් ගන්නේ. මම අදාළ වන සියලුම රාජ්‍ය ආයතනවලින් සහ ලංකාවේ ජනතාවගෙන්, - මේ ව්‍යාපෘතියට ජනාධිපතිතුමාගේ ඍජු මැදිහත්වීමක් තිබෙනවා - මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට, "ක්ලීන් ශ්‍රී ලංකා" යටතේ වන "හරිත මාවත" ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

සියලුදෙනාටම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Lasith Bhashana Gamage. You have four minutes to make the Mover's winding up remarks.

[අ.භා. 1.57]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි නුවර පාරේ බැලුම්මහර ප්‍රදේශයට යද්දී colour lightsවලට කලින් තිබෙනවා ගස් සිටුවපු කුඩා ප්‍රදේශයක්. ඇත්තටම ඒ ප්‍රදේශයේ ඒ ගස් සිටුවා තිබෙන්නේ 1990 දශකයේ වාගේ මහවැලියේ වැඩ කරපු මහින්ද පනාපිටිය කියන ඉංජිනේරු මහත්මයෙක්. ඇත්තටම එතුමාට ගෞරවයක් විධියට තමයි මම මේ නම කියන්නේ. එය එතුමාගේ සංකල්පයක්. ඒ වාගේම, එතුමා යම් articles කිහිපයක් ලියලා තිබෙනවා. එතුමා කරපු researches පවා තිබෙනවා, මේ biotechnology engineering අපි ලංකාවට ගෙන්වා ගන්න ඕනෑ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඉතින්, ඒ සාකච්ඡාව එතුමා එක්ක එන්නේ. අර මම කලින් කිව්වා වාගේ, අපි කාලයක් තිස්සේ හැප්පිලා මෙන්න මේ මාර්ග රක්ෂිතවල ගස් හිටවන්නේ කොහොමද කියන සාකච්ඡාව ටික ටික අඩපණ වීගෙන යන මොහොතක තමයි ඇත්තටම එතුමාව හමු වෙන්නේ.

මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, මෙම යෝජනාව ස්ථිර කරපු අපේ ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා ඇතුළු මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සියලු මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට. විශේෂයෙන්ම ජගත් මන්ත්‍රීතුමා පැහැදිලි කළා, කොහොමද මේ සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගන්නේ කියලා. පෞද්ගලික අංශය විශේෂයෙන්ම ලොකු සහායක් ලබා දෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. විශාල පැළ සංඛ්‍යාවක් එවනවා සම්බන්ධීකරණ කමිටුවලට, මෙන්න මෙහෙම projects තිබෙනවා, කරමු කියලා. හැබැයි, අපට ගැටලුවක් මතු වෙනවා, මේක ප්‍රායෝගිකව බිමේ ක්‍රියාත්මක කරද්දී. අපි කොහොමද මේ සඳහා පාසල් පාවිච්චි කරන්නේ? මධ්‍යම පරිසර අධිකාරියේ විශේෂ පරිසර හට කණ්ඩායම් ඉන්නවා. ඔවුන්ගේ අත්පොත්වල තිබෙනවා, ගස් සිටුවන්න ඕනෑ කියලා. මෙන්න මේ සම්බන්ධයෙන් අපි කොහොමද පාසල, ඒ වාගේම අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කරගන්නේ?

ගරු සභ්‍යලිංගම් මන්ත්‍රීතුමාත්, ගරු අර්විවුනා මන්ත්‍රීතුමාත් පැහැදිලි කළා වවුනියාව සහ වවුනියාවෙන් එහා තිබෙන ප්‍රදේශවල බිමේ තිබෙන ප්‍රායෝගික තත්ත්වය. ඒ වාගේම, සභ්‍යලිංගම් මන්ත්‍රීතුමා පැහැදිලි කළා, පළාත් පාලන ආයතන

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

තුළට අපි කොහොමද මේක සම්බන්ධ කරන්නේ කියලා. ඇත්තම කථාව තමයි, පළාත් පාලන ආයතනවලට අදාළ මාර්ගවලටත් UDA එකේ regulations තිබෙනවා. ඒවාට අදාළ පළලක් තිබෙනවා. නමුත්, ඒ පළල හරියට පාවිච්චි වෙන්නේ නැහැ. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලට හිසරදයක් වෙලා තිබෙනවා දෙපැත්තේ පැළ සිටුවීම සහ ගස් සිටුවීම. ඊට අදාළව මහජන පැමිණිලි එනවා. මම හිතන විධියට, ඒ ගැන අදාළ පළාත් පාලන ආයතනවල සභාපතිවරු සහ නගරාධිපතිවරු දන්නවා, අනිවාර්යයෙන්ම.

ඒ වාගේම අපේ තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා පැහැදිලි කළා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන පාරවල් පිළිබඳව, විශේෂයෙන්ම ජය මාවතේ සුන්දරත්වය, ස්වභාව සෞන්දර්ය රැකෙන විධියට කොහොමද ඒ පාර සකස් කර තිබෙන්නේ කියලා. 1980 දශකයේ හිටවපු පැළවල අවුරුදු 50කට පසු තිබෙන සුන්දරත්වය අපි දැන් විඳිනවා. අපි මේ සාකච්ඡාව ඉදිරියට අරගෙන යන්න ඕනෑ. මේ මොහොතේ මේ ව්‍යුහයන් ගොඩනඟලා තව අවුරුදු 50කින් අපේ අනාගත පරපුරට අපි කොයි වාගේ රටක් භාරදෙනවාද, අපි කොයි තරම් ලස්සන ශ්‍රී ලංකාවක් භාර දෙනවාද, කොයි තරම් හරිතවත් ශ්‍රී ලංකාවක් භාර දෙනවාද කියන සාකච්ඡාව අපි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ විධියට Clean Sri Lanka යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වැඩසටහනක් එන්න නියමිතව තිබෙනවා. අපි බලමු, කොහොමද සම්බන්ධීකරණ කමිටු එක්ක සම්බන්ධීකරණය කරගෙන එය කරන්නේ කියලා. එතුමා කිව්වා වාගේ මේ රක්ෂිතවල නඩත්තුව සහ ගස් සිටුවීම සිද්ධ කිරීමේදී UDA එකේ තිබෙන Environment and Landscape Division එක මේ ක්‍රමවේදයට දැවැන්ත පිටුවහලක් කරගන්න පුළුවන් කියලා මම හිතනවා. මේ සම්බන්ධයෙන් ප්‍රගතිශීලී අදහස් දැක්වූ පක්ෂ, විපක්ෂ සියලුම මන්ත්‍රීතුමන්ලාට සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Private Members' Motion - P. 4/2024 - is to be moved by Hon. Hesha Withanage Ankumbura Arachchi. You have five minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Sir, I propose that the Hon. Sanjeewa Ranasingha do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම
இலங்கையின் சகல கல்வியியற் கல்லூரிகளையும் பல்கலைக்கழக பீடங்களாக மாற்றுதல்
CONVERTING ALL COLLEGES OF EDUCATION IN SRI LANKA INTO UNIVERSITY FACULTIES

[අ.භා. 2.02]

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන්ගට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යාපීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම යෝජනාව ගෙනෙන මේ මොහොත වනකොට කුලියාපිටිය විද්‍යාපීඨයට අදාළව විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගැනීමට අවශ්‍ය පරිසරය හදා තිබෙනවා. ඒ වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන ගමන් මම මේ යෝජනාව ගැන අදහස් දක්වනවා.

මේ යෝජනාව තුළින් විශේෂයෙන්ම අපේ රටේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට වටිනාකමක් එකතු කරන්න නම්, ඒ ගුරුවරුන්ගේ ගුරු පුහුණුව, ගුරුවරුන්ගේ පහසුකම්, ගුරුවරුන්ගේ වැටුප්, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාවන් පිළිබඳ ප්‍රශ්නවලට උත්තර සොයන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම විද්‍යාපීඨවල ගුණාත්මකභාවය වැඩි කරන්න නම්, අවශ්‍ය පරිදි විෂය නිර්දේශ සකස් කරලා ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමේ වගකීමක් ආණ්ඩුවට තිබෙනවා.

අද දින අපි අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මතු වුණු කාරණයක් මා කියන්නම්. එය ඉතාම කනගාටුදායක කාරණයක්. අපේ ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් එහි සිටියා; මමත් සිටියා. අපේ රටේ අධ්‍යාපන විද්‍යාපීඨවල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පසුගිය අය වැයෙන් ප්‍රාග්ධන වියදම් විධියට රුපියල් මිලියන 1,150ක් වෙන් කර තිබෙනවා. අධ්‍යාපන විද්‍යාපීඨ ටික සංවර්ධනය කරන්න රුපියල් මිලියන 1,150ක් වෙන් කළත්, 2026.10.31වන දා වනකොට අවුරුද්දෙන් මාස 10ක් ගිහිල්ලා

තිබියදීත් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 3.2යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ කවදාකවත් අපි මෙවැනි දෙයක් දැකලා නැහැ. රුපියල් මිලියන 1,150න්, රුපියල් මිලියන 3.2යි වියදම් කරලා තිබෙන්නේ. මම දන්නේ නැහැ ඒ ඇයි කියලා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාත් අද එම කාරක සභා රැස්වීමෙහි සිටියා. අදාළ නිලධාරිතුමියත් එහිදී කථා කළා. විවිධ හේතු තිබෙන්න පුළුවන්. රුපියල් මිලියන 1,150කින් රුපියල් මිලියන 3.2ක් කියන්නේ ප්‍රතිශතය 0.3යි; සියයට 1ක්වත් නැහැ. මේ මාස දෙකේදී එය සියයට 5 දක්වාවත් ගෙන යන්න වෙන්නේ නැහැ. විද්‍යාපීඨවලට පහසුකම් සපයන්න ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ අරගෙන, අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත්, ක්ෂේත්‍රය තුළ ඒ මුදල් පාවිච්චි කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිලියන 3.2 කිව්වාම හිතන්න කෝ, මේ රටේ අධ්‍යාපන විද්‍යාපීඨවල පහසුකම් සංවර්ධනය වෙන්නේ කොහොමද කියලා. ඒ නිසා අපි ඒ කාරණය ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරනවා. විශේෂ අවධානය යොමු කරන්න, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියන එක සොයා බලන්න. දැන් අපට හිතා ගන්න පුළුවන්, ඒ දරුවෝ කොච්චර අපහසුතා මධ්‍යයේ ද ඒ ඩිප්ලෝමාව ලබා ගන්නේ කියලා. ඒ හින්දා ඒ කරන කැපකිරීම්වලට වටිනාකමක් දෙන්න. උපාධියක් පිරිනමන්න ඒ අය ඉතාම සුදුසු පිරිසක්.

අපේ රටේ සමහර නීති තිබෙනවා, යල්පැන ගිහින් තිබෙන නිසා වෙනස් විය යුතු. විශේෂයෙන්ම ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවලින් ඉගෙනගෙන අධ්‍යාපනවේදී උපාධිය ලබාගත් අය අද ගෙදරට වෙලා ඉන්නවා. ඔවුන්ට පාසලකට ගිහින් උගන්වන්න විධියක් නැහැ. ඒ, රට තුළ තිබෙන පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් ලබා ගන්නා අධ්‍යාපනවේදී උපාධියත් එක්ක ඒ උපාධිය ගළපන්න බැරිකම නිසයි. ඒ හින්දා රටේ තිබෙන මීට අදාළ නීති වෙනස් කරලා හරි, විශේෂයෙන්ම පාසල් පද්ධතිය තුළ පැන නැඟී තිබෙන මේ ගැටලුවට උත්තර සොයන්න. ගරු අග්‍රාමාත්‍යතුමියගේ අවධානය මම මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. විශේෂයෙන්ම මේ යෝජනාව තුළින් අරමුණු කරන්නේ මේ රටේ පාසල්වල ගුණාත්මකභාවයකින් යුතු ගුරු පරපුරක් නිර්මාණය කිරීමයි. ඒ සඳහා පළමුවැනි පියවර විධියට මේ රටේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨවලින් ලබා දෙන ඒ ඩිප්ලෝමාව උපාධියක් විධියට පරිවර්තනය කළ යුතුය කියලා මම යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ස්ථිර කිරීම, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.06]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කාලීන වැදගත්කමක් තිබෙන යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. මම ඒ යෝජනාව ස්ථිර කරමින් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ වනකොට කුලියාපිටිය විද්‍යාපීඨය විශ්වවිද්‍යාලයක් බවට පත් කරමින් උපාධිය ලබා දීමට කටයුතු කරන බව. මේවා අප කාලයක් තිස්සේ කරපු ඉල්ලීම් අනුව සිද්ධ වෙච්ච දේවල්. ඒ සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ඉදිරිපත් කළ යෝජනාත් තිබෙනවා. හැබැයි, මෙහි පුංචි ගැටලුවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ මොකක්ද? එකම ගැසට් නිවේදනයකින් විද්‍යාපීඨවලට අරගෙන, කුලියාපිටිය විද්‍යාපීඨයෙන් උපාධියක් ලැබීමත්, අනෙක් විද්‍යාපීඨවලින් ඩිප්ලෝමාවක් ලැබීමත් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානයන් අසමාන කොට සැලකීම නොකළ යුතුයි කියන වගන්තිය උල්ලංඝනය වීමක් සිදු වෙනවා කියලා මම හිතනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා මම කියනවා, ඉතිරි විද්‍යාපීඨත් කඩිනමින් විශ්වවිද්‍යාල බවට පත් කිරීම සුදුසුයි කියලා. එම නිසා කාලීන යෝජනාවක් හැටියට මම මේ යෝජනාව දකිනවා.

ඇත්තටම කිව්වොත්, විද්‍යාපීඨයෙන් එළියට එන්නේ ඩිප්ලෝමාවක් එක්ක. ඒ බව හැමෝම දන්නවා. නමුත් විශ්වවිද්‍යාලයෙන් එන කෙනා උපාධිධාරියෙක්; ඒ වාගේම අධ්‍යාපනවේදියෙක්. අධ්‍යාපනය වෙනුවෙන්ම ලබාගත් උපාධියක් එක්ක තමයි ඒ අය සේවයට එන්නේ. එහෙම නැතිව ඩිප්ලෝමාව අරගෙන ගුරු සේවයට එන කෙනාට ඉස්කෝලේ දරුවන්ට ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරන්න තිබෙන කාලය උපාධිය ලබා ගැනීම සඳහා යොදවන්න සිදු වෙනවා. ගුරුවරයා කියන කෙනා පැය 8කට සීමා වන කෙනෙක් නොවෙයි; පාසල් කාලයට පමණක් සීමා වන කෙනෙකුත් නොවෙයි. ඩිප්ලෝමාව අරගෙන ගුරු සේවයට එන කෙනාට උපාධිය ලබා ගන්න කාලයක් යොදවන්න සිදු වෙනවා. එය ගුරුවරයාගේත්, දරුවාගේත් කාලය නාස්ති වීමක් හැටියට මම දකිනවා.

මම කියනවා, මේ යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයි කියලා. මෙය ක්‍රියාත්මක කිරීම තුළ වාසි මිසක අවාසි නැහැ. එමඟින් ගුරුවරයාගේ ගුණාත්මකභාවය වැඩි වෙනවා; ගුරුවරයාගේ වෘත්තීය අභිමානය වැඩි වෙනවා; ගුරුවරයාගේ විවේචනාත්මක චින්තනය දියුණු වෙනවා. මොකද, විශ්වවිද්‍යාලයේ තිබෙන ස්වාධීනව සිතීමේ හැකියාව, ගැටලු විසඳීමේ කුසලතාව කෙරෙහි ඇති පර්යේෂණාත්මක නැඹුරුව වාගේ දේවල් ගත්තාම ඒවා මඟින් ගුරුවරයාගේ ගුණාත්මකභාවය වැඩි වෙනවා. ඒ වාගේම උපාධිය නොමැතිකම නිසා ඇති වන, සේවා සංවර්ධනය සහ උසස්වීම්වලදී පසුබෑම්වලට ලක්වීම ආදි ගැටලු ද එමඟින් වළක්වා ගන්න පුළුවන්; පරිපාලනමය වශයෙන් තිබෙන බාධාවන් ද ඉවත් කර ගන්න පුළුවන්. ඒ වාගේම, උසස් අධ්‍යාපනයට නැඹුරු වෙන්නත් එයාට පුළුවන්. අපේ අධ්‍යාපන පද්ධතිය තුළ විෂය උගන්වන අතරේ ඒ කෙනා ඊට පස්සේ මහන්සි වෙන්නේ Master's Degree එකක් ගැනීම, PhD එකක් ගැනීම වාගේ දේවලට. ඒ වාගේ කෙනෙකු තමයි ගුරු සේවයට එන්න ඕනෑ. එවිට Master's Degree එකක් තිබෙන, එහෙම නැත්නම් PhD එකක් තිබෙන කෙනෙක් අපේ අධ්‍යාපන පද්ධතියට එකතු කිරීමක් සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

මෙවැනි උපාධිධාරියකු කෙළින්ම සේවයට බඳවා ගැනීම තුළ, මේ වනකොට ගරු සේවයේ තිබෙන වැටුප් විෂමතාව පිළිබඳ ගැටලුවටත් විසඳුමක් සොයා ගන්න අපට පුළුවන් වෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. එම නිසා අධ්‍යාපනවේදියෙකු හැටියට

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

එන කෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ වටිනාකමක් තිබෙනවා. ඒ වාගේම තමයි ඕනෑම උපාධියක් කරපු කෙනෙකු ගෙනැල්ලා ගුරුවරයෙකු හැටියට පත්වීමක් දෙනවාට වඩා අධ්‍යාපනය වෙනුවෙන්ම, ඒ කියන්නේ උගන්වන්නටම හදපු උපාධිධාරියෙකු පද්ධතියට එකතු කර ගැනීම තුළ වාසියක් අත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසාන වශයෙන් කියනවා, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගෙන ආ මෙම යෝජනාව ඉතාම කාලෝචිත බව. දැනට විශ්වවිද්‍යාල උපාධියක් ලබා දෙන තත්ත්වයට ගෙනැවිත් තිබෙන්නේ කුලියාපිටිය විද්‍යාපීඨය පමණයි. ඉතිරි විද්‍යාපීඨත් කඩිනමින් විශ්වවිද්‍යාල බවට පත් කළ යුතුයි. අච්චර මුදලක් වෙන් කරලා තිබියදීත් ඒකෙන් ලක්ෂ 32ක් නම් වියදම් කරලා තිබෙන්නේ, ඒක අභාග්‍යයක්. ඒ මුදල් වෙන් කරලා මෙම විද්‍යාපීඨ මේ කියන ඉහළ මට්ටමට ගෙනෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ අදහස් දක්වන්න ලැබීම මහත් සතුටක්. ඒ, අපත් අපේ මැනිවරණ ප්‍රකාශයෙන් දක්වපු කාරණයක් සම්බන්ධයෙන් වන යෝජනාවක් විපක්ෂයෙන්ම ඇවිල්ලා තිබෙන එක පිළිබඳවයි. අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ස්ථිර කළා. මමත් නැවත වතාවක් ඒක උචිතයි කියලා ප්‍රකාශ කරනවා.

ලංකාවේ ගුරු සේවයට අතීතයක් තිබෙනවා. එදා දුප්පත්කම සලකා දීපු සහතිකය තමයි "ජනසවි" සහතිකය. ජනසවි සහතිකයට ලකුණු 50ක් දීලා ගුරුවරුන් බඳවා ගත්තු ඉතිහාසයක් තිබෙන ලංකාවේ ගුරු සේවයේ සියලු ගුරුවරුන් උපාධිධාරීන් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවක්. ඒ පිළිබඳව තවත් වාද විවාද තිබෙන්න ඕනෑ නැහැ. අපි දන්නවා, රටට අවශ්‍ය පරිපූර්ණ පුරවැසියා බිහි කර ගැනීම සඳහා වන වගකීම පැවරී තිබෙන්නේ ඒ රටේ අධ්‍යාපනයට බව. අන්න එහිදී අධ්‍යාපනය කරවන සියලු මානව සම්පත් වැදගත්. මෙතැනදී ගුරුවරයා විතරක් නොවෙයි, ගුරු උපදේශකවරයා, අධ්‍යාපන පරිපාලන සේවයේ අය, ගුරු අධ්‍යාපනඥ සේවයේ අය වාගේ අධ්‍යාපනයට සම්බන්ධ සියලුදෙනාම වෘත්තිකයන් බවට පත්විය යුතුයි. අපි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන්ම කියලා තිබෙනවා, ගුරු වෘත්තිය ශ්‍රී ලංකාවේ පළමු වෘත්තීන් 10 අතරේ පළමු තැන තිබෙන්න ඕනෑ කියලා. ගුරු වෘත්තිය මුල් වෘත්තීන් දෙක තුන ඇතුළත තිබෙන්න ඕනෑ. අපි දන්නවා, ලෝක සාහිත්‍යයේ එන කතන්දරයක්. නමුත්, එය ජර්මනියේ හිටපු චාන්සලර් ඇන්ජලා මර්කර්ගේ කාර්ය මණ්ඩලය වෙතින් තහවුරු කරලා නැහැ. නමුත්, එය ලෝක සාහිත්‍යයේ තිබෙන කතන්දරයක්. ජර්මනියේ විනිශ්චයකාරවරුන් එක් දවසක යනවා, එහි රාජ්‍ය නායකයා වන ඇන්ජලා මර්කර්ව මුණ ගැහෙන්න. ගිහිල්ලා කියනවා, "අපටත් ගුරුවරුන් හා සමාන වැටුපක් දෙන්න" කියලා. ඒ කියන්නේ, ගුරුවරයා කොයි තරම් උඩින් ඉන්නවාද කියන එක තමයි එතැනින් හැඟෙන්නේ. එතැනදී ඇය කියනවා, "මට තේරෙන්නේ නැහැ, ඔබ ගුරුවරුන් හා සම කරන්නේ කෙසේද කියලා"යනුවෙන්. ඒකෙන් අදහස් වෙන්නේ මොකක්ද? ගුරුවරුන් රටකට ඒ තරම් වැදගත්. ඒ තරම් උඩින් තමයි ගුරුවරයා ඉන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අපිත් අපේ මැනිවරණ ප්‍රකාශනයෙන්ම කිව්වේ, රටේ ඉන්න ගුරුවරු සියලුදෙනා වෘත්තිකයන් බවට පත් කරන්න ඕනෑ බව. ඔවුන්ගේ වෘත්තිය පළමු පෙළ රස්සාවල් අතරට එකතු කරන්න ඕනෑ බව. අන්න ඒ නිසා අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාමාර්ග කිහිපයක් අරගෙන තිබෙනවා, අපි කොහොමද අධ්‍යාපනයේ මානව සම්පත සංවර්ධනය කරන්නේ කියලා.

අපේ රටේ අධ්‍යාපන සභාවක් පිහිටුවීමට යෝජිතයි. ඒ සභාවෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, අධ්‍යාපනයට සම්බන්ධ සියලු වෘත්තීන්වල යෙදෙන අය කොහොමද වෘත්තිකයන් බවට පත් කරන්නේ කියන එකයි. ඒ විතරක් නොවෙයි. ඒ වෘත්තීන්ගේ ප්‍රමිතිය අපි කොහොමද ගොඩනඟා ගන්නේ, කොහොමද ඒ වෘත්තීන්ගේ ගුණාත්මකභාවය වැඩි කර ගන්නේ කියන කාරණාත් ඉන් බලාපොරොත්තු වනවා. එම කාරණාවලින් තොරව අපට ලංකාවේ හොඳ අධ්‍යාපනයක් ගැන හිතන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා, අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරනකොට අධ්‍යාපනය ජාතික උරුමයක්; ජාතික වස්තුවක්; ජාතික අවශ්‍යතාවක්. ඒ නිසා අපි පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කරන්න, ප්‍රමිතිය වැඩි කරන්න කටයුතු කළ යුතුය කියා යෝජනා කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.15]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළාත් අධ්‍යාපන විෂය භාර හිටපු ඇමති කෙනෙක් විධියට කියන්න කැමැතියි, විශේෂයෙන් වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විධියට අපට තිබුණ විශාලම අර්බුදය තමයි දක්ෂතාව සහිත විද්‍යාපීඨ ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබීම. ඒ නිසාම අපට විවිධ ආකාරයෙන් එම ගැටලුව සමනය කර ගන්න සිද්ධ වුණා. ඒක තමයි අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වේ, ජනසවියටත්

ලකුණු දුන්නා කියලා. ඔව්, කවුරුවත් හිටියේ නැහැ. හිටපු නැති හින්දා මොනවා හරි විධියකට ගෙනැල්ලා, කවුරු හරි ඔබන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. මොකද හේතුව, අද ප්‍රාථමික ගුරුවරු හොයා ගන්න විධියක් නැහැ. ප්‍රාථමික ගුරුවරු හොයන්න බැරි නිසා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබපු graduatesලා ගෙනැල්ලා, නැත්නම් ආර්ථික විද්‍යාව කරපු අයව ගෙනැල්ලා, ප්‍රාථමික අංශවල උගන්වන්න දාන්නයි සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා තමයි අපි මෙය කියන්නේ. එවැනි තත්ත්වයක් තිබෙන නිසා තමයි මේ යෝජනාව ගෙනාවේ. මොකද, විද්‍යාපීඨ ගුරුවරු විශාල ප්‍රමාණයක් අපට අවශ්‍යයි. හැබැයි, විද්‍යාපීඨවලට අයදුම් කරන්නේ ඉතාම කුඩා සංඛ්‍යාවක්. ඒ නිසා අවුරුද්දකට පුළුවන් තරම් ප්‍රමාණයක් විද්‍යාපීඨවලට බඳවාගෙන ඒ අයට degree එකක් දීලා, පාසල් පද්ධතියට ඇතුළු කළොත් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉස්සරහට ඉතාම ඉහළ තැනකට ගේන්න පුළුවන්.

මෙහිදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, විද්‍යාපීඨවල ගැටලු ගණනාවක් තිබෙන බව. දේශකවරුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලවල විශාල හිඟයක් තිබෙනවා. ඒ වාගේම විද්‍යාපීඨවල තිබෙන තවත් විශාල අර්බුදයක් තමයි යල් පැන ගිය විෂය නිර්දේශ. ඒ වාගේම නේවාසික පහසුකම්, පන්ති කාමර සහ සනීපාරක්ෂක පහසුකම් ඇතුළු යටිතල පහසුකම්වල ගැටලු පවතිනවා. අනික් පැත්තෙන් තිබෙනවා, ශිෂ්‍ය සුබසාධනය සහ ඔවුන් මුහුණ දෙන මානසික ගැටලු. මේ කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම කියන්න කැමැතියි, විද්‍යාපීඨ ටික අපි ගොඩ ගන්නවා නම්, මෙන්න මේ කාරණය පිළිබඳවත් ඇත්තවශයෙන් අපි අවධානය යොමු කළ යුතුයි කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අගමැතිතුමිය ඒ කාලයේ අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න කියලා පෙළපාළි ගිය කෙනෙක්. දැන් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරලා තිබෙන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.04යි. එතකොට තව සියයට 3යි ගණනකින් ප්‍රතිපාදන වැඩි කරන්න තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය ඒක නෙවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙන් කරලා තිබෙන සල්ලි ටිකත් වියදම් කරලා නැහැ. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා, වෙන් කරපු රුපියල් මිලියන එක්දහස් ගණනක මුදලෙන් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 3යි කියලා. දැන් තමුන්නාන්සේලා සියලුදෙනා කැලණිය විශ්වවිද්‍යාලයට නේ වෙන් කරන්නේ, ජනාධිපතිතුමා නිසා. කැලණිය විශ්වවිද්‍යාලයට රුපියල් මිලියන 700 ගණනක මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. හැබැයි, රුපියල් මිලියන 20යි වියදම් කරලා තිබෙන්නේ. අනික් රුපියල් මිලියන 680 ගණනම අද අපතේ ගිහිල්ලා තිබෙන්නේ. සබරගමුව විශ්වවිද්‍යාලයට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ විශ්වවිද්‍යාලයෙත් ඔය වාගේම තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒකෙන් මොකක්ද අදහස් කරන්නේ? Allocation එක තිබෙනවා. නමුත්, තමුන්නාන්සේලාට වැඩ කරන්න බැහැ. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. කයිය නම් ගහන්න පුළුවන්. මොනවා හරි දෙයක් කිව්වාම ඒකට දහසකුත් දේවල් කියවනවා. කිව්වාට වැඩක් නැහැ. වැඩකටයුතු ක්‍රියාත්මක කරන තැනකට ගෙනෙන්න ඕනෑ.

ඊළඟට, අධ්‍යාපන ක්ෂේත්‍රය ගනිමු. ඔබතුමන්ලා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ මහ ලොකුවට කයිය ගහනවා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? 2025 Auditor-General's Report එකේ තිබෙනවා, දැනට විෂය නිර්දේශ සංවර්ධනයට හා මානව සම්පත් සංවර්ධනයට තමයි යාන්තම් හරි අතගහලා ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කියලා. යටිතල පහසුකම් සංවර්ධනය සහ පරිපාලනමය වෙනස්කම් තවම අවසන් නොවී අතරමඟ පවතින බව තමයි Auditor-General's Report එකෙන් කියන්නේ. තමුන්නාන්සේලා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන මහ ලොකුවට කථා කරනවා. ඒ ගැන මාස ගණන්, අවුරුදු ගණන් කියෙව්වා. හැබැයි, වැඩ වෙන්නේ නැහැ. ඒක තමයි මේ ආණ්ඩුවේ තත්ත්වය. කයිය විතරයි, වැඩක් කෙරෙන්නේ නැහැ. සල්ලි වියදම් කරන්නේ නැහැ. ආයතනවලට අවශ්‍ය මුදල් ටික ලැබෙන්නේ නැහැ. රුපියල් කෝටි ගණනින් බදු මුදල් එකතු කරනවා. සත පහක් වියදම් වෙන්නේ නැහැ. ඒක තමයි ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව කිව්වේ, අධ්‍යාපන විද්‍යාපීඨවල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කළ රුපියල් මිලියන එක්දහස් ගණනින් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 3.2යි කියලා. විද්‍යාපීඨවල අතිවිශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොහේදෝ ගිහිල්ලා හිටගෙන ඉඳලා දැන් ඉතා ජනප්‍රියයි. හැමතැනම ෆොටෝ දානවා. ඔබතුමා ඉතාම අභිංසක මන්ත්‍රීතුමෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන් කළ මුදල් වියදම් කිරීම ඒ තැනටයි පත් වෙලා තිබෙන්නේ. මේ වෙලාවේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම කියනවා, විෂය භාර අගමැතිතුමියත් එක්කත් කථා කරලා, මේ වෙන් කරන මුදල් හරියාකාරව වියදම් කරන්න කටයුතු කරන්න කියලා. මොකද, රට රටවල ගිහිල්ලා කථා කරලා වැඩක් නැහැ. එම වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට, විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[ප.ව. 2.19]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வியியற் கல்லூரிகளை பல்கலைக்கழக பீடங்களாக மாற்றுவது தொடர்பில் கௌரவ ஹேஷா விதானகே அவர்கள் கொண்டுவந்துள்ள இப்பிரேரணை ஆசிரியரின் கல்வியின் தரத்தை மேம்படுத்தும் நோக்கத்தைக் கொண்டுள்ளது. அந்த நோக்கத்தை நாங்கள் வரவேற்கின்றோம். எனினும், இந்த மாற்றத்தைச் செயற்படுத்துவதற்கான வளங்கள், நிதி மற்றும் நிருவாக ஏற்பாடுகள் குறித்த பார்வையும் சமநேரத்தில் நோக்க வேண்டியதாக இருக்கின்றது. ஆசிரியர் கல்வியின் தரம் உயர்வதை நாங்கள் விரும்புகிறோம். அந்த உயர்வு பெயர்ப்பலகையில் மட்டுமன்றி, விரிவுரை மண்டபத்திலும் ஆய்வுகூடங்களிலும் பயிற்சி வகுப்பறையிலும் பிரதிபலிக்க வேண்டும். இப்போது, கல்வியியற் கல்லூரியாக இயங்கும் வவுனியா தேசிய கல்வியியற் கல்லூரி மிகுந்த வளக்குறைபாட்டுடன் இயங்குகின்றது.

2025.10.18ஆம் திகதியன்று குறித்த கல்வியியற் கல்லூரிக்கு நேரடியாகச் சென்று, ஆளணி வளத்திலும் பௌதிக வளத்திலும் மிகுந்த பற்றாக்குறையோடு அது

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

இயங்குவதைப் பார்வையிட்டு உறுதிப்படுத்தியிருந்தோம். 60 சதவீதம் இயங்குநிலை கல்விசார் ஆளணியோடும் 38 சதவீதம் கல்வி சாரா ஆளணியோடும் நாளாந்த நிருவாக மற்றும் கலைத்திட்ட நடைமுறைகளை வினைத்திறனாகக் கொண்டுசெல்வதில் அந்த நிறுவனம் இடர்படுவதை அவதானிக்க முடிந்தது. சீரான மலசலகூட வசதியின்மை, விஞ்ஞான ஆய்வுகூட வசதிப் பற்றாக்குறை, நூலக வசதிப் பற்றாக்குறை, விடுதிப் பற்றாக்குறை, கல்வியியல் கல்லூரிகளின் கட்டடங்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்ட நிலை, வடிகாலமைப்புச் சீரின்மை, மின்விளக்குப் பற்றாக்குறை, வகுப்பறைகளில் நவீன கற்றல் கருவிகளின் பற்றாக்குறை, உள்ளக வீதிகள் சீரின்மை, பாதுகாப்பற்ற மின்சாரக் கட்டமைப்புகள் எனப் பல்வேறு குறைபாடுகளுடன் வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள ஒரேயொரு கல்வியியற் கல்லூரியான வவுனியா தேசிய கல்வியியற் கல்லூரி இயங்கி வருகின்றது.

ஆசிரியர்களை உருவாக்குகின்ற அந்த நிறுவனத்தைவிடவும், சில பாடசாலைகள் சிறந்த வளங்களைக் கொண்டுள்ள நிலையில் காணப்படுகின்றன. இவ்வாறான நிலையில், அதனைப் பல்கலைக்கழக பீடமாக மாற்றிவிட்டு, அதற்குரிய வளங்களை ஒதுக்காவிட்டால் உயர்த்தப்பட்ட அந்தஸ்துக்கும் உண்மையான வசதிகளுக்கும் இடையிலான இடைவெளி மேலும் அதிகரிக்கும். ஆகவே, முதலில் ஒவ்வொரு கல்வியியற் கல்லூரிகளினதும் தற்போதைய வளங்கள், ஆளணி மற்றும் குறைபாடுகள் மதிப்பிடப்பட வேண்டும். பட்டப்படிப்பை நடத்துவதற்குத் தேவையான தகுதியான விரிவுரையாளர்கள், நூலகங்கள், ஆய்வுகூடங்கள், கணினிகள், இணைய வசதிகள் மற்றும் விடுதி வசதிகள் என்பன உறுதிப்படுத்தப்பட வேண்டும். கட்டுமானங்களுக்கான நிதியுடன் அவற்றின் பராமரிப்புக்கும் தொடர்ச்சியான கல்விச் செயற்பாடுகளுக்கும் போதிய வருடாந்த நிதி ஒதுக்கப்பட வேண்டும். எனவே, நிறுவனங்களின் வளத் தயார் நிலையை மதிப்பிட்டு, குறைபாடுகளைப் பூர்த்திசெய்து, உரிய தரநிலைகளுடன் இந்த மாற்றம் முன்னெடுக்கப்பட வேண்டுமென இச்சபையைக் கேட்டுக்கொள்கின்றேன். நன்றி. வணக்கம்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.23]

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் தேசிய கல்வியியற் கல்லூரிகளை பல்கலைக்கழக பீடங்களாக தரமுயர்த்துவது தொடர்பான தனிநபர் பிரேரணையை இந்தச் சபையில் முன்வைத்த கௌரவ சட்டத்தரணி ஹேஷா விதானகே அவர்களுக்கு என்னுடைய மனமார்ந்த நான்றியை தெரிவித்துக்கொள்கின்றேன். இந்தப் பிரேரணையின் அடிப்படை நோக்கத்தை நான் முழுமையாக ஆதரிக்கிறேன். ஏனெனில், ஒரு நாட்டின் எதிர்காலத்தைத் தீர்மானிப்பது, அதன் பொருளாதார வளங்கள் மாத்திரமல்ல, அந்த நாட்டின் கல்வித் தரமும் கல்வியை வழங்குகின்ற ஆசிரியர்களுடைய ஆற்றலும் ஆகும். நான் இந்த இடத்தில் ஒரு திருக்குறளை ஞாபகப்படுத்த விரும்புகிறேன்.

" தொட்டனைத்து ஊறும் மணற்கேணி மாந்தர்க்குக்

கற்றனைத்து ஊறும் அறிவு"

அதாவது, மணற்கேணியைத் தோண்டத் தோண்ட நீர் ஊறுவதுபோல, ஆசிரியர்கள் தங்களைத் தொடர்ந்து புதுப்பித்து கற்றுக்கொள்ள வேண்டும். அவர்களது அறிவும் மாணவர்களுக்கான கற்பித்தல் வளமும் பெருகிக்கொண்டே இருக்க வேண்டும்.

சிறந்ததொரு கல்வி முறைமையை உருவாக்க வேண்டுமாயின், முதலில் சிறந்த ஆசிரியர்களை உருவாக்க வேண்டும். அதில் எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் மிகவும் உறுதியாக இருக்கின்றது. அதன் காரணமாகத்தான் நாங்கள் புதிய கல்விச் சீர்திருத்தங்களைக் கொண்டுவந்து இருக்கின்றோம். ஓர் ஆசிரியரானவர் சமூகத்தில் நற்பிரஜைகளை உருவாக்குவதுபோன்று, நல்ல வைத்தியர்களையும் நல்ல அரசியல்வாதிகளையும் உருவாக்குகின்றார். நல்ல அரசியல்வாதிகள் நாட்டுக்குத் தேவையான சிறந்த சட்டங்களை வகுக்கிறார்கள். என்னைப் பொறுத்தவரை, நான் ஓர் ஆசிரியராக இருந்து, பின்னர் அதிபராக இருந்து, அதன் பின்னரே அரசியல்வாதியாக வந்திருக்கிறேன். நான் அதிக புள்ளிகளைப் பெற்று, போட்டி போட்டு கல்விகற்று வந்தவன் கிடையாது. ஆனால், நல்ல விழுமியங்களைக் கற்று, அதனூடாக வளர்ந்த ஓர் ஆசிரியராக இருந்து, இப்பொழுது ஒரு பாராளுமன்ற உறுப்பினராக இருக்கிறேன். என்னை உரமிட்டு வளர்த்த நல்லாசிரியர்களை நினைத்து நான் இந்த இடத்தில் பெருமைகொள்கின்றேன். எங்களைப் போன்ற பலரை உருவாக்கிய ஆசிரியர்களுக்கு நாங்கள் எப்பொழுதும் நன்றியுடையவர்களாக இருக்க வேண்டும்.

கல்விக்கென தனியானதொரு பல்கலைக்கழகத்தை உருவாக்கவேண்டியது கட்டாயத் தேவையாகும். ஏனென்றால், ஒரு பாடசாலைக்கு பல்கலைக்கழகங்களில் கற்றுவருகின்ற பட்டதாரிகள் ஆசிரியர்களாக வருகின்றார்கள். ஆனாலும், அவர்கள் மாணவர்களைத் தயார்படுத்தக்கூடிய ஆற்றலோடு வருவதில்லை. இலங்கையின் ஆசிரியர் சேவைக்குள் பட்டதாரிகள் இருக்கிறார்கள்; டிப்ளோமாதாரிகள் இருக்கிறார்கள்; பயிற்றப்பட்ட ஆசிரியர்கள் இருக்கிறார்கள். கடந்த காலத்தில் என்ன நடந்தது என்பது உங்களுக்குத் தெரியும்! அரசியல் ரீதியாகவே நியமனங்கள் வழங்கப்பட்டன. வண்டியில் வடை விற்ற ஒருவருக்குக்கூட இரவோடு இரவாக ஆசிரியர் நியமனம் வழங்கப்பட்டதாக நான் கேள்விப்பட்டு இருக்கிறேன்.

எனவே, கல்விக்கென தனியான பல்கலைக்கழகங்களை நாங்கள் உருவாக்க வேண்டும். அதேபோன்று, ஆசிரியர்களுக்கு மத்தியில் காணப்படுகின்ற தரங்களை இல்லாமல் செய்ய வேண்டும். உதாரணத்துக்கு, கல்வியியற் கல்லூரியில் மூன்று வருடங்கள் கற்கின்ற ஓர் ஆசிரியர், பின்னர் கல்விமாணி பட்டத்தை -Bachelor of Education- பெறுவதற்காக இன்னும் மூன்று அல்லது நான்கு வருடங்கள் படிக்கவேண்டி இருக்கின்றது. ஓர் ஆசிரியர் பட்டதாரியாக வருவதற்கு கிட்டத்தட்ட பத்து வருடங்கள் செல்கின்றன. அதேபோன்று, பல்கலைக்கழகங்களில் வெவ்வேறு துறைகளில் பட்டப்படிப்பை நிறைவுசெய்கின்றவர்கள்,

எந்தவிதமான கற்பித்தல் அறிவும் இல்லாமல் பாடசாலைக்கு ஆசிரியர்களாக வருகிறார்கள். இதனால் அவர்கள் Postgraduate Diploma - PGDE - பாடநெறியைக் கற்கவேண்டி இருக்கின்றது. இந்த விடயங்கள் அனைத்தையும் புரிந்துகொண்டதன் அடிப்படையில்தான் நாங்கள் கல்விக்கென தனியான பல்கலைக்கழகத்தை உருவாக்க வேண்டும் என்பதில் உறுதியாக இருக்கிறோம்.

இவ்வளவு காலமும் மாணவர்களைப் புள்ளிகளுக்காகத் தயார்படுத்துகின்ற ஆசிரியர்களாகவே நாங்கள் இருந்து வருகின்றோம். மனிதநேயத்தையும் நேர்மையையும் திறன்களையும் கற்பிக்கின்ற, உலகத்தோடு போட்டி போடக்கூடிய நல்ல சமூகத்தை உருவாக்குகின்ற ஆசிரியர்களை உருவாக்க வேண்டும் என்று சொன்னால், நிச்சயமாக எங்களுடைய கல்வித்திட்டங்களை நாங்கள் மாற்ற வேண்டும். அதற்காக தேசிய மக்கள் சக்தி அரசாங்கம் பல்வேறு முயற்சிகளை எடுத்திருக்கின்றது.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Please give me one more minute, Sir.

எதிர்காலத்தில் கல்வியியற் கல்லூரிகளில் இருந்து வெளியேறுகின்றவர்கள் பட்டதாரிகளாக நீண்டகாலம் கற்றுக்கொண்டு இருக்காமல், அவ்வப்போது தமது வாண்மையை விருத்தி செய்கின்ற ஆசிரியர்களாக இருக்க வேண்டும். எனவே, இந்தப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ சட்டத்தரணி ஹேஷா விதானகே அவர்களுக்கு மீண்டும் நன்றியை கூறிக்கொள்கின்றேன். இந்தப் பிரேரணை மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. எனவே, நாங்கள் இதனை நிறைவேற்றியே தீருவோம் என்று இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.28]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ ஹேஷா விதானகே அவர்கள் மிகவும் முக்கியமானதொரு பிரேரணையைக் கொண்டுவந்து இருக்கிறார். இலங்கையின் சகல கல்வியியற் கல்லூரிகளையும் பல்கலைக்கழக பீடங்களாக மாற்றுதல் என்பது உண்மையிலேயே தேவையான ஒரு விடயமாகும். இந்த விடயம் பற்றி பலரும் பல்வேறு கருத்துகளைக் கூறியிருக்கின்றார்கள்.

இப்போதிருக்கின்ற கல்வியியற் கல்லூரிகளைப் பொறுத்தமட்டில், அவை 3 ஆண்டுகளில் கற்பித்தல் டிப்ளோமாவை வழங்குகின்றதே ஒழிய, பட்டக் கற்கையை வழங்குவதில்லை. அதாவது, ஆசிரிய மாணவர்களை பட்டதாரிகளாக மாற்றுவதில்லை. இவர்கள் 3 வருடங்கள் கல்வியியற் கல்லூரியில் கற்றதன் பின்னர், பட்டதாரியாக மாற வேண்டுமாக இருந்தால், இன்னும் 3 வருடங்கள் பட்டக் கற்கையை மேற்கொள்ள வேண்டும். அப்படியென்றால், அவர்களுக்கு ஒரு பட்டப் படிப்பை முடிப்பதற்கு 6 அல்லது 7 ஆண்டுகள் செல்கின்றது. இந்த கல்வியியற் கல்லூரிகள் பல்கலைக்கழக பீடங்களாக மாற்றப்படுகின்றபோது, ஏற்கெனவே இருக்கின்ற 3 ஆண்டுகள் கொண்ட கற்பித்தல் டிப்பிளோமா பாடநெறியுடன், பட்டப்படிப்பை முடிப்பதற்கு இன்னும் ஓர் ஆண்டு கற்றால், 7 ஆண்டுகள் வரை நீடிக்கின்ற இந்தக் கற்கையை 4 ஆண்டுகளில் நிறைவு செய்யக்கூடியதாக இருக்கும். அது மாத்திரமல்லாமல், ஆசிரிய மாணவர்கள் பெறுமதியான கற்பித்தல் தரத்தைப் பெறக்கூடியதாகவும் இருக்கும். எனவே, இந்த கல்வியியற் கல்லூரிகளை அரைகுறையான பீடங்களாக வைத்திருக்காமல், பல்கலைக்கழக பீடங்களாக மாற்றுகின்றபோது முழுமையான பட்டக் கற்கையைப் பெறமுடியும். அதுமட்டுமல்லாமல், இப்போது கல்வியியற் கல்லூரியில் டிப்ளோமா கற்கை நெறியை முடித்து வருகின்ற ஓர் ஆசிரியர் பட்டதாரியாக மாறுவதற்கு 3 வருடங்கள் கற்க வேண்டியிருக்கிறது.

கௌரவ ஹேஷா விதானகே அவர்கள் கொண்டுவந்துள்ள இந்தத் திட்டமானது முற்போக்கான ஒரு திட்டமாகும். இந்தத் திட்டத்தின் அடிப்படையில் கல்வித் தகுதியை மாத்திரமல்லாமல், தொழில் வாண்மைத் தகுதியையும் பெறுவதற்கு, இந்த கல்வியியற் கல்லூரிகள் நிச்சயமாக பல்கலைக்கழக பீடங்களாக மாற்றப்பட வேண்டும். அதுமட்டுமல்லாமல், கல்வியியற் கல்லூரிகளில் காணப்படுகின்ற குறைபாடுகள் நீக்கப்பட்டு, ஒரு பல்கலைக்கழகத்தின் தரத்துக்குரிய கற்பித்தலும் நடக்க வேண்டும். இந்த கல்வியியற் கல்லூரிகள் academic qualifications, professional qualifications இரண்டையும் வழங்கக்கூடியதாக மாற்றப்படும்போது, அது அங்கு கற்கின்ற மாணவ ஆசிரியர்களுக்குப் பிரயோசனம் உள்ளதாகவும், அவர்களின் கல்வித் தரத்தை அதிகரிக்கக்கூடியதாகவும் இருக்கும்.

ஆசிரியர்களுக்கான பட்டக் கற்கை, முதுமாணி கற்கை, PhD கற்கை எனப் பல கற்கைகள் இருந்தாலும்கூட, அவர்களின் கல்வித் தகைமைக்கு ஏற்ற விதத்தில் சம்பளம் கொடுக்கப்படுவதில்லை. சாதாரணமாக GCE (O/L), GCE (A/L) தகைமையுடன் உள்ளவர்களுக்கும் முதுமாணி அல்லது முனைவர் பட்டத்தைப் பெற்றவர்களுக்கும் இடையிலான சம்பள வேறுபாடு குறைவாகவே இருக்கின்றது. எனவே, இதனையும் சீர்செய்ய வேண்டும்.

இப்போது கல்விமாணிப் பட்டத்தைப் பெற்றுக்கொண்டவர்கள் ஆசிரியர் நியமனத்துக்காக காத்துக்கொண்டு இருக்கிறார்கள். அவர்களுக்குப் போட்டிப் பரீட்சை இல்லாமலே ஆசிரியர் நியமனத்தைக் கொடுக்கவேண்டிய தேவையிருக்கின்றது. கல்வியியற் கல்லூரிகளில் கற்பித்தல் டிப்ளோமாவை முடித்தவர்களுக்கு நியமனம் கொடுப்பதுபோன்று, கல்விமாணி பட்டத்தை முடித்தவர்களுக்கும் நியமனம் வழங்க வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.31]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ ஹேஷா விதானகே அவர்களால் கொண்டுவரப்பட்டுள்ள கல்வியியற் கல்லூரிகளை பல்கலைக்கழக பீடங்களாக மாற்றுகின்ற தனிநபர் பிரேரணை மிகவும் முக்கியத்துவம் வாய்ந்தது. இது அடையாளத்துக்குரிய விடயம் என்று நான் நினைக்கின்றேன்.

ஒன்பது இலட்சத்துக்கும் மேற்பட்ட தமிழ் மக்கள் வாழுகின்ற இலங்கையின் மலைநாட்டுப் பகுதியில் பல்கலைக்கழக வசதி இல்லாத நிலையில், அங்குள்ள மாணவர்கள் வேறு பல்கலைக்கழகங்களை நாடிச் செல்கின்ற இந்த நேரத்தில், கொட்டகலை - ஸ்ரீபாத கல்வியியற் கல்லூரியை பல்கலைக்கழகத்தோடு இணைக்கப்பட்ட குறிப்பாக, பேராதனைப் பல்கலைக்கழகத்தோடு இணைக்கப்பட்ட ஒரு பீடமாக மாற்றுகின்றபோது, அந்த மாணவர்களுடைய அடிப்படைக் கல்வித் தேவைகளை நிறைவு செய்யக்கூடியதாக இருக்கும். இந்த அரசாங்கம்கூட, மலையக மக்களுக்கு வீடு, காணி வழங்குவதாகக் கூறி வந்த நிலையில், கடந்த வாரம் முதலீட்டாளர்களுக்கு அரச காணிகளை வழங்குகின்றதே தவிர, அம்மக்களுக்கு குடியிருக்க காணிகளை வழங்குகின்ற நிலைமையில் இல்லை. இந்த நிலையில், அங்கிருக்கின்ற கல்வியியற் கல்லூரிகளை பீடங்களாக மாற்றுவது மிகவும் முக்கியமானது என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன்.

மிக முக்கியமாக, யாழ்ப்பாண பல்கலைக்கழகத்தின் கல்வியியல் துறை ஒரு பீடமாக மாற்றப்பட வேண்டும். அவ்வாறு மாற்றப்படுகின்ற பொழுதுதான், அதிபர்கள், கல்வியியலாளர்கள், ஆசிரியர்களுக்குரிய முகாமைத்துவத் துறை வளர்ச்சி பெறும். இலங்கையில் மீப்பேயில் மாத்திரம்தான் கல்வி முகாமைத்துவத் துறை காணப்படுகின்றது. அது தேசிய கல்வி நிறுவகத்துக்குக்கீழ் இயங்கின்றது. இதனைப் பரவலாக்கம் செய்வதென்றால், பல்கலைக்கழகத்துக்குக்கீழ் இந்த முகாமைத்துவத் துறை கொண்டுவரப்பட வேண்டும். குறிப்பாக, யாழ்ப்பாணப் பல்கலைக்கழகம், கிழக்குப் பல்கலைக்கழகத்தின்கீழ் கல்வி முகாமைத்துவத்தைக் கற்கக்கூடியதாக பீடங்கள் செழுமை பெறக்கூடிய வகையில் மாற்றப்பட வேண்டும். எனவே, யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் கல்வியியல் துறை கல்விப் பீடமாக மாற்றப்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வலிகாமம் வடக்கு பிரதேச செயலகத்தின் தகவல்களின்படி, 54.5 ஏக்கர் காணியையுடைய யாழ்ப்பாணம், பலாலி ஆசிரியர் பயிற்சிக் கலாசாலை இப்பொழுதும் இராணுவத்தின் வசம் இருக்கிறது. இராணுவம் கல்வியியல் துறை சார்ந்த நிறுவனமொன்றை இப்பொழுதும் வைத்திருக்கின்றது என்றால், இந்த நாட்டின் கல்வி எந்தளவுக்கு செத்துப்போய் இருக்கின்றது என்பதை சற்று யோசித்துப் பாருங்கள்! பல நூற்றுக்கணக்கான ஆசிரியர்களை உருவாக்கிய பலாலி ஆசிரியர் பயிற்சிக் கலாசாலை இப்பொழுதும் இராணுவ முகாமாக இருக்கின்றது என்றால், அதனை விடுவிக்க வேண்டும். காணிகளை விடுவிப்போம், மக்களின் வாழ்க்கையை மாற்றுவோம், அபிவிருத்தியைச் செய்வோம் என்று எத்தனையோ வாக்குறுதிகளை யாழ்ப்பாணத்தில் சொன்ன நீங்கள், இந்த பயிற்சிக் கலாசாலைக்குரிய காணியை விடுவித்து, அதனை யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் ஒரு பீடமாக மாற்றுங்கள்! இன்று அதிகரித்து இருக்கின்ற இளைய தலைமுறையினரின் தற்கொலைகள், அவர்களின் தவறான வழிநடத்தல்களை இல்லாமல் செய்வதற்கு, சீர்மிய வழிகாட்டல்களை வழங்கக்கூடிய பீடங்களை உருவாக்குவதற்கு இவற்றைப் பயன்படுத்த வேண்டுமென நான் இந்த இடத்தில் வலியுறுத்தி, விடை பெறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට. ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම සඳහා ගුරුවරුන්ගට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක සිට සිවි වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් කරන ලද මේ යෝජනාව ඉතාම කාලෝචිත සහ දැනට ක්‍රියාත්මක කළ යුතු එකක්. වගකීම් සහිත ආණ්ඩුවක් විධියට අපි ඒ යෝජනාව බොහොම ගෞරවයෙන් භාර ගන්නවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් මේ ගැන සඳහන් වෙනවා. ගුරු වෘත්තියේ ගෞරවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතිය තුළ සිටින සියලුම ගුරුවරුන් විශ්වවිද්‍යාල මට්ටමට උසස් කිරීම සඳහා අපේ ප්‍රතිපත්තිමය ඉලක්කයක් තිබෙනවා; ජාතික ඉලක්කයක් තිබෙනවා. ඒ සඳහා අපි වගකියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලුම විද්‍යාපීඨවල ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්වවිද්‍යාලවල තිබෙන පරිසරය හදන්නයි අපට ඕනෑ. ඒ කියන්නේ විවේචනාත්මකව හිතන, පර්යේෂණ කරන පරිසරයක් හදන්න අපට අවශ්‍යතාවක් තිබෙනවා. ඒ මතින් තමයි අපට විශ්වවිද්‍යාල මට්ටම දක්වා වර්ධනය කරගන්න වෙන්නේ.

දැන් අපි හිතන්නේ AI තාක්ෂණය ගැන. ඒ වාගේම තමයි ලෝකය ඉදිරියට යනකොට ගුණාත්මකභාවය වර්ධනය වෙන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙනුත් විද්‍යාපීඨ යාවත්කාලීන කළ යුතුයි. ගුරු වෘත්තියට ගියාට පසුව කොයි තරම් දුරට අපි අඛණ්ඩව වෘත්තිය සංවර්ධනය කරනවාද කියන කාරණාවත් විශේෂයෙන් වැදගත් වෙනවා. මේ පද්ධතියෙන් එළියට ගියත් නැවත වාරයක් අපි හිතනවා, අධ්‍යාපන පද්ධතිය ඇතුළත කොයි තරම් දුරට අපි අඛණ්ඩ ගුණාත්මක සංවර්ධනයක් කර තිබෙනවාද කියලා. මේ සම්බන්ධයෙන් අපි ගත්ත නිශ්චිත තීරණ ගැන කිව්වොත්, ජාතික විද්‍යාපීඨ තත්ත්ව සමාලෝචන කමිටුවක් අපි පත් කර තිබෙනවා, විද්‍යාපීඨවල භෞතික සහ මානව සම්පත් දියුණු කිරීම සම්බන්ධයෙන්.

මෙතැනදී මතු වෙච්ච කාරණා ටිකක් තිබෙනවා. භෞතික සම්පත් සහ මානව සම්පත් කියන දෙකේම අඩුකමක් ගැන කථා කළා. ඔව්, ඒ කාරණාව ඇත්ත. මේ සියලු විද්‍යාපීඨවල අපි හඳුනා ගත්ත ගැටලු කිහිපයක් තිබෙනවා. ඒවා තමයි, සනීපාරක්ෂාව සහ

නේවාසිකාගාර පිළිබඳ ප්‍රශ්න. ගුරු ශික්ෂණවේදීන් විධියට ඔවුන් ඉගෙනුම් පද්ධතියක ඉන්නේ. ඒ සියලු දේවල් ගැන අපට අදහසක් තිබෙනවා.

මෙවර අය වැය සම්බන්ධයෙනුත් මම යමක් කියන්න ඕනෑ. හේෂා මන්ත්‍රීතුමා සඳහන් කරපු නිසාත්, එතුමා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඉන්න නිසාත් තමයි මම මේ කාරණය කියන්නේ. මෙහි භෞතික සහ මූල්‍යමය ප්‍රගතිය සම්බන්ධයෙන් අපි නිරන්තරයෙන්ම සොයා බලමින් ඉන්නවා. ඔබතුමා ඒ ගැන හොයා බලන එකත් හොඳයි. අපට සැප්තැම්බර් 30වැනි දාට වඩා මූල්‍ය ප්‍රගතියක් ගන්න වෙන්නේ දෙසැම්බර් 31වැනි දා වෙනකොටයි. හැබැයි, අපි යම්කිසි මට්ටමක භෞතික ප්‍රගතියක් දකිනවා. ඒක අපට මූල්‍ය ප්‍රගතියට ගන්න බැරි නිසා අපි උපදෙස් දීලා තිබෙනවා, පුළුවන් තරම් ඉක්මනින් මූල්‍ය කටයුතුත් ඉවර කරන්න කියලා. ඒක කොන්ත්‍රාත්කරුවන්ටත් පහසුවක්. නමුත් අපි හිතනවා, මේ අවුරුද්ද අවසන් වෙනකොට අපට සැලකිය යුතු මට්ටමින් මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. එහිදී ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම විශේෂයෙන්ම වැදගත් වෙනවා. ඒක තමයි නිශ්චිත සැලැස්ම. පළමුවෙනි අදියර තමයි අපි දැන් සිදු කරමින් තිබෙන විද්‍යාපීඨවල දැනට ඇති විෂය නිර්දේශය - syllabus එක - අලුත් කිරීම. දශකයකට වඩා පරණ syllabus එකක් තමයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒක අලුත් කරලා, අලුත් විෂය නිර්දේශයක් - syllabus එකක් - තුළ තමයි ගුරු විද්‍යාපීඨ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැන් ඉන්නේ. දෙවැනි අදියර තමයි දැන් තිබෙන මට්ටමෙන් ඉදිරියට ගිහිල්ලා, SLQF Level 4 දක්වා, ඒ කියන්නේ උසස් ඩිප්ලෝමාවක් දක්වා වර්ධනය කිරීම. මේකේ credit map කිරීමක් අපි කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා. තුන්වැනි කාරණය මේකයි. දැන් මේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට SLQF Level 4 එකට ගිහිල්ලා SLQF Level 6 දක්වා යාම සඳහා අනුමැතිය ලැබී තිබෙනවා. ඒක තමයි ගෞරව උපාධි කියන මට්ටම. මෙහිදී කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි, අධ්‍යයන කටයුතු මණ්ඩලයෙන් - Academic Affairs Board, AAB එකෙන් - අනුමැතිය ලැබෙන්න ඕනෑ. ඊට පසුව ආයතන මණ්ඩලයෙන් අනුමැතිය ලැබෙන්න ඕනෑ. මේ සඳහා ඒ දෙකෙන්ම අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ කොටස් තුනයි. අප විද්‍යාපීඨ යාවත්කාලීන කරනවා. දෙක, SLQF Level 4 දක්වා වර්ධනය කරනවා. ඊළඟට, SLQF Level 6 දක්වා වර්ධනය කරලා ගෞරව උපාධියක් දක්වා එන්න දැන් අනුමැතිය ලැබිලා තිබෙනවා. ඕක තමයි කාරණය. අපි මේ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. ඒ අනුව මූලික කටයුත්ත තමයි භෞතික සම්පත් ලබා දීම.

මානව සම්පත් ගැන කථා වෙච්ච හින්දා මම නැවත වරක් මේ ගැන කියන්න කැමතියි. විශේෂයෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් ප්‍රමාණයක් කරනවා. එතැනදී ගුරු අධ්‍යාපන විද්‍යාපීඨවලට රසායනාගාර සහායක, තාක්ෂණ පීඨ සහායක, සේවා සහායක, පාසල් ආරක්ෂක, විදුලි කාර්මික, ජලනල කාර්මික ආදී වශයෙන් බඳවා ගැනීම් කිහිපයකුත් කරන්න අපි සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මෙන්න මේ කාරණාවත් කියන්න ඕනෑ. අපි කුලියාපිටිය අධ්‍යාපන විද්‍යාපීඨය ගැන කථා කළා. මෙතැනදී ගෞරව උපාධියක් දෙනවා. ඉදිරියේදී සියලු විද්‍යාපීඨවලට පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ හා සමානව උපාධිය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු අපි කරනවා. මෙතැනදී පැන නඟින කාරණා කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහිදී මතු වන එක කාරණාවකට මම මුලින් උත්තර දීලා ඉන්නම්. අධ්‍යාපනවේදී උපාධිය සම්බන්ධයෙන් අපි කිහිප වතාවක් පාර්ලිමේන්තුවේ කථා කළා. අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම සිද්ධ කරනවා. එතැනදී ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණාව ඇත්ත. එතැනදී මතු වෙන්නේ මේ උපාධිවල තිබෙන ප්‍රමිතිය සම්බන්ධවයි. ඒ සම්බන්ධයෙන් නිශ්චිතව කමිටුවක් පත් කරලා දැන් නිර්ණායක හතරක් මත කටයුතු කරනවා. දැනට ඒ නිර්ණායක සපුරන විශ්වවිද්‍යාල, පෞද්ගලික විශ්වවිද්‍යාල තෝරාගෙන තිබෙන්නේ. එතැනදී කාරණා හතරක් බලලා තිබුණා. එනම්, physical degree එකක් දෙනවාද, online නොවෙයිද, ඊළඟට, credit 120ද, සීමාවාසික පුහුණුවක් දෙනවාද, පර්යේෂණ කරනවාද කියන ඒවා. ඔය හතර බලලා තමයි Public Service Commission - PSA - එකෙන් අවස්ථාව දෙන්නේත්, මේ දෙගොල්ලන් බඳවා ගන්න. ඒ සඳහා කලින් තිබුණු නඩු තීන්දුවකුත් බලපා තිබෙනවා. ඒ නිසා මේ කියන රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතියට එන්නේ,-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

බඳවා ගැනීම් අපි ඉතාම ඉක්මනින් කරනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් මේ ගැන සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වයඹ පළාතේ කරුවලගස්වැව ප්‍රදේශයේ සියලු පහසුකම් තිබෙන ප්‍රාථමික පාසලක් අපි හදලා තිබෙනවා. මේක තමයි prototype එක; ආදර්ශ පාසලක්. කරුවලගස්වැවට මමත් ගියා. ඒ පාසලට ශිෂ්‍යයන් ලබා ගන්න පුළුවන් වෙයිද කියන එක බැලුවා. මේ විධියේ ආදර්ශ විද්‍යාල 309ක් අපි හදනවා, සියලු කොටස්වාස පුරා. මේක තමයි විධිය. ඉදිරියේදී පාසල කියන්නේ ඉගෙනුම් අවකාශයක් මිස බිත්ති හතරක් නොවෙයි. කරුවලගස්වැවත්, නගරයේත් හැමෝටම පාසල් අධ්‍යාපනය සමානව දෙන්න තමයි අපි කල්පනා කරන්නේ. ඒක තමයි විධිය.

මේ ගරු සභාවේ අදහස් දක්වපු සියලුම මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට මගේ ස්තුතිය පළ කරනවා, බොහොම ධනාත්මකව මේ සම්බන්ධයෙන් අදහස් යොමු කිරීම ගැන. අපි බොහොම සුබවාදීව ඉදිරි කටයුතු කරන බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ස්ථිර කරපු ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සුනිල් රාජපක්ෂ

[ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

මන්ත්‍රීතුමාට, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට, ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමාට, ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමාට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට සහ පිළිතුරු කථාව කළ නියෝජ්‍ය අමාත්‍ය ගරු මධුර සෙනෙවිරත්න මැතිතුමාට මගේ ස්තුතිය පිරිනමනවා. මේ යෝජනාව පිළිබඳව පක්ෂ විපක්ෂ සියලු දෙනාම ඉතාම සාධනීය ලෙස අදහස් ප්‍රකාශ කළා. මේ යෝජනාව ඉදිරියට ගෙන යන්න අවශ්‍ය ශක්තිය ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ප්‍රකාශ වුණා. ඒ පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම විශේෂ කාරණාවක් මතු කරනවා. අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව විසඳන්න පුළුවන් ප්‍රශ්න, දීර්ඝ කාලයක් තිස්සේ එක් එක් අමාත්‍යවරුන්ගේ ක්‍රියාකලාප නිසා එක තැන පල් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මම එක් කාරණාවක් කියලා මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඒ, ගුරු සේවය ගැනයි. ගුරු සේවයේ 2-II, 2-I ශ්‍රේණිවල ඉන්න ගුරුවරයෙක් විදුහල්පතිවරයෙක් වෙනවාය කියන්නේ, මේ තිබෙන ක්‍රමවේදය අනුව ඔහුගේ රැකියා ජීවිතයම විනාශ වෙලා යනවා. ගුරු සේවයේ 2-II, 2-I ශ්‍රේණිවල ඉඳලා විදුහල්පතිවරයෙක් වෙච්ච ගමන් වැටුප අඩු වෙනවා. වැටුප අඩු වෙන එකට ගැළපුම් දීමනාවක් දීලා, යම් කිසි කාලයක් ගිහිල්ලා ඒක ආයෙත් අතහැරලා දමනවා. මේ වෙනකොට විදුහල්පති සේවයේ ඉන්න අය "අපිට ආපහු ගුරු සේවයට යන්න දෙන්න" කියලා ඉල්ලනවා. අපේ රටේ අධ්‍යාපන පරිපාලනය තුළ ගුණාත්මකභාවයකින් ඉස්සරහට අරගෙන යන්න පුළුවන් විදුහල්පතිවරයෙක් හදන්න පුළුවන් වෙන්නේ නැහැ, මේ විධියට.

ඒ වාගේම මම මේ වෙලාවේදී සිහිපත් කරනවා, නිටපු අධ්‍යාපන අමාත්‍ය, අකිල විරාජ් කාරියවසම් මැතිතුමාව. මේ තත්ත්වය නිවැරැදි කරන්න උත්සාහ කරනකොට එතුමාගේ කාලසීමාව අවසන් වුණා. ඔබතුමන්ලාගේත් දැන් අවුරුදු දෙකක කාලයක් ගෙවිලා ගිහිල්ලා තිබෙනවා. මම හිතනවා, මේ යෝජනාව අතිශය වැදගත් වෙයි කියලා. මේක අපේ රටේ ඉතාම සංවේදී කාරණාවක්. අපේ ශාන්ත මන්ත්‍රීතුමන්ලා එහෙම මේ ගැන දන්නවා. ගුරුවරු විධියට ඔබතුමන්ලාගේ යාළුවෝ ඔබතුමන්ලාට මේ චෝදනාව කරනවා ඇති. ඒ නිසා මේ වෙනුවෙන් යම් කිසි මැදිහත්වීමක් කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවදුරටත් මම කාරණයක් මතක් කරනවා. අද අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුදෙනා කැඳවුවා. එහිදී අපි දැකපු දේ එච්චර හොඳ නැහැ. මම ඒ දැකපු කරුණු කිහිපයක් ගැන කියන්න විස්තර අරගෙන ආවා. සබරගමුව විශ්වවිද්‍යාලයට වෙන් කරපු මුදලින් මූල්‍ය ප්‍රගතිය සියයට 2යි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා කියපු විධියට දෙසැම්බර් 31 වෙනකොට සියයට 98ක් වැඩ කරන්න බැහැ නේ. සියයට සියයක් නොවෙයි සියයට 50ක්වත් කරන්න බැහැ. ඒ වාගේම ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියයට 11යි. මේ 10වැනි මාසයේ 31වැනි දාට. ඒ වාගේම "දිවිවා" වෙනුවෙන් Eastern University එකට දීලා තිබෙන මුදලින් මේ වෙනකොට රුපියලක්වත් වියදම් කරලා නැහැ. ඒ නිසා මම හිතනවා, අධ්‍යාපනය තුළ ගුණාත්මකව ඉස්සරහට යන්න නම්, පරිපාලනය ඇතුළේ ඉන්න කණ්ඩායම්වල ක්‍රියාවලිය මොකක්ද කියන එක අධීක්ෂණයට යටත් කරන්න වෙයි කියලා. අපි ඒ යුතුකම තමයි ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් කරන්නේ. අද මේ රටේ ඉතා විශාල සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන, විද්‍යාපීඨවලින් එළියට එන ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ට අපේ රටේ පිළිගත් උපාධියක් ලබා දෙන්න අවශ්‍ය යෝජනාව සම්මත වුණා. ඒ වෙනුවෙන් සියලුදෙනාට ඉදිරි ක්‍රියාමාර්ග ගන්න කියන ඉල්ලීම කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පෞද්ගලික මන්ත්‍රී යෝජනා අංක 6 - පා. 56/2025 - ඉදිරිපත් කිරීම, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම

உடவளவை பிரதேசத்தை சுற்றுலா வலயமாகப் பிரகடனப்படுத்தல்

DESIGNATION OF THE UDAWALAWE AREA AS A TOURIST ZONE

[අ.භා. 2.48]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඝපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පත හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ෂණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උඩවලව ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් බවට පත් වුණේ ඇයි කියලා බැලුවොත්, ඒකේ ප්‍රධානම සාධකය තමයි සංචාරකයන්ගේ පැමිණීම සිද්ධ වෙන උඩවලව ජාතික වනෝද්‍යානය. 1972 ජූලි මාසයේ 31වැනි දා උඩවලව ජාතික වනෝද්‍යානය ප්‍රකාශයට පත් කරනවා. එහි මූලික අරමුණ වන්නේ, උඩවලව ජලාශය ඉදි කිරීම නිසා එහි වාසස්ථාන අහිමි වූ වන සතුන්ට ප්‍රදේශයක් වෙන් කිරීමත්, උඩවලව ජලාශය පෝෂිත ස්ථානයක් බවට පත් කිරීමත්. උඩවලව වනෝද්‍යානය ජාතික වනෝද්‍යානයක් බවට පත් කළාට පසුව එය නැරඹීම සඳහා 1990 දශකයේ මුල් කාලයේ පැමිණියේ දෙස් විදෙස් සංචාරකයන් එක්කෙනෙක් දෙදෙනෙක් පමණක් බව අපි දන්නවා. එක්කෙනෙකුවත් පැමිණියේ නැති දවස් පවා තිබුණු බව අපි දන්නවා. හැබැයි, එම දශකයේ අවසාන භාගය වන විට දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත් ප්‍රදේශයක් බවට උඩවලව ජාතික වනෝද්‍යානය පත් වුණා. ඒ ආකාරයට උඩවලව වනෝද්‍යානය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් බවට වර්ධනය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය තුළ උඩවලව ඇත් අතුරු සෙවණ නැරඹීම සඳහා දේශීය සංචාරකයන් 149,785දෙනෙකු පමණ සහ විදේශීය සංචාරකයන් 113,447දෙනෙකු පමණ වූ විශාල පිරිසක් පැමිණ තිබෙනවා. උඩවලව ජාතික වනෝද්‍යානය නැරඹීමට දෙස් විදෙස් සංචාරකයන් ඊටත් වඩා විශාල පිරිසක් එනවා. එම සංචාරකයන්ගේ පැමිණීම නිසා උඩවලව ප්‍රදේශය තුළ මේ වනවිට ප්‍රධාන hotels, සුළු සුළු මට්ටමේ hotels සහ නිවාඩු නිකේතන 400ක් වාගේ ප්‍රමාණයක් ගොඩනැගී තිබෙනවා. ඒ වාගේම එම ප්‍රදේශය තුළ සංචාරකයන්ගේ මාර්ගෝපදේශනය සඳහා ජීප් රථ 500කට වැඩි ප්‍රමාණයක් යොදවා තිබෙනවා. ඒ නිසාම එම ප්‍රදේශය තුළ මේ වනකොට සංචාරක කර්මාන්තය ආශ්‍රිතව පුද්ගලයන් 2,000ක්, 3,000ක් වාගේ ප්‍රමාණයක් සෘජු හා වක්‍ර රැකියාවල නියැළෙනවා. විශේෂයෙන්ම සංචාරකයන් සඳහා මේ හැම පහසුකමක්ම සැලසීමට පෞද්ගලික අංශයේ දායකත්වය තමයි වැඩිපුර ලැබී තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහා විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු යැයි අපි යෝජනා කරනවා. ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන කොට්ඨාස එකතු කරලා තමයි මේ සංචාරක කලාපය නිර්මාණය කරන්න කියලා අප කියන්නේ. මොකද, අප මුලින් කිව්වා වාගේම උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, උඩවලව ජලාශය, චන්ද්‍රිකා වැව, කටුපිල වැව සහ හබරලු වැව ඇතුළු ප්‍රධාන ජලාශ පහක් අපට ඒ ප්‍රදේශයේ දැක ගන්න තිබෙනවා. ඒ වාගේම සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය වාගේ ස්ථානත් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යොදා ගන්න පුළුවන්. ඒ වාගේම සංඛපාල රජමහා විහාරය, රංචමඩම ඓතිහාසික සොහොන් කොත්, පනාමුරේ ඇත් ගාල, මඩුවන්වෙල වලව්ව, සිංහරාජ වනාන්තරය, හිමිදිරි පෙදෙස - Morning Side, ගොන්ගල කඳු ප්‍රදේශය සහ ටැම්පිට විහාර තුනක් ඒ ප්‍රදේශ ආශ්‍රිතව අපට දක්නට තිබෙනවා. ඒ වාගේම කොලොන්න ප්‍රදේශයේ ඇලි 7ක් දකින්න තිබෙනවා. ඒ වාගේම වවුල්පන හුණු ගල් ගුහාව, අවුරුදු 100කට වඩා පැරණි ලියන්ගස්තොට අමුණ වාගේ ස්ථානත්, මෑතකදී අලුත්වැඩියා කළ රක්වාන-සූරියකන්ද මාර්ගයේ පිහිටා ඇති වංගු 10 වාගේ ස්ථාන එකතු කරමින් මේ සංචාරක කලාපය නිර්මාණය කරන්න පුළුවන්.

ඒ නිසා මම මේ ගරු සභාවට යෝජනා කරනවා, එම ප්‍රදේශය විශේෂිත සංචාරක කලාපයක් හැටියට නිර්මාණය කර සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නෛතික පහසුකම් ලබා දී එම ප්‍රදේශයේ භෞතික සංවර්ධනය සහ මානව සංවර්ධනය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගන්න කියලා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.53]

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළේ හුදෙක් එක ගමකට, එක ප්‍රදේශයකට හෝ එක දිස්ත්‍රික්කයකට අදාළ යෝජනාවක් නොවෙයි. ඇත්තටම අප විශ්වාස කරන විධියට ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ගෙන ආ මෙම යෝජනාව ලංකාවේ සංචාරක සිතියම වෙනස් කරන්න පුළුවන් මට්ටමේ යෝජනාවක්. ඇයි, අපි එහෙම කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරමින්, එහි අන්තර්ගතය පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. දැනටමත් උඩවලව ප්‍රදේශයට දෙස් විදෙස් සංචාරකයන් විශාල වශයෙන් පැමිණෙනවා. හැබැයි, ඔවුන් පැය දෙකතුනක් ඇතුළත අලි ඇතුන් නරඹා, වනජීවී කලාපය නරඹා පිටත්ව යනවා. නමුත් ඔවුන් දන්නේ නැහැ, ලංකා ඉතිහාසය තුළ ඉතාම විශිෂ්ට ශිෂ්ටාචාරයක් ගොඩනැගුණු තැනක් වන රංචමඩම සොහොන් කොත් බැලීමට එතැන සිට විනාඩි 10ක් ඇතුළත යන්න පුළුවන් බව. ඒ ගැන ඔවුන්ට අදහසක් නැහැ. තමන්ගේ වර්ගයා වෙනුවෙන් සටන් කරපු, 1950දී පමණ ලෝකයේම ප්‍රසිද්ධ වුණු පනාමුරේ ඇතා හිටපු ලංකාවේ අවසාන ඇත්ගාල වන පනාමුර ප්‍රදේශයේ පිහිටි පනාමුරේ ඇත්ගාලට විනාඩි 20කින් යන්න පුළුවන් කියන අදහස ඔවුන්ට නැහැ. ඒ වාගේම, 1818 කැරැල්ලට මධ්‍යස්ථානයක් වුණු, ඓතිහාසික පුරාවෘත්තයක් සහිත කාමර 121ක් සහ මැද මිදුල් 21ක් සහිත ලංකාවේ විශාලම වලව්ව වන මඩුවන්වල වලව්ව එහි පිහිටා තිබෙනවා කියලා සංචාරකයන්ට අදහසක් නැහැ. ඒ විතරක් නොවෙයි, භූගත දිය ඇලි සහිත, මිලියන ගණනක් වවුලන් සිටින, ලංකාවේ විශාලම ගුහාශ්‍රිත ප්‍රදේශයක් වන ඓතිහාසික හුණුගල් ගුහාවට විනාඩි 60කින් විතර යන්න පුළුවන් කියලා ඒ සංචාරකයන්ට අදහසක් නැහැ. ඒ විතරක් නොවෙයි, ලංකාවට ආවේණික, ලංකාවෙනුත් ලෝක උරුමයක් වන සිංහරාජ වැසි වනාන්තරයට පමණක් ආවේණික සතුන්, දිය ඇලි පමණක් නොව, අලි ඇතුන්, කොටි ආදී සතුන් වසන වනජීවී කලාපයක් සිංහරාජය තුළ තිබෙනවා කියලාත් සංචාරකයන්ට ලොකු අදහසක් නැහැ. ඒ වාගේම, ඒ ආසන්නයේම තිබෙන "හිමිදිරි පෙදෙස" නමින් හඳුන්වන ඉතාම රමණීය - ඉතා අලංකාර, සෞන්දර්යාත්මක - සහ ජෛව විවිධත්වයෙන් අනූන ප්‍රදේශයක් ගැනත් ඔවුන්ට අදහසක් නැහැ. ඒ විතරකුත් නොවෙයි, ලංකාවෙන් තුනෙන් දෙකක වාගේ ප්‍රමාණයක් නරඹන්න පුළුවන්, නැරඹුම් මැදිරියක් තරමට ඉතාම සුන්දර පරිසරයක් වන ගොංගල කියන ප්‍රදේශය ඒ ප්‍රදේශයටම ආසන්නව තිබෙනවා කියලාත් ඔවුන්ට අදහසක් නැහැ. එහෙම බැලුවොත්, උඩවලවේ සිට පැය එකහමාරක් ඇතුළත ඔය සියල්ලම නරඹන්න පුළුවන් කියන අදහස සංචාරකයන්ට නැහැ.

ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව ක්‍රියාත්මක වෙලා ලංකාවේ සංචාරක සිතියම වෙනස් වුණාට පස්සේ ඒ ඔස්සේත් සංචාරක කර්මාන්තය සාර්ථක සහ දියුණු කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ මඟින් ගොඩකවෙල, ඇඹිලිපිටිය, කොලොන්න, සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත් වන අපේ තරුණ තරුණියන්ට එක පැත්තකින් ආදායම් මාර්ගයක් ඇති වෙනවා; ඔවුන්ගේ රැකියා ප්‍රශ්නයට උත්තරයක් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි, දෙස් විදෙස් සංචාරකයන්ට එකම කලාපයක් තුළින් ලංකාවේ ඉතිහාසය, ලංකාවේ සංස්කෘතිය, ජෛව විවිධත්වයෙන් අනූන ලංකාවේ ස්වභාව සෞන්දර්යය පැය කිහිපයක් ඇතුළත විඳගන්න පුළුවන් හොඳ අත්දැකීමකුත් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනාමුර" කියන්නේ, හුදෙක් ඇත් ගාලක් නොවෙයි. "මඩුවන්වල වලව්ව" කියන්නේ, ගරා වැටුණු තවත් එක් වලව්වක් නොවෙයි. "සිංහරාජය" කියන්නේ, ගස් සහිත කැලෑවක් විතරක් නොවෙයි. ඒවාට ලොකු ඉතිහාසයක් තිබෙනවා, ලොකු පුරාවෘත්තයක් තිබෙනවා, ලොකු සංස්කෘතියක් තිබෙනවා, ඒ වාගේම ජෛව විවිධත්වයක් තිබෙනවා.

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ලත් එක්ක බලන කොට, සංචාරකයන්ට පැයක් වැනි ඉතාම කෙටි කාලයක් ඇතුළත ලංකාවේ සියලුම කාලගුණික, දේශගුණික රටා සහ කාලගුණික, දේශගුණික අත්දැකීම් ලබන්න පුළුවන් ඉතා මනරම් ප්‍රදේශයක් වන උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කළ යුතුය කියන යෝජනාව තමයි ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. අපේ ගරු විජිත හේරත් ඇමතිතුමාත් ඒ බව පෞද්ගලිකව දන්නවා. මොකද, එතුමා ඒ සුන්දරත්වය අත්විඳලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උඩවලව ප්‍රදේශය ආශ්‍රිතව තිබෙන රංචාමඩම සොහොන් කොත්, පනාමුරේ ඇත් ගාල, ඒ වාගේම වලල්ගොඩ, ඕමල්පේ, මඩුවන්වෙල තිබෙන පුරාණ ටැම්පිට විහාර, මඩුවන්වෙල ආශ්‍රිතව තිබෙන දිය ඇලි 7ක්, ඊළඟට, වවුල්පන හුනුගල් ගුහාව, සිංහරාජයේ Morning Side, ගොන්ගල කියන ප්‍රදේශ එකම සංචාරක කලාපයක් කරන්න කියලා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කරමින්, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චචුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චචුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ගෙනාපු උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස develop කරන්න ඕනෑ කියන යෝජනාව හොඳ යෝජනාවක් විධියට මම පිළිගන්නවා.

ඒකට හේතුව මෙයයි. උඩවලව කියන්නේ අපේ රටේ තුන්වෙනුවට වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණෙන සංචාරක කලාපයක්. සාමාන්‍යයෙන් topic එකක් දුන්නාම topic එක ගැන නේ කථා කරන්න ඕනෑ. ඒ නිසා මම Google එකේ පොඩ්ඩක් search කරලා බැලුවා. අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් එහෙම නේ. එතුමා AIවලින් අහලා නේ කියන්නේ. ඒ වාගේ මමත් Google එකේ search කරලා බැලුවා. උඩවලවට පසුගිය අවුරුදු දෙක තුළ 378,000ක් විතර සංචාරය කරන්න ගිහින් තිබෙනවා. Percentage එකක් විධියට ගත්තොත්, ඒ අයගෙන් සියයට 48ක් ඇවිත් තිබෙන්නේ සුද්දෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ, Udawalawe area එක develop කරන්න මේ දක්වා කරලා තිබෙන්නේ මොනවාද කියන එකයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 159ක් ඉන්නවා නේ. ඒ හැමෝම මෝඩයන් නොවෙයි. ඒ අය අතරේ අපේ උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා වාගේ කට්ටියත් ඉන්නවා. මෙතුමා ඉදිරිපත් කළේ ඇත්තටම හොඳ යෝජනාවක්. හැබැයි, උඩවලව අවට ඉන්න සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ අයගේ business develop කරන්න අය වැය තුළින් කරලා තිබෙන්නේ මොනවාද කියන එකයි තිබෙන ප්‍රශ්නය. ආණ්ඩු බලය අරගෙන අවුරුදු දෙකක් හිටියා නේ. ඒ අවුරුදු දෙක ඇතුළේ develop කරන්න මොනවාද කළේ කියන එක තමයි ලොකුම ප්‍රශ්නය.

දැන් සුද්දා ආවාට පස්සේ, කොළඹ ඉඳලා උඩවලවට එක්කන් යන්න, අපේ රටේ තෙල් නැහැ. පෙට්‍රල් 92ත් නැහැ, 93ත් නැහැ, 95 විතරයි තිබෙන්නේ. ඒකත් ලීටරය රුපියල් 515යි. එතකොට කොහොමද, මිනිස්සු සංචාරකයන්ව උඩවලවට අරන් යන්නේ. සාමාන්‍යයෙන් මේ වාගේ යෝජනා ගෙනෙන කොට master plans ගැන හිතන්න ඕනෑ. ඒ කියන්නේ, උඩවලව ප්‍රදේශයේ tourism develop කරනවා නම්, ඒකට multidisciplinary approach එකක් තිබෙන්න ඕනෑ, කොහොමද ඒක develop කරන්නේ කියලා. මම විශ්වාස කරනවා, මේ යෝජනාව අපි මොනවා හරි කරලා pass කළත්, මෙතැනින් එහාට යෝජනාව ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා. නමුත්, මේක හොඳ යෝජනාවක්. මේ පාර්ලිමේන්තුවේ මේ වාගේ හොඳ යෝජනා ගේන මන්ත්‍රීවරුත් ඉන්නවා, පිටිපස්ස පේළියේ. හැමදාම ඇවිල්ලා, Motions එහෙම දාගෙන, රුපියල් 75,000ක් පඩි අරගෙන, එහෙම ඉන්න හොඳ මන්ත්‍රීවරුත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. හැබැයි තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් අපේ රටේ මිනිසුන්ට, කොහෙවත් යන්න පෙට්‍රල් නැහැ. සංචාරකයන් එනවා නම්, ඒ එන සංචාරකයන්ට කෑම උයලා දෙන්න, ගෑස් නැහැ. උඩවලව ප්‍රදේශය සංවර්ධනය කරන්න කථා කළාට දැන් උඩවලව අවට ඉන්න මිනිසුන්ට කන්න බොන්න නැහැ. හැබැයි, මේ වාගේ යෝජනා ඉදිරිපත් කළාම අපිත් ගෙදර ඉන්නේ නැතුව ඇවිල්ලා, ඒවාට පක්ෂව කථා කරලා, ඒවා සම්මත කරලා, පාර්ලිමේන්තුවෙන් සල්ලි වෙන් කරනවා. නමුත්, අන්තිමට ඉතුරු වෙන්නේ මොකක්ද? ඒක තමයි මට තිබෙන ප්‍රශ්නය.

උඩවලව විතරක් නොවෙයි, Anuradhapura District, සිංහරාජය වාගේ ඕනෑ තැනක් develop කරන එක හොඳයි. හැබැයි, දැන් ආණ්ඩු කාලයෙන් අවුරුදු දෙකක් ඉවරයි නේ. මේ අවුරුදු දෙක ඇතුළේ අපේ ඇමතිවරු ගිහිල්ලා කියනවා "We bankruptcy" කියලා. එතැනින් ඔක්කෝම ඉවරයි. ඊට පස්සේ ඒගොල්ලෝ අහනවා, මොකක්ද ප්‍රශ්නේ කියලා. එතකොට "නෝ කුවින්" කියනවා. ඒකෙන්ම අපේ රට ඉවරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මේ යෝජනාව ගෙනාපු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ, අද දවසේ පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වෙනවාත් එක්ක මේ යෝජනාවත් ඉවර වෙනවා කියලායි. 2025, 2026 වර්ෂවල සංචාරකයන්ගේ පැමිණීම කොච්චර අඩු වෙලා තිබෙනවාද කියලා බලන්න. හැබැයි, ට්‍රිලියන ගණන්, බිලියන ගණන් සල්ලි තිබෙනවාය කියනවා. දැන් tourism develop කරනවා කිව්වාට ගිහිල්ලා බලන්නකෝ තත්ත්වය. පුළුවන් නම් කළුතරට ගිහිල්ලා, beach එක පැත්තේ තිබෙන hotel එකකින් කාලා බලන්නකෝ, ඔයගොල්ලන්ට කොහොමද කුණුහරුපෙන්

ඒ මිනිස්සු බණින්නේ කියලා. උගන්ඩා අක්කා කිව්වා, සල්ලි ටික ගේනවා කියලා. දැන් අවුරුදු දෙකක් වෙනවා. තවම ගෙනැල්ලා නැහැ. එතකොට ත්‍රීවිල් පදින කෙනා ලීටරය රුපියල් 515ට, 520ට තිබෙන සුපර් පෙට්‍රල් විතරක් ගහගෙන කොළඹ ඉඳලා කොහොමද සංචාරකයන් අරන් යන්නේ? දැන් කොහේවත් පෙට්‍රල් නැහැ, ගෑස් නැහැ කියලා ආරංචියි. දැන් හෝටල් පවත්වාගෙන යන්න බැරි බව කියනවා.

මම එක දවසක් ගියා, කළුතරට. කළුතර ලොකු hotel එකක ඉන්න එතුමා කියනවා,- එයා ඉන්නේ ජර්මනියේ. මගේ නම්බර් එක අරගෙන කථා කළා. එයා කියනවා, ඔයගොල්ලන්ගේ ප්‍රාදේශීය සභාවල ඉන්න වල් පැළ නොවෙයි, මල් පැළ ටික ඔක්කෝම ඇවිල්ලා කඩනවාලු, hotel ටික. ඒ hotel ටික හදලා තිබෙන්නේ මුහුද පැත්තට කියලා, ඒවා ටික කඩලා දමනවාලු. හැබැයි, අන්තිමට ඒවා කඩලා ඉවර වෙලා පාර්ලිමේන්තුවට මේ වාගේ යෝජනා ඉදිරිපත් කළාට වැඩක් නැහැ. ඒ ගැන knowledge එකක් තිබුණාට ප්‍රශ්නයක් නැහැ. ඒක apply කරන්න ඕනෑ. ඒ කියන්නේ, අපි මෙතැන Motion එකක් ඉදිරිපත් කළා කියලා උඩවලවේ ඉන්න අලින්ට කන්න හම්බ වනවාද? මම Google එකේ search කළා. මම ළඟදී දැනගත්තේ, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් Google එකේ AI එක search කරලා තමයි කථා කරන්නේ කියලා. ඇත්තටම මම උඩවලවේ එක දවසයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා උඩවලව ගැන කථා කරන්න Google එක search කළාම,- *[බාධා කිරීමක්]* ඉන්නකෝ, පොඩ්ඩක්. ඇත්තටම උඩවලවේ ඉන්න අලින්ට කන්න නැහැ කියලා එනවා Google එකේ. ඕනෑ නම් search කරලා බලන්න. "What are the issues with Udawalawe?" කියලා search කරලා බැලුවා. බැලුවාම, උඩවලවේ ඉන්න අලින්ට කන්න නැහැලු. යකෝ! උඩවලවේ ඉන්න අලින්ට විතරක් නොවෙයි, කොළඹ ඉන්න, ගමේ ඉන්න මිනිසුන්ටත් කන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිතලා බලන්නකෝ. අපි මේගොල්ලන්ට ඡන්දය දීලා අවුරුදු දෙකක් වෙනකොට දැන් අලින්ටත් කන්න නැතිව ගිහිල්ලා තිබෙන්නේ. එක්කෝ, අලියා මරලා දමනවා. අපි අලියා ගැන පැය ගණනක් කථා කරනවා. හැබැයි, මෙය හොඳ යෝජනාවක්. උපුල් කිත්සිරි මන්ත්‍රීතුමනි, මම පිළිගන්නවා, මේක හොඳ යෝජනාවක් කියලා. හැබැයි, ඔයාට රුපියල් හැත්තෑපන්දහසයි, නැත්නම් ලක්ෂයයි පඩි ලැබෙන්නේ. ඔයාට වාහනයකුත් නැහැ, යන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් වාහනයක් නැතිව ඇති නේද? හැබැයි, ප්‍රාදේශීය සභාවල ඉන්න මිනිස්සු වාහනවල යනවා. නමුත්, මන්ත්‍රීවරු යන්නේ,- ඔයගොල්ලන්ට නම් සමහර වෙලාවට ජෙප්පෝ දෙනවා ඇති නේ, වාහන. අපට වාහනයක් නැහැ. ඒ නිසා කරුණාකරලා මේ වාගේ යෝජනා ගෙනෙනකොට පිටුපස්සේ ජේළියේ ඉන්න අපේ NPP මන්ත්‍රීවරුන්ට අඩුම ගාණේ වාහනයක් දෙන්න කියලා අපේ ජනාධිපතිතුමාට මම යෝජනාවක් කරනවා. *[බාධා කිරීමක්]* හිනා වෙන්න එපා. මේක තමයි ඇත්ත තත්ත්වය. ප්‍රාදේශීය සභාවල ඉන්න මිනිස්සු වාහන අරගෙන යනවා. GA වාහනවල යනවා, DS වාහනවල යනවා. ඒත් DCC meetingsවලට අපි යන්නේ පොඩි ඇල්ටෝ වාහනයේ. නැත්නම් බස්වල ඉඳගෙන වීඩියෝ දමනවා. ඒවා හරියන්නේ නැහැ. පොඩ්ඩක් හිතලා මේ අය වැයෙන් හරි මිනිසුන්ට සාධාරණයක් ඉටු කරයි කියලා විශ්වාස කරගෙන ඉන්නවා.

අලියා මැරුණ එකටත් නාමල්ට බණිනවා. උඩවලවේ මේ කථාවටත් නාමල්ට බණිනවා. නාමල් දන්නවාද දන්නේ නැහැ, උඩවලවේ අලියා ඉන්නවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා, තත්පර 20ක් දෙන්න.

මේක හොඳ යෝජනාවක්. හැබැයි, හැමදේටම නාමල්ට, ඩී.වී. චානකට, චාමර සම්පත්ට සහ මට බණින්න එපා. ඒ ඔක්කොම ටික දමලා ඉවරයි. මම විතරයි ඉතුරු වෙලා ඉන්නේ. ඔක්කොටම දැන් බැණලා ඉවරයි නේ.

මේක හොඳ යෝජනාවක්. මන්ත්‍රීවරුන් 20ක් අත්සන් කරලා දුන්නාම මේ සඳහා committee එකක් පත් කරලා ඉස්සරහට යන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. මේ වෙනුවෙන් මොනවා හෝ දෙයක් කරමු.
Thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.07]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. එක පැත්තකින්, එතුමා එතුමාගේ ප්‍රදේශය පිළිබඳව ලොකු වුවමනාවකින් කරුණු ගණනාවක් මතු කරලා තිබෙනවා. යෝජනාව ස්ථිර කරමින් ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමාත් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා, අපිත් අහලා නැති ස්ථාන ගණනාවක් ගැන. ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන.

අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, 2025 වර්ෂය ගත්තාම, මිලියන 2.36ක සංචාරක පැමිණීමක් වාර්තා වෙනවා. ඒකෙන් උඩවලව ප්‍රදේශයට ඇවිල්ලා තිබෙන සංචාරකයන් ප්‍රමාණය ගත්තොත්, විදේශීය සංචාරකයන් 197,981යි. ඒ කියන්නේ, ලක්ෂ දෙකකට අඩු ප්‍රමාණයක්. ඒකෙන් අදහස් කරන්නේ එම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය තවදුරටත් පුළුල් කිරීමේ හැකියාවක් ඇති බවයි. ඒ වාගේම ලංකාවේ - දේශීය සංචාරකයන් - ඇවිල්ලා තිබෙන්නේ 170,890යි. ඔක්කෝම 368,000ක විතර සංචාරකයන් ප්‍රමාණයක් තමයි, උඩවලව ආශ්‍රිතව කථා කරපු සංචාරක කලාපයට ඇවිල්ලා තිබෙන්නේ.

ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රචලිත නොවුණු සමහර තැන් තිබෙනවා, ඒ අයත් දන්නේ නැති ප්‍රධාන ප්‍රදේශ ගණනාවක් තිබෙනවා කියලා. ඒකට තමයි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මුදල් තිබෙන්නේ. ඒ මුදල් වෙන් කරන්නේ ඒ ඒ ප්‍රදේශවල සංචාරක මධ්‍යස්ථාන ස්ථාපිත කරන්න, තිබෙන ඒවා දියුණු කරන්න වාගේම, ඒ මාර්ගයේ යන විදේශීය

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

සංචාරකයන්ට හා දේශීය සංචාරකයන්ට මාර්ග පද්ධති පෙන්වලා දෙන වැඩ පිළිවෙළක් හදන්නයි. හැබැයි ඒක සිද්ධ වෙලා නැති තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ. විශේෂයෙන්ම මේ 2026 වර්ෂයේ පළමු මාස 6 තුළ දේශීය සහ විදේශීය සංචාරකයින් 219,465ක් ඇවිල්ලා තිබෙනවා, ඒ තුළින් උඩවලව ප්‍රදේශයෙන් පමණක් රුපියල් මිලියන 927ක ආදායමක් ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ, අතිවිශාල මුදලක් - සෑහෙන මුදල් ප්‍රමාණයක් - අපට ඒ මඟින් ලැබිලා තිබෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, උඩවලව ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් වෙලා තිබුණු බව. 2025දී සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 350ක් වෙන් කර තිබෙනවා. ඇත්තටම ඒකෙන් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 145යි. මේ ක්‍රියාවලිය තුළ මම විශේෂයෙන් අපේ ඇමතිතුමාගෙනුත් යම් ඉල්ලීමක් කරන්න කැමැතියි.

සංචාරක කර්මාන්තය පිළිබඳව ප්‍රශ්න ගණනාවක් මතු කරනකොට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, අලුත් සංචාරක ගමනාන්ත පිළිබඳ map එක ගැන නැවත සාකච්ඡා කරන්න කියන එක. මොකද මේ වන විට අලුත් ස්ථාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා, සංචාරකයින්ට නරඹන්න. නමුත් ඒවා ගැන නොදන්නා අය විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ විධියට ගත්තාම, ඒ සම්බන්ධ කටයුතු වර්ධනය කිරීම ඇත්තටම ලොකු ක්‍රියාවලියක් විධියටයි අපි දකින්නේ.

උදාහරණයක් විධියට අපි 2025 සහ 2026 වර්ෂවල සංචාරකයින්ගේ පැමිණීම ගනිමු. 2024දී සංචාරකයින්ගේ පැමිණීම මිලියන 2.05ක්. පසුව එය මිලියන 2.36 දක්වා වර්ධනය වෙලා තිබුණා. විශේෂයෙන්ම වැදගත්ම කාරණය තමයි, සංචාරක පැමිණීම සියයට 15.1කින් වැඩි වුණාට ඇත්තවශයෙන්ම සංචාරක කර්මාන්තයෙන් උපයන ලද ආදායම ඉහළ ගිහිල්ලා තිබෙන්නේ සියයට 1.6කින් වීම. ඒ අනුව සංචාරකයින් එන ප්‍රමාණය සියයට 15කින් වර්ධනය වුණාට ඔවුන් ලංකාවට ආදායමක් නොගෙනෙන තත්ත්වයක් දක්නට ලැබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, මේ වර්ෂයේ ජනවාරි ඉඳලා සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ පසුගිය වර්ෂයට වඩා සියයට 1.2කින් සංචාරක පැමිණීම අඩු වෙලා තිබෙනවා. 2026 ජනවාරි ඉඳලා සැප්තැම්බර් මාසය දක්වා සංචාරක කර්මාන්තයෙන් උපයන ලද ආදායම ඩොලර් බිලියනවලින් ගත්තොත්, ඩොලර් බිලියන 2.24ක් විතර වනවා. ඒක සියයට 9.2ක අඩුවීමක්. එක පැත්තකින්, මේ වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා සංචාරක පැමිණීම ගත්තොත්, පසුගිය 2025 වර්ෂයට සාපේක්ෂව විශාල අඩුවක් තිබෙනවා. මෑත පෙරදිග යුද තත්ත්වය සහ ජාත්‍යන්තර වශයෙන් ගමනාගමනයට ඇති වෙලා තිබෙන බලපෑම් විශේෂයෙන් මේකට හේතු වෙන්න පුළුවන්. නමුත් අපි දැන් මේ තත්ත්වය ශක්තිමත් කරගන්නේ කොහොමද කියන එකට අවශ්‍ය කටයුතු ටික කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි දන්නවා, මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 100ක පහසුකම් ලැබිලා තිබෙන බව. ඒ වාගේම සංචාරක ගමනාන්ත සංවර්ධනය සඳහාත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම මේවා 2026 අය වැය යෝජනා. මේ සම්බන්ධයෙන් තිබුණු යෝජනාවලින් ඉතාම ස්වල්ප ප්‍රමාණයක් තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, බස්නාහිර පළාතේ වෙරළබඩ හා සමුද්‍ර සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 3,500ක් වෙන් කර තිබෙනවා. මේකෙන් ඉතාම කුඩා මුදලක් තමයි වැය කරලා තිබෙන්නේ. බෙරේ වැව සංවර්ධනයට රුපියල් මිලියන 2,500ක්, සීගිරිය සහ ත්‍රිකුණාමලය දේශීය ගුවන් තොටුපළවල් සංවර්ධනයට හා යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමට රුපියල් මිලියන 1,000ක්, සංචාරක පුහුණු වැඩසටහන්වලට රුපියල් මිලියන 500ක් විතරක් නොවෙයි, සංචාරක ප්‍රවර්ධනය සහ ඩිජිටල් අළෙවිකරණය සඳහාත් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. අපි අහන්න කැමැතියි, මේවායෙන් සිද්ධ වෙලා තිබෙන කටයුතු මොනවාද කියලා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට ආවේ ලංකාව ඩිජිටල්කරණය කරනවා කියලා. හැබැයි 2005 ඉඳලා ආරම්භ කරපු ITMIS එක, ඒ කියන්නේ ලංකාවේ රාජ්‍ය ආයතනවල සමස්ත ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා ආරම්භ කරපු ව්‍යාපෘතියට රුපියල් බිලියන 15ක් වියදම් කර තිබෙනවා, පැවති සියලු ආණ්ඩු. හැබැයි දැන් තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? මේ ITMIS එකම සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න දැනට මුදල් අමාත්‍යාංශයේ සාකච්ඡා 3ක් පවත්වා තිබෙනවා. ඒ සාකච්ඡා පවත්වා තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? ඒකට කරන්න හදන්නේ පරණ ලොරියක් ගෙනැල්ලා පාරට අතහරිනවා වාගේ 2005දී ගෙනා පරණ system එක ආපහු ගෙනැල්ලා අතහරින්න හදන එක. තමුන්නාන්සේලා වැඩ පටන් ගත්තේ ලංකාව ඩිජිටල්කරණය කරනවා කියලා. ජනාධිපතිතුමාගේ මූලික කථාවේ තිබුණේ ඒක. හැබැයි ලංකාවේ අවුරුදු 15ක්, 20ක් විතර තිස්සේ ඇදගෙන ගිය ITMIS ක්‍රියාදාමයට වියදම් කරපු මුදල් ඇතුළු සියල්ල පැත්තකට විසි කරලා ITMIS එක සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න දැන් සාකච්ඡා පවත්වාගෙන යනවා. මම ඒකයි කිව්වේ, තමුන්නාන්සේලා මේවා ගැන මීට වඩා සාපේක්ෂව කල්පනා කරනවා නම් හොඳයි කියලා.

ඒ වාගේම අපේ ගරු ඇමතිතුමාගෙන් මම මේකත් අහන්න කැමැතියි. විශේෂයෙන්ම ADB එකෙන් දාලා තිබෙන ඩොලර් මිලියන 100ක මුදල් ටික කොයි විධියට වෙන් කරන්න ද ඔබතුමන්ලා කටයුතු කරන්නේ? හේතුව, තවමත් ඒ සම්බන්ධව විශාල අර්බුද ගණනාවක් මතුව තිබීම. ඒකත් මතක් කරන ගමන් මම විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න කැමැතියි.

දැන් සංචාරකයින් ගැන කිව්වාම අර්ච්චුනා මන්ත්‍රීතුමාත් කිව්වා, තෙල් සම්බන්ධ ප්‍රශ්නය. ඊයේ කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය කියනවා මම දැක්කා, ගොඩබාන ගාණටම තෙල් දෙනවා කියලා. මම දන්නේ නැහැ, එහෙම තෙල් දෙන්නේ ලෝකයේ මොන රටෙද කියලා. මම හිතන විධියට ලංකාවේ නොවෙයි, වෙන කොහේ හරි රටක වෙන්න ඇති, එහෙම දෙන්නේ. ජනාධිපතිතුමා පසුගිය පෙබරවාරි මාසයේදී විද්වත් සභාවේදී කිව්වා, තෙල් ලීටරයක් වරායට එන ගාස්තුවත් එක්කම. එතුමා එදා කිව්වා, ඩීසල් බැරල් එකක් ගන්නේ ඩොලර් 308කට කියලා. එතකොට ඩීසල් ලීටරයක් රුපියල් 170යි වෙන්නේ. එතකොට ඩීසල් ලීටරයක් වරායට යනකොට රුපියල් 170යි. පෙට්‍රල් ලීටරයක් ගොඩබෑමේ ගාස්තුව රුපියල් 145යි. එහෙම නම් ප්‍රශ්නයක් තිබෙන්න විධියක් නැහැ නේ. ප්‍රශ්නයක් තිබෙන්න විධියක් නැහැ, ඒ ගාණට දෙන්න ඕනෑ.

අද තිබෙන තත්ත්වය අනුව තමුන්නාන්සේලා මේ හැම තෙල් ලීටරයකින්ම ගහන බද්ද සොයා බැලුවාම මට ඒක හිතාගන්න බැරි වුණා. තමුන්නාන්සේලා ඒ කාලයේ විශාල වශයෙන් කෑ ගැහුවේ, ඉන්ධනවලට බදු ගහනවා කියලායි. දැන් මේ ආණ්ඩුව පෙට්‍රල් ලීටරයකට රුපියල් 145ක බද්දක් ගහනවා. ඩීසල් ලීටරයකට රුපියල් 129ක බද්දක් ගහනවා. ජනාධිපතිතුමාගේ කථාවට අනුව දැන් ඇත්තවශයෙන්ම පෙට්‍රල් ලීටරයක විකුණුම් මිල රුපියල් 332ක් වෙන්න ඕනෑ. ඊළඟට, රුපියල් 167ට ගෙනාපු

ඩීසල් ලීටරයක් රුපියල් 346ක් වෙන්න ඕනෑ. දැන් තමුන්නාන්සේලා මේවාට තව තව බදු ගහලා විශාල විනාශයක් කරමින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමා වැඩිපුරත් විනාඩියක් කථා කරලා තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ නිසා මම විශේෂයෙන්ම මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරයට, සංචාරකයින්ට අවශ්‍ය ඩීසල් හා පෙට්‍රල් ලබා ගැනීම සඳහා තමුන්නාන්සේලා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න. මේ බොරු කීමේ කලාව තවදුරටත් කරගෙන යන්න එපා. නියෝජ්‍ය ඇමති කෙනෙක් එකක් කියනවා, ඇමති තව එකක් කියනවා, ජනාධිපති තව එකක් කියනවා. කවුරු කියන දේවල් විශ්වාස කරන්න ද කියලා දෙවියෝ තමයි අවසාන වශයෙන් දන්නේ.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලීන යෝජනාවක්. ඒ නිසාම එම යෝජනාව මා අනුමත කරනවා. අපි දැනටමත් ලංකාවේ නව සංචාරක කලාප 22ක් හඳුනාගෙන තිබෙනවා. පසුගිය සංචාරක සංවර්ධන මණ්ඩල විධායක සභාවේදී අපි ඒ සංචාරක කලාප 22 අනුමත කළා. ඊට පස්සේ ඒ සඳහා වෙච්ච ක්‍රියාවලියක් තිබෙනවා. ඒ ක්‍රියාවලියෙන් පස්සේ තමයි අදාළ ගැසට් නිවේදන නිකුත් කරන්නේ. උඩවලව කලාපයත් ඒ සංචාරක කලාප 22 ඇතුළත තිබෙනවා. ඒ නිසා එතුමා ඉදිරිපත් කරපු යෝජනාව දැනටමත් අපි අමාත්‍යාංශය විධියට පිළිඅරගෙන තවත් නව සංචාරක කලාපයක් ලෙස එය නම් කිරීමට තීන්දුවක් අරගෙන තිබෙනවා.

එතැනදි එතුමා සඳහන් කරපු ඒ කලාපයේ තිබෙන විශේෂතාව, එහි තිබෙන ඓතිහාසික උරුමයන්, සංස්කෘතික විශේෂත්වයන් ආදී ඒ සියල්ලම අපි ඉතා පැහැදිලිව දැකලා තිබෙනවා. උඩවලව සහ සෙවනගල ආවරණය වන විධියට, මේ ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් විධියට නම් කරන්න අපි ඉදිරියේදී කටයුතු කරනවා. එතැනදි සිදු කළ යුතු ක්‍රියා පටිපාටියක් තිබෙනවා. මේක කරන්නේ 2005 අංක 38 දරන සංචාරක පනත අනුව. එහිදී මහජනතාවගේ අදහස් ලබා ගත යුතු වනවා, සීමා මායිම් නිර්ණය කළ යුතු වනවා. ඒ වාගේම එය සංචාරක කලාපයක් විධියට නම් කළාට පස්සේ ඒ කලාපයට බලපාන යම් යම් නීති-රීති ද යම් ආකාරයකට වෙනස් වනවා. ඒවාත් සැලකිල්ලට අරගෙන තමයි අපි මේ දේ කරන්නේ. එතැනදි අපි රජයේ සැලැස්ම විධියට රුවන්පුර අධිවේගී මාර්ගයේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව රුවන්පුර අධිවේගී මාර්ගයේ වැඩ අවසන් වීමත් එක්ක ඇත්තටම සංචාරකයින්ට වඩා පහසුවෙන් ඒ ප්‍රදේශවලට යන්න පුළුවන් වනවා.

ඒ වාගේම අපි කවුරුත් දන්නවා, රත්නපුර, පැල්මඩුල්ල සහ ඇහැලියගොඩ කියන ප්‍රදේශ මැණික්වලට ලෝක ප්‍රසිද්ධ බව. Gem tourism destination එකක් විධියටත් ඒ ප්‍රදේශ ලෝකය තුළ ප්‍රවර්ධනය කරන්න පුළුවන්. අපි ඒක ඉතා මැනවින් හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා තමයි හඳුනා ගත් කලාප 22ට, විශේෂයෙන් උඩවලව සහ සෙවනගල ප්‍රදේශ දැනටමත් අපි ඇතුළත් කර තිබෙන්නේ. ඒ නිසා ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අපි ගන්නවා. දේශීය වශයෙන් එවැනි ස්ථාන හඳුනාගෙන ඒ ස්ථානවල තිබෙන ස්වාභාවික සෞන්දර්යය, ජාතික උරුමයන් සහ ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව තුළ තිබෙන ආගන්තුක සත්කාර කියන සියල්ලම සැලකිල්ලට අරගෙන සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි දැනටමත් පියවර ගණනාවක් අරගෙන තිබෙනවා කියන එක මම සතුටින් කියන්න කැමතියි.

ඒ වාගේම සංචාරකයින් ගෙන්වා ගැනීමේදී ගමනාන්ත - destinations - හඳුනාගෙන, එම ගමනාන්තවල යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු වනවා වාගේම සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා අපේ රට ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් රටක් බවට පත් කරන්නත්, අපේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ඉහළට ඔසවා තැබීම සඳහාත් විවිධ ක්‍රියාකාරකම් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. එවැනි දේවල් බොහෝ ප්‍රමාණයක් අපි දැනටමත් සිදු කර තිබෙනවා. ඒ අනුව තමයි 2025 අවුරුද්ද, වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට පැමිණි අවුරුද්ද බවට ඓතිහාසික වාර්තාවක් තැබුවේ. මේ අවුරුද්දේ මේ වනකොට ඒ ප්‍රමාණය විශාල වශයෙන් අඩු වෙලා නැහැ. දැනට 30,000ක වාගේ අඩුවීමක් තිබෙනවා, පසුගිය අවුරුද්දට සාපේක්ෂව. 2025 ඔක්තෝබර් මාසයේ සංචාරකයින් 165,000ක් අපේ රටට ආවා. මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 168,000ක් ඇවිල්ලා තිබෙනවා. ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල මැදපෙරදිග ඇති වුණු යුද්මය තත්ත්වය නිසාත්, ගුවන් ගමනාන්තවල ඇති වූ යම් ගැටලුකාරී තත්ත්වයක් නිසාත් අපේ රටට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය අඩු වුණා. නමුත් එතැනින් එහාට තත්ත්වය ආපහු වෙනස් වුණා. "දිවිවා" සුළි කුණාටු තත්ත්වය තුළත් අපි සමත් වුණා, සංචාරකයින් වැඩිම ප්‍රමාණයක් පැමිණි මාසය බවට පසුගිය අවුරුද්දේ දෙසැම්බර් මාසය පත් කරගන්න. මේ අවුරුද්දේ අද දවස වනකොට විවිධ අභියෝග මැද්දේ වුණත් සංචාරකයින් 1,862,000ක් අපේ රටට ඇවිල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය ඉතිහාසයේ වැඩිම සංචාරකයින් පැමිණි මාසය බවට පත් වෙලා තිබෙනවා. ඒ, අපි කරන විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් අනුවයි. දේශීය වශයෙන් ගමනාන්ත දියුණු කිරීමට යටිතල පහසුකම් වැඩි කරනවා වාගේම ගෝලීය වශයෙනුත් අපි විවිධ වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - Sri Lanka Tourism Promotion Bureau - පසුගිය කාලය තුළ විවිධ රටවල සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා තිබෙනවා. මම ඒ වාගේ වැඩසටහන් එකක්, දෙකක් ගැන විතරක් මතක් කරන්නම්.

International Travel Fair එක මේ අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා රටවල් ගණනාවක පැවත්වුවා. එය නෙදර්ලන්තයේ පැවැත්වීම සඳහා අපි රුපියල් මිලියන 71ක් වියදම් කරලා තිබෙනවා. තනි රටක සංචාරක ප්‍රවර්ධන වැඩසටහනකට, travel fair එකකට රුපියල් මිලියන 71ක් වියදම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 7.1ක්. ඒ වාගේම මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේදී ඉන්දියාවේ පැවැත්වූ වැඩසටහනට රුපියල් මිලියන 106ක් වියදම් කරලා තිබෙනවා. ඉන්දියාවේ එකේදි travel fair එකක් පවත්වන්න විතරක් අපි රුපියල් මිලියන 106ක් වියදම් කරලා තිබෙනවා.

[ගරු විජිත හේරත් මහතා]

ඒ වාගේම ඔස්ට්‍රියාවේ වියානාවල, ස්පාඤ්ඤයේ, ඉන්දියාවේ මුම්බායිවල, ඉන්දියාවේ නව දිල්ලිවල එවැනි වැඩසටහන් පවත්වා තිබෙනවා. ඉන්දියාවේ මුම්බායිවල පැවැත්වූ වැඩසටහනට රුපියල් මිලියන 95ක් වෙන් කළා. ඒ වාගේම ජර්මනියේ බර්ලින්වල මාර්තු 03 - 05 දක්වා තිබුණු ITB එකට රුපියල් මිලියන 109ක් අපි වියදම් කළා. ඒ කියන්නේ, රුපියල් කෝටි 10.90ක්. ජර්මනිය, සිංගප්පූරුව, චීනය, දකුණු කොරියාව, එක්සත් රාජධානිය, රුසියාව කියන රටවල එවැනි වැඩසටහන් පවත්වා තිබෙනවා. මේ අවුරුද්දේ සැප්තැම්බර් 15 - 17වැනි දා දක්වා ප්‍රංශයේ තිබුණු IFTM එකට රුපියල් මිලියන 122ක් - කෝටි 12.2ක් - අපි වියදම් කළා. ඒ, තනි රටක ප්‍රවර්ධන වැඩසටහනකට. ඒ වාගේම පසුගිය සැප්තැම්බර් මාසයේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තිබුණු වැඩසටහනකට රුපියල් මිලියන 196ක් - කෝටි 19.6ක් - අපි වියදම් කරලා තිබෙනවා.

ඒ වාගේම roadshows ගත්තොත්, තනි රටක roadshow එකක් පවත්වන්න අපෙන් කණ්ඩායමක් යන්න ඕනෑ; ඒකට අවශ්‍ය වන සංස්කෘතික උපාංග අරගෙන යන්න ඕනෑ; නැටුම් කණ්ඩායම් අරගෙන යන්න ඕනෑ; සංචාරක ප්‍රවර්ධනයට අවශ්‍ය විවිධ ආකෘති අරගෙන යන්න ඕනෑ; ඒවාට අපි PR companies වෙනම ගන්න ඕනෑ; ඒ අයට ගෙවීම් කරන්න ඕනෑ. ඒ සඳහාත් අපි ලොකු වියදමක් දරනවා, ඒ තනි තනි රටවලට. උදාහරණ වශයෙන් මම කිහිපයක් කියන්නම්. ඊට අදාළ සම්පූර්ණ වියදම් වාර්තාව මම **සභාගත*** කරනවා.

මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ චීනයේ පැවැත් වූ එක roadshow එකකට රුපියල් මිලියන 65ක් අපි වියදම් කරලා තිබෙනවා. රුමේනියාවට රුපියල් මිලියන 5ක් වියදම් කරලා තිබෙනවා. ඔස්ට්‍රේලියාවේ, ඒ කියන්නේ තනි රටක නගර දෙක තුනක සංචාරක කර්මාන්තය වෙනුවෙන් පසුගිය සැප්තැම්බර් මාසයේදී කරපු roadshow එකට ගිය වියදම රුපියල් මිලියන 90ක් - රුපියල් කෝටි 9ක්. නවසීලන්තයේ ඔක්ලන්ඩ් සහ ක්‍රයිස්ට්චර්ච් කියන නගර දෙකේ මේ අවුරුද්දේ කරපු roadshowsවලට ගිය වියදම රුපියල් මිලියන 60යි. ඒ කියන්නේ, ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය කියන රටවල් දෙකේ පසුගිය සැප්තැම්බර් මාසයේදී කරපු roadshowsවලට විතරක් අපට වියදම් වෙලා තිබෙනවා, රුපියල් මිලියන 150ක් - කෝටි 15ක්. ඇත්තටම අපේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට තනි තනි රටවල වෙන වෙනම සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් කරද්දී මේ සා විශාල මුදලක් වැය වෙනවා. සංචාරකයින් ගෙන්වා ගන්න නම්, ඒ අයගෙන් ඩොලර් බිලියන ගණන් අපි ආදායම් ගන්න නම්, එවැනි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යම් වියදමක් දරන්න වෙනවා.

එවැනි වැඩසටහන් ගණනාවක් අතරේ අපට ලැබුණු විශේෂ අවස්ථාවක් තමයි පසුගිය දවස්වල පැවැත්වුණු Asia-Pacific Broadcasting Union එකේ, ලංකාවේ පැවැති 63වැනි සමුළුව. ඇත්තටම ඒක අපට විශේෂ අවස්ථාවක්; විශේෂ වාසියක්. මොකද, 2024දී තුර්කියේ පැවැත්වුණු ඒ අයගේ මහා සභා රැස්වීමේදී ඒගොල්ලන් තීරණය කරලා තිබුණා, 2026දී ඒක ලංකාවේ පවත්වන්න. ඇත්තටම ඒක ලංකාවට ලැබුණු විශේෂ, වාසිදායක තත්ත්වයක්. අපි එලෙස ලැබුණු වාසිය ප්‍රයෝජනයට ගත්තා. ඒක පෞද්ගලික නාළිකාවක් ප්‍රවර්ධනය කරන්න කරපු දෙයක් නොවෙයි. ඒක අපට ලැබුණු විශේෂ අවස්ථාව, සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා පාවිච්චි කර ගන්න අපි කරපු දෙයක්. ඒ යෝජනාව ඇවිල්ලා තිබුණේ 2024දී. මාධ්‍ය ආයතන 225ක් විතර ABU එකේ සාමාජිකත්වය දරනවා. රටවල් 66ක් ඒකේ සාමාජිකත්වය දරනවා. අපේ රටෙත් රජයේ මාධ්‍ය ආයතන සහ පෞද්ගලික මාධ්‍ය ආයතන වශයෙන් මාධ්‍ය ආයතන 6ක් නිශ්චිත වශයෙන්ම එහි ස්ථිර සාමාජිකත්වය දරනවා.

එවැනි ජාත්‍යන්තර සමුළුවක් ලංකාවේ පවත්වනකොට ඒක සමුළුවකට විතරක් සීමා වෙන්නේ නැහැ. ඒ සඳහා වන workshops, විවිධ වැඩසටහන්, ඒ වාගේම විවිධ ගමනාන්ත සඳහා ඒ අය රැගෙන යාම, අපේ රටේ විවිධ ස්ථාන වීඩියෝගත කිරීම, විවිධ වැඩසටහන් සම්පාදනය කිරීම සිදු කරනවා. ඒ සියලුම වැඩසටහන් ඔවුන්ගේ ඒ අදාළ රටවල නාළිකාවල ප්‍රචාරය කරනවා. 350කට ආසන්න නියෝජිතයින් සංඛ්‍යාවක් ඒ අවස්ථාවේදී ලංකාවට පැමිණියා. ඒ ආපු හැම කෙනෙක්ම තමන්ගේ මාධ්‍ය ආයතනයෙන් - තමන්ගේ නාළිකාවෙන් - ලංකාවේ සංචාරක ස්ථාන පිළිබඳව, අපේ සංස්කෘතිය පිළිබඳව, අපේ සියලු ක්‍රියාකාරකම් පිළිබඳව මුළු ලෝකයටම ප්‍රචාරය කළා. මම ඉස්සෙල්ලා කියපු විධියට, ඔස්ට්‍රේලියාව, නවසීලන්තය කියන රටවල් දෙකට විතරක් අපි වෙනම සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් කළ වැඩසටහනට රුපියල් කෝටි 15ක් වියදම් වුණා. නමුත් අපි මෙතැනදී රුපියල් කෝටි 10න් ඊට වඩා ලොකු වාසියක් ගත්තා. ඒ වාසිය ගත්ත එකට තමයි දැන් මේ කට්ටිය කලබල වෙලා තිබෙන්නේ. ඒ නිල සාමාජිකත්වය තිබෙන මාධ්‍ය ආයතනවලට තමයි ඒ අය මේ අවස්ථාව දෙන්නේ.

MTV Channel (Pvt.) Limited එකට, ලංකාවේ host කරන්න දෙන්න 2024දී තුර්කියේදී මහා සභාව තීරණය කළා. ඒ අනුව එම ආයතනය ලංකාවේ එම කටයුතු කරන්න යනකොට අපි මැදිහත් වෙලා, සාකච්ඡා කරලා, ඒ අයත් එක්ක ඒකාබද්ධව එම කටයුතු සිදු කළා. අපි ඒ වෙනුවෙන් යම් වියදමක් දැරුවා. ඒක ඇත්ත. හැබැයි, ඒක සංචාරක ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අපි ගත්ත ක්‍රියාමාර්ගයක්. අපේ රට පිළිබඳ කීර්ති නාමය ලෝකයට ප්‍රචලිත කරන්න අපට ලැබුණු අනගි අවස්ථාවක්, මේක. ඒ වාගේම මේක MICE tourismවලට ඉතාම වැදගත් අවස්ථාවක්. එමෙන්ම එම කණ්ඩායම විවිධ වැඩසටහන් මෙහේ ක්‍රියාත්මක කරද්දී අපි ඒ අය ගාල්ලට එක්ක ගෙන ගියා, බෙන්තොට නවත්වා ගත්තා. එතකොට ගාල්ල, බෙන්තොට ආදී දක්ෂිණ සංචාරක කලාපය පිළිබඳව වීඩියෝ වැඩසටහන් කළා; වාර්තා වැඩසටහන් කළා. ඒ වැඩසටහනට ආවේ ලෝකයේ ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන. ඇත්තටම ගත්තොත්, ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන ගණනාවක් ඒකට සම්බන්ධ වුණා; ඔස්ට්‍රේලියාවේ ABC, ඒ වාගේම ජපානයේ NHK වාගේ ආයතන. ඒවා අපට කිට්ටු කරන්නවත් පුළුවන් ඒවා නොවෙයි. මම කලිනුත් කිව්වා වාගේ කෝටි ගණන් වියදම් කරලා තමයි අපට ප්‍රවර්ධන වැඩසටහන් කරන්න වෙන්නේ. නමුත් අපට ලැබුණු මේ අවස්ථාව අපි උපරිම වශයෙන් පාවිච්චි කළා. ඒ අවස්ථාවේදී ජපානයේ NHK, ඔස්ට්‍රේලියාවේ ABC, චීනයේ China Media Group, දකුණු කොරියාවේ KBS, ඉන්දියාවේ Prasar Bharati, සිංගප්පූරුවේ Mediacorp, තුර්කියේ TRT වාගේ ප්‍රධාන පෙළේ ආයතන ගණනාවක් ලංකාවට ආවා. අපි ඒ අවස්ථාව පාවිච්චි කළා. එසේ පාවිච්චි කිරීමේදී අපි නිවැරදි ක්‍රමවේදයට අනුවයි කටයුතු කළේ. අපි 2026 වර්ෂය සඳහා හඳන වාර්ෂික සැලැස්මට පසුගිය අවුරුද්දේ මේක ඇතුළත් කර තිබුණේ නැහැ. මොකද, අපට මේ අවුරුද්දේ මැද - ජූලි මාසයේ - තමයි මේ අදහස ඉදිරිපත් වුණේ. ඒ අනුව අපි MTV Channel (Pvt.) Limited එකත් එක්ක සාකච්ඡා කළා. මොකද, ඒ අයට තමයි නිල බලය තිබෙන්නේ. ඒක මේ රජය විසින් ගත්ත එකක් නොවෙයි. ඒක මාධ්‍ය ආයතන ගණනාවක් එකතු වෙච්ච මහා සභාවේදී ගත්ත තීරණයක් අනුවයි ඒ අයට දීලා තිබුණේ. හැබැයි, අපි සංචාරක ප්‍රවර්ධනය සඳහා ඒක පාවිච්චි කර ගත්තා.

අපි ඒක host කරන්න යම්කිසි කොටසක් බාර ගත්තා. ඒ ආයතනයත් එක්ක ඒ යෝජනාව ගැන සාකච්ඡා කරලා මේ

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

අවුරුද්දේ ජූලි මාසයේ 23වෙනි දා පැවති Sri Lanka Tourism Promotion Bureau එකේ පළමුවෙනි Board meeting එකට අපි ඒ යෝජනාව ඉදිරිපත් කළා. එතැනදී Board එක ඒකෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව තවත් අධ්‍යයනය කරන්න ඕනෑය, ඒ පිළිබඳව තොරතුරු තවත් ලබා ගන්න ඕනෑය කියලා තීරණය කරලා දෙවැනි දවසකට කල් තිබ්බා. ඊට පස්සේ අගෝස්තු මාසයේ 11වෙනි දා Board එක ඒක අනුමත කළා. බුද්ධික හේවාවසම් මහතා තමයි ඒකේ සභාපති. එතුමා ඉන්දෙද්දි තමයි ඒක අනුමත කළේ. එතුමා ඉල්ලා අස් වුණේ IATA එකේ ස්ථිර රැකියාවකට යන්න මිස වෙන මොකක්වත් හේතුවක් නිසා නොවෙයි. වැරදි අදහසක් ගිහින් තිබෙන්නේ. අපේ SLTPB එකේ පෞද්ගලික අංශයේ හයදෙනෙකු ඉන්නවා. හෝටල් සංගමයෙන් ඉන්නවා; travel agentsලාගේ සංගමයෙන් - SLAITO එකෙන් - ඉන්නවා. ඒ සියලුදෙනාත් එකතු වෙලා අපි මේ තීන්දුව ගත්තා.

මේක ගිය අවුරුද්දේ සැලැස්මේ නොතිබුණු නිසා සහ මේකේ වියදම මිලියන 106ක් වෙන නිසා අපි මේක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න කලින් අපි 2026 සැප්තැම්බර් මාසයේ 18වෙනි දා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගත්තා; එහෙට ඉදිරිපත් කරලා ඒ ලිපිය ලබා ගත්තා. ඊට පස්සේ අපි පළමුවෙනි කැබිනට් පත්‍රිකාව සැප්තැම්බර් 28වැනි දා ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය මේ ගැන තවදුරටත් නිරීක්ෂණ ඉදිරිපත් කරන්න කල් ගත්තා. ඒ අනුව සැප්තැම්බර් 30වෙනි දා තිබුණු කැබිනට් මණ්ඩල රැස්වීමේදී එය අනුමත කළා. නීත්‍යානුකූලව, නිවැරදි ක්‍රමවේදයට අපි ඒ කටයුත්ත සිද්ධ කරලා තිබෙනවා, එතැන කිසිදු වැරැද්දක් කරලා නැහැ.

ඊට පස්සේ ඔක්තෝබර් 5වෙනි දා MTV ආයතනයයි, SLTPB එකයි, අපියි අවබෝධතා ගිවිසුමකට අත්සන් කළා. මේ වැඩසටහනෙන් පස්සේ අපට ලැබෙන වාසිදායක තත්ත්වයන් මොනවාද, ප්‍රතිලාභ මොනවාද කියලා ඒ අවබෝධතා ගිවිසුමේ ඉතා පැහැදිලිව තිබෙනවා. ඒ නිසා මම ඉතා පැහැදිලිව මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, අපි මෙවැනි වැඩසටහන්වලට අනුග්‍රාහකත්වය දක්වන්නේ වෙන මොකටවත් නොවෙයි, රටේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයටයි කියන එක. මේ ආයතනයට විතරක් නොවෙයි අපි අනුග්‍රාහකත්වය දක්වා තිබෙන්නේ. "දෙරණ" ආයතනයෙන් ජාත්‍යන්තර සරුංගල් ප්‍රදර්ශනයක් පැවැත්වුවා. අපි මිලියන 7ක් සල්ලි දීලා තිබෙනවා, ගිය අවුරුද්දයි මේ අවුරුද්දයි ගත්තාම. එහෙම භේදයක් නැහැ. ITN එකේ වැඩසටහන්වලට අපි sponsor කරලා තිබෙනවා, ජාතික රූපවාහිනියේ වැඩසටහන්වලට sponsor කරලා තිබෙනවා. ඊයේ ශ්‍රී ලංකාවේ පැවැත්වුණා යුරෝපයේ, ප්‍රංශයෙන් ආරම්භ වුණු Raid Amazon තරඟාවලිය; කාන්තාවන් පමණක් සහභාගි වෙන වැඩසටහන. ඒකට අපි sponsor කරලා තිබෙනවා. එවැනි වැඩසටහන් ගොඩක් තිබෙනවා අපි sponsor කරපු. මේ රටේ ජනතාවගේ දැන ගැනීම සඳහා මම 2026 වසරේ අපි sponsor කළ වැඩසටහන් විස්තර සියල්ල **සභාගත*** කරනවා.

සංචාරක ප්‍රවර්ධනයට, - පෞද්ගලික අංශය වෙන්න පුළුවන්, රාජ්‍ය ආයතන වෙන්න පුළුවන් - අපි යම් මුදලක් වියදම් කරනවා. ඒකෙන් තමයි ප්‍රතිලාභ එන්නේ. ලංකාවේ විහාරස්ථානවල පැවැත්වෙන පෙරහැරවලට, විශේෂයෙන් කැලණිය රජමහා විහාරයේ දුරුතු පෙරහැරට සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් සල්ලි වෙන් කරනවා. ලංකාවේ තිබෙන ප්‍රධාන පන්සල්වල, කෝවිල්වල උත්සවවලටත් අපි සල්ලි වෙන් කරනවා. ඇයි ඒ? ඒවා බලන්න, ඒවා නරඹන්න සංචාරකයෝ ආවාම තමයි අපේ සංචාරක ක්ෂේත්‍රය දියුණු වෙන්නේ, ප්‍රවර්ධනය වෙන්නේ.

ඉතා පැහැදිලිව අපි මේ කටයුත්ත කරන්නේ රටේ ප්‍රතිරූපය ලෝකයට ගෙනියන්න. ඒ මාධ්‍ය ආයතන ඇවිල්ලා දවස් 5ක් විවිධ වැඩසටහන් සැලසුම් කරලා ක්‍රියාත්මක කළා. එතැනින් නතර වෙන්නේ නැහැ. අපේ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ඒ හැම මාධ්‍ය ආයතනයක් එක්කම, ප්‍රධාන මාධ්‍ය ආයතන සියල්ල එක්කම වෙන වෙනම ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට විවිධ වැඩසටහන් කරන්න එකඟතාවන්ට ආවා. ලෝකය පුරා ඒගොල්ලන් ඒවා ප්‍රචාරය කරනවා. ඇත්තටම ගත්තොත්, ඒකෙන් ලැබෙන ප්‍රතිලාභය මිල කළ නොහැකියි. මෙහාට ඇවිල්ලා දවස් 5ක් තිස්සේ ලංකාවේ හෝටල්වල හිටියා; ඒවා ඉක්මනින් ලැබෙන සල්ලි. මේකෙදි එහෙම නොවෙයි. මේකෙදි අපේ ප්‍රතිරූපය ජාත්‍යන්තරයට ගෙනියන්න ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන සියල්ල පාවිච්චි කරන්න ලැබුණු එක මම ඉස්සෙල්ලා කියපු විධියට ඕස්ට්‍රේලියාවේයි, නවසීලන්තයේයි roadshow එකක් කරනවා වාගේ නොවෙයි. ඒ roadshow එකට වඩා විතරක් මිලියන 150ක් අපි වියදම් කළා, රටවල් දෙකක වැඩකට. ඇත්තටම ගත්තොත් මේකට ඇතුළත් වනවා රටවල් 66ක්. අප්‍රිකානු කලාපයේ, යුරෝපා කලාපයේ, විවිධ කලාපවල ප්‍රධාන පෙළේ මාධ්‍ය හරහා අපේ රටේ ප්‍රතිරූපය ලෝකයට ගෙනියන්න පුළුවන් අනගි අවස්ථාවක් අපි මේ පාවිච්චි කළේ. ඒ නිසා මේ ABU General Assembly එකේ 63වන වාර්ෂික සමුළුවට අපි සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අනුග්‍රාහකත්වය දැක්වූයේ රටේ සංචාරක ප්‍රවර්ධනයේ ප්‍රගතිය වෙනුවෙන්. ඒක සද්භාවයෙන් කරපු දෙයක්. ඉතා පැහැදිලිව, නීත්‍යානුකූලව, නිවැරදි ක්‍රමවේදයටයි අපි ඒ දේ කර තිබෙන්නේ. මෙතැන කාගේවත් පෞද්ගලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් නැහැ. ඉතා පැහැදිලිව අපේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ගණනාවක් ප්‍රචාරය කළා. ඒ workshop එකේත් තිබුණා, ඒ ප්‍රධාන ආරම්භක උත්සවයේත් එහෙම තිබුණා. අපේ සීගිරිය, අනුරාධපුරය, මහනුවර, නාගදීපය, ත්‍රිකුණාමලයේ කෝවිල් ආදී සියල්ලම අපි ඒ සංචාරක වීඩියෝ වැඩසටහන්වල ප්‍රචාරය කළා. දැන් ඒ මාධ්‍ය ආයතනවලින් ඒවා ලෝකය පුරාම ප්‍රචාරය කරනවා. එයින් ලැබෙන වාසිය අපට, අපේ රටට ඉතාම වැදගත් වෙනවා. උඩවලව, ගාල්ල, සෙවනගල වැනි ප්‍රදේශවල තිබෙන සංචාරක ගමනාන්තවල වටිනාකම පිළිබඳව, ඒ ප්‍රදේශවල සිටින ජනතාවගේ ආගන්තුක සත්කාර පිළිබඳව, සංස්කෘතික ලක්ෂණ පිළිබඳව ලෝකයට කියන්න තමයි අපි මේවා පාවිච්චි කරන්නේ. මෙහි වාසිය ලැබෙන්නේ අපේ රටට, රටේ ජනතාවට මිස කිසිදු පෞද්ගලික ආයතනයකට නොවෙයි. මේක රටේ සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙන් කරපු දෙයක්. ඒ නිසා පැහැදිලිව අපි උඩවලව ප්‍රදේශය ප්‍රවර්ධනය කරන්නත් ඉදිරියේදී තවත් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. උඩවලව ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් විධියට නීත්‍යානුකූලව හඳුන්වා දෙන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ගවලට විතරක් සීමා වෙන්නේ නැතිව, මෙවැනි ලෝක පරිමාණ, ජාත්‍යන්තර පරිමාණ වැඩසටහන් හරහා ලෝකයේ සිටින සංචාරකයන්ට එම ස්ථාන ප්‍රවර්ධනය කරන්නත් ඉදිරියේදී කටයුතු කරන බවට මන්ත්‍රීතුමාට සහතික වෙමින් මගේ කථාව නතර කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 3.38]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විසින් ගෙන එන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව අප දිස්ත්‍රික්කයේ ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කළා. එතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ ඉදිවන සංචාරක කලාප හතරටම නායකත්වය ලබා දෙමින් මනාව කටයුතු කරනවා. ඒ වාගේම මෙම යෝජනාව සම්බන්ධව අදහස් දැක්වූවා, ගරු රාමනාදන් අර්චිචුනා මන්ත්‍රීතුමාත්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්. එම දෙපළ දැක්වූ අදහස් වෙනුවෙනුත් අපගේ ගෞරවය එතුමන්ලාට හිමි වෙනවා. විශේෂයෙන්ම දයාසිරි මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමේදී උඩවලව ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය පිළිබඳව යම් අධ්‍යයනයක් සහිතව කථා කළා. අපි එතුමාට ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ගරු අමාත්‍යතුමාගේ කථාවේදී සඳහන් කළා, සංචාරක කලාප 22ක් ඉදිකරද්දී උඩවලව සංචාරක කලාපයට ප්‍රධාන තැනක් ලබාදෙන එක ගැන. මොකද, අපි දන්නවා අර කියපු සංඛ්‍යාලේඛන අනුව උඩවලව සංචාරක කලාපය වසරකට සංචාරකයන් දහස් ගණනක් පැමිණෙන ප්‍රදේශයක් බව. නමුත්, මේ කලාපයේ විධිමත් සංවර්ධනයක් වෙලා තිබුණේ නැහැ.

විශේෂයෙන්ම ගත්තොත්, අර්චිචුනා මන්ත්‍රීතුමා සඳහන් කළ අදහස් වටිනවා. හැබැයි, එතුමාගේ අදහස් දැක්වීමේදී "යන්නේ කොහෙද, මල්ලේ පොල්" ආකාරයේ අදහසක් තමයි ඉදිරිපත් කළේ. ඒ ප්‍රදේශය අඩුම වශයෙන්වත් සංචාරකයන්ට අවශ්‍ය විධියට සංවර්ධනය කර නැහැ කියලා චෝදනාවක් තමයි අපට ඉදිරිපත් කළේ. ඇත්තටම මම එතුමාට කියන්න කැමැතියි, අපි බලයට එනකොට ඒ ප්‍රදේශයේ අඩුම තරමින් විදේශිකයන්ට තබා දේශීය සංචාරකයන්ට යන්න ටොයිලට් පහසුකමක්වත් තිබුණේ නැති බව. හැබැයි, අපි ඉතාම කඩිනමින් මේ වෙනකොට රුපියල් මිලියන 23ක වියදමින් අති නවීන ටොයිලට් පද්ධතියක් හදලා, එහි වැඩකටයුතු දැන් කරගෙන යනවා. මේ වෙනකොට අපි ඒ සංචාරක කලාපයට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් සභාව, පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සංචාරක සංවර්ධන මණ්ඩලය, ඒ වාගේම සංචාරක මහ පෙන්වන්නන්, සංචාරක ජීප් රථ සංගම්, ඒ වාගේම හෝටල් සංගම් කියන සියලුදෙනා ඒකාබද්ධ කරමින් දැවැන්ත සංවර්ධන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසාම අපි මේ අවුරුද්ද ඇතුළත මිලියන 300ක වාගේ ප්‍රමාණයක් මේ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා, පුහුණුවීම් සඳහා යොදවා තිබෙනවා. මේ වෙනකොට අපි සංචාරක ජීප් රථ රියදුරන් 50දෙනෙකු බැගින් කණ්ඩායම් 5කට සබරගමුව පළාත් සභාව හරහා දැනුවත් කිරීම්, දින 3ක පුහුණු කිරීම් කටයුතු කරගෙන ගියා. ඒ වාගේම, සංචාරක දිනය නිමිත්තෙන් අපි දවස් 3ක විශේෂ වැඩසටහනක් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක කළා. ඒ වාගේම තමයි, ආසියානු සංවර්ධන බැංකුව හරහා ඉදිරි කාලයේදී මිලියන 350ක වාගේ දැවැන්ත මුදල් ප්‍රමාණයක් මේ ප්‍රදේශයට ලබා දෙන්න යෝජනා කර තිබෙනවා, මෙම සංචාරක කලාපය සඳහා. උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් හැටියට නම් කරන්න කියලා අප කියන්නේම විශේෂ හේතුවක් ඇතිවයි. මොකද අපි දන්නවා, ඒ ප්‍රදේශවල තිබෙන ඓතිහාසික ස්ථාන, පාරිසරික වැදගත්කම් ඇති ස්ථාන වාගේම ජාතික වනෝද්‍යානය, ඇත් අතුරු සෙවණ ආදියට දේශීය, විදේශීය සංචාරකයන් ගෙන්වා ගැනීම හරහා එම ප්‍රදේශයේ hotels, ජීප් රථ ආශ්‍රිතව සෘජු සහ වක්‍ර රැකියා කරන අයගේ ආදායම් මට්ටම ඉහළට පැමිණෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දේශීය ව්‍යාපාරිකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා තවමත් මෙවැනි නිශ්චිත තැන් හඳුනාගෙන නැතිව. ඒ වාගේම එම ස්ථානවල සංචාරයට කැමැති බොහෝ දෙනෙක් ඉන්නවා. අප මේ යෝජනාව තුළින් බලාපොරොත්තු වන්නේ විදේශීය සංචාරකයන් වාගේම දේශීය සංචාරකයනුත් මේ ප්‍රදේශවලට ගෙන්වලා ඔවුන්ට ඒ ස්ථාන නරඹන්න අවස්ථාව ලබා දෙන ගමන්, ඒ ප්‍රදේශවල තිබෙන සංස්කෘතිය, ඒ වටිනාකම් පෙන්වා දීලා ඒ සංචාරකයන්ට විනෝදය ලබා දීම වාගේම ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට යම් ආර්ථික හැකියාවක් හදන එකයි. ඒ නිසා තමයි අප ඉල්ලා සිටින්නේ උඩවලව ප්‍රදේශය, සෙවනගල ප්‍රදේශය බද්ධ කරමින් සංචාරක කලාපයක් පිහිටුවන්න කියලා. අපි හිතනවා, මේ වනකොට අමාත්‍යාංශය අරගෙන තිබෙන තීන්දුවට මෙය රුකුලක් වෙයි කියලා. ඒ සඳහා අවශ්‍ය කරන නීති, අණ පනත් සකස් කරලා ඒ ප්‍රදේශය සංචාරක කලාපයක්, හොඳ සංචාරක ගමනාන්තයක් බවට පත් කරමු. ඒ වෙනුවෙන් මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ඇමතිතුමා ඇතුළු සියලු දෙනාට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, යෝජනා අංක පා. 79/2025 ඉදිරිපත් කිරීම, ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය සහ මර්දනය කිරීම

நீர்த்தாமரை செடியின் பரவலை சாதகமான வகையில் கட்டுப்படுத்துதல் மற்றும் அழித்தல்

FAVOURABLE CONTROL AND SUPPRESSION OF THE PROLIFERATION OF COMMON WATER HYACINTH

[අ.භා. 3.43]

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ජපන් ජබර නොහොත් *Eichhornia crassipes (Mart.) Solms* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රෝන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේ දී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිභරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්ත වීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර විධියට මර්දනය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු බවටයි මා අද දවසේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව යටතේ ඉදිරිපත් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම 1905 වර්ෂයේදී තමයි ජපන් ජබර ශාකය විසිතුරු පැළෑටියක් හැටියට නිවෙස්වල භාවිත කිරීමට හොංකොං රාජ්‍යයෙන් මෙරටට ආනයනය කරන්නේ. ඒ ආකාරයට ආනයනය කළ මෙම ශාකය 1909 වාගේ වෙද්දී රට පුරා ඉතා ආක්‍රමණශීලී ශාකයක් බවට පත් වෙනවා. 1905දී මේ රටට ගෙන ආ මෙම ශාකය ඉන් පසුව මේ රටට ගෙන්වීම සහ නිවෙස්වල තබා ගැනීම, වතුපිටිවල තබා ගැනීම දඩ ලැබිය හැකි වරදක් බවට පත් කරනවා. ඒ, 1909 වර්ෂයේදී ගෙන ආ Water Hyacinth Ordinance එක මඟිනුයි. ශාකයක් කේන්ද්‍ර කරගෙන මේ රටේ ස්ථාපිත වුණු ප්‍රථම ආඥාපනත හැටියට 1909දී ගෙන ආ ජපන් ජබර සම්බන්ධ ආඥාපනත හඳුන්වන්න පුළුවන්. මේ පනත ගෙනාවාට පසුව නිවෙස්වල ලස්සනට හදලා තිබුණු ජපන් ජබර ශාක ටික අවට වැව් අමුණු, ජලාශ පද්ධතිවලට මුදා හැරියා. ඒ, එම ශාක ළඟ තබා ගත්තොත් දඩයක් කන්න සිදු වන නිසා.

තවත් කථාවක් තිබෙනවා, ලෝක යුද්ධ සමයේදී මෙම ශාකය මෙරටට ආනයනය කරලා ජලාශවලට ව්‍යාප්ත කළා කියලාත්. ඒ කෙසේ වෙතත්, මේ සියලු කථා අස්සේ 1905 ඉඳන් 2026 වසරේ අද දවස වනකල් වසර 121ක් පුරාවට මෙම ශාකය මෙරට වැව් අමුණු, ජලාශ 30,000ක් පමණ වන මිරිදිය පරිසර පද්ධතියට දැඩි තර්ජනයක් බවට පත් වෙලා තිබෙනවා, ජෛව පරිසර පද්ධතිය තුළ ආක්‍රමණශීලී ශාකයක් බවට පත් වෙලා තිබෙනවා. අපි මෙම ශාකයේ ව්‍යාප්තිය කඩිනමින් පාලනය කර ගත යුතුයි. අපි මේ සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමු කළ යුතුයි.

අපි අත්දැකලා තිබෙනවා, වසර ගණනාවක් තිස්සේ වර්ෂා කාලයේදී පහත් බිම්වල මේ ජපන් ජබර ශාකය ඉතා හොඳින් වැඩීම හින්දා ඒ ඇළ මාර්ග, පහත් බිම් යට වීමට, ගංවතුර තත්ත්වයන් ඇති වීමට මෙම ශාකය හේතු වෙලා තිබෙන බව. ඒ වාගේම මෙම ශාකය පරිසර පද්ධතියේ තිබෙන වැව් අමුණු වසා ගනිමින් වසර 100කට ආසන්න කාලයක් පැවතීම හේතුවෙන් ඒ ශාකවල මුල් රොන් මඩවලට එකතු වෙලා එම ජලාශ ගොඩවන තත්ත්වයට ද පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මෙම ශාක ඩෙංගු, මැලේරියා, බරවා ආශ්‍රිත මදුරුවන්ට රජදහනක් බවටත් පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, දේශීය ජලජ ශාකවලට සහ මත්ස්‍යයන්ට තර්ජනයක් ගෙන දෙන ශාකයක් බවට ද මෙම ශාකය පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි, නෙළුම්, ඕලු වැනි ශාක ලංකාවේ ජලාශ තුළ වර්තමානයේ දකින්න නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා, ජපන් ජබර ශාකයේ ආක්‍රමණශීලී තත්ත්වය නිසා. විශේෂයෙන්ම පසුගිය අවුරුදුවල කෘෂිකර්ම අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී කලින් තිබුණු අමාත්‍යාංශ සහ ආයතන යටතේ මිලියන 500කට වඩා වසරකට වැය කරලා තිබෙනවා, මෙම ශාකයෙන් පරිසර පද්ධතිය ආරක්ෂා කරලා මේවා පරිසර පද්ධතියෙන් ඉවත් කිරීමට. ඒ වාගේම 1988 වර්ෂයේදී මෙම ශාකය පාලනයට ජෛව පාලන කුරුමිණියකු ඕස්ට්‍රේලියාවෙන් මෙරටට ගෙනැල්ලා කැලණිය විශ්වවිද්‍යාලය හරහා ඒ ගැන පර්යේෂණ කරලා කොළඹ පැලියගොඩ අවට පරිසරයට මුදා හැරලා තිබෙනවා. එසේ කරලාත් මේ තත්ත්වය පාලනය කිරීමට හැකියාවක් ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ශාකය නිසා අවුරුදු ගණනාවක් තිස්සේ මේ පරිසර පද්ධතියට බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම, මේ රටේ මුදල් රුපියල් මිලියන ගණනක්, බිලියන ගණනක් වතුරට දමන තත්ත්වයට පත් කර තිබෙනවා, මෙම ශාක වැව් ජලාශවලින් ඉවත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ගවලින්. අවුරුද්දකට කෝටි ගණනක් වියදම් කරලා ජලාශ සුද්ද පවිත්‍ර කළාට තව මාසයක්, හමාරක් යද්දී ඊට වඩා හොඳට මෙම ශාකය ව්‍යාප්ත වෙනවා. මේ ශාකය ඉවත් කිරීමට දිගින් දිගටම නඩත්තු කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. ඒක හොඳ විසඳුමක් නොවෙයි. තායිලන්තය, ඉන්දියාව, වියට්නාමය, පිලිපීනය වාගේ රටවල් මේ ජපන් ජබර ශාකයේ පත්‍ර, කඳ පාවිච්චි කරලා පුටු, සාරි, මේස, කඩදාසි ආදි දේවල් නිෂ්පාදනය කරනවා. මේ ආකාරයට අදාළ අමාත්‍යාංශ මැදිහත්වීමක් කරලා මෙම ශාකය මර්දනය කිරීමට, එවැනි නිෂ්පාදන සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම ශාක ව්‍යාප්තිය වැඩිපුරම තිබෙන දිස්ත්‍රික්කවලට ලබා දීම සුදුසු බව මම යෝජනා කරනවා. අද බොහෝ පළාත් පාලන ආයතන කාබනික පොහොර නිෂ්පාදනය කරනවා. මේ ජපන් ජබර ශාකය කාබනික පොහොරක් හැටියට වර්තමානයේ හොඳින් භාවිත කිරීම සිදු වෙනවා.

විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිති නොවන වැව් විවිධ ප්‍රදේශවල තිබෙනවා අපි දැකලා තිබෙනවා.

(මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ඒ වැව් ටික කළමනාකරණය වාගේම පොහොර නිෂ්පාදනය සඳහා ජපන් ජබර ලබා ගැනීමට පළාත් පාලන ආයතනවලට ලබා දීම සුදුසු බව ද මම යෝජනා කරනවා. ඊට අමතරව, විශේෂයෙන්ම මෙම ජලජ ශාක මර්දනය කිරීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වෙලා එක දිස්ත්‍රික්කයකට team එකක් නම් කරන්න. ඔවුන්ට දිගින් දිගටම ඒවා පාලනය කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ ටික ලබා දීමට මැදිහත්වීමක් කරන්න. ඒ ආකාරයට මේ ආක්‍රමණශීලී ශාකය පරිසරයෙන් තුරන් කිරීමට අමාත්‍යාංශය මැදිහත්වීම වඩාත් සුදුසු බව මම යෝජනා කර සිටිනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය සහ මර්දනය කිරීම සම්බන්ධව ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කර තිබෙන්නේ වැදගත් වාගේම කාලීන යෝජනාවක්. මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

මා නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැව් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය සඳහා කුඩා වැව්වල ජලය රඳවා තබා ගැනීමේදී මේ ජපන් ජබර කියන ශාකයේ ව්‍යාප්තිය නිසා දැඩි බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. ඒ කොහොමද කියනවා නම්, වැව්වල ඒ ශාකය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වනවා. ඒ නිසායි එය

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

අහිතකර වෙන්නේ. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම නිසා නිතර නිතර ඉවත් කළත් නැවත මේ ශාකය බෝවීම සිදු වෙනවා. මේ ශාකය වැව්වල රැඳීම නිසා එක අතකින් වැව් ගොඩවීමක් සිදු වෙනවා. අනෙක් අතින්, ජලය ගලා යන ප්‍රවාහ අවහිර වීමක් ද සිදු වෙනවා. ඒ කාරණා දෙකම නිසා වැව් ගොඩවීමෙන් වැව්වල ජලය රැස් කර තබා ගත හැකි ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මෙය කෘෂි කර්මාන්තයට දැඩි සේ බලපෑමක් එල්ල කර තිබෙනවා.

අනෙක් කාරණය මෙයයි. ජලය නිසි ලෙස ගලා යන මාර්ග අවහිර වීම ගංවතුර තත්ත්වයන් පාලනය කිරීමේදී ගැටලුසහගත තත්ත්වයක් වෙලා තිබෙනවා. මොකද, මෙම ශාක ජලය ගලා යන මාර්ග අවහිර කිරීම හේතුවෙන් ගංවතුර තත්ත්වයන් ඇති වනවා. ඉහත කී කාරණා දෙකේදීත් මෙම ශාකය අහිතකර විධියට බලපාන බව කියන්න පුළුවන්. මෙම ශාකයේ ව්‍යාප්තිය ජෛව විවිධත්වයට බලපානවා. ජපන් ජබර ශාකය ව්‍යාප්තිය නිසා අනෙකුත් ජලජ ශාකවලට හිරුඑළිය ලැබීම අවහිර වීමෙන් ජලජ පැළෑටි වර්ධනය වීම කෙරෙහිත් එය අහිතකර ලෙස බලපානවා. ඒ නිසා එය ජලජ ජීවීන්ගේ වර්ධනයටත් අහිතකර විධියට බලපානවා. එම නිසා පරිසර පද්ධතියේ සමතුලිතතාව බිඳ වැටෙනවා. මොකද, පරිසර පද්ධතිය නිසි ලෙස පවත්වාගෙන යාමට නොහැකි වීම, ජෛව විවිධත්වයට අහිතකර ලෙස බලපා තිබෙනවා.

ඊළඟට, ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය කෘෂි කර්මාන්තයට බලපානවා. ඒ විතරක් නොවෙයි, එම ශාකය ඩෙංගු වාගේ රෝග පැතිරී යාමටත් බලපා තිබෙනවා. ඒ විධියට ගත්තාම ජපන් ජබර ශාකය නිසා ඇති වන අහිතකර බලපෑම් රැසක් තිබෙනවා. එම නිසා ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අනුගමනය කිරීම සුදුසුයි කියන කාරණය මම ගරු සභාවට කියන්න කැමතියි.

ජපන් ජබර ශාක ප්‍රයෝජනයට ගන්න පුළුවන් ආකාර පිළිබඳ විවිධ පර්යේෂණ කරලා තිබෙනවා. උදාරහණයක් විධියට කිව්වොත්, යාපනය විශ්වවිද්‍යාලය විසින් කරන ලද පර්යේෂණයකට අනුව ජපන් ජබර ශාක යොදාගෙන කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් සාර්ථක වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඉන්දියාව එම ශාක ජෛව ගෑස් නිෂ්පාදනය කිරීම සඳහා යොදාගෙන තිබෙනවා. ඒ වාගේම මේස හා පුටු නිෂ්පාදනයට, ඇඳුම් නිෂ්පාදනයට එම ශාක යොදා ගෙන තිබෙනවා. ඊට අමතරව සත්ව ආහාර නිෂ්පාදනයටත් යොදාගෙන තිබෙනවා. ඒ වාගේ උදාහරණ ඕනෑ තරම් තිබෙනවා.

විශේෂයෙන්ම කෘෂි කාර්මික රටක් වන අපට කාබනික පොහොර නිෂ්පාදනයට එම ශාකය ලෙහෙසියෙන්ම යොදා ගන්න පුළුවන්. මොකද, ගලවා ඉවත් කිරීමෙන් විතරක් අපට එම ශාකයේ ව්‍යාප්තිය පාලනය කරන්න බැහැ. එය අසාර්ථක වෙලා තිබෙනවා. ශාකවල ශීඝ්‍ර වර්ධනය නිසා එම ශාක ඉවත් කිරීමට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් වනවා. ඒ සඳහා රජයේ මුදල් මෙන්ම පෞද්ගලික මුදල් වියදම් වෙනවා. ඒ වාගේම කාලය නාස්ති වෙනවා. එම නිසා ව්‍යාප්තිය පාලනය සඳහා හිතකර ව්‍යාපෘති යෝජනා කිරීම කාලෝචිත බව මා කියනවා. ඒ නිසා මේ වෙනුවෙන් රජයේ අවධානය යොමු කරලා ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කළ යුතුයි. විශේෂයෙන්ම ජපන් ජබර ශාකය පොහොර නිෂ්පාදනය සහ වෙනත් නිෂ්පාදන සඳහා යොදා ගැනීමට ව්‍යාපෘති සකස් කිරීමට කටයුතු කිරීම ඉතා කාලෝචිත බව මා කියනවා.

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව නැවතත් ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එවුත්තියම්පප්පෙරුම.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[ප.ප. 3.53]

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

அஸ්ஸலாமு அலைக்கும்! ආයුබෝවන්! வணக்கம்!

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! நீர்த்தாமரைச் செடியின் பரவலை சாதகமான வகையில் கட்டுப்படுத்துதல் மற்றும் அழித்தல் என்ற தனிநபர் பிரேரணையை முன்மொழிந்த கௌரவ ஹிருனி விஜேசிங்ஹ அவர்களுக்கு நன்றி! ஏனென்றால், இது மிகவும் முக்கியமானதொரு பிரேரணை. அதாவது, ජපන් ජබර என்பது தமிழில் 'ஜபான் பாசி' அல்லது வெங்காயத்தாமரை என்று சொல்லப்படும். இது தென் அமெரிக்காவை தாயகமாகக் கொண்டது. இத்தாவரமானது 1905ஆம் ஆண்டளவில் அலங்காரத் தாவரமாக ஹொங்கொங்கில் இருந்து இலங்கைக்குக் கொண்டுவரப்பட்டது. ජපන් ජබර என்ற பெயர் கொண்ட தாவரமானது எமது நாட்டிலும் இருக்கின்றது. இந்தத் தாவரங்கள் குளங்கள் மற்றும் ஏனைய நீர்நிலைகளில் பரவலாக தீவுகளாகப் பரந்து காணப்படுகின்றன. அதுமட்டுமல்ல, இது ஒரு பாய் விரிப்பு போலவும் பரந்து காணப்படுகின்றது. ජපන් ජබර என்று அழைக்கப்படும் வெங்காயத்தாமரை நமது நாட்டுக்கு எந்தளவுக்குப் பிரயோசனம் என்று பார்க்கும்போது, அதனால் பாதிப்புத்தான் இருக்கின்றது.

இது ஒரு நீர் வாழ் தாவரமாகக் காணப்படுவதோடு, அந்தத் தாவரம் இருக்கின்ற நீரின் வெப்பநிலை மற்றும் அதன் pH பெறுமானத்தையும் ஒட்சிசனையும் குறைக்கின்றது. அவ்வாறு இருந்தாலும், இந்தத் தாவரங்களால் என்ன பிரயோசனம் என்று பார்த்தால், இது இலகுவாக உக்கக்கூடிய தன்மையுடையதாக இருப்பதால், எங்களுக்கு compost பசளை தயாரிக்கக்கூடியதாக இருக்கின்றது. இந்தத் தாவரத்தின்மூலம் இதுபோன்ற நலன் இருந்தாலும், பாதிப்புகள்தான் அதிகமாகக் காணப்படுகின்றன. இந்த வெங்காயத் தாமரை என்ற தாவரத்தின் ஊடாக நீர்வாழ் உயிரினங்கள் மிகவும் பாதிக்கப்படுகின்றன. அத்துடன், நீர் வழிப் பாதைகள் அல்லது நீர் வழிந்தோடக்கூடிய பாதைகளில் இந்தத் தாவரம் வளர்வதால், வெள்ளப்பெருக்கு ஏற்படுவதற்கும் இது காரணமாக இருக்கின்றது. அதுமட்டுமல்லாமல், குளங்களில் நேர்த்தியாக இந்தத் தாவரம் வளர்ந்திருப்பதால் எங்களுடைய நாட்டுக்கு வரக்கூடிய சுற்றுலாத்துறையினரையும் அது அதிகமாகக் கவர்கின்றது.

அது மட்டுமல்லாமல், கிராமப்புறங்களில் இருக்கின்ற மக்கள் அந்தக் குளங்களிலிருந்து நீரைப் பாவனைக்கு எடுக்கும்போது, நீரின் சுகாதாரத் தன்மை பாதிக்கப்பட்டு

සුකාතාරප් පිරච්සිනෙකලුම් ඒර්පටුකින්රන. ඉතනාල් අන්ත නීරෙප් පාවනෙක්කු එටුක්ක මුටියාතුළ්ළතෝටු, නීර්මින් උර්පත්තියුම් සෙය්ය මුටියාමල් ඉරුක්කිරතු. ඉන්ත මාතිරියාන පාතිප්පුකළෙ ඒර්පටුත්තුම් ඉත්තාවරත්තෙ අකර්රුවතර්කාක, මික නීණ්ටකාලමාක - 21 වරුටකාලමාක - අව්වප්පෝතු අරසාංකංකළ් අතිකමාන පණත්තෙච් සෙලවළිත්තු වරුකින්රන. නීරෝට්ටම් තටෙසෙය්යප්පට්ටු, වෙළ්ළප් පෙරුක්කු ඒර්පටුවතාල් ඉව්වාරාන තාවරංකළෙ මුරෙයාක අළිත්තොළික්ක වේණ්ටියතු කට්ටායමාකුම්. කුළංකළිලිරුන්තු වරුකින්ර නීර් තටෙප්පටුවතාල් විවසායමුම් පාතික්කප්පටු කින්රතු. අතු මාත්තිරමල්ලාමල්, එමතු නාට්ටිල් පල කුළංකළ් නන්නීර් මීන් වළර්ප්පුක්කාකප් පයන්පටුකින්රන. ආනාල්, පාසි පෝන්ර ඉන්ත වෙංකායත්තාමරෙ අවර්රිල් වළර්වතාල්, නන්නීර් මීන් වළර්ප්පෙ මුරෙයාකච් සෙය්ය මුටියාමල් ඉරුක්කින්රතු. නන්නීර් මීන් වළර්ප්පෙච් සිරන්ත මුරෙයිල් සෙය්තාල්, කිරාමංකළිල් වාළ්කින්ර මක්කළ් මීන්පිටිත් තොළිලිල් ඊටුපටුවතෝටු, අවර්කළුටෙය පොරුළාතාරත් තෙයුම් වාළ්වාතාරත්තෙයුම් අතිකරිත්තුක්කොළ්ළක්කූටියතාක ඉරුක්කුම්.

මේලුම්, අන්තප් පකුතිකළිල් වාළ්කින්ර මක්කළුක්කු සුකාතාරප් පාතිප්පුකළුම් ඒර්පටුකින්රන. ඉන්තත් තාවරම් වළරුම් නීර්නිලෙකළිල් නුළම්පුකළ් පෙරුකුකින්රන. ඉතනාල් යානෙක්කාල්, ටෙංකු පෝන්ර නෝය්කළ් ඒර්පටුකින්රන. අන්ත වකෙයිල්, ඉංකු කොණ්ටුවරප්පට්ටු ඉරුක්කින්ර ඉප්පිරේරණෙයානතු එමතු නාට්ටුක්කු මික මුක්කියත්තුවම් වාය්න්තතුම් පිරයෝසනමානතුම් ආකුම්. ඉතෙච් සුත්තප්පටුත්තුවතර්කාක කෝටික්කණක්කාන පණත්තෙ නාංකළ් සෙලවළිත්තු වරුකින්රෝම්. එනවේ, ඉතෙ මුරෙයාක අකර්රි, කුළංකළෙච් සුත්තප්පටුත්ත වේණ්ටුම්. ඉතනාල් කුළංකළුක්කු අරුකිල් වාළ්කින්ර මක්කළ් නන්නීර් මීන් වළර්ප්පෙ මේර්කොළ්වාර්කළ්. එමතු නාට්ටිල් කුරෙන්ත වරුමානම් පෙරුවෝරින් වරුමානත්තෙ අතිකරිත්තු, පොරුළාතාරත්තෙයුම් අතිකරිත්තුක්කොළ්ළවතර්කු ඉතු ඔරු සිරන්ත තිට්ටමාක ඉරුක්කින්රතු. අන්ත වකෙයිල්, ඉත්තකෙය පිරයෝසනමාන පිරේරණෙයෙක් කොණ්ටුවන්ත කෙළරව හිරුනි විජේසිංහ අවර්කළුක්කු මීණ්ටුම් නන්රි තෙරිවිත්තුක් කොළ්කින්රේන්. අත්තෝටු, එමතු අරසාංකම් ඉන්තප් පිරේරණෙයින් මුක්කියත්තුවත්තෙක් කරුත්තිර්කොණ්ටු, ඉතෙ නටෙමුරෙප්පටුත්ති එමතු නාට්ටින් පොරුළාතාර වළර්ච්චියෙ අතිකරික්කුමෙනක් කූරි විටෙපෙරුකින්රේන්. නන්රි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.58]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කාලීන වැදගත්කමකින් යුත් යෝජනාවක් තමයි ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරලා තියෙන්නේ. ජපන් ජබර - water hyacinth - ශාකයේ උද්භිද විද්‍යාත්මක නාමය *Eichhornia crassipes* වනවා. මෙම ශාකය ලෝකය තුළ වඩාත් ආක්‍රමණශීලී ජලජ ශාකයක් ලෙස සැලකුවත්, ආර්ථික වටිනාකමක් මෙන්ම කාබනික පොහොර - කොම්පෝස්ට් - නිෂ්පාදනය සඳහා ද ඉතාම හොඳ විභවයක් මේ තුළ පවතිනවා.

ජපන් ජබර ශාකය ශ්‍රී ලංකාව මෙන්ම ලෝකයේ වෙනත් රටවලට හඳුන්වා දෙනු ලැබුවේ එහි ඇති මනරම් දම් පැහැති මල් සහ අලංකාර පෙනුම නිසා අලංකාර උද්‍යානවල වගා කිරීම සඳහායි. ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේම විසිවන සියවස ආරම්භයේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී හොංකොං රාජ්‍යයෙන් තමයි ලංකාවේ උද්භිද උද්‍යානවල අලංකාරය සඳහා වගා කිරීමට මේ ශාකය ගෙනැල්ලා තිබෙන්නේ කියන එක සඳහන් වනවා.

මෙහි ආර්ථික වටිනාකම බැලුවාම, ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල ජපන් ජබර ජල මූලාශ්‍රවලට බාධාවක් වුවද, නිසි ලෙස කළමනාකරණය කළහොත් එය විවිධ ආර්ථික කටයුතු සඳහා යොදා ගැනීමට හැකි බව විද්වතුන් සඳහන් කරනවා. හස්ත කර්මාන්ත සහ අස්වැන්න අතින් බැලුවොත්, ජපන් ජබරවල ශක්තිමත් සහ නම්‍යශීලී කඳ කොටස් - මල්ටිපොඩ් - වියළා ගැනීමෙන් පසු බෑග්, පැදුරු, බාස්කට්, පුටු සහ විවිධ අලංකාර භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ විභවතාවක්, ඒ වාගේම කර්මාන්තයක් ලෙස ලෝකයේ බොහෝ රටවල විශේෂයෙන් ආසියාතික රටවල දැනටත් සිදු කරනවා.

ඒ වාගේම ජල පවිත්‍රකරණය අතින් බැලුවොත්, මෙම ශාකයට ජලයේ ඇති නයිට්‍රජන්, පොස්පරස් සහ කැඩ්මියම්, ඊයම් වැනි බැර ලෝහ වේගයෙන් අවශෝෂණය කර ගැනීමේ අපූරු හැකියාවක් තිබෙනවා. කාර්මික අපද්‍රව්‍ය හෝ අපජලය පවිත්‍ර කිරීමට අඩු වියදම් ක්‍රමයක් ලෙස එය ප්‍රයෝජනවත් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම සත්ව ආහාර විධියට ජපන් ජබරවල ප්‍රෝටීන් සහ පෝෂ්‍ය පදාර්ථ අඩංගු බැවින්, නිසි ලෙස සකස් කර - වියළා හෝ සිහින්ව කපා - ඌරන්, කුකුළන් සහ ගවයන් සඳහා සත්ව ආහාර නිෂ්පාදනයටත් මෙම ශාකය යොදා ගත හැකි බව විද්වතුන් සඳහන් කරනවා. කෙසේ වෙතත්, මෙහි ජල අංශු අධික බැවින් ඍජුවම ලබා දීම සුදුසු නොවේ කියලාත් විශ්වාස කරනවා.

ඒ වාගේම ජෛව ස්කන්ධ හා ජෛව ඉන්ධන සම්බන්ධව බැලුවොත්, මෙම ශාකය නිර්වායු වියෝජනයට ලක් කරමින් ජෛව වායු නිෂ්පාදනය සඳහා භාවිත කළ හැකි බව විද්වතුන් සොයාගෙන තිබෙනවා. ඒ වාගේම පරිසර ගැටලුවක් හැටියට දැක්කත්, මේ ශාකයේ තිබෙන අධික ප්‍රජනන වේගය, එනම් දින කිහිපයකින් දෙගුණවීමේ හැකියාව නිසා පාලනයකින් තොරව වැව්, ඇළ දොළ, ගංගා සහ ජලාශ ආවරණය කරමින් ඉක්මනින් පැතිර යෑම නිසා වැව් පද්ධතිවල ජල ප්‍රවාහයට, මත්ස්‍ය කර්මාන්තයට සහ වාරිමාර්ග පද්ධතිවලට බාධා ඇති කරන ප්‍රධාන පාරිසරික අභියෝගයක් බවටත් මෙම ශාකය පත් වෙලා තිබෙනවා. නමුත් කාබනික පොහොර - කොම්පෝස්ට් - සෑදීම සඳහා මෙම ශාකය භාවිත කළ හැකිය කියන එක හඳුනාගෙන තිබෙන අතර, පොහොර සෑදීම සඳහා මෙම ශාකය ඉතා සාර්ථක ලෙස භාවිත කළ හැකිය කියන එකත් අපි විශ්වාස කරනවා. මොකද, මෙහි පෝෂණ ගුණය ඉහළ මට්ටමක පවතින බැවින් එයින් ගුණාත්මක කාබනික පොහොරක් සකසා ගත හැකියි කියලා අපි විශ්වාස කරනවා. පෝෂණ සංයුතිය බැලුවාම, ජපන් ජබර ශාකයේ නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් - NPK - මෙන්ම කැල්සියම් සහ මැග්නීසියම් වැනි සූක්ෂ්ම පෝෂකත් බහුලව අඩංගු වනවා.

මෙම ශාකයේ ජලය ඉවත් කිරීම ගැන බැලුවොත්, ජපන් ජබරවල සියයට 90කට වඩා අඩංගු වන්නේ ජලයයි. එබැවින් මුලින්ම ඒවා ගොඩගසා අව්වේ හොඳින් වියළා ගත යුතුයි. ඒ වාගේම වියළා ගත් ශාක කොටස් වෙනත් කාබනික අපද්‍රව්‍ය වන ගවයන්ගේ අසුචි, පිදුරු, කොළ රොඩු සමඟ ස්තර වශයෙන් අතුරා කොම්පෝස්ට් ගොඩක් සකස් කර ගත හැක. ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිය දෙස බැලුවොත්, මෙහි කාබන්-නයිට්‍රජන් අනුපාතය සමතුලිත

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

කිරීමට ගොම හෝ කුකුළු පොහොර සමඟ මිශ්‍ර කිරීමෙන් ඉතා ඉක්මනින් ගුණාත්මක කොම්පෝස්ට් පොහොර ලබා ගත හැකි බවත් අපි විශ්වාස කරනවා.

එම නිසා මෙම ශාක මඟින් බැර ලෝහ අවශෝෂණය කර තිබිය හැකි බැවින්, කර්මාන්තශාලා ආශ්‍රිත අප ජල මූලාශ්‍රවලින් එකතු කරන ලද ජපන් ජබර ආහාර භෝග සඳහා යොදන පොහොර නිෂ්පාදනයට භාවිත කිරීමේ දී ඉතා ප්‍රවේශම් විය යුතුයි. ඒ නිසා පිරිසිදු වැව්වලින් එකතු කර ගන්නා ජපන් ජබර කෘෂිකාර්මික කටයුතු සඳහා ඉතාම යෝග්‍ය වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් මේ ආණ්ඩු දෙකම අතහැරලා දාපු හැම සම්පතක්ම ජනතාවාදී ජාතික ජන බලවේගය අණ්ඩුව විධියට අපි රටේ සංවර්ධනයට, ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් සංවර්ධනය කරන බව මේ මොහොතේ වගකීමකින් යුතුව මා ප්‍රකාශ කරනවා.

ස්තූතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට පිළිතුරු කථාව, ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.04]

ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමියක් වන ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය විසින් ජපන් ජබර ශාකය මර්දනය කිරීම සම්බන්ධයෙන් ඉතාම කාලෝචිත යෝජනාවක් අද දිනයේ ගෙනාවා. ඒ යෝජනාවට පක්ෂ, විපක්ෂ අප සියලුදෙනාම එකඟ වනවා. මොකද, එහි ප්‍රතිවිපාක ඉතාම වැඩියි. ඉතින් මම හිතනවා, මේ ජපන් ජබර ශාකය මර්දනය කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් යම් දත්ත ප්‍රමාණයක්, ලක්ෂණ කිහිපයක් අපි අධ්‍යයනය කරන්න ඕනෑය කියලා. ඒ නිසා ඒ ගැන තිබෙන කරුණු කිහිපයක් මම ඉදිරිපත් කරන්න කැමැතියි.

මට පෙර කථා කරපු සියලුම මන්ත්‍රීතුමියලා සහ මන්ත්‍රීතුමන්ලා කිව්වා, විසිතුරු පැළෑටියක් හැටියට ජපන් ජබර ශාකය මේ රටට ආනයනය කරන බව. දෙවන ලෝක යුද්ධය කාලයේදී මේ ශාකය ගුවන් යානා ගිල්ලවීම සඳහා තණපිටි හැටියට පෙන්වීමටත් භාවිත කර තිබෙනවා. සාමාන්‍යයෙන් මර්දනයටත් වඩා ඒගොල්ලන් purposely, එහෙම නැත්නම් වැඩි අවධානයක් යොමු කරලා ඒක වර්ධනය කළා කියලාත් වාර්තා වනවා.

මේ ශාකයේ ජන්ම භූමිය දකුණු ඇමෙරිකාවයි. දකුණු ඇමෙරිකාවේ ඉඳලා තමයි මේ ශාකය ලෝකය පුරාම ව්‍යාප්ත වන්නේ. හැබැයි, දකුණු ඇමෙරිකාව මෙය තර්ජනාත්මක ශාකයක් හැටියට හඳුනා ගන්නේ නැහැ. දළ වශයෙන් ගත්තොත්, සති දෙක තුනක් අතර කාලයකදී මෙහි වර්ධනය දෙගුණයක් බවට පත් වනවා - ප්‍රමාණය දෙගුණ වෙනවා. ඒ කියන්නේ, මෙය ඉතාම ශීඝ්‍රයෙන් වර්ධනය වන ජලජ ශාකයක්. එය වසරකට බීජ දහස් ගණනක් නිපදවනවා. මෙන්න මේ කරුණුත් එක්ක ගත්තොත්, පරීක්ෂණයකින් ඔප්පු කර තිබෙනවා, ආරම්භක අවස්ථාවේදී සැල්වීනියා මත තමයි මේ ශාකය වර්ධනය වීම ආරම්භ කරන්නේ; ඊට පස්සේ මූල පද්ධතිය ආශ්‍රිතව සුළං කෝෂ - vacuums - ප්‍රමාණයක් නිර්මාණය කිරීම නිසා මේ ශාකය ජලය මත පාවෙනවා කියන එක.

මේ ශාකය අපේ රටේ තර්ජනාත්මක ශාකයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේ ජපන් ජබර ශාකය ශීඝ්‍රතම වර්ධනයක් පෙන්වන්නේ, සෙන්ටිග්‍රේඩ් අංශක 25-30 අතර උෂ්ණත්වයක් තිබෙනවා නම් පමණයි. ඒ වාගේම ජලයේ ආම්ලිකතාව - pH එක - 5 සිට 7.5 වාගේ වනකොට මේ ශාකය හොඳ වර්ධනයක් පෙන්වනවා. මෙන්න මේක තමයි හිතකරම තත්ත්වය. ඒ හිතකර තත්ත්වය අපේ රටේ බොහෝ ජලාශවල තිබෙනවා. ඒ තත්ත්වය අපේ රටේ ජලාශවල තිබීම නිසා ඉතාම ශීඝ්‍රයෙන් අපේ රට තුළ ජපන් ජබර ශාකය ව්‍යාප්ත වනවා. හිතකර තත්ත්වයක් යටතේ සාමාන්‍යයෙන් ජපන් ජබර ශාකයේ පත්‍රයක දණ්ඩේ දිග අඩි 3ක් විතර වෙන්නත් පුළුවන්. ඊට ආසන්න ඒවා අපේ රටෙන් වාර්තා වනවා. පත්‍රයේ උපරිම දිග සෙන්ටිමීටර 20ක් විතර වනවා.

මෙහි තිබෙන අවාසිය මොකක්ද? ජපන් ජබර ශාකය නිසා අපේ පරිසර පද්ධතියට සිදුවෙලා තිබෙන අවාසිය මොකක්ද? අපේ රටේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා වාෂ්පීකරණය දෙගුණයක් වෙලා තිබෙනවා. මීට අවුරුදු 30කට විතර කලින් නම් අපේ රටේ වාෂ්පීකරණය සාමාන්‍යයෙන් මිලිමීටර් 3, 3.5 වාගේ මට්ටමක තිබුණා. හැබැයි, දැන් ඒක මිලිමීටර් 7 දක්වා වර්ධනය වෙලා තිබෙනවා, පෘථිවි ගෝලයේ උෂ්ණත්වය ඉහළ යෑම නිසා. මේ ජපන් ජබර ශාකය ජලාශ මතු පිට තිබීම නිසා ඒක තව ගුණයක් වැඩි වනවා. ඒ තුළින් විශාල වාෂ්පීකරණයක් සිද්ධ වනවා. එතකොට දිනකට මිලිමීටර් 10කට වඩා වැඩි ජල ප්‍රමාණයක් වාෂ්ප වනවා. අනෙක් පැත්තෙන් ගත්තොත්, ජපන් ජබර ශාකය විසින් ජලාශය වසාගෙන සිටීම නිසා හිරු එළිය ඒ ජලාශය ඇතුළට පතිත වන්නේ නැහැ. එතකොට ඒවායේ තිබෙන කුඩා ජලජමය ශාක මඟින් ප්‍රභාසංස්ලේෂණයක් සිදු නොවන නිසා ජලයට ලැබෙන ඔක්සිජන් ප්‍රමාණය අඩු වනවා. මේ නිසා ජලය තුළ සිටින සියලුම ජීවීන් විනාශ වෙලා යන තර්ජනයකට ලක් වනවා.

අපේ රට biodiversity එක පැත්තෙන් ඉතාම හොඳ රටක් බව අපි දන්නවා. විශේෂයෙන් ජලජමය ශාකවල හොඳ ජෛව විවිධත්වයක් - biodiversity එකක් - තිබෙනවා. මෙන්න මේ ජලජමය ශාක සම්පූර්ණයෙන්ම ආක්‍රමණය කරලා වඳ වෙලා ගිහිල්ලා තිබෙනවා. අපේ රටේ තිබුණු ජලජමය ශාක මොනවාද, වඳ වෙලා ගිය ඒවා මොනවාද කියලා අපට ගණනය කරගන්න බැරි තරමටම ජපන් ජබර ශාකය ව්‍යාප්ත වෙලා තිබෙනවා. කලින් කිව්වා වාගේ මදුරුවන් බෝවීම වැනි ප්‍රශ්න තිබෙනවා. අගල් සහ කාණු block වීම නිසා ගංවතුර තත්ත්වයක් - flooding - එන්න පුළුවන්.

ජපන් ජබර ශාකයේ බෝවීම ගත්තොත්, පඳුරුවල ඇට සහ නැවත පැළ උත්පාදනයෙන් ඒවා බෝ වෙනවා. සාමාන්‍යයෙන් ගංගා ද්‍රෝණිවල ඉහළ ජලාශවල තිබෙන ජපන් ජබර ශාක ජලයත් සමඟ පහළට ගමන් කරලා විශාල ප්‍රමාණයෙන් ව්‍යාප්ත වෙනවා. ඒ වාගේම පායන කාලයට සතුන්ගේ කුර මඟින් මේ ශාකයේ බෝවීම සිද්ධ වෙනවා.

අපට මේ ශාකයෙන් වාසි ලබා ගන්නත් පුළුවන්. ජලය පිරිසිදු කිරීම සඳහා අපට මේ ශාකය යොදා ගන්න පුළුවන්. මොකද, ශීඝ්‍ර වර්ධනයක් තිබෙන නිසා ඉතා දරුණු විෂකාරක, cadmium, lead වාගේ බැර ලෝහ ඉක්මනටම උරා ගන්න පුළුවන්, මේ ශාක control කිරීම තුළින්. ඒ කියන්නේ ජලාශ, ඇළ, දොළවල control කරලා මේවා වගා කිරීම තුළින් ඒවායේ ජලය යම් පමණකට පිරිසිදු කරගැනීමේ හැකියාවක් තිබෙනවා. කලින් මතු කළා වාගේ මේ ශාකය biogas නිර්මාණය කරන්න ඉතාම යෝග්‍යයි. ඉන්දියාව මේක හොඳ තත්ත්වයකට ගෙනැල්ලා තිබෙනවා. පරීක්ෂණ මඟින් හොයා ගෙන තිබෙනවා, ජපන් ජබර හෙක්ටෙයාරයකින් biogas ඝන මීටර් 70,000ක් ලබා ගන්න පුළුවන් කියලා. මේ නිපදවන biogasවලින් සියයට 70ක් මීතේන්, සියයට 30ක් විතර කාබන්ඩයොක්සයිඩ් හැටියට තිබෙන බව තමයි වාර්තා වෙන්නේ.

ඒ වාගේම සත්ව ආහාර නිපදවීමටත් මේ ශාකය යොදා ගන්නවා. විශේෂයෙන් silage නිපදවීමත් සිද්ධ කරනවා, කේරළය, බෙංගාලය වාගේ ප්‍රාන්තවල. ඒක සත්ව ආහාර හැටියට පාවිච්චි කරන්න පුළුවන්. ජපන් ජබර ශාකය තවත් ද්‍රව්‍ය සමඟ mixed කිරීමෙන් silage හදා ගන්න පුළුවන්. ඒ වාගේම කාබනික පොහොර නිපදවන්න යොදා ගන්නත් පුළුවන්. ඒ වාගේම තමයි, පරිසර හිතකාමී විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය. විශේෂයෙන්ම තොප්පි, බෑග්, පෙට්ටි වාගේ දේවල් මේ ශාකය යොදා ගෙන හදන්නත් පුළුවන්. අපේ රටේ දකුණු පළාතේ විශේෂයෙන්ම බලපිටිය වාගේ ප්‍රදේශවල කුඩා කර්මාන්ත හැටියට මේ වෙනකොට විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය ක්‍රියාත්මක වෙනවා. ජපන් ජබර ශාකයේ දඬු අරගෙන process කරලා, ඒ නිෂ්පාදන කරගෙන යන ආකාරය අපට දකින්න පුළුවන්.

ජපන් ජබර කෙඳි කඩදාසි වැනි විවිධ කර්මාන්ත සඳහා භාවිත කරන්නත් පුළුවන්. එමෙන්ම සමහර රටවල් carotene-rich food එකක් හැටියට ඒවා පාවිච්චි කරන්න අත්හදා බැලීම් සිදු කරගෙන යනවා. ඒ වාගේම දිරා යන biodegradable plastic වර්ග හදන්නත් පුළුවන්. මේ වනකොට කෙන්යාව එමඟින් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන තිබෙනවා.

අපේ ගරු හිරුනි මන්ත්‍රීතුමිය යෝජනා කරපු පරිදි අපි මේ ශාකය control කරන්නේ කොහොමද? අපට තුන් ආකාරයකින් මේක control කරගන්න පුළුවන්. එකක් තමයි, chemical control. ජලය සමඟ තිබෙන නිසා සාමාන්‍ය වල්නාශකවලින් අපට ඒක කරන්න බැහැ. විශේෂයෙන් බ්‍රෝමියම්වල තිබෙන ඔක්සයිඩ්වලින් මේක control කරගන්න පුළුවන් කියලා පර්යේෂණ මඟින් සොයාගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, biological control. ඒක Neochetina කියන කෘමීන් පාවිච්චි කරලා කරන්න පුළුවන්. හැබැයි, මේක විශාල පරිමාණයෙන් කරන්න බැහැ. කුඩා පරිමාණයකට මේක යෝග්‍යයි කියලා පසුව සොයා ගෙන තිබෙනවා. මේකට සුදුසුම ක්‍රමය mechanical control. අපට තිබෙන්නේ ජලය මත පාවෙන ටික එකතු කරලා ඉවත් කිරීමයි.

වැව් හිඳිලා ගියාට පසුව ඉහළ තිබෙන වැව්වල සිට පහළ වැව්වලට ගසාගෙන එන මේ ශාක සම්පූර්ණයෙන් ඉවත් කර ගත්තොත්, අපට මේක හොඳ විධියකට කළමනාකරණය කරගන්න පුළුවන්. මේ ශාක අයින් කර ගැනීම ලෙහෙසි කටයුත්තක්. මම යෝජනා කළ පරිදි කර්මාන්ත සඳහා යොදා ගැනීමෙන් සහ මේ ශාකයේ තිබෙන වාසි උපයෝගී කරගෙන ජපන් ජබර ශාකය මර්දනය කිරීමට හැකියාවක් තිබෙනවා. මම හිතන විධියට, මේ සඳහා අපට පර්යේෂණ විශාල ප්‍රමාණයක අවශ්‍යතාවක් තිබෙනවා. අපි තවදුරටත් මේ සම්බන්ධව පරීක්ෂා කරන්න ඕනෑ. මොකද, එම පරීක්ෂණවල අවශ්‍යතාවක් තිබෙනවා.

ඒ වාගේම තමයි මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට නම් විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය ආදී වශයෙන් අමාත්‍යාංශ ගණනාවක් එකතු වී ඒකාබද්ධ වැඩ පිළිවෙළක්; නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බවට අප යෝජනා කරනවා. එහෙම වුණොත් අපිට මේක සිදු කරන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපි ඉස්සරහට වැඩ කරමු. අපේ ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව ඉතා කාලෝචිත එකක්. එය ඉතා වටිනවා. එම යෝජනාව ඉතාම යෝග්‍ය බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.15]

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ මා විසින් ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ගීතා භේරත් මන්ත්‍රීතුමිය, ගරු මුහම්මදු ෆයිසාල් මන්ත්‍රීතුමා, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා, ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලු දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා. නමුත් කනගාටුවට කාරණාවකුත් තිබෙනවා. මොකද, අවුරුදු ගණනක් තිස්සේ මේ රටට ප්‍රශ්නයක් වෙලා තිබෙන, අපේ රටේ පරිසර පද්ධතියට ප්‍රශ්නයක් වෙලා තිබෙන දෙයක් ගැන කථා කරන්නයි ආණ්ඩු පක්ෂය පැත්තෙන් අද මෙම යෝජනාව ගෙනාවේ. නමුත් ඒ ගැන කථා කරන්න අද මේ ගරු සභාව තුළ සිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හතරදෙනෙක් සහ පරිසර නියෝජ්‍ය ඇමතිතුමා පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසය තුළ මේ ආක්‍රමණශීලී ශාකය මර්දනය කිරීමට වාරිමාර්ග, පරිසර, කෘෂිකර්ම ආදී අමාත්‍යාංශ භාරව සිටි ඇමතිවරුන් කටයුතු කර තිබෙන්නේ කොහොමද කියා මට බලන්න හිතුණා. මොකද, විශේෂයෙන්ම අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල ආදී විවිධ ප්‍රදේශ නියෝජනය කළ මන්ත්‍රීවරුන් හරහා මේ පිළිබඳව පාර්ලිමේන්තුවට ප්‍රශ්න, යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ අනුව 2010 වර්ෂයේදී අනුර ප්‍රියදර්ශන යාපා හිටපු අමාත්‍යතුමා පිළිතුරු ලබා දී තිබෙනවා, ආගන්තුක ආක්‍රමණශීලී ශාක පැතිරීම පාලනය කිරීම සඳහා ඒගොල්ලන්ට පස්අවුරුදු විදේශ ප්‍රදානයක් හම්බ වෙලා තිබෙනවා කියා, ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකක. ඒ අනුව කටයුතු සූදානම් කර 2011 වර්ෂයේ සිට මෙම ශාකය මර්දනය කිරීමට ක්‍රියාමාර්ග ගන්නවා කියලා එතුමා ඒ දවස්වල පාර්ලිමේන්තුවේදී උත්තර දීලා තිබෙනවා. ඉන්පසුව 2021 වර්ෂයේදී සිරිපාල ගමලත් රාජ්‍ය අමාත්‍යවරයා මේ ආශ්‍රිතව නැඟුණු ප්‍රශ්නයකට පිළිතුරක් ලබා දීලා තිබෙනවා, කාබනික

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

පොහොර නිෂ්පාදනය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධ වී වැඩසටහනක් සිදු කිරීමට සාකච්ඡා කරගෙන යන බවට. ඊට අමතරව 2023 වර්ෂයේදී රොෂාන් රණසිංහ නිටපු අමාත්‍යතුමා "වාරි සෞභාග්‍යා" ව්‍යාපෘතිය යටතේ වැව් ශුද්ධ පවිත්‍ර කිරීමට සහ ආක්‍රමණශීලී මෙම ශාකය කෘමීන් භාවිත කර විනාශ කිරීමට කටයුතු කරන බවට යෝජනා කර තිබෙනවා. මම මේ ඉදිරිපත් කළේ, 2010, 2021, 2023 ආදී වසරවල මේ වාගේ ගැටලු මතු වුණාම ඉදිරිපත් කර තිබෙන අදහස්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය වසර 121ක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. මේ ශාකයෙන් ගන්න පුළුවන් ප්‍රයෝජන පිළිබඳව විශේෂයෙන්ම නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා සහ අපේ පරිසර නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා. ඇත්තටම මෙම ශාකය වටා බැඳුණු වෙනත් කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. අපේ රටේ සංස්කෘතිය වැව සමඟ බද්ධ වෙලා තිබෙන්නේ. අපි ගමකට ගියත්, අපේ දිස්ත්‍රික්කයට ගියත් අපේ ගම්වල ඉන්න මිනිස්සු කියන්නේ අපේ වැව ශුද්ධ කරන්න, වැව ජපන් ජබරවලින් පිරිලා තිබෙනවා කියායි. මොකද, ගමට බැඳුණු ගමේ සංස්කෘතිය පෙන්නුම් කරන්නේ, ගම සංකේතවත් කරන්නේ අලංකාරව නිලට නිලේ දිලෙන වැවයි. ඒ නින්දා ගම්වල මිනිස්සුන්ට ආක්‍රමණශීලී ශාකවලින් වැසී තිබෙන වැව් දිහා බලා සිටියදී දුකයි.

වසර ගණනාවක් තිස්සේ මේකට පිළියම් හොයනවා. මම බලාපොරොත්තු වෙනවා, මා විසින් ඉදිරිපත් කළ යෝජනාව වාගේම පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන යෝජනාත් සමගාමීව ගනිමින් නව රජය යටතේ වැඩ පිළිවෙළක් සකස් කර මෙම ශාකය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා කටයුතු කරයි කියා. ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි, එයින් ගත හැකි උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහාත් කටයුතු කළ යුතු බව. අපේ අසල්වැසි ඉන්දියාව ඉතා සාර්ථක විධියට biogas නිෂ්පාදනය කිරීම සඳහා මෙම ශාකය භාවිත කරනවා. ඒ වාගේම මම කලින් කිව්වා වාගේ වියටිනාමය, පිලිපිනය වාගේ රටවල ග්‍රාමීය කාන්තාවන්ගේ අතමිට සරු කර ගැනීමේ ව්‍යාපාර සඳහාත් මෙම ශාකය භාවිත කරනවා. ඒ අනුව ප්ලාස්ටික් බෑග්වලට ආදේශකයක් හැටියට මෙම ශාකය භාවිත කර බෑග් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම විසිතුරු භාණ්ඩත් නිෂ්පාදනය කරනවා. එසේ ජපන් ජබර ආශ්‍රිතව සිදු කරන නිෂ්පාදන ලෝකයට ඉදිරිපත් කිරීම හරහා ඔවුන් සංචාරක ආකර්ෂණයත් දිනා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය තුළ ඉතා ඉහළ වටිනාකමක් ඒ නිෂ්පාදන සඳහා ලැබෙනවා.

ඉතින්, අද දවසේ මා විසින් ඉදිරිපත් කළ මෙම යෝජනාවට සාධනීය ක්‍රියාමාර්ගයක් අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ගනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. එහි යම් කිසි නියමු ව්‍යාපෘතියක් වන්නේ නම්, එය පුත්තලම දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීමට මාගේ උපරිම දායකත්වය ලබා දෙන බව මම මේ අවස්ථාවේ ගරු අමාත්‍යතුමාට දන්වා සිටිනවා.

ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
ඛිනා ඛිඩුක්කප්පට්ටු ඵற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු දයාසිරි ජයසේකර මහතා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් ලැබෙනවා.

කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් කඩිනම් කිරීම
கொழும்புத் துறைமுகத்தின் கிழக்கு கொள்கலன் முனையத்தின் நிர்மாணப் பணிகளை துரிதப்படுத்தல்
ACCELERATION OF CONSTRUCTION OF EAST CONTAINER TERMINAL AT COLOMBO PORT

[අ.භා. 4.20]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය ඉදිකිරීමේ කටයුතු අවසන් වන දිනයක් නොපෙනෙන මට්ටමකට පත්ව ඇත. දකුණු ආසියාවේ උපායමාර්ගික යටිතල පහසුකම් සහිත මෙවන් ස්ථානයක් සොයා ගැනීම අතිශය දුර්ලභ බව නොරහසකි. ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා ගැනීමට ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත් කරගත හැකි බවට පැහැදිලි සාක්ෂි සහිත මෙම පර්යන්තය දශකයකට වැඩි කාලයක සිට අවසන් නොවන, සංවර්ධන කටයුතු සිදුවන ස්ථානයක් බවට පත්ව ඇත. විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර ඇති මෙම ව්‍යාපෘතියේ වැඩ කඩිනමින් අවසන් කර රටේ ආර්ථිකයට පැහැදිලි දායකත්වයක් ලබා ගැනීම ඉතාම වැදගත් ය.
>
> ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන ලෙසට මෙමඟ ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013දී තමයි මේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වුණේ. 2013දී ආරම්භ වෙලා එහි පළමුවැනි අදියර 2015, 2016 වෙනකොට අවසන් කෙරුණා. එහි මූලික වියදම විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 755ක විතර ඇස්තමේන්තුවක් තිබුණා. ඊට පස්සේ 2022 ජනවාරි 12වැනි දා එහි දෙවැනි අදියරේ වැඩ පටන් ගත්තා. ඒක

පටන් ගන්නකොට එහි තිබිය යුතු තත්ත්වයට එහා ගිහිල්ලා අර්බුද විශාල ගණනක් මතු වෙලා තිබුණා. එහි ඉදිකිරීම් කටයුතු මේ වෙනකොට අවුරුදු ගණනාවක් ඇදි ඇදී ගිහිල්ලා තිබෙනවා.

එහි තිබූ ප්‍රධානම අර්බුදයත් එක්ක ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව 2022දී - එතකොට අපිත් ආණ්ඩුවේ හිටියේ - ඒක පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට, නැත්නම් පෞද්ගලික අංශයට බාර දෙන්න කටයුතු කරනකොට, ආණ්ඩුවේ හිටපු ඇමතිවරු විධියට අපි ඒකට විරුද්ධව විශාල ප්‍රශ්න ගණනාවක් මතු කළා. අපේ වෘත්තීය සමිති, විශේෂයෙන්ම මේ රටට ආදරය කරන මිනිස්සු විධියට විමල් වීරවංශ මැතිතුමා, උදය ගම්මන්පිල මැතිතුමා, ගෙවිඳු කුමාරතුංග මැතිතුමා - මම මේ වෙලාවේ ඒ අයව මතක් කරනවා - ඇතුළු අපි විශාල පිරිසක් එම බහලුම් පර්යන්තය පෞද්ගලීකරණය කිරීමට විරුද්ධවයි කථා කළේ. මොකද, එම පර්යන්තය අතහැර දාලා කෙළින්ම ඉන්දියාවට බාර දෙන්නයි ඒගොල්ලන්ගේ plan එක තිබුණේ. නමුත්, අපි ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ඒ විරුද්ධ වීමේ ප්‍රතිඵලයක් විධියට ඒ ජනාධිපතිවරයා අපිත් එක්ක විශාල රණ්ඩුවක් ඇති කර ගත්තා. ඊට පස්සේ අපි ආණ්ඩුවෙන් එළියට එන්න ඒකත් එක හේතුවක් වෙන්න ඇති.

අපි ඒ ක්‍රියාදාමය කළේ වෙන හේතුවක් නිසා නොවෙයි, ඒක අතිවිශාල වැදගත්කමක් සහ වටිනාකමක් තිබෙන වරායක් නිසායි. මොකද, 2029 වෙනකොට SAGT ජැටිය නැවත ලංකාවට හිමි වන බව අපි දන්නවා. දැනට ඒක පෞද්ගලික අංශයටයි දීලා තිබෙන්නේ. එම බහලුම් පර්යන්තය වැදගත් වෙන්නේ ඇයි කියා මා කියන්නම්. ආසියාව ගත්තොත්, සිංගප්පූරුවට පස්සේ box model එකට තිබෙන එකම වරාය ලංකාවේ මේ වරාය බවට පත් වෙනවා, මේ නැහෙනහිර ජැටියත් එක්ක. ඒ නිසාම තමයි අපි කිව්වේ, ඒක විකුණන්න එපා, 2029 වෙනකොට මේ SAGT ජැටිය අපට අයිති වෙනවා කියලා. එක පැත්තකින් feeders තිබෙන්නේ SAGT ජැටියේ. අනෙක් පැත්තෙන් ගත්තාම mainline එක තිබෙන්නේ ECT එකේ. ඒ දෙක එකතු කළාට පස්සේ ඒකෙන් අතිවිශාල වටිනාකමක් ලැබෙනවා කියලා අපි කිව්වා.

ඒ වාගේම, එහි ඉදිකිරීම් කටයුතු දිගින් දිගටම ප්‍රමාද වන ආකාරය අපි දැක්කා. මේ ආණ්ඩුව යටතේත් ඒක ඒ විධියටම වෙනවා. මේ කාරණය එසේ තිබියදී මම ගිය සතියේ දැක්කා, අපේ ජනාධිපතිතුමා කළ ප්‍රකාශයක්. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ගණනාවක් ඒ කාලයේ මේකට විශාල සහයෝගයක් දුන්නා. අද වෙනකොට ඒ අය ඇමතිවරු. උදාහරණයක් විධියට අනුර දිසානායක මැතිතුමාගේ ඉඳලා සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, ඊළඟට ලාල් කාන්ත මැතිතුමා, වසන්ත සමරසිංහ මැතිතුමා, මහින්ද ජයසිංහ මැතිතුමා, චන්දන සූරියආරච්චි මැතිතුමා - ඔහු ඒ වෙලාවේ මන්ත්‍රීවරයෙක් නොවෙයි - ඒ වාගේම, රන්ජන් ජයලාල් මැතිතුමා යන අය මේකට විශාල සහයෝගයක් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ සියල්ල ක්‍රියාත්මක වෙමින් තිබෙනකොට ජනාධිපතිතුමා ගිය සතියේ කියනවා, එහි පරිපාලනය පෞද්ගලික කොම්පැනියකට භාර දෙනවා කියලා.

ඩොලර් මිලියන ගණනක් යොදවලා මේක හදලා ඔක්කෝම කරලා ඉවර වෙලා, එහෙම පරිපාලනය භාර දෙන්න බැහැ. මොකද, සාමාන්‍යයෙන් වර්ෂයකට ඩොලර් මිලියන 280කට වැඩි ආදායමක් ගන්න පුළුවන්. අපට ඉන්න රත්තරන් කිකිළියක් මේගොල්ලන් මේ විකුණන්න හදන්නේ. මේගොල්ලන් කථා කෙරුවේ මේවා නොවෙයි. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. මේක ලංකාව තුළදීම CICT කියන පෞද්ගලික කොම්පැනියට සියයට 85ක් යනකොට සියයට 15ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබෙනවා. ඒ වාගේම CWIT එක ගත්තොත්, අදානි සමාගමට සියයට 51යි, ජෝන් කීල්ස් සමාගමට සියයට 34යි, Sri Lanka Ports Authority එකට සියයට 15යි. හම්බන්තොට වරාය ගත්තොත්, පෞද්ගලික අංශයට සියයට 85යි, ශ්‍රී ලංකා වරාය අධිකාරියට සියයට 15යි. මේ විධියට තමයි යන්නේ. එතකොට කවුද, මේ අපි හදපු එක භාරගෙන ක්‍රියා කරන්නේ? අද වන විට මේ සඳහා අවශ්‍ය කරන ඕනෑ තරම් සේවකයින් අපට ඉන්නවා. වර්තමානයේ ඉංජිනේරුවන් විශාල සංඛ්‍යාවක් ලංකාවෙන් යන්නේ නැතිව ඉන්නවා, මේකේ වැඩ කරන්න ඕනෑ නිසා. හැබැයි මෙහෙම තිබියදී මේ ආණ්ඩුව දැන් මොකක්ද කරන්න හදන්නේ? නැහෙනහිර ජැටියේ පරිපාලනය කෙළින්ම පෞද්ගලික අංශයට භාරදෙන්න හදන්නේ. එහෙම පරිපාලනය භාරදෙන්න බැහැ. ඒ කරන්න හදන්නේ, කෙළින්ම මේක පාවිච්චි කරන්න ඉඩ දෙන එකයි.

දැනට මේකේ ලක්ෂ 10ක - එතුමාට වැරදිලා ගණන් කියැවුණේ - බහලුම් මෙහෙයුම් ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේක ලක්ෂ 35 දක්වා වැඩි කරගන්න පුළුවන්, මේ දෙකම එකට එකතු කරලා ඉස්සරහට ගෙන ගියාට පස්සේ. මේක රටට අතිවිශාල ආදායමක් ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක්. අද ඒක පෞද්ගලික අංශයට භාරදෙන්න හදනවා. මම දන්නේ නැහැ ඇයි කියලා. මෙතුමන්ලා ඒ කාලයේ මේවාට මරාගෙන මැරුණු අය. ජීවිතය තිබෙනකල් මේක අතාරින්න එපා කියලා මෙතැන ඇවිල්ලා කථා කරනවා අපට මතකයි. ඉතින්, එවැනි තත්ත්වයක් තිබුණේ. මම හිතන විධියට, අද ඒක අහෝසි කරලා තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අද වරාය විෂයය භාර ඇමතිතුමා මෙතැන සිටියා නම් හොඳයි. නියෝජ්‍ය ඇමතිතුමා තමයි අද උත්තර දෙන්නේ. මේ ගැන හරියට මේ රටට ප්‍රකාශයක් කරන්න. මේ නැහෙනහිර ජැටිය තමුන්නාන්සේලා පෞද්ගලික අංශයට දෙනවාද? දෙනවා නම්, ඒ කොහොමද? කොහොමද කටයුතු කරන්න හදන්නේ කියන එක කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වෙලාවේ මම තව කාරණයක් කියන්න කැමැතියි. ඒ, පොලිස්පතිතුමා විසින් එක් පළාතකට පමණක් අදාළ වන පරිදි ගහපු ගැසට් එකක් සම්බන්ධයි. ගම්පහ මහෙස්ත්‍රාත්තුමා දීපු තීන්දුවක් තිබුණා, ඒක ලංකාවටම අදාළ වන පරිදි ගෙනෙන්න කියලා. නමුත් එලෙස කටයුතු නොකරන්නේ මන්ද, එය උසාවියට අපහාස කිරීමක් කියලා, එසේ අපහාස කිරීම සම්බන්ධව පොලිස්පතිතුමාට විරුද්ධව කටයුතු කරන්න කියලා අභියාචනාධිකරණය - Appeal Court එකට - වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව අදහස් දක්වන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කියන්නම්. මම යෝජනා කරන්නේ ඒක තමයි. එතකොට ඒ තීන්දුව ලබා දුන්නු මහෙස්ත්‍රාත්තුමාව මේ වෙනකොට මාරු කරලා තිබෙනවා, අධිකරණ සේවා කොමිෂන් සභාව. මේකද, මේ රටේ නීතිය? මේ රටේ මිනිස්සු අරගෙන ගිහිල්ලා අතුරුදහන් කරනකොට, පහර දෙනකොට ඒවාට විරුද්ධව කටයුතු කළ මහෙස්ත්‍රාත්තුමාට අද එතුමාගේ සේවා ස්ථානය අතහැරලා එතැනින් යන්න සිදු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධවත් මතක් කරමින්, විශේෂයෙන් කොළඹ වරායේ නැහෙනහිර ජැටිය පිළිබඳව නැවතත් ආණ්ඩුවේ මතය විමසමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් ගෙනාපු, කොළඹ වරායේ නැහෙනහිර ජැටිය පිළිබඳ යෝජනාව මම ස්ථිර කරනවා. මේ නැහෙනහිර ජැටිය සම්බන්ධව වැඩියෙන්ම කටයුතු කරන කොට අපි හිටියේ ආණ්ඩුවේ. අපි දෙගොල්ලන් දෙකට බෙදුණා. වීරවංශලා, ගම්මන්පිලලා දෙකට බෙදිලා තමයි නැහෙනහිර ජැටිය පෞද්ගලීකරණයට විරුද්ධ වුණේ. ඒකට විරුද්ධව වැඩියෙන්ම වැඩ කළේ ජනතා විමුක්ති පෙරමුණේ trade union එක. ලංකාවේ තිබුණු හැම trade union එකක්ම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පොහොට්ටුව, UNP එක කියන ඔක්කොම එදා එක පැත්තක් ගත්තා. ඒ නිසා තමයි ගෝඨාභය රාජපක්ෂට එදා නැහෙනහිර ජැටිය පෞද්ගලීකරණය කරන්න බැරි වුණේ. එදා ගෝඨාභය ජනාධිපති වුණත්, ඔහුට තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් තිබුණත් trade unionsවල ඉල්ලීමට නැහෙනහිර ජැටිය පෞද්ගලීකරණය කරන එක නවත්වන්න සිද්ධ වුණා. එහිදී තමයි ආණ්ඩුව කඩා වැටෙන්න පටන්ගත්තේ. ගෝඨාභයගේ ආණ්ඩුව කඩා වැටෙන්න පටන්ගත්තේ නැහෙනහිර ජැටියෙන් තමයි. එක ජැටියක් අදානි සමාගමට දුන්නා. නැහෙනහිර ජැටිය දෙනකොට, දෙන්න එපා කියන එක අපේ වෘත්තීය සමිති තමයි කිව්වේ. ඒ ගැන මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ එක්කම මම මේ කාරණයත් කියන්න ඕනෑ. අද වෙනකොට මාව රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා මාසයක් වනවා. අද මම උසාවියට ගිය වෙලාවෙත් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමා මාව නැවත රිමාන්ඩ් කරන්න නියෝග කළා, අහහරුවාදා වෙනකල්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. අපි අධිකරණයට හිස නමන්න ඕනෑ, අධිකරණ තීන්දු පිළිගන්න ඕනෑ. ඒක අපි පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට සති දෙකකට කලින් ගම්පහ මහෙස්ත්‍රාත්තුමා නිවැරදි තීන්දුවක් ගත්තේ. ඒක නිවැරදි තීන්දුවක් කියන්නේ ඇයි? ගැසට් එකක් ගහන කොට බස්නාහිර පළාතට විතරක් ගහන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගැසට් එක ගහන්න ඕනෑ, ලංකාවටම අදාළවයි. නමුත්, පොලිස්පතිවරයා වැරදි ගැසට් එකක් ගහපු නිසා තමයි ගම්පහ මහෙස්ත්‍රාත්වරයා කිව්වේ, මේ ගැසට් එක වැරදියි, සමස්ත ලංකාවටම අදාළව ගහන්න ඕනෑ ගැසට් එකක් තමයි පළාතට විතරක් ගහලා තිබෙන්නේ කියලා.

මහෙස්ත්‍රාත්වරයෙකුට තමන් සතු බලතල පාවිච්චි කරන්න පුළුවන්. මේ ආණ්ඩුවෙත් උගත්, බුද්ධිමත් නීතිඥවරු ගොඩක් ඉන්නවා. සෘජු තීන්දුවක් ගත්තු, මේ කාලයේ මේ රටේ ඉන්න කොන්ද කෙළින් තිබුණු එකම නඩුකාරයා තමයි හිටපු ගම්පහ මහෙස්ත්‍රාත්වරයා. එතුමා ගත්තු තීන්දුවට විරුද්ධව අද එතුමාව මාරු කරලා තිබෙනවා. කොමිෂන් සභාවට එහෙම මාරු කරන්න බැහැ. පොලිස්පතිට විරුද්ධව තීන්දුවක් ගත්තා කියලා හිටි හැටියේ ඒ මහෙස්ත්‍රාත්වරයාව මාරු කරන්නේ කොහොමද?

අද නීතිය හැල්ලුවට ලක් වෙනවා. ආණ්ඩුව නිතර දෙවේලේ කියනවා, "අපි අධිකරණයට අත තියන්නේ නැහැ, අපි නීතියට ඇඟිලි ගහන්නේ නැහැ" කියලා. එහෙම නම් කොහොමද, පොලිස්පතිට විරුද්ධව අභියාචනාධිකරණයට නඩු ෆයිල් එක යැවිවා කියලා සතියක් ඇතුළත ගම්පහ මහෙස්ත්‍රාත්වරයාට ස්ථාන මාරුවීමක් එන්නේ? එහෙම ස්ථාන මාරු කරන්න පුළුවන්ද, මේ රටේ නඩුකාරවරු? නඩුකාරවරුන් 21දෙනෙකුගේ වැඩ තහනම් කළා. ඒ වාගේම නඩුකාරවරුන් එහේට මෙහේට මාරු කරනවා. මෙහෙම ගියොත් මේ රටේ නීතිය බල්ලාට යනවා නේ. මම මේ වෙලාවේදී කියනවා, පොලිස්පතිවරයාට විරුද්ධව නඩු ෆයිල් එක අභියාචනාධිකරණයට යවපු නිසා තමයි ගම්පහ මහෙස්ත්‍රාත්වරයා මාරු කළේ කියලා. ආණ්ඩුවේ ඉන්නවා, නීතිඥ මහත්වරු. ඒ වාගේම අපේ අධිකරණ ඇමතිවරයාත් නීතිඥයෙක්. එතුමන්ලාට වගකීමක් තිබෙනවා, මේ ගැන සොයා බලන්න. හරියට කථා කරන නීතිඥ මහත්මියක් - මන්ත්‍රීතුමියක් - මෙහි ඉන්නවා. එතුමිය සාධාරණව කථා කරනවා. අපි දැක්කා, එතුමිය ඊයේ පෙරේදා සංශෝධන පනත් කෙටුම්පතක් ගැනත් කථා කළා. උගත්, බුද්ධිමත් නීතිඥ මහත්වරු ආණ්ඩුව පැත්තේත් ඉන්නවා.

ආණ්ඩුව හැටියට මේ කියපු කාරණා ගැන කල්පනා කරලා කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.31]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කොළඹ වරාය නගරයේ නැහෙනහිර බහලුම් පර්යන්තයේ ඉදි කිරීම් කටයුතු සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධව ගත්තොත්, මේ ආයෝජන සියල්ලම අපේ රටට බලපානවා. සති කිහිපයකට කලින් අපි දැක්කා, චයිනා

මර්වන්ටිස් සමාගම ඩොලර් මිලියන 390ක ආයෝජනයක් ඉවත් කර ගත්තා. රටේ නීතියේ ආධිපත්‍යයත් මේකට බලපාන කරුණක්. රටේ නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය ආදි සියලු දේවල් අපේ ආයෝජනවලට බලපානවා. අද මේ කථාවට පසුබිම ගොඩ නැහෙන්නේ ඇයි?

විශේෂයෙන්ම අද ඇති වෙච්ච සිදුවීම තමයි, බන්දුල ගුණරත්න මහෙස්ත්‍රාත්තුමා මාරු කිරීම. ඇයි එතුමාව මාරු කළේ? එතුමා පසුගිය කාලය පුරාම එම අධිකරණය තුළ - මහෙස්ත්‍රාත් උසාවියේ - ලබා දීපු තීන්දු කීපයක්ම තිබෙනවා. පොලිස්පතිතුමා කරපු වැරැදි ගැසට් නිවේදනයක් සම්බන්ධව - අත්තනෝමතිකව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සම්බන්ධව සියලු පොලිස් ස්ථානවලට දැනුම් දීමට වක්‍රලේඛයක් නිකුත් කරන්න කියලා එතුමා නියෝගයක් කළා. ඒ නියෝගය පොලිස්පතිතුමා ඉෂ්ට කළේ නැහැ. ඒ හින්දා එය උසාවියට කරපු අපහාසයක් හැටියට - අධිකරණයට කරපු අපහාසයක් හැටියට - සලකා එතුමා රෙජිස්ට්‍රාර්ට නියෝගයක් දුන්නා, ඒ සියලු ලිපි ලේඛන අභියාචනාධිකරණයට යවන්න කියලා. ඒ නියෝගය දීලා පැය කිහිපයක් ගියේ නැහැ, එතුමාට මාරු වීමේ ලිපිය ඇවිල්ලා තිබෙනවා. මෙහෙමද තමුන්නාන්සේලා මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරන්න යන්නේ? මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරනවා කියලා ජනතාවට පොරොන්දු දීලා, විනිශ්චයකාරවරුන් මාරු කරලා අර පැරණි විධියටම තමන්ට අවශ්‍ය කරන තීන්දු ගැනීම කරන්නද මේ යන්නේ? ඒ තුළින් වෙන්නේ අධිකරණය පිළිබඳව තිබෙන විශ්වාසය බිඳ වැටීමයි. ඒ විශ්වාසය බිඳ වැටීම අපේ ආයෝජනවලට, අපේ රටට එන ආයෝජකයන්ට අනිවාර්යයෙන්ම බලපාන කරුණක්.

අපි දැක්කා, පසුගිය කාලයේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ නඩුවක් තිබුණු ගල්කිස්ස උසාවියේ හිටපු විනිශ්චයකාරතුමාව මාරු කළ ආකාරය. ඊළඟට, කොටුව උසාවියේ හිටපු විනිශ්චයකාරතුමාව මාරු කළා. මේ විනිශ්චයකාරවරුන් මාරු කිරීම තුළ ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ තමන්ට අවශ්‍ය තීන්දු ලබා ගැනීමද? නිරන්තරයෙන් සැකයක් ඇති කරන ක්‍රියාවලියක් මේක. මෙවැනි ක්‍රියාමාර්ග රටේ අනාගතයට, දියුණුවට, සංවර්ධනයට, නීතියේ ආධිපත්‍යයට සුබදායක නැහැ. ජනාධිපතිතුමා කියන ආකාරයටම, පසුගිය මැතිවරණ වේදිකාවල තමුන්නාන්සේලා කථා කරපු ආකාරයටම මේ කරන ක්‍රියාවලිය රටේ ඉදිරි අනාගතයට සුබදායක නැහැ.

මේ නැවත වතාවක් යන්නේ අර පරණ වනවාරී යුගයට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය යනාදි සියලු දේවල් එකට බැඳිලා තිබෙනවා. මොකද, රටක් හැටියට ඉස්සරහට යන්න ඕනෑ නම් රටේ නීතියට, රටේ අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කරන යුගයක්, ගරු කරන පරිසරයක් අපි රට තුළ ගොඩනඟන්න ඕනෑ. එහෙම පරිසරයක් ගොඩනඟන්නේ නැතුව තමන්ට අවශ්‍ය තීන්දු ගන්න අධිකරණයක් හදනවා නම් අපේ රටට එන ආයෝජන ඇතුළු සියලු දේවල් ඒ හේතුවෙන් නැති වනවා කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව කාලීන යෝජනාවක් හැටියට මා සලකනවා. එම යෝජනාවේ මූලික අන්තර්ගතය පිළිබඳවයි මා කථා කරන්නේ. කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය ඉක්මනට හදලා එය රටේ ආර්ථිකයට දායක කරන එක සම්බන්ධයෙන් විවාදයක් නැහැ. රජය විධියට ඒක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, විදේශ විනිමය උපයා ගැනීමේ ප්‍රධාන උපායමාර්ගයක් විධියට අපට අපේ වරාය පාවිච්චි කරන්න පුළුවන්. ඒ වාගේම අපි දන්නවා, මේ වනකොට ලෝකයේ ඇති වෙලා තිබෙන යුධමය තත්ත්වයන් හමුවේ; ඇතැම් වරායවලට අත් වෙලා තිබෙන ඉරණම හමුවේ වර්තමානය වනකොට පරණ මුහුදු මාර්ග විවෘත කරලා විවිධ අවස්ථා විවෘත කර ගැනීමේ හැකියාව අපට යම් ප්‍රමාණයකට තිබෙන බව. අපි ඒ වෙනුවෙන් කැප වෙලා සිටිනවා. හැබැයි අවාසනාව වන්නේ මෙයයි. මේ කියන කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය හදන්න පටන් ගන්නේ 2021 ඉඳලායි. 2025දී අවසන් කරන්න තිබ්බිව ව්‍යාපෘතියක් තමයි මේ ප්‍රමාද වෙලා තිබෙන්නේ. රජය විධියට අපි බලයට ඇවිල්ලා ඒ ප්‍රමාදයන් සම්බන්ධව පරීක්ෂණ කළා. කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් ප්‍රමාද වීම ගැන COPE එකේත් අවධානය යොමු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් COPE එකේ වාර්තාවක් ද තිබෙනවා. අපි ඒ ප්‍රතිලාභයේ වටිනාකම දැනගෙන ඒ වෙනුවෙන් වහ වහා ක්‍රියාත්මක වෙලා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා.

ඒ වාගේම අපි දන්නවා, කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ විතරක් නොවෙයි, මුළු වරාය පද්ධතියේම මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක ආයෝජනයක් මේ වන විට කර තිබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, රජය විධියට අපි එම තීරණය අරගෙන එහි සංවර්ධන කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම තමයි අපි මේ සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර යොදවා තිබෙනවා, සේවකයන්ගේ පුරප්පාඩු ද පුරවා තිබෙනවා.

අපි දන්නවා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය කියන්නේ පසුගිය යුගවල ඉතාම දූෂිත තත්ත්වයට පත් වුණු ආයතනයක් කියලා. අපේ රට තුළට අනවසර දේවල් ආවා නම් ඒකට ගොඩක් අනුබල දීපු ආයතනයක් බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පත් වෙලා තිබුණා. ඒ නිසා අප එහි නිලධාරීන්ගේ භීතය පියවීම, තාක්ෂණික අවශ්‍යතාව පියවීම වාගේම, ඒ තුළ තිබුණු වංචාව, දූෂණය, නාස්තිය ඉවත් කරලා ක්‍රමානුකූලව මේ තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම අපි එහි නවීන යන්ත්‍ර සූත්‍ර සවි කළා. ඒ හේතුව නිසා 2026 පළමු මාස 4හි විතරක් කොළඹ වරායේ

[ගරු වම්පික හෙට්ටිආරච්චි මහතා]

බහලුම් මෙහෙයුම් කටයුතුවල සියයට 22ක වර්ධනයක් ළඟා කර ගන්න අපට පුළුවන් වුණා. අපි රජයක් විධියට ඒ ක්‍රියාමාර්ග අරගෙන වරාය රටේ හොඳ තැනක් බවට පත් කරන්න කටයුතු සූදානම් කර තිබෙනවා.

ඒ මන්ත්‍රීතුමාගේ කථාවේදී මතු වෙච්ච තවත් කාරණයක් තිබෙනවා. ඒ කාරණයටත් මම උත්තර දෙන්න ඕනෑ. අපි රජය විධියට තවම තීරණයක් ගෙන නැහැ, වරාය දියුණු කරලා ඉස්සරහට ගෙන යන model එක මොකක්ද කියන එක ගැන. එය සාකච්ඡාවට විවෘතයි. සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා ඒ සාකච්ඡාවලින් ගන්නා තීරණ අනුව තමයි අපි රජය විධියට ඉදිරියේදී වරායේ ආර්ථික තත්ත්වය, එහෙම නැත්නම් වරායේ මෙහෙයුම් කටයුතු කෙරෙන්නේ කොහොමද කියන එක ගැන තීන්දු කරන්නේ. පසුගිය කාලයේ අපේ අනුර කරුණාතිලක ඇමතිවරයා ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කර තිබෙනවා. මා එය කියවන්නම්. 2026 ජූලි මාසයේ 07වන දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 69හි මෙසේ සඳහන් වනවා:

"1. බදු දීම හෝ පෞද්ගලීකරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය හෝ පරිපාලනමය තීරණයක් ගෙන නොමැත"

ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා කලබල වෙන්න එපා. රට කලබල කරන්නත් එපා. අපි රටේ තිබෙන ආර්ථික මර්මස්ථාන සම්බන්ධයෙන් තීරණ ගන්නේ බොහොම විනිවිදභාවයෙන්; රටටම පෙනෙන විධියට සහ හැමෝගේම එකඟතාවෙන්.

හැබැයි, අපි දන්නවා පසුගිය ආණ්ඩු කාලවල තීන්දු ගත්තු හැටි. ඒ බව ඔබතුමන්ලාට මතක ඇති. ඔය කථා කරපු මන්ත්‍රීවරුම තමයි, එනම් හම්බන්තොට වරාය විකුණන කොට, ඒවායේ චෙක්පත් ගන්න කොට, ඒ ෆොටෝවල හිටපු මන්ත්‍රීවරු, ඒවාට අත උස්සපු මන්ත්‍රීවරුම තමයි අද මේ කැක්කුම හැදිලා, එළියට බැහැලා කෑ ගහන්නේ. එතකොට අපට තේරෙනවා, ඒ අය මේ එන්නේ මොකටද කියලා. අපේ රටේ වරායවල් විකුණන කොට නිදාගෙන සිටි මන්ත්‍රීවරුන් අද එක සැරේට අවදි වෙලා, කෑ ගහලා සමාජය අවුස්සන්න ගියාට සමාජය එහෙම ඇවිස්සෙන්නේ නැහැ. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, මේ වරාය දියුණු කරලා, ලෝකයේ තිබෙන අභියෝග, ලෝකයේ තිබෙන ආර්ථික වාසි ටික ළඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම අප ඒ තුළ හදනවා කියලා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා එහි තිබෙන තාක්ෂණික කාරණා ටික ඉදිරියේදී මැනවින් පැහැදිලි කරයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.40]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාදන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

இன்றைய தினம் கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்களால் கொண்டுவரப்பட்ட கொழும்புத் துறைமுகத்தின் கிழக்கு கொள்கலன் முனையத்தின் நிர்மாணப் பணிகளை துரிதமாக நிறைவு செய்தல் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நான் உண்மையாகவே வரவேற்கிறேன். உங்களுக்குத் தெரியும், 323 containers வந்த காலப்பகுதியில் இருந்து இன்றுவரை இவர்கள் கொழும்பு கிழக்கு கொள்கலன் முனையத்தை அபிவிருத்தி அடையச் செய்வதற்கான முயற்சியில் ஈடுபட்டுக்கொண்டு இருக்கிறார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, துறைமுக அபிவிருத்தியை எடுத்துக்கொண்டால், இன்றுவரை இலங்கையின் வடக்கு, கிழக்குப் பகுதியில் எந்தவிதமான துறைமுக அபிவிருத்தியும் நடைபெறவில்லை. இந்தியாவிலிருந்து பெரிய இழுவைப் படகுகளில் கொண்டுவரப்படுகின்ற மிகப் பெரிய படகுகள் மயிலிட்டி துறைமுகத்தில் கடற்படையால் பிடிக்கப்பட்டு நீதிமன்றத்தால் தடுத்து வைக்கப்படுகின்றன. நீதிமன்றம் தீர்ப்பு வழங்கிய பிறகு, அந்தப் படகுகளை நடுக்கடலுக்குக் கொண்டுபோய் தாக்குமாறு நாங்கள் DCC meetingஇல் பல தடவை வேண்டிக்கொண்டபோதும், அவை அங்கேயே வைக்கப்பட்டுள்ளதால், இன்று மயிலிட்டித் துறைமுகத்தை மீனவர்களால் பயன்படுத்த முடியாத நிலைமை ஏற்பட்டு இருக்கின்றது.

வடக்கு, கிழக்கைப் பொறுத்தவரைக்கும், கடலோர மாவட்டங்களுக்கு முக்கியமாக மன்னார், யாழ்ப்பாணம், முல்லைத்தீவு மாவட்டங்களுக்கு வருமானம் கிடைப்பது மீன்பிடித்துறை மூலம்தான். இந்த மூன்று மாவட்டங்களிலும் மொத்த மக்கள் தொகையில் 20 சதவீதமானோர் மீனவ சமூகத்தினராக இருக்கிறார்கள் என்று நான் நினைக்கின்றேன். கௌரவ மீன்பிடித்துறை அமைச்சர் சந்திரசேகர் அவர்கள் தற்பொழுது இங்கு இல்லை. வடக்கைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்கள் எவருமே வடக்கு, கிழக்கில் இருக்கின்ற எந்தத் துறைமுக அபிவிருத்தி தொடர்பாகவும் கதைப்பதில்லை. கௌரவ பிமல் ரத்நாயக்க அவர்களைப் பொறுத்தவரைக்கும், அவருக்கு KKS துறைமுகத்தை அபிவிருத்தி செய்கின்ற எந்தவோர் எண்ணமும் இல்லை. இந்த இரண்டு வருடங்களில் எந்தவிதமான அபிவிருத்தியும் அங்கு செய்யப்படவில்லை.

இதைவிட கவலை என்னவென்றால், எமது வடக்கு, கிழக்கு மீனவர்கள் தினமும் இந்திய இழுவைப் படகுகளின் பிரச்சினையால் பாதிக்கப்படுவதுதான். இது தொடர்பில் இந்த இரண்டு வருடங்களில் இந்த அரசாங்கம் எந்த நடவடிக்கையும் மேற்கொள்ளவில்லை. நான் இந்த மீன்பிடித் துறைமுக அபிவிருத்திக்காக என்னுடைய பன்முகப்படுத்தப்பட்ட நிதியிலிருந்து 20 இலட்சம் ரூபாயைக் கொடுத்தேன். இன்றைய தினம் அவர்கள் மாதகல் பகுதியில் தங்களுடைய கட்டிடத்தைக் கட்டிமுடித்து திறப்பு விழா கொண்டாடி இருக்கிறார்கள்.

நான் காக்கைதீவு, கொட்டடிக்கு 40 இலட்சம் ரூபாய் கொடுத்தேன். மொத்தம் 100 இலட்சம் ரூபாயில் - ஒரு கோடி ரூபாயில் - 40 இலட்சம் ரூபாய் இன்றுவரை பாவிக்கப்படவில்லை. என்னைப் பொறுத்தவரை, அந்த கடலோரப் பாதுகாப்புத் திணைக்களத்தின் அபிவிருத்திக்காக கொடுக்கப்பட்ட நிதியை கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்கள் இன்றுவரை கொடுக்கவில்லை. பன்முகப்படுத்தப்பட்ட நிதியாக வழங்கப்பட்ட 100 இலட்சம் ரூபாயில் 40 இலட்சம் ரூபாய் இந்த அரசாங்கத்தால் வீண்விரயமாக்கப்பட்டு இருக்கின்றது. நாங்கள் இந்த அரசாங்கத்திடம் கேட்பது இங்கே எனக்கு முன்னால் நான்கு ஆசன வரிசைகள் இருக்கின்றன. நான்காவது வரிசையில்

இந்த மூலையிலும், அந்த மூலையிலும், அந்த மூலையிலும்தான் யாழ்ப்பாணத்தைச் சேர்ந்த மூன்று பாராளுமன்ற உறுப்பினர்களின் ஆசனங்களும் இருக்கின்றன. கௌரவ இளங்குமரன், கௌரவ றஜீவன், கௌரவ பவானந்தராஜா ஆகியோர் தற்போது இங்கு இல்லை. பாவம்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉයා! මුඩික්කිරේන්.

அவர்கள் இங்கு இல்லாதது வடக்கு மாகாணத்துக்கே வெட்கம்! வடக்கு மாகாணத்தில் மீனவர்கள் படுமோசமாகப் பாதிக்கப்படுகிறார்கள். தங்களிடம் இந்த விடயம் தொடர்பாக முறையிட்டுப் பலனில்லை என்று தெரிந்திருந்தும் இந்த விடயத்தை முன்வைக்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, මම හිතන විධියට කල් තැබීමේ විවාදයේදී ප්‍රශ්න ගොඩක් යොමු කළා. නැඟෙනහිර ජැටිය සම්බන්ධයෙන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කරුණු කාරණා බොහොමයක් මතු කළා. 2022 වර්ෂයේ තමයි ඒකේ වැඩ පටන් ගත්තේ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ නැහැ ව්‍යාපෘතිය අවසන් කරන්න තිබුණු දවස කවදාද කියලා. 2025 ජනවාරි මාසයේ තමයි එම ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කරන්න තිබුණේ. එය අපි ආණ්ඩුව භාරගෙන මාස 2ක් වැනි කාලයකදී අවසන් වෙන්න තිබුණු ව්‍යාපෘතියක්. නමුත්, ඒ වන විට එම පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු සියයට 40ක වාගේ ප්‍රමාණයක් තමයි අවසන් කරලා තිබුණේ. ඒ අවුරුදු තුන ඇතුළත මන්දගාමී ස්වරූපයෙන් තමයි වැඩ කෙරිලා තිබුණේ. නමුත්, අපේ රජය බලයට පත් වුණු වහාම අපි එම කටයුතු කඩිනම් කළා. මොකද, එම වරායේ තිබෙන අවශ්‍යතාව, ගුවන් තොටුපළක තිබෙන අවශ්‍යතාව, පර්යන්තවල තිබෙන අවශ්‍යතාව පිළිබඳව අපි ආණ්ඩුවක් විධියට හොඳටම අවබෝධ කරගෙන සිටියා. ඒ අනුව, අපි 2025 අවුරුද්දේ එම ව්‍යාපෘතිය කඩිනම් කිරීමේ වැඩ පිළිවෙළක් පටන් ගත්තා. ඒ හරහා අපි මේ වෙනකොට සියයට 90ක විතර සංවර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා.

මෙය කලාප 4කට තිබෙන්නේ. ඒ කියන්නේ, එහි සංවර්ධන කටයුතු ගත්තොත්, කොටස් 4කට තිබෙන්නේ. ඒ කියන්නේ ජැටිය, yard එක, machinery සහ terminal operating system එක. ජැටිය විධියට ගත්තාම quay wall එකේ වැඩ මේ වන විට සියයට 100ක් අවසන් කර තිබෙනවා. ඒ වාගේම, යන්ත්‍රෝපකරණ ගත්තාම STS cranes, ඒ කියන්නේ Ship-to-Shore cranes 12කින් ඒ project එක සමන්විතයි. ඒ 12ම මේ වන විට ආනයනය කරලා commission කරලා අවසන් කර තිබෙනවා. ඒ වාගේම yard construction එක ගත්තොත්, yard එකට අවශ්‍ය machinery 40ම ඇවිල්ලා තිබෙන්නේ. 40න්, 20ක් commission කරලා අවසන් කර තිබෙනවා. ඒ වාගේම Terminal Operating System එක මේ වන විට සියයට 90ක් වාගේ ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ straddle carriers සම්බන්ධයි. අපි ආණ්ඩුව භාර ගන්නකොටත් මේ සඳහා කිහිප වතාවක්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියට ගිහිල්ලා, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවහිර වෙලා තිබුණේ. යම් යම් හේතු කාරණා මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙලා තිබුණේ නැහැ. අපි එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය පටන් අරගෙන මේ වන විට ප්‍රසම්පාදනය අවසන් කරලා තිබෙනවා. මම හිතන විධියට අපට මේ අවුරුද්දේ අග වෙනකොට straddle carriers 15කට award letters issue කරන්න පුළුවන් මට්ටමේ තිබෙනවා. ඒ වාගේම තමයි, ඉතිරි 15ටත් අපි ලබන අවුරුද්දේ මැද වන විට ප්‍රසම්පාදනය අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ, කාල සීමාවක් නැති චෝදනාවලට තමයි අපට පිළිතුරු දෙන්න තිබෙන්නේ. අපි මේ දෙසැම්බර් වෙනකොට නැඟෙනහිර බහලුම් පර්යන්තය straddle carriers නැතිවත් trucks use කරලා, prime movers පාවිච්චි කරලා පටන් ගන්න අවශ්‍ය සැලසුම් හදලා තිබෙන්නේ.

Straddle carriers මාස 10කින් ලංකාවට එයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත්, ලබන අවුරුද්දේ අග වන විට සියයට 50ක ධාරිතාවකට සහ ඊට මාස 6කට පසුව සියයට 100ක ධාරිතාවකට යාමට අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි මේ සංවර්ධනයේ දැනට තිබෙන ප්‍රගතිය.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා මතු කළා, මේක දැන් පෞද්ගලීකරණය කරන්න යනවා, අපි රජයට අයිති දේපළක් විකුණන්න යනවා කියලා. අපි තේරුම් ගන්න ඕනෑ, වරායේ සිදුවෙන ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව. අපේ වරායේ සහ වෙනත් වරායන්වල සිදුවෙන ව්‍යාපාරවල ස්වභාවය එකිනෙකට වෙනස්. අපේ වරායේ සියයට 85ක්ම ප්‍රතිඅපනයනය තමයි කරන්නේ. අපි 1983 ඉඳලා 2026 වෙනකල් වරායේ container operation කරලා තිබෙනවා. ඒ container operationවලදී වරායේ ධාරිතාව සහ වරාය තුළ handle කරන ප්‍රමාණය TEU මිලියන 9යි. ඒ වාගේම අපි දන්නවා, බටහිර බහලුම් පර්යන්තය - WCT -I - සහ නැඟෙනහිර බහලුම් පර්යන්තය සංවර්ධනය කිරීමෙන් වරාය ධාරිතාවට තවත් මිලියන 6ක් එකවර එකතු වෙනවා කියලා. එතකොට අපි අවුරුදු 43ක් යනකල් කරලා තිබෙන්නේ මිලියන 9යි. අපි ලබන අවුරුද්ද ඇතුළත තවත් මිලියන 6ක් ඒකට එකතු කරනවා.

ඒ වාගේම අපි රජය විධියට සැලසුම් කර තිබෙනවා, බටහිර බහලුම් පර්යන්තය 2 සංවර්ධනය කරන්න. එහි වැඩකටයුතු ඊළඟ අවුරුදු 6 ඇතුළත අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් තවත් මිලියන 3ක ධාරිතාවක් වරායට එකතු වෙනවා. එතකොට ඉදිරි අවුරුදු 7 ඇතුළත වරායේ ධාරිතාව දෙගුණයක් බවට පත් වෙනවා. අපට cargo ගේන්නේ, containers ගේන්නේ අපට අයිති සමාගම්වලින් නොවෙයි. ලෝකයේ තිබෙන ප්‍රධාන නැව් සමාගම 10ක් අතේ තමයි මේ සම්පූර්ණ ව්‍යාපාරයම තිබෙන්නේ. ඉතින්, ඒ ව්‍යාපාරය අපත් එක්ක ගැටගසා ගැනීමට, බද්ධ කර ගැනීමට අපට අවශ්‍යතාවක් තිබෙනවා. එහෙම නැතිව විකුණනවා නොවෙයි. මොකද, අපි දැන් මිලියන 9ක market එකක් සොයාගෙන යන්නේ. අවුරුදු හතළිස් ගණනක් තිස්සේ අපි මිලියන 9ක market එකක් ගත්තා. ඒක හොඳයි. නමුත් අපි ඊළඟ අවුරුදු 7 ඇතුළත ඒ මිලියන 9 කොළඹ වරාය ඇතුළට ගේන්නේ

[ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා]

කොහොමද? රජයට අයිති JCT එක ගත්තොත්, ඒකට Terminal Services Agreement - TSA - එකක් තිබෙනවා; shipping companies එක්ක Terminal Services Agreement - TSA - එකක් තිබෙනවා. ඒවා හරහා අපි secure කර ගන්නවා, අත්පත් කර ගන්නවා, නැව් සමාගම්වලින් යම්කිසි ප්‍රමාණයක් මේක ඇතුළට. ඒ ප්‍රමාණය bulk එකක් විධියට නැඟෙනහිර බහලුම් පර්යන්තයට ගන්නේ කොහොමද කියන එක තමයි අපේ අභිප්‍රාය වන්නේ. ඒක, පෞද්ගලීකරණය කිරීමක් නොවෙයි. වරායේ තිබෙන සියලු assets ටික සම්පූර්ණයෙන්ම - සියයට 100ක්ම - රජයේ අයිතියේ තමයි තබා ගන්නේ. නමුත්, එතැනින් එහාට අපට මේ operation එකේදි වැඩි volume එකක් ලබා ගන්න අවශ්‍යයි. අපට මිලියන 3ක ධාරිතාවක් තිබෙනවා. එතකොට අපි ඒ මිලියන 3ටම යන්නේ කොහොමද? මොකද, අපි හදන්නේ යටිතල පහසුකම් - infrastructure - විතරයි. ඒ නිසා අපට ඒකට cargo අවශ්‍ය වෙනවා. මේ මිලියන 3ම නැඟෙනහිර බහලුම් පර්යන්තයට ඇද ගන්නේ කොහොමද කියන සාකච්ඡාව අපි දිගින් දිගටම කරගෙන යනවා. අපි ඒක කරගෙන යන්නේ තනිවම - ආණ්ඩුවක්, අමාත්‍යාංශයක් විධියට - නොවෙයි. අපි මේකට සියලු ආයතන, stakeholdersලා සම්බන්ධ කරගෙන තිබෙනවා. ඒ වාගේම අපි වරායේ තිබෙන සියලු වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරනවා. අපි පසුගිය සතියේත් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා.

ගරු මන්ත්‍රීතුමා කියපු දෙය හරි. කොළඹ වරායේ නැඟෙනහිර බහලුම් පර්යන්තය කියන්නේ වටිනා සම්පතක්, මුදල් උපයන උල්පතක්. ඒ ඔක්කෝම හරි. හැබැයි, නැඟෙනහිර බහලුම් පර්යන්තයෙන් වරායට වැඩි වාසියක් ලැබෙන විධියට මුදල් උපයා ගන්නේ කොහොමද කියන එක ගැනත් අපි සාකච්ඡා කරගෙන යනවා. එහෙම නැතුව එය විකුණා දැමීමට අපි කිසිම තීරණයක් අරගෙන නැහැ. ඒක අපි පැහැදිලි කරන්න ඕනෑ. මොකද, අපට බිල්ලෝ මවන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ඔබතුමා කියනවා වාගේ නැඟෙනහිර බහලුම් පර්යන්තයේ box terminal එක අපිට අවශ්‍යයි. SAGT එක, 2029දී expire වෙනවා. ඒක හරි. නමුත්, box terminal එක හදන්න නම් උතුරු වරායේ breakwater එකත් අවශ්‍ය වෙනවා. ඒක ඉස්සරහට තිබෙන වැඩක්. හැබැයි, අපි ඒ ගැනත් හිතලා තිබෙනවා.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, China Merchants Port Holdings එක අපේ ආයෝජන දාලා යනවා කියලා. එහෙම ආයෝජන දාලා ගිය එකක් නොවෙයි එතැන සිද්ධ වුණේ. ඒ වාගේම අපි වන්දියක් ගෙවපු කථාවකුත් කිව්වා. අපි වන්දියක් ගෙවලා නැහැ. 2024දී අපි එනකොටත් ඒ project එකට අවුරුද්දක් තිස්සේ ගල් කැටයක්වත්, ගඩොල් කැටයක්වත් නොතියන මට්ටමක තිබුණේ. ඒක, ඉදිරියට නොයන මට්ටමක තිබුණු project එකක්. නමුත්, අපට පුළුවන් වුණා, නීතිමය කටයුතුවලට නොයා amicable solution එකකට එන්න. ඒක තමයි අපි කළේ.

එතැනදි ඒගොල්ලන් ඩොලර් මිලියන 26ක් මේ business එකට දමා තිබුණා. ඒ ඩොලර් මිලියන 26න් ඒගොල්ලන්ට අදාළ ඩොලර් මිලියන 21 ආපසු මේ ගිවිසුම අවලංගු වීමේදී ලබා දෙන්න අපට සිදු වුණා. ඉතින් එතැනදි ආයෝජනය දමා යෑමක් නොවෙයි වුණේ. මේ ව්‍යාපෘතිය සම්බන්ධව unsolicited proposal එකක් තමයි ගිහිල්ලා තිබුණේ. ඒ පටන් ගැනීමේදීම තිබුණු මූලික අර්බුදය නිසා මේ project එක අන්තිම වෙනකල්ම අර්බුදයක තිබුණා. ඒ නිසා තවදුරටත් එම අර්බුදය පවත්වා ගෙන යෑමට නොහැකි නිසා එම අර්බුදය ඉවර කරලා, අලුත් EoIs call කරලා වරාය අධිකාරිය විධියට අපි ඉතා ඉක්මනින් මේ සම්බන්ධව නැවත අලුත් ව්‍යාපෘතියකට යනවාය කියන කාරණයත් මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම KKS වරාය ගැනත් සඳහන් කළා. එතැන සංවර්ධනය කරන්න අපි කිසිම දෙයක් පටන් අරගෙන නැහැ කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් news බැලුවා නම් හොඳයි. මොකද එතුමන්ලා දන්නේ නැද්ද දන්නේ නැහැ, ඉන්දියාවෙන් ලැබෙන්න තිබෙන ඩොලර් මිලියන 60ක ණය මුදල අපි මේ වනකොට ඉන්දියානු රජයත් එක්ක සාකච්ඡා කරලා ආධාරයක් බවට පරිවර්තනය කරගෙන තිබෙන බව. ඒ සම්බන්ධ MoU එක මේ වනකොට අවසන් අදියරේ තිබෙන්නේ. අපි හිතනවා, ඒ අනුව ඉදිරි මාස තුන හතරක කාලය ඇතුළත KKS වරායේ සංවර්ධන කටයුතු ටිකත් පටන් ගන්න අපට පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම මෙතැනදි අධිකරණ සම්බන්ධවත් යම් කාරණයක් මතු කළා. ඒක අධිකරණයට සම්බන්ධ කටයුත්තක් නිසා ඒකට මම උත්තර නොදී ඉන්නම්. ඒවා අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් ගන්නා තීන්දු තීරණ. ඒවා අපි ඒ අයට කරගන්න දෙමු. මෙතැනදි ඒක මතු කරන්නේ නැතිව ඉන්න කියා මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.52ට, අද දින සභා සම්මතිය අනුව, 2026 නොවැම්බර් 12වන බ්‍රහස්පතින්දා අ.භා 1.30 වන තෙක් කල් ගියේය.
அதன்படி பி. ப. 4.52 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2026 நவம்பர் 12, வியாழக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Parliament adjourned accordingly at 4.52 p.m. until 1.30 p.m. on Thursday, 12th November, 2026, pursuant to the Resolution of Parliament of this Day.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

කම්කරු අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රම වාසනා අරමුදල මඟින් සපයන ලද සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම: විස්තර
தொழில் அமைச்சின் கீழுள்ள சிரம வாசனா நிதியத்தால் வழங்கப்பட்ட சேவைகளைத் தொடர்ந்தும் வழங்குதல்: விபரம்
CONTINUATION OF SERVICES FORMERLY PROVIDED BY SHRAMA WASANA FUND UNDER MINISTRY OF LABOUR: DETAILS

2394/2026

1. ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදලේ' සේවාවන් සඳහා අයදුම්පත්, මාර්ගෝපදේශ, සුදුසුකම් සපිරීමේ කොන්දේසි සහ අනෙකුත් තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) අමාත්‍යාංශය එම සේවාවන් භාර ගැනීමෙන් පසු අයදුම්පත්, මාර්ගෝපදේශ, මාර්ගගත සේවා සහ තීන්දු පිළිබඳ ලිපි භාෂා ත්‍රිත්වයෙන් ලබා දීමට

පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වන කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අරමුදලේ සේවාවන් සඳහා අමාත්‍යාංශය යටතේ ඇති සෑම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයකටම සෘජුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසන්නේද;

(ii) අන්තර්ජාල පහසුකම් හෝ ප්‍රමාණවත් ඩිජිටල් සාක්ෂරතාවක් නොමැති සේවකයින් සඳහා සෘජුව හෝ තැපෑලෙන් අයදුම් කිරීමට විකල්ප පහසුකම් සලසන්නේද;

(iii) මුලතිව්, මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් පත් කරන්නේද;

(iv) ග්‍රාමීය හා අවිධිමත් අංශයේ සේවකයින් දැනුම්වත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

තොழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'சிரம வாசனா நிதியத்தின்' சேவைகளுக்கான விண்ணப்பப் படிவங்கள், வழிகாட்டிகள், தகைமைகளைப் பூர்த்திச்செய்யும் நிபந்தனைகள் மற்றும் ஏனைய தகவல்கள் சிங்களம், தமிழ் மற்றும் ஆங்கிலம் ஆகிய மும்மொழிகளிலும் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அமைச்சு குறித்த சேவைகளைப் பொறுப்பேற்ற பின்னர் விண்ணப்பப் படிவங்கள், வழிகாட்டிகள், இணையவழிச் சேவைகள் மற்றும் தீர்மானக் கடிதங்களை மும்மொழி களிலும் வழங்குவதற்கு நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான காலவரையறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நிதியத்தின் சேவைகளுக்காக அமைச்சின் கீழுள்ள ஒவ்வொரு மாவட்டத் தொழில் அலுவலகத்திலும் நேரடியாக விண்ணப் பங்களைச் சமர்ப்பிக்கும் வசதிகள் ஏற்படுத்தப் படுமா என்பதையும்;

(ii) இணைய வசதிகள் அல்லது போதுமான டிஜிட்டல் அறிவு இல்லாத ஊழியர்களுக்கு நேரடியாக அல்லது தபால்மூலம் விண்ணப் பிப்பதற்கான மாற்று வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படுமா என்பதையும்;

(iii) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களுக்கு ஒருங்கிணைப்பு உத்தியோகத்தர்கள் நியமிக்கப்படுவார்களா என்பதையும்;

(iv) கிராமிய மற்றும் முறைசாராத் துறையிலுள்ள ஊழியர்களை விழிப்புணர்வூட்டுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) whether application forms, guidelines, eligibility criteria, and other information regarding the services provided by the Shrama Wasana Fund have been made available in all three languages, namely Sinhala, Tamil, and English;

(ii) if not, the reasons therefor;

(iii) whether the Ministry will take steps to provide the application forms, guidelines, online services, and letters regarding the decisions in all three languages after taking over the provision of the said services by the Ministry; and

(iv) if so, the timeframes for taking such action?

(b) Will he also inform this House -

(i) whether facilities will be provided to submit application forms directly to any District Labour Office of the Ministry to obtain the services provided by the Fund;

(ii) whether workers who lack Internet access or sufficient digital literacy will be provided with alternative facilities to submit their applications directly or by post;

(iii) whether coordinating officers will be appointed for the Mullaitivu, Mannar, and Vavuniya Districts; and

(iv) the measures that will be taken to raise awareness among workers in the rural areas and in the informal sectors?

(c) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

(අ) (i) ඔව්.

(ii) පැන නොනඟී.

(iii) ඔව්.

(iv) සති දෙකක් ඇතුළත.

(ආ) (i) දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල හරහා වෘත්තීය අනතුරු සඳහා ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධ අයදුම්පත් යොමු කළ හැකිය.

කම්කරු දෙපාර්තමේන්තුවට අයත් සියලුම කාර්යාලවලින් අදාළ අයදුම්පත් භාරගෙන යොමු කිරීමට හෝ විද්‍යුත් තැපෑල මඟින් හෝ සාමාන්‍ය තැපෑල මඟින් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අවශ්‍ය උපදෙස් සහිත චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කරමින් ඇත.

(ii) ඔව්.

(iii) නැත.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(iv) කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන් හරහා.

සමාජ මාධ්‍ය භාවිතයෙන්.

අමාත්‍යාංශ හා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා.

වෘත්තීය සමිති සාමාජිකයින් දැනුවත් කිරීම මඟින්.

(ඇ) පැන නොනඟී.

(අ) (i) ඔව්.

(ii) එපා වී නැත.

(iii) ඔව්.

(iv) සති දෙක ඇතුළත

(ආ) (i) රාජ්‍ය සේවා නියුක්තිකයන් බඳවා ගැනීම් ක්‍රියාවලිය සඳහා වන විභාග ක්‍රමය නවීකරණය කිරීම සඳහා වන යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වන කාල සීමාව 2025 සැප්තැම්බර් 01 වන දින සිට 2026 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇත.

(ii) ඔව්.

(iii) නැත.

(iv) රාජ්‍ය සේවා කොමිසම විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය සේවා නියුක්තිකයන් බඳවා ගැනීම් ක්‍රියාවලිය සඳහා වන විභාග ක්‍රමය නවීකරණය කිරීම සඳහා වන යෝජනා, 2025 ඔක්තෝබර් 01 වන දින සිට 2026 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇත.

(ඇ) ඔව්.

(a) (i) Yes.

(ii) Not Applicable.

(iii) Yes.

(iv) Within two weeks.

(b) (i) Applications for benefits in respect of occupational accidents/injuries can be submitted through the Offices of the District Factory Inspecting Engineers.

Arrangements are being made to issue a circular containing the necessary instructions to enable all Offices of the Department of Labour to accept and forward the relevant applications, and to enable applications to be submitted via email or ordinary post.

(ii) Yes.

(iii) No.

(iv) Through Labour Officers of the Department of Labour;

Through social media;

Through the websites of the Ministry and the Department of Labour; and By raising awareness among trade union members.

(c) Not Applicable.

රාජ්‍ය සේවා බඳවා ගැනීම් සමාලෝචනය කිරීම සඳහා NPP ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු යෝජනාව: ප්‍රගතිය

அரச சேவை ஆட்சேர்ப்பு முறையை மீளாய்வு செய்தல் தொடர்பில் NPPஇன் கொள்கைப் பிரகடனத்திலுள்ள முன்மொழிவு: முன்னேற்றம்

PROPOSAL IN NPP POLICY STATEMENT TO REVIEW PUBLIC SERVICE RECRUITMENTS: PROGRESS

2497/2026

2. ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ජන බලවේග රජයේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ 86වැනි පිටුවෙහි සඳහන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී දැනට පවතින තරග විභාග ක්‍රමය නවීකරණය කර තෝරා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීම යන යෝජනාව, 2026.09.01 දිනය වන විට ඉටු කර තිබේද;

(ii) එසේ නම්, එහි මූල්‍ය/භෞතික ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் 'வளமான நாடு - அழகான வாழ்க்கை' கொள்கைப் பிரகடனத்தின் 86ஆம் பக்கத்தில் குறிப்பிடப் பட்டுள்ள அரச வேலைவாய்ப்புகளுக்கு ஆட்சேர்ப்புச் செய்வதற்கு தற்போதுள்ள போட்டிப் பரீட்சை முறையை நவீனமயப்படுத்தி தெரிவுசெய்யும் நடவடிக்கை முறையை இற்றைப்படுத்துதல் என்ற முன்மொழிவானது 2026.09.01ஆம் திகதியின்போது நிறைவேற்றப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதன் நிதி/பௌதிக முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether the proposal mentioned in page 48 of the National People's Power Government's policy statement "A Thriving Nation - A Beautiful Life"' to review the current competitive examination system for government employments and update the selection process had been accomplished as at 01.09.2026; and

(ii) if so, its financial/physical progress?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

(අ) (i) රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් පටිපාටි, සේවා අවශ්‍යතා සලකා බලමින් විධිමත්ව හා අවස්ථාවෝචිතව යාවත්කාලීන කරමින් නව ක්‍රමවේදයක් පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.

(ii) රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් පටිපාටි, සේවා අවශ්‍යතා සලකා බලමින් විධිමත්ව හා අවස්ථාවෝචිතව යාවත්කාලීන කිරීම සිදු කරයි.

එහිදී, මෙතෙක් පැවති ක්‍රමවේදය වෙනස්කොට ඒකාබද්ධ රියදුරු සේවයේ බඳවා ගැනීම්, ගැළපෙන තරගකාරී විභාග ක්‍රමවේදයක් තුළින් සිදුකර සුදුස්සන් තෝරාගෙන, ඉන්පසු වෘත්තීය පරීක්ෂණයන්ගෙන් සමත්වන්නන් සඳහා පත්වීම් ලබා දීම දැනටමත් ආරම්භ කර ඇත.

තවද, කාර්යාල සේවක සේවයේ බඳවා ගැනීම්වලදී ආයතනික සේවා අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි විධිමත් සහ විනිවිදභාවයක් සහිත ලකුණු ලබා දෙන සම්මුඛ පරීක්ෂණයක් තුළින් තෝරා ගැනීම දැනට සිදු කරනු ලබයි.

එමෙන්ම සියලුම බඳවා ගැනීම්වලදී එම සේවාවන්ට අදාළ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට සාධාරණ අවස්ථාවක් ලැබෙන පරිදි තරගකාරී බඳවා ගැනීම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදී රාජ්‍ය සේවයේ වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට බඳවා ගැනීම් පටිපාටිවලට නවීකරණයන් අවශ්‍ය වන සෑම අවස්ථාවකදීම ඊට නියමිත සංශෝධන එක් කරනු ලැබේ.

2025.12.19 දිනැතිව සංශෝධිත ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ විභාග නිවේදනය 2026.02.13 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර, එම ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනය 2026.07.28 දිනැතිව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

ඒ අනුව 2026 සැප්තැම්බර් මස 05, 06, 10 සහ 11 දිනවල පවත්වන ලද අතර, එහිදී සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් 400කට ආසන්න ප්‍රමාණයකට 2026 නොවැම්බර් මාසයේදී පත්වීම් ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ.

දීප ව්‍යාප්ත සේවා සඳහා ඒ එක් එක් සේවා ව්‍යවස්ථා ප්‍රකාරව බඳවා ගැනීම තරග විභාග ක්‍රමවේදය හරහා සිදු කෙරේ.

මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා දීප ව්‍යාප්ත සේවා සඳහා එක් එක් සේවාවන්ට වෙන් වෙන්ව පැවති විභාග ක්‍රමවේදය වෙනුවට නව තරග විභාග ක්‍රමයක් වශයෙන් සියලු දීප ව්‍යාප්ත සේවාවන්ට පොදු තරග විභාග ක්‍රමය 2021 වසරේ හඳුන්වා දුන් අතර, 2023 වසරේ විභාග පවත්වා 2025 වර්ෂයේ බඳවා ගැනීම් සිදු කරන ලදී.

ඒ අනුව එලෙස හඳුන්වා දුන් නව ක්‍රමවේදයක් යටතේ තරග විභාග මෙතෙක් පවත්වා ඇත්තේ එක් වතාවක් පමණක් වන අතර, එකී ක්‍රමවේදයම ඉදිරියටත් අනුගමනය කරන ලෙස ලද ප්‍රතිපත්තිමය තීරණය අනුව එහි පැවති දෝෂ, දුර්වලතා හඳුනා ගැනීම සිදු කර ඒවාට විසඳුම් ඇතුළත් කර එකී නව තරග විභාග ක්‍රමවේදය ඔස්සේම නැවත වතාවක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අදාළ බඳවා ගැනීම් ද මෙම පොදු තරග විභාග කොටසට ඇතුළත් කර පැවැත්වීමට තීරණය කර ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) அரச சேவையின் ஆட்சேர்ப்பு நடைமுறைகள், சேவைத் தேவைகளைக் கருத்திற்கொண்டு முறையாக மற்றும் சந்தர்ப்பத்துக்கேற்பவும் இற்றைப்படுத்தி, புதிய நடைமுறையொன்று தொடர்பாக ஆய்வு மேற்கொள்ளப்பட்டு வருகிறது.

(ii) அரச சேவையின் ஆட்சேர்ப்பு முறைகள், சேவைத் தேவைகளைக் கருத்திற்கொண்டு முறையாக மற்றும் சந்தர்ப்பத்துக்கேற்பவும் இற்றைப்படுத்தல் மேற்கொள்ளப்படுகின்றன.

அங்கு, இதுவரை நடைமுறையிலிருந்த முறைமை மாற்றப்பட்டு, இணைந்த சாரதிகள் சேவையின் ஆட்சேர்ப்புகள், பொருத்தமான போட்டிப் பரீட்சை முறைமை ஊடாக மேற் கொள்ளப்பட்டு, தகுதியானவர்கள் தெரிவு செய்யப்படுவதோடு, அதன் பின்னர் தொழில்சார் பரீட்சைகளில் சித்தியடைபவர்களுக்கு நியமனங்கள் வழங்குவது ஏற்கனவே ஆரம்பிக் கப்பட்டுள்ளது.

மேலும், அலுவலக ஊழியர் சேவையின் ஆட்சேர்ப்புகளின்போது தாபன சேவைத் தேவைகளை அடைந்துகொள்வதற்கு இயன்ற பிரகாரம், முறையாக மற்றும் வெளிப்படைத் தன்மை வாய்ந்ததுமான புள்ளிகள் வழங்கும் நேர்முகப் பரீட்சையொன்றின்மூலம் தெரிவு செய்தல் தற்போது மேற்கொள்ளப்பட்டு வருகின்றது.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

අත්‌துடன், அனைத்து ஆட்சேர்ப்புகளின் போதும், அச்சேவைகளுக்குரிய தகைமைகளைப் பூர்த்திசெய்யும் விண்ணப்பதாரர்களுக்கு நியாய மான சந்தர்ப்பமொன்று கிடைக்கும் வகையில் போட்டி ஆட்சேர்ப்பு முறைமை நடைமுறைப் படுத்தப்படுகின்றது.

இங்கு, அரச சேவையின் தற்போதைய தேவை களுக்குப் பொருத்தமான வகையில் ஆட்சேர்ப்பு நடைமுறைகளில் நவீனமயமாக்கல்கள் தேவைப் படும் ஒவ்வொரு சந்தர்ப்பத்திலும் அதற்குரிய திருத்தங்கள் சேர்க்கப்படும்.

2025.12.19ஆந் திகதிய திருத்தப்பட்ட இணைந்த சாரதிகள் சேவைப் பிரமாணக் குறிப்பின் பிரகாரம், இணைந்த சாரதிகள் சேவையின் IIIஆம் தரத்துக்கு ஆட்சேர்ப்புச் செய்வதற்கான திறந்த போட்டிப் பரீட்சையின் பரீட்சை அறிவித்தல் 2026.02.13ஆந் திகதிய இலங்கை சனநாயக சோசலியக் குடியரசின் வர்த்தமானி யில் பிரசுரிக்கப்பட்டதுடன், அவ்வெழுத்துமூலப் பரீட்சையில் சித்தியடைந்த விண்ணப்பதாரர் களின் பெயர்ப்பட்டியல் 2026.07.28ஆந் திகதிய பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் இணையத்தளத்தில் வெளியிடப்பட்டது.

அதன்பிரகாரம், 2026 செப்ரெம்பர் 05, 06, 10 மற்றும் 11ஆம் திகதிகளில் நடாத்தப்பட்டதுடன், அங்கு தகைமைகளைப் பூர்த்திசெய்த கிட்டத் தட்ட 400 விண்ணப்பதாரர்களுக்கு 2026 நவம்பர் மாதத்தில் நியமனங்கள் வழங்குவதற்கு எதிர்பார்க்கப்படுகிறது.

நாடளாவிய சேவைகளுக்கான அவ்வொவ் வொரு சேவைப் பிரமாணக் குறிப்பின் பிரகாரம் ஆட்சேர்ப்பு போட்டிப் பரீட்சை முறைமை ஊடாக மேற்கொள்ளப்படுகின்றது.

இந்த அமைச்சின்கீழ் காணப்படும் நாடளாவிய சேவைகளுக்காக, ஒவ்வொரு சேவைக்கும் தனித் தனியாக நடாத்தப்பட்ட பரீட்சை முறைமைக்குப் பதிலாக புதிய போட்டிப் பரீட்சை முறையாக அனைத்து நாடளாவிய சேவைகளுக்கும் பொதுவான போட்டிப் பரீட்சை முறைமை 2021ஆம் ஆண்டில் அறிமுகப்படுத்தப் பட்டதுடன், 2023ஆம் ஆண்டில் பரீட்சைகள் நடாத்தப்பட்டு 2025ஆம் ஆண்டில் ஆட்சேர்ப்புகள் மேற்கொள்ளப்பட்டன.

அதன்பிரகாரம், அவ்வாறு அறிமுகப்படுத்தப் பட்ட புதிய முறைமையின்கீழ் போட்டிப் பரீட்சைகள் இதுவரை ஒரு தடவை மட்டுமே நடத்தப்பட்டுள்ளதுடன், அதே முறைமையைத் தொடர்ந்து பின்பற்றுமாறு பெறப்பட்ட கொள்கை முடிவின் பிரகாரம், அதில் காணப் பட்ட குறைகள், பலவீனங்கள் இனங்காணப் பட்டு, அவற்றுக்கான தீர்வுகள் உள்ளடக்கப் பட்டு, அப்புதிய போட்டிப் பரீட்சை முறைமை ஊடாகவே மீண்டும் ஒருமுறை ஆட்சேர்ப்புச் செய்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டு வருகின்றன.

இலங்கை கமத்தொழில் சேவை மற்றும் இலங்கை கல்வி நிருவாக சேவைக்குரிய ஆட்சேர்ப்புகளின்போதும் இந்த பொதுப் போட்டிப் பரீட்சைப் பகுதிக்குள் உள்ளடக்கப் பட்டு நடாத்துவதற்குத் தீர்மானிக்கப் பட்டுள்ளது.

(ஆ) பொருத்தமற்றது.

(a) (i) A new methodology is currently being examined to systematically update Public Service recruitment procedures in line with service requirements.

(ii) Recruitment procedures in the Public Service are systematically and appropriately updated, considering service requirements.

Accordingly, changing the system that existed hitherto, recruitment to the Combined Drivers' Service is conducted through an appropriate competitive examination framework to select eligible candidates, and the awarding of appointments to those who subsequently pass the trade tests has already commenced.

Furthermore, recruitment to the Office Employees' Service is currently carried out through a systematic and transparent interview, at which marks are awarded, enabling the achievement of organizational service requirements.

Furthermore, in all recruitments, the competitive recruitment process is implemented so as to provide a fair opportunity to applicants who fulfil the qualifications relevant to the respective services.

In this regard, whenever modifications are required in the recruitment procedures to align with the contemporary requirements of the Public Service, the necessary amendments are duly incorporated.

In accordance with the Service Minutes of the Combined Drivers' Service, as amended on 19.12.2025, the notification for the Open Competitive Examination for Recruitment to Grade III of the Combined Drivers' Service was published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka dated 13.02.2026, and the list of applicants who passed the said written examination was published on the website of the Ministry of Public Administration, Provincial Councils and Local Government on 28.07.2026.

Accordingly, the practical tests were held on 05th , 06th , 10th and 11th of September, 2026, and it is expected to award appointments in November, 2026 to nearly 400 applicants who fulfilled the required qualifications.

Recruitment for all-Island services is conducted through a competitive examination process in accordance with the respective Service Minutes of each service.

Replacing the separate examination systems previously in place for each service, a single competitive examination common to all all-Island services under this Ministry was introduced in 2021 as a new competitive examination scheme; the examinations were conducted in 2023, and recruitments were carried out in 2025.

Accordingly, under the new system so introduced, competitive examinations have so far been conducted only once, and pursuant to the policy decision received to continue following the same system, steps are currently being taken to recruit once again through that same new competitive examination system, after identifying its existing flaws and weaknesses and incorporating solutions for them.

It has also been decided to include the recruitments related to the Sri Lanka Agricultural Service and the Sri Lanka Education Administrative Service into this common competitive examination category and conduct them accordingly.

(b) Not applicable.

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 2498/2026 - පිළිතුර දීමට ඩිජිටල් ආර්ථික අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு ஜே.சீ. அலவத்துவல அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 2498/2026 - விடையளிப்பதற்கு, டிஜிட்டல் பொருளாதார அமைச்சர் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் இரண்டு வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Anura Kumara Dissanayake, Minister of Digital Economy, has requested for two weeks' time to reply to Question No. 03 - 2498/2026 - raised by the Hon. J. C. Alawathuwala, appearing in today's Order Paper.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.